# ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදය

## ජනමාධ්‍යවේදීන්ට, මානව හිමිකම් ආරක්ෂා කරන්නන්ට සහ සිවිල් සමාජයට ඇති තර්ජන

අභියෝග සහ යෝජිත ප්‍රතිසංස්කරණ
පිළිබඳ ලුහුඬු විශ්ලේෂණයක්
2022

CPA
Centre for Policy Alternatives

FMM Sri Lanka Free Media Movement

# ශ්‍රී ලංකාවේ
# මානව හිමිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදය

## ජනමාධ්‍යවේදීන්ට, මානව හිමිකම් ආරක්ෂා කරන්නන්ට සහ සිවිල් සමාජයට ඇති තර්ජන

අභියෝග සහ
යෝජිත ප්‍රතිසංස්කරණ පිළිබඳ ලුහුඬු විශ්ලේෂණයක්

CPA
Centre for Policy Alternatives

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
2022

**ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදය**
ජනමාධ්‍යවේදීන්ට, මානව හිමිකම් ආරක්ෂා කරන්නන්ට සහ සිවිල් සමාජයට ඇති තර්ජන

ප්‍රථම මුද්‍රණය : **මාර්තු 2022**

**ISBN : 978-624-5914-19-7**

පරිගණක සැකැස්ම : **වාක්‍ය රූ**

ප්‍රකාශනය : **විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය**

මෙම ප්‍රකාශනයේ අඩංගු ලිපි විවිධ මාධ්‍ය වෘත්තිකයන් සහ සිවිල් ක්‍රියාකාරීන් විසින් දායක කරන ලද ලේඛන වේ. ඒවායෙහි කතුවරුන් විසින් ප්‍රකාශ කර ඇති අදහස් ඔවුන්ගේ මතයන් වන අතර ඒවා තුළින් අත්‍යවශ්‍යයෙන්ම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ අදහස් පිළිබිඹු නොවේ.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන, දේශපාලන පක්ෂවාදීත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටුවනු ලැබූයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජනය කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැප වී සිටී.

අංක 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5, ශ්‍රී ලංකාව.

| | | |
|---|---|---|
| දුරකථන | : | +94112081384,+94112081385,+94112081386 |
| ෆැක්ස් | : | +94112081388 |
| විද්‍යුත් තැපැල | : | info@cpalanka.org |
| වෙබ් අඩවිය | : | www.cpalanka.org |
| මුහුණුපොත | : | www.facebook.com/cpasl |
| ට්විටර් | : | @cpasl |

# පටුන


කෙටි යෙදුම් 5

පෙරවදන 7

හැඳින්වීම 9

භාෂණයේ නිදහස සහ ප්‍රකාශනය ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස 13

අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම, රඳවා තබා ගැනීම සහ වධහිංසාව 19

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ නොවිසඳුණු ගැටලු - සංශෝධන කිරීම ද අවලංගු කිරීම ද? 26

වෙනස් කොට සැලකීම, සාමකාමී රැස්වීම සහ නීතියේ සමාන රැකවරණය පිළිබඳ ගැටලු 28

භාෂා අයිතිවාසිකම උල්ලංඝනය කිරීම සහ
රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය නිසි පරිදි ක්‍රියාත්මක නොවීම 33

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කරන ලද
පැමිණිලි සම්බන්ධයෙන් වන සාරාංශගත විශ්ලේෂණය 36

යෝජිත නිර්දේශ 42

ශක්තික සත්කුමාරඃ සිතීමේ නිදහස සිරගත කිරීම - චාන්දනී දිසානායක 47

චමුදිතගේ පවුල බිය ගන්වා මාසයයි! - තරිඳු උඩුවරගෙදර 49

තොරතුරු ඉල්ලන පුරවැසියාගේ ආරක්ෂාව තහවුරු කළ යුතුයි - රාහුල් සමන්ත හෙට්ටිආරච්චි 53

ජනමාධ්‍යයට එරෙහි ප්‍රචණ්ඩත්වය හා නීතියේ ගොළුවත - මංගලනාත් ලියනආරච්චි 55

ලංකාවේ මාධ්‍ය නිදහස, සිදුවීම් සහ ප්‍රවණතා - නීතිඥ විරංජන හේරත් 61

නීතිඥ අම්බිකා සත්කුනනාදන්ට එරෙහි ආණ්ඩුවේ
ප්‍රතිචාරය හා අදහස් පළ කිරීමේ නිදහස - ඉලට්චුමණන් දේවඅදිරන් 66

උමතු පුද්ගලයන් සම්බන්ධයෙන් රාජ්‍යයේ වගකීම ඉටු කිරීම - දයා නෙත්තසිංහ 70

PTA සහ ICCPR හෙවත් අදහස් මර්දනයේ බර අවි - රේඛා නිලුක්ෂි හේරත් 74

තර්ජනයෙන් යටපත් කළ පොලිස් හිංසනය - සජීව විජේවීර 79

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරන ලෙස
අයිතිවාසිකම් ආරක්ෂකයෝ බල කරති - ක්වින්ටස් කොළඹගේ 83

ෂෙහාන් මාලක අත්අඩංගුවට ගැනීම හා
අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියට වැට බැඳීම - ප්‍රියන්ජිත් ආලෝකබණ්ඩාර 87

'සිරකරුවන්ගේ පවුල්වල අයද මනුෂ්‍යයෝය' - අසේල කුරුළුවංශ 91

සිරගත වූ පියා වෙනුවෙන් දඬුවම් විඳින දියණියක් - අසේල කුරුළුවංශ 95

799 දෙනෙකු මගහැර එක් අයකුට එරෙහිව ක්‍රියාත්මක වූ 'වනජීවී' නීතිය! - අචල උපේන්ද්‍ර 98

සංස්කෘතික නිදහස හා අන්තවාදය අතර ගැටුමඃ
නැගෙනහිර පාසලක අත්දැකීමක් - ලක්මාල් කේ. බදුගේ 101

සාගරගම නිවාස ගුවන් හමුදාවෙන් කඩා දැමීම - ප්‍රසාද් පූර්ණමාල් ජයමාන්න 105

පොලිස් හිංසනයකට එරෙහිව මූලික අයිතිවාසිකම් පෙත්සමක් - සමන්ති වීරසේකර 110

සීමා නිර්ණය නිසා පීඩාවට පත් බෝගස්වැව - දිනසේන රතුගමගේ 112

අපේ මුදල් වියදම් කරන හැටි දොරවල් වහගෙන කතා කිරීම - රේඛා නිලුක්ෂි හේරත් 115

නල්ලූර් මුහුදු ආදිවාසීන්ගේ උරුමය උදුරාගැනීමේ අවනඩුව - මංගලනාත් ලියනආරච්චි 119

අධිකරණයෙන් ඉටු කළ යුක්තියට අභියෝග කරන ඇමති බලය! - ශාලික විමලසේන 124

මන්නාරම දෙමළ ජනයාගේ භාෂා අයිතිය උල්ලංඝනය වීම - ජෝෂප් නායා 128

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේ අභියෝග - සනත් ප්‍රියන්ත 130

# කෙටි යෙදුම්

BHC – බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලය

CID – අපරාධ විමර්ශන කොට්ඨාශය

COLIO – ප්‍රධාන රාජ්‍ය භාෂා ක්‍රියාත්මක කිරීමේ නිලධාරී

CPA – විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

FMM – නිදහස් මාධ්‍ය ව්‍යාපාරය

FR – මූලික අයිතිවාසිකම්

HRCSL – ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ICCPR – සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය

OLC – රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

OLIO – රාජ්‍ය භාෂා ක්‍රියාත්මක කිරීමේ නිලධරයා

OLP – රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය

PTA – 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත

TID – ත්‍රස්ත විමර්ශන අංශය

UDHR – මානව හිමිකම් විශ්ව ප්‍රකාශනය

# පෙරවදන

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් ප්‍රවර්ධනය කිරීමේ මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණයි. මාධ්‍ය නිදහස, තොරතුරු සඳහා ප්‍රවේශය සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ශක්තිමත් කිරීම අපගේ අභිලාෂය යි. එම අරමුණු උදෙසා යෝජිත පියවර වූයේ, සිවිල් සමාජය හා ජනමාධ්‍ය ක්ෂේත්‍රය නියෝජනය කරන කලාපීය සහ ජාතික මට්ටමේ සංවිධාන හා මානව හිමිකම් ආරක්ෂකයින් සඳහා පොදු හා තිරසාර වේදිකාවක් නිර්මාණය කිරීම යි. මාධ්‍ය භාවිතයන් ශක්තිමත් කිරීම, ආරක්ෂාව සහ දේශපාලන සහභාගීත්වය සඳහා විකල්ප අවකාශයන් නිර්මාණය කිරීම සහ මානව හිමිකම් කඩ කිරීම් හා මූලික නිදහසට එල්ල වන තර්ජන ආපසු හැරවිය හැකි වනු පිණිස එකිනෙකාගේ හැකියාවන් ශක්තිමත් කිරීමට හා ප්‍රයෝජනයට ගැනීමට එක් ව ක්‍රියා කිරීම යි.

මෙම ව්‍යාපෘතිය කෙටිකාලීන මුලපිරීමක් වුව ද, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සහ ජනතාවගේ මූලික නිදහස පිළිබඳ දීර්ඝකාලීන සමාජ සහ ප්‍රතිපත්තිමය කතිකාවක් සඳහා එය පදනමක් බවට පත් කිරීමට අපි සියලු දෙනා කැප වී සිටිමු. මාධ්‍යවේදීන්, මානව හිමිකම් ආරක්ෂකයින් සහ සිවිල් සමාජයේ නියෝජිතයන් ගණනාවක් අතීතයේ දී සහ වර්තමානයේ දී මානව හිමිකම් පිළිබඳ පුළුල් සාකච්ඡාවට සහ උද්දේශනයට ඉමහත් දායකත්වයක් ලබා දී ඇත. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරය එක් ව මෙම ව්‍යාපෘති මුලපිරීම යටතේ මාධ්‍යවේදීන්, මානව හිමිකම් ආරක්ෂකයින් සහ සිවිල් සමාජයේ නියෝජිතයින් එකම මණ්ඩපයකට ගෙන ඒමට සහ අසාධාරණයන්ට එරෙහිව සාමූහිකව පෙනී සිටීමේ ශක්තිමත් උපාය මාර්ගයක් සමඟ ඔවුන්ගේ සබඳතා ශක්තිමත් කිරීමට උත්සාහ දරා ඇත.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පාර්ශ්වකරුවන් ගණනාවක් සමග සාකච්ජා කළෙමු. අසාධාරණයට ලක් වීම් පිළිබඳ සිදුවීම් බෙදා ගැනීමට සහ මාධ්‍යවේදීන්ගේ, මානව හිමිකම් ආරක්ෂකයින්ගේ සහ සිවිල් සමාජයේ නියෝජිතයින්ගේ අයිතිවාසිකම් සඳහා දරන ලද තවත් වෑයමකි. ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම් සහ නීතිය යන මූලධර්ම යටපත් කරමින් ශ්‍රී ලංකාවේ මාධ්‍යවේදීන්, මානව හිමිකම් ආරක්ෂකයින් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් වැඩි වශයෙන් ඉලක්ක කර ගැනීම සහ මර්දනය කිරීම හෙළිදරව් කිරීම වෙනුවෙන් භෞතිකව සහ අන්තර්ජාලය හරහා සුරක්ෂිතව තොරතුරු ගොනු කිරීම සහ ප්‍රකාශ කිරීම සඳහා ජංගම දුරකථන යෙදවුමක් මෙම මුලපිරීමේ කොටසක් ලෙස නිර්මාණය කරන ලදී.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු මහතා මෙම මැදිහත්වීම සාර්ථක කර ගැනීම සඳහා ලබාදුන් සහයෝගය සහ අගනා මගපෙන්වීම පිළිබඳව ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. "ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කිරීම" යන මාතෘකාවෙන් යුත් මෙම ව්‍යාපෘතියට බ්‍රිතාන්‍ය මහකොමසාරිස් කාර්යාලයේ නොමසුරු උපකාරය සහ සහයෝගීතාව නොලැබුණේ නම් මෙය යථාර්ථයක් නොවනු ඇති බව සිහිපත් කරමින්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙනුවෙන් ඔවුන්ට අපගේ විශේෂ ස්තුතිය පුද කර සිටිමු. ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ සහතික කිරීම සඳහා කැප වූ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ සියලු ම සාමාජිකයින්ට ද, මෙම ප්‍රකාශනය භාෂා ත්‍රිත්වයෙන් ම නිෂ්පාදනය කිරීමට ඉමහත් මෙහෙවරක් ඉටු කළ

මාධ්‍යවේදීන්ට, මානව හිමිකම් ආරක්ෂකයන්ට, ලිපි සපයමින් දායක වූ සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට සහ පරිවර්තකයන්ට ද මගේ අවංක ස්තුතිය පුද කරමි. අභියෝග පිළිබඳ කෙටි විශ්ලේෂණයක් සහ යෝජිත ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කිරීමට සහාය වූ පර්යේෂණ කණ්ඩායම, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ කාර්ය මණ්ඩලය සහ මෙම මුලපිරීම සඳහා සහාය දුන් අනෙකුත් සියලු ම සගයන් මගේ මුළු හදින් ම අගය කිරීමට කැමැත්තෙමි.

මෙම ප්‍රකාශනයේ නිර්දේශ මූලික මානව හිමිකම් සහ නිදහස පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදකයින් සහ අනෙකුත් අදාළ පාර්ශ්වයන් විසින් නිර්මාණාත්මක ලෙස සලකනු ඇති අතර ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ අවශ්‍ය වන විට ඊට අදාළ ක්‍රියාමාර්ග ගනු ඇතැයි අපි තරයේ විශ්වාස කරමු.

**ලයනල් ගුරුගේ**
ජ්‍යෙෂ්ඨ පර්යේෂක,
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය.

# හැඳින්වීම

සෑම කෙනෙකු ම, ඇයගේ හෝ ඔහුගේ මනුෂ්‍යත්වයේ ගුණය අනුව, විශ්වීය වශයෙන් පිළිගත් මූලික මානව හිමිකම්වලට උරුමකරුවෝ වෙති. එබැවින් ගෞරවාන්විතව ජීවත්වීමේ අයිතිය සම්පූර්ණයෙන් සාක්ෂාත් කර ගැනීම සඳහා, මානව හිමිකම් සහ මූලික නිදහස පිළිබඳ පොදු අවබෝධය ඉතා වැදගත් වේ. ඓතිහාසික වශයෙන්, 1215 සිට, මැග්නා කාර්ටා ප්‍රකාශනය සහ තවත් එවන් ජාත්‍යන්තර ලේඛන කිහිපයක් සමඟ මානව හිමිකම් නැවත නැවත තහවුරු කරන ලද ලේඛන ගණනාවක් ගෝලීය තලයේ තිබේ. කෙසේ වෙතත්, පුද්ගල අයිතිවාසිකම් පිළිබඳ පොදුවේ සහ වචනාර්ථයෙන් පිළිගත්ත ද, ශ්‍රී ලංකාව ඇතුළු, ලොව පුරා බොහෝ රටවල පාලකයන්ගේ ක්‍රියාවලින් ඔප්පු වී ඇත්තේ අන්‍යෝන්‍ය වශයෙන්, වර්ණය, ස්ත්‍රී පුරුෂ භාවය, භාෂාව, ආගම, වෘත්තිය සහ දේශපාලන මතය යන කරුණු මත මානව හිමිකම් බැහැර කිරීම, වෙනස් කොට සැලකීම සහ උල්ලංඝනය කිරීම ආදී තත්ත්වයන් අඛණ්ඩව නොවිසැඳී පවතින බව යි.

මානව හිමිකම් ආරක්ෂා කිරීමට වඩා උල්ලංඝනය වන යුගයක් පසුකරමින් පැමිණ, මානව හිමිකම් පිළිබඳ අඛණ්ඩ කතිකාව මගින්, වර්ෂ 1948 දී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයට මග පෑදී ය. එය සියලු ජනතාවට සහ සියලු ජාතීන් සඳහා පොදු සම්මතයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද්දේ මෙම අයිතිවාසිකම් සහ නිදහසට ගරු කිරීම සහ ධනාත්මක පියවරයන් මගින් එය ප්‍රවර්ධනය කිරීම සඳහා ය. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 1 වන වගන්තියේ මෙසේ සඳහන් වේ.

> 1 වන වගන්තිය - මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය[1]
>
> "සියලු මනුෂ්‍යයෝ නිදහස්ව උපත ලබා ඇත. ගරුත්වයෙන් හා අයිතිවාසිකම්වලින් සමාන වෙති. යුක්ති අයුක්ති පිළිබඳ හැඟීමෙන් හා හෘදය සාක්ෂියෙන් යුත් ඔවුන්, ඔවුනොවුන්ට සැලකිය යුත්තේ සහෝදරත්වය පිළිබඳ හැඟීමෙනි."

මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ පූර්විකාවේ මෙසේ සඳහන් වේ, "...මානව අයිතිවාසිකම් නොතැකීම හා අවඥාවට ලක්කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් මිනිස් වර්ගයාගේ හෘදය සාක්ෂිය සාහසික පීඩනයට භාජනය කෙරෙන ම්ලේච්ඡ කෲරකම් සිදු වී ඇති හෙයින් ද, මිනිස් වර්ගයාට අදහස් ප්‍රකාශ කිරීමේ හා විශ්වාස ඇදහිලි දැරීමේ නිදහසත්, බියෙන් හා අගහිඟකමින් තොරවීමේ නිදහසත් භුක්ති විඳීමට හැකි ප්‍රජාවක් බිහි කිරීම, පොදු ජනතාවගේ ශ්‍රේෂ්ඨතම අපේක්ෂාව ලෙස ප්‍රකාශයට පත් වී ඇති හෙයින් ද," යනුවෙන් සඳහන්ව තිබීම මගින් "අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසේ" වැදගත්කම අවධාරණය කරයි.

1 https://www.un.org/sites/un2.un.org/files/udhr.pdf

තව ද, මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය හා සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය යන ද්විත්වයේම 19 වැනි වගන්තිය මගින් 'ප්‍රකාශනයේ නිදහස' සහතික කොට ඇත්තේ අනෙකුත් මානව හිමිකම් සාක්ෂාත් කර ගැනීමේ දී එය නැතිව ම බැරි අයිතියක් ලෙස වැදගත්කමක් ලබා දෙමිනි.

ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ, විශේෂයෙන් ම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය තුළ, එහි 14(1)(අ)[2] ව්‍යවස්ථාව මගින් "භාෂණයේ නිදහස සහ ප්‍රකාශනය ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස" සහතික කර ඇත. කෙසේ වෙතත්, බොහෝ මාධ්‍යවේදීන්ට, මානව හිමිකම් ආරක්ෂකයින්ට සහ සිවිල් සමාජයේ සාමාජිකයින්ට, අදහස් ප්‍රකාශ කිරීමෙන්, භාෂණයෙන් සහ ප්‍රකාශයට පත් කිරීමෙන් පසු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කොට ඇති භාෂණයේ නිදහසට සහ ප්‍රකාශනය ඇතුළු අදහස් පළ කිරීමේ නිදහසට අගතිගාමී වශයෙන් බලපාන කරුණක් බවට බොහෝ විට පත්ව ඇත්තේ මේ රටේ කලින් කලට පැවැති ආණ්ඩු විසින් මානව හිමිකම් කෙරෙහි අසංවේදී බව සහ ඒවා සම්බන්ධයෙන් නිසි ගරුත්වයක් නොදැක්වීම නිසා ය.

පුළුල් පරාසයක මානව හිමිකම් උල්ලංඝනය කිරීමේ සහ උල්ලංඝනය කිරීමට අත්‍යාසන්න තර්ජනවල පරාසයකට එරෙහි ව හඬ නැගීමේ දී, සාමකාමී රැස්වීමේ සහ සංවිධානය වීමේ නිදහස සමග බැඳුණු අදහස් ප්‍රකාශ කිරීම සඳහා වූ නිදහස අත්‍යවශ්‍ය පදනමක් බවට පත් වෙයි. එබැවින් අදහස් ප්‍රකාශ කිරීමේ, භාෂණයේ සහ ප්‍රකාශයට පත් කිරීමේ නිදහස සීමා කරන ආණ්ඩුකරණ පද්ධති, ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම්වල හරයට නිසැකව ම අනතුරුදායක වෙයි. මක්නිසාද යත්, තමන් යම් ප්‍රමාණයකට හෝ ආරක්ෂිත බවට මහජනයාට සහ සමාජයට හැඟීමක් ලබාදීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදයේ අවම ප්‍රමිතීන් පවත්වාගෙන යෑමට මූලික අයිතීන් සහ නිදහස අත්‍යවශ්‍ය වන හෙයිනි. තව ද, මූලික නිදහස යටපත් කරන තර්ජන මගින් වඩාත් බලපෑමට ලක් වන්නේ, අයුක්තියට එරෙහිව සහ යුක්තිය ඉල්ලා නිතර ම හඬ නගන සමාජ කොටස විය හැකි ය.

ලෝකය පුරා මෙන් ම, ශ්‍රී ලංකාවේ ද, ප්‍රධාන වශයෙන්, ඔවුන්ගේ ප්‍රකාශයනයෙහි නිදහස ඇතුළු අදහස් ප්‍රකාශ කිරීමේ සහ භාෂණයේ නිදහසේ මූලික අයිතීන් සමගින්, මාධ්‍යවේදීහු, සිවිල් සමාජ ක්‍රියාකාරීහු සහ මානව හිමිකම් ක්‍රියාකාරීහු වැදගත් කාර්යභාරයක් ඉටු කරති. කෙසේ වෙතත්, රටේ පවතින සන්දර්භය වන්නේ, රටේ ප්‍රජාතන්ත්‍රවාදී අවකාශයට ඇති අහිතකර බලපෑම් හේතුවෙන්, මාධ්‍යවේදීන්, සිවිල් සමාජ ක්‍රියාකාරීන් සහ මානව හිමිකම් ආරක්ෂකයින් ගණනාවක් පෙර නොවූ විරූ ආවේක්ෂණයට, තර්ජනයට සහ බිය ගැන්වීමට ලක් වීම සම්බන්ධයෙන් කරුණු වාර්තා වීමයි.

ශ්‍රී ලංකාව තුළ, මාධ්‍යවේදීන්, සිවිල් සමාජ ක්‍රියාකාරීන් සහ මානව හිමිකම් ආරක්ෂකයින් භෞතිකව මෙන්ම අතත්‍ය ලෙස යන දෙආකාරයෙන් ම ඉලක්ක කිරීම සහ මර්දනය කිරීම, ප්‍රජාතන්ත්‍රවාදයේ මානව හිමිකම්වල සහ නීතියේ පාලනයේ මූලධර්මවලට එල්ල වන ප්‍රහාරයකි. රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අඩංගු මූලික අයිතීන් සහ නිදහස තිබිය දී, ප්‍රතිපත්ති සහ සැබෑ ජීවිතයේ භාවිතයන් මගින් පෙන්නුම් කරන්නේ දිගින් දිගට පවතින නොගැළපීමකි. එනම් නීති පොත්වල ප්‍රකාශිත අයිතීන් සහ විශේෂයෙන් ම ප්‍රකාශනයෙහි නිදහස ඇතුළු අදහස් ප්‍රකාශ කිරීමේ සහ භාෂණයේ නිදහස, සාමකාමී රැස්වීමේ සහ සංවිධානය වීමේ අයිතිය, නිදහසේ ගමන් බිමන් යෑමේ සහ ශ්‍රී ලංකාව තුළ තමන් කැමති ස්ථානයක වාසස්ථානය තෝරාගැනීම ඇතුළු මානව හිමිකම් සහ නිදහස භුක්ති විඳීමට ඇති ඉඩ ප්‍රස්ථාවට අවහිරතා ඇති කිරීම යි. නීතිය නිසි පරිදි සාධාරණව ක්‍රියාත්මක නොවීම, දණ්ඩන මුක්තිය සහ නීතියේ සමාන ආරක්ෂාවක් නොමැති වීම සමග මානව හිමිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය හැකිළීම සම්බන්ධ බරපතළ ප්‍රශ්න විසඳීමට නීති සම්පාදන සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ අවැසි පරිදි නොමැති වීම හේතුවෙන් මෑත කාලයේ මාධ්‍යවේදීන්, සිවිල් සමාජ ක්‍රියාකාරීන් සහ මානව හිමිකම් ආරක්ෂකයින් මුහුණ දෙන තර්ජන උත්සන්න වී ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4(ඈ)[3] වගන්තියේ නිශ්චිතව මෙසේ සඳහන් වෙයි:

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගනු ලබන මූලික අයිතිවාසිකම් සියලු පාලන ආයතන විසින් ගරු කරනු ලැබිය යුත්තේ ය. ආරක්ෂා කරනු ලැබිය යුත්තේ ය. තව ද, එම මූලික අයිතිවාසිකම් මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති ආකාරයට සහ ප්‍රමාණයට මිස, සක්ෂිප්ත කිරීම, සීමා කිරීම හෝ අහිමි කිරීම නොකළ යුත්තේ ය." යනුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් කිරීම මගින්, මෙම අයිතීන් පිළිබඳ හැඟීමක් පුරවැසියන් තුළ ඇති වීමේ පරිසරයක් සහතික කිරීමේ ආණ්ඩුවේ වගකීම අවධාරණය කරයි.

---

2 https://www.parliament.lk/files/pdf/constitution.pdf

3 https://www.parliament.lk/files/pdf/constitution.pdf

කෙසේ වෙතත්, විශේෂයෙන් ම, මාධ්‍යවේදීන්ට, මානව හිමිකම් ආරක්ෂකයින්ට, සිවිල් සමාජයට සහ පොදු වශයෙන් මහජනයාට මර්දනයට ලක්වීමෙන් තොරව ක්‍රියාත්මක වීමට හිතකර සමාජ- දේශපාලන වාතාවරණයක් ගොඩ නැගීමේ දී ශ්‍රී ලංකාවේ අනුප්‍රාප්තික ආණ්ඩුවල කාර්යභාරය පිළිබඳ ප්‍රශ්න අද දක්වා වලංගුව පවතියි. මාධ්‍යවේදීන්, මානව හිමිකම් ආරක්ෂකයින් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් මුහුණ දෙන අවදානම සහ තර්ජන රටේ සමාජය සමස්තයක් ලෙස මුහුණ දෙන, විශේෂ අවධානය යොමු කළ යුතු අවදානම පිළිබඳව වැදගත් දර්ශකයකි.

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ පෙන්වා දී ඇති මූලික අයිතීන් සහ නන්වැදෑරුම් නිදහස පහත වගුවේ දක්වා ඇති පරිදි පෙන්වා දිය හැකිය.

| **මූලික අයිතීන් සහ නන්වැදෑරුම් නිදහස** | |
|---|---|
| සිතීමේ නිදහස, හෘද සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස | භාෂණයේ නිදහස සහ ප්‍රකාශනය ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස |
| වධ හිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන්සහගත සැලකිල්ලට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතු බව | සාමකාමීව රැස්වීමේ නිදහස |
| නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්වසාධාරණ විය යුතු බව | සමාගමයේ නිදහස |
| කිසිම පුරවැසියකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය මත වෙනස්කමකට හෝ විශේෂයකට භාජනය නොවීමේ නිදහස | වෘත්තීය සමිති පිහිටුවීමේ සහ වෘත්තීය සමිතිවලට බැඳීමේ නිදහස |
| නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තකු සිරභාරයට ගැනීම නොකළ යුතු බව සහ එසේ කරනු ලබන්නේ නම් ඒ සඳහා හේතුව ඒ තැනැත්තාට දැන්විය යුතු වීම | තම ආගම, ලබ්ධිය හෝ විශ්වාසය ඇදහීමෙන්, පිළිපැදීමෙන්, ප්‍රගුණ කිරීමෙන් සහ ඉගැන්වීමෙන් ප්‍රකාශ කිරීමේ නිදහස |
| අධිකරණය විසින් ලබාදෙනු ලබන නීතියෙන් නියම කරනු ලබන ආඥාවක් මත නීතියෙන් නියම කර ඇති කාලයකට වඩා වැඩි කාලයක් කිසිම තැනැත්තකු අත්අඩංගුවෙහි හෝ රඳවා තබා ගැනීම හෝ පෞද්ගලික නිදහස අහිමි කිරීම නොකළ යුත්තේ ය. | එකලාව හෝ අන් අය සමග හෝ ස්වකීය සංස්කෘතිය භුක්ති විඳීමේ හා වැඩි දියුණු කිරීමේ නිදහස හා ස්වකීය භාෂාව භාවිත කිරීමේ නිදහස |
| වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව චෝදනා නගනු ලැබ ඇත්තේ ද ඒ තැනැත්තාට, නිසි අධිකරණයක් විසින් පවත්වනු ලබන සාධාරණ නඩු විභාගයක දී පෞද්ගලිකව ම හෝ නීතිඥවරයකු මගින් හෝ කරුණු කියා සිටීමට ඇති හිමිකම | නීත්‍යානුකූල රැකියාවක, වෘත්තියක, කර්මාන්තයක, වෙළඳ ව්‍යාපාරයක හෝ ව්‍යවසායක නියුක්ත වීමේ නිදහස |
| නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව නිසි අධිකරණයක් විසින් කරනු ලැබූ ආඥාවක් අනුව මිස, කිසිම තැනැත්තකු මරණීය දණ්ඩනයට යටත් කිරීම හෝ බන්ධනාගාරගත කිරීම නොකළ යුතු බව | ශ්‍රී ලංකාව තුළ යාම් ඊම් කිරීමේ නිදහස සහ අභිමත ස්ථානයක වාසය කිරීමේ නිදහස |
| වරදකරු යැයි ඔප්පු කරනු ලබන තෙක් සෑම තැනැත්තකුම නිර්දෝෂී යයි පූර්ව නිගමනය කළ යුතු බව | ශ්‍රී ලංකාවට පෙරළා පැමිණීමේ නිදහසට ඇති හිමිකම |
| අතීතයට බලපාන දණ්ඩන නීති පැනවීම තහනම් බව | |

සාමාන්‍ය ජනතාවගේ මානව හිමිකම් සම්බන්ධයෙන් අනර්ථකාරී ප්‍රතිවිපාක ඇති කරන බොහෝ සිදුවීම් වන අවස්ථාවල දී, මාධ්‍යවේදීහු, මානව හිමිකම් ආරක්ෂකයෝ සහ සිවිල් සමාජ ක්‍රියාකාරීහු, මානව හිමිකම් ආරක්ෂා

කිරීම සඳහා නිතරම පාහේ පෙරමුණ ගත්හ. මානව හිමිකම්වලට ගරු කිරීම කොතරම් වැදගත් ද යන්න සහ ඒවාට විශ්වීය වටිනාකමකින් සැලකීමේ අවශ්‍යතාව පිළිබඳ ව ප්‍රදර්ශනය කිරීමේ කා වැදුණු හැකියාවක් සිවිල් සමාජයේ මෙම කණ්ඩායම්වල කාර්යභාරයට අන්තර්ගතව ඇත. අඩු ප්‍රජාතන්ත්‍රවාදී නිදහසක් සහිත සන්දර්භයක පවා මානව හිමිකම් උල්ලංඝනයන් සහ උල්ලංඝනයන් සිදුවීමේ අත්‍යාසන්න තර්ජන පිළිබදව මහජන අවකාශයේ හෙළිදරව් කිරීමට ඔවුනට හැකි නමුත් එය සිදු වන්නේ දැඩි අවදානමක් සහිතව ය. එමෙන් ම, දූෂණ, පොදු දේපළ අයථා පරිහරණය, මූලික අයිතීන් සහ නිදහස උල්ලංඝනය වීම, අධිකරණයේ ස්වාධීනත්වය සහ නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන ගැන මහජන විශ්වාසය යටපත් කරන දණ්ඩන මුක්තිය ආදිය හෙළිදරව් කිරීමේ දී ගවේෂණාත්මක මාධ්‍යවේදයේ කාර්යභාරය කේන්ද්‍රීය වෙයි. විශේෂයෙන් ම, මාධ්‍යවේදීන්ට, සිවිල් සමාජයට, සහ මානව හිමිකම් ආරක්ෂකයින්ට එල්ල වන ඕනෑම ආකාරයේ තර්ජනයක නිසැක ප්‍රතිඵලය වන්නේ රටේ නීතියේ ආධිපත්‍යය යටපත් කරමින් වගවීම් රහිත ආණ්ඩුකරණයක් ප්‍රවර්ධනය කිරීම යි.

මෙම ප්‍රකාශනයේ ඇතුළත් වන ලිපි මාලාව මගින් පෙන්නුම් කරන්නේ, මාධ්‍යවේදීන්ගේ, මානව හිමිකම් ආරක්ෂකයින්ගේ සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන්ගේ කාර්යභාරය සහ නියමිත කටයුතු ඉටු කිරීමටත්, සමාජයේ ජනයාගේ අභිමානය සහිතව ඔවුන්ගේ ජීවිතයට ඇති අයිතියටත් ඇති විවිධාකාර ස්වභාවයෙහි තර්ජන සහ බාධාවන් සම්බන්ධයෙනි.

ඒ අනුව, මාධ්‍යවේදීන් සහ මානව හිමිකම් ආරක්ෂකයින් ගණනාවක් විසින් ලියන ලදුව, මෙම ප්‍රකාශනයේ පසු භාගයේ ඇතුළත් කොට ඇති ලිපි මාලාව මත පදනම් වෙමින් ශ්‍රී ලංකාවේ මාධ්‍යවේදීන්, සිවිල් සමාජය සහ මානව හිමිකම් ආරක්ෂකයින් මුහුණ දෙන ප්‍රධාන ප්‍රශ්න සහ තර්ජන පිළිබඳව කෙටි විග්‍රහයක් මෙම ප්‍රකාශනයෙහි මුල් කොටසට ඇතුළත් ය. ඊට අමතරව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කොට ඇති මානව හිමිකම් පැමිණිලි 237ක් මගින් හඳුනා ගත් මහජනයාගේ මානව හිමිකම් සම්බන්ධ ප්‍රශ්න ද මෙම වාර්තාවේ ලුහුඬු විශ්ලේෂණයක් සඳහා සැලකිල්ලට ගනු ලැබී ය. කෙසේ වෙතත්, මෙම ප්‍රකාශනය, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්ත්වය ගැන හෝ ජනමාධ්‍යවේදීන්, මානව හිමිකම් ආරක්ෂකයින් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් මුහුණ දෙන මානව හිමිකම් සහ මූලික නිදහස සම්බන්ධ ප්‍රශ්න සහ අභියෝග පිළිබඳව හෝ සම්පූර්ණ විශ්ලේෂණයක් නොවන බව සැලකිය යුතු වේ. මානව හිමිකම් සහ මූලික නිදහස් භුක්ති විඳීමේ පුරවැසියන්ගේ අවකාශය සම්බන්ධයෙන් ඇති ගැටලු, සිවිල් සමාජයට සාමාන්‍ය වශයෙන් බරපතළ ලෙස බලපාන සහ දශක ගණනාවක් තිස්සේ ඉල්ලා සිටි ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ නීති සම්පාදන සහ ප්‍රතිපත්ති රාමුවේ ඇතැම් අඩු ලුහුඬුකම් පිළිබඳවත් වන පුළුල් ප්‍රශ්නයේ එක්තරා පැතිකඩක් පමණක් මෙමගින් කෙටියෙන් සලකා බලනු ලැබ ඇත.

ප්‍රකාශනයේ අවසන් කොටසෙහි අඩංගු ලිපි පදනම් වී ඇත්තේ පුද්ගලයකුගේ හෝ පුද්ගල කණ්ඩායමක හෝ ඇතැම් සත්‍ය ජීවිත අත්දැකීම් මත වුව ද, සාකච්ඡාවට ලක් වන ප්‍රශ්නවල හරය පුරවැසි ගෞරවය සහිත ව ජීවත්වීමේ පුළුල් අයිතීන්ටත්, වගවීම් සහිත ආණ්ඩුකරණයේ නැතිව ම බැරි අවශ්‍යතාවටත් නිශ්චිතව ම අදාළ වන්නේ ය.

මුද්‍රණය කරන අවස්ථාවේ දී නොවැළැක්විය හැකි අන්දමින් උද්ගත වූ (මාර්තු 2022) ප්‍රායෝගික බාධාවන් හේතුවෙන් ලිපි කිහිපයක් මෙම වාර්තාවේ මුද්‍රිත පිටපතෙන් ඉවත් කිරීමට සිදු වී ඇත. කෙසේ වෙතත්, ඒවා සහ තවත් සිදුවීම් සම්බන්ධයෙන් වන තොරතුරු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයෙහි වෙබ් අඩවිවල විද්‍යුත් අනුවාදයන් ඔස්සේ සම්පූර්ණයෙන් ම ලබා ගත හැකි ය.

# භාෂණයේ නිදහස සහ ප්‍රකාශනය ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස

ප්‍රකාශනයේ නිදහස ප්‍රජාතන්ත්‍රවාදයේ අත්‍යවශ්‍ය අංගයකි. මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ[1] 19 වැනි වගන්තියෙන් පවසන ආකාරයට, "තම නිදහස් මතය දැරීමට හා ප්‍රකාශ කිරීමට සෑම පුද්ගලයෙකුට ම අයිතියක් ඇත. අනුන්ගේ බාධාවක් නොමැති ව, තම දැරීමටත්, දේශසීමා නොසලකා කවර මාධ්‍යයකින් හෝ තොරතුරු ලැබීමට හා දීමටත් ඇති අයිතිය ද ඊට ඇතුළත් ය." 2007 අංක 56 දරන සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය[2] (ICCPR) හි 19(2) වගන්තිය යටතේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වගකීමක් ද වේ. එහි සඳහන් වන්නේ තම නිදහස් මතය දැරීමට සෑම පුද්ගලයෙකුටම අයිතියක් ඇති බව යි. සෑම කෙනෙකුටම, වාචිකව, ලිඛිතව හෝ මුද්‍රිතව, කලා කෘතියක් ආකාරයෙන් හෝ ඔහු කැමති වෙනත් කවර මාධ්‍යයක් හරහා දේශසීමා නොසලකා සියලු වර්ගවල තොරතුරු සහ අදහස් සෙවීමේ, ලබා ගැනීමේ සහ බෙදා හැරීමේ නිදහස මෙම අයිතියට ඇතුළත් වේ.

මාධ්‍ය නිදහස තහවුරු කිරීම සඳහා අදහස් ප්‍රකාශ කිරීම ඇතුළු භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස මූලික වේ. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(අ)[3] වගන්තිය, මූලික අයිතිවාසිකම් තුළ එය සහතික කරයි. කෙසේ වෙතත්, රට පුරා වාර්තා වන ප්‍රකාශනය ඇතුළු ව භාෂණයේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස උල්ලංඝනය කිරීම් ලැයිස්තුවට එකතු වන අන්තරාදායක සිදුවීම් සම්බන්ධයෙන් දැඩි කනස්සල්ලක් පවතී. මාධ්‍යවේදීන්ගේ, මානව හිමිකම් ආරක්ෂකයන්ගේ සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට එල්ල වන තර්ජන සහ අභියෝග ශ්‍රී ලංකාව තුළ නැවත නැවතත් මතු වන නිරන්තර ප්‍රශ්නයක් බවට පත්ව ඇත. එබැවින්, එය ප්‍රජාතන්ත්‍රවාදී අවකාශයේ ඌනතාව සහ තම පුරවැසියාගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ආණ්ඩුවේ අපොහොසත්කම පිළිබඳ දර්ශකයක් ලෙස සැලකිය හැකි ය.

මාධ්‍යවේදීන් සහ මානව හිමිකම් වෙනුවෙන් නැගී සිටින ක්‍රියාකාරීන් ගණනාවක් විසින් මෙම ප්‍රකාශනයට රචිත ලිපිවලින් පෙන්නුම් කරන්නේ, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (අයි.සී.සී.පී.ආර්.) පනතේ සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ නීතිමය ප්‍රතිපාදන අනිසි ලෙස පරිහරණය කිරීම, විසම්මුතිය ඇතුළු ප්‍රකාශනයේ මූලික අයිතියට දැඩි ලෙස අහිතකර අන්දමට බලපා ඇති බව යි. එම ලිපිවලින් පමණක් නොව, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් පිළිබඳ නොයෙකුත් මාධ්‍ය වාර්තා සහ වෙනත් වාර්තා ද අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට එල්ල වී ඇති තර්ජන සම්බන්ධයෙන් භයානක තත්වයක් පෙන්නුම් කරයි. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 2019 සිය වාර්ෂික වාර්තාවේ[4] මෙසේ සටහන් කරයි.

1 https://www.un.org/en/about-us/universal-declaration-of-human-rights

2 https://www.ohchr.org/en/instruments-mechanisms/instruments/international-covenant-civil-and-political-rights

3 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වැනි ව්‍යවස්ථාව https://www.parliament.lk/files/pdf/constitution.pdf

4 https://www.hrcsl.lk/wp-content/uploads/2020/01/Annual-Report-2019.pdf

"... වසර (2019) තුළ ලැබුණු පැමිණිලි අතරින් වැඩිම ප්‍රමාණය පුද්ගලික නිදහස උල්ලංඝනය කිරීම සම්බන්ධ පැමිණිලි (1,629). වන අතර දෙවන වැඩි ම පැමිණිලි සංඛ්‍යාව (1,240) සටහන් වන්නේ ප්‍රකාශනයේ නිදහස, සමාගමයේ නිදහස, ආගම සහ රැස්වීම වැනි අනෙකුත් සිවිල් සහ දේශපාලන අයිතීන් උල්ලංඝනය කිරීම සම්බන්ධව යි."

ෆේස්බුක් හි පළ වූ 'අර්ධ' නැමති කෙටිකතාවේ රචකයා වන ශක්තික සත්කුමාර අත්අඩංගුවට ගැනීම හා ඒ ආශ්‍රිත නීතිමය ක්‍රියාමාර්ග විස්තර කරන ලිපියක් තුළින්, මෙම ප්‍රකාශනයට දායක වී ඇති මාධ්‍යවේදිනියක වන චාන්දනී දිසානායක භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහසට එල්ල වන තර්ජන වර්ධනය වීමේ ප්‍රවණතාව ඉස්මතු කර ඇත.

ශක්තික සත්කුමාරගේ 'අර්ධ' කෙටිකතා ප්‍රකාශනය ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 291(ආ)[5] වගන්තිය සහ 2007 අංක 56 දරන සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (අයි.සී.සී.පී.ආර්) පනතේ 3(1) වගන්ති යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් බව පවසමින් ඔහු සැකපිට අත්අඩංගුවට ගෙන ඇත. මෙම සිද්ධිය අදහස් ප්‍රකාශ කිරීමේ සහ ප්‍රකාශනයේ නිදහසේ අනාගත තර්ජනවල පෙර නිමිත්තක් පමණක් නොව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III පරිච්ඡේදයේ දක්වා ඇති මූලික අයිතිවාසිකම් පරාසයටද තර්ජනයක් වනු ඇත. සත්කුමාරට ඇප ලබා දීමට එරෙහි ව පොලිසිය ඉදිරිපත් කර ඇති විරෝධතාවල පරස්පරතා පැහැදිලි කරමින් ලේඛක රුවන් ලක්නාත් ජයකොඩි[6] සිය ලිපියෙන් මෙසේ අවධාරණය කරයි,

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වැනි වගන්තිය සිතීමේ සහ හෘදය සාක්ෂියේ නිදහස සහතික කරයි (කෙටි කතාවක් යනු මේ දෙකෙහි ම නිෂ්පාදනයකි). ව්‍යවස්ථාවේ 14(1)(අ) ව්‍යවස්ථාව යටතේ ආගමික සංහිඳියාවේ අවශ්‍යතා සඳහා සහ 15(2) සහ 15(7) වැනි ව්‍යවස්ථාවන් ප්‍රකාර ව මහජන සාමය සම්බන්ධයෙන් අපහාස කිරීම හෝ වරදක් සඳහා පෙළඹවීම සම්බන්ධයෙන් පමණක් මෙම අයිතීන් සීමා කළ හැක. තවද, ව්‍යවස්ථාවේ 14(1)(ඊ) ව්‍යවස්ථාව මගින් එකලා ව හෝ අන් අය හා සමග හෝ ස්වකීය සංස්කෘතිය භුක්ති විඳීමේ හා වැඩි දියුණු කිරීමේ නිදහස (සාහිත්‍ය ක්ෂේත්‍රයට අයත් වන කෙටිකතා සංස්කෘතියේ අංගයකි) සහ ස්වකීය භාෂාව භාවිත කිරීමේ නිදහස (කෙටි කතාව ලියා ඇති භාෂාව) ලබා දී ඇති අතර (14)(1)(උ) ව්‍යවස්ථාව මගින් කෙනෙකුට එකලා ව හෝ අන් අය හා සමග යම් නීත්‍යානුකූල රැකියාවක, වෘත්තියක, කර්මාන්තයක, වෙළඳ ව්‍යාපාරයක හෝ ව්‍යවසායක නියුක්ත වීමට නිදහස ලබා දෙයි (කෙටි කතා ලිවීම සහ ප්‍රකාශනය නීත්‍යානුකූල රැකියාවක සහ වෘත්තියක විෂය පථයට අයත් වේ)."

සත්කුමාර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වයවස්ථාව ප්‍රකාරව සමානාත්මතාවය සම්බන්ධ අයිතිය සහ නීතිය ඉදිරියේ සමාන ආරක්ෂාව සම්බන්ධයෙන් මූලික අයිතිවාසිකම් පෙත්සමක් ශ්‍රේෂ්ඨාධිකරණයට ගොනු කරමින් (SC/FR/167/2019) කියා සිටියේ 13(1) ව්‍යවස්ථාව ප්‍රකාරව තමන් අත්තනෝමතික ව සිරභාරයට ගැනීම, රඳවා තබා ගැනීම සහ දඬුවම් කිරීම වළක්වන නිදහස සහ ප්‍රකාශනය ඇතුළු ව (කෙටි කතා මෙයට ඇතුළත් වේ) භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස සඳහා විධිවිධාන සපයන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(ආ) ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බව යි.

සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ සමස්ත පරමාර්ථය වන්නේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 19 වැනි වගන්තියෙන් ප්‍රකාශනයේ නිදහස විශේෂයෙන් සහතික කරන පරිදි මිනිසුන් සිවිල් සහ දේශපාලන නිදහස භුක්ති විඳීම සහතික කිරීමයි. කෙසේ වෙතත්, දේශීය නීති මගින් බලාත්මක කිරීමට අදහස් කරන ලද වර්ෂ 2007 අංක 56 දරන සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය පනතේ ඇතැම් වගන්ති මේ වන විට එම සම්මුතිය මගින් සහතික කර ඇති අයිතිවාසිකම් සහ නිදහස සීමා කිරීමට බහුලව භාවිත වන බව කවුරුත් දන්නා කරුණකි.

---

5 මහරජතුමාණන්ගේ යටත් වැසියන් පංතියක ආගමික හැඟීම් කෙලෙසීම සඳහා ඒකාන්ත හා ද්වේශසහගත අදහසින් භාෂිත හෝ ලිඛිත වචනයෙන් හෝ දැකිය හැකි නිරූපණවලින් එකී පංතියේ ආගමට හෝ ආගමික විශ්වාසවලට නින්දා කරන හෝ නින්දා කිරීමට තැත් කරන තැනැත්තකුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතුය. https://ihl-databases.icrc.org/applic/ihl/ihl-nat.nsf/0/2962721b86fc380ac125767e00582c62/$FILE/Penal%20Code.pdf

6 https://www.colombotelegraph.com/index.php/contradictions-in-police-objections-to-granting-bail-to-shakthika-sathkumara/

අයි.සී.සී.පී.ආර්. පනතෙහි 3(1) වගන්තිය, අයථා පරිහරණය නිරීක්ෂණය කිරීම හරහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසන් සභාව පවා මූලික අයිතිවාසිකම් සහ නිදහස සම්බන්ධව එහි අවධානම පිළිගෙන ඇති අතර ඒ අනුව වර්ෂ 2019 දී අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම් සහ රඳවා තබා ගැනීම් පිළිබඳ පොලිස් දෙපාර්තමේන්තුවට මාර්ගෝපදේශ සකස් කිරීමට පියවර ගෙන ඇත.

මාධ්‍යවේදී තරිඳු උඩුවරගෙදර මෙම ප්‍රකාශනයට ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී චමුදිත සමරවික්‍රම ගේ නිවසට පහරදීමේ සිද්ධිය සම්බන්ධයෙන් ලිපියක් ලියන අතර, ඔහු ප්‍රකාශ කර සිටින්නේ "මේ ආණ්ඩුව ප්‍රකාශනයේ නිදහස පාවිච්චි කිරීම අපරාධයක් ලෙස දකින අතර ප්‍රකාශනයේ නිදහස භාවිත කිරීමේ අයිතිය උල්ලංඝනය කිරීම හෝ තර්ජනය කිරීම අපරාධයක් ලෙස දකින්නේ නැත. ප්‍රකාශනයේ නිදහස භාවිත කිරීම සම්බන්ධයෙන් යමෙකුට තර්ජන එල්ල වූ විට පොලිස් ස්ථානවල අලස විමර්ශන රටාවල් අනුගමනය කරන අතර නිදහස් අදහස් ප්‍රකාශ කරන්නන් පසුපස හඹා යෑම ඉහළ පොලිස් විමර්ශන ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සාමාන්‍ය කාර්යයක් බවට පත් වී තිබේ."

මෙම නඩුවේ විමර්ශනවල උදාසීන ප්‍රගතිය ඉස්මතු කරන තරිඳු, නම හෙළි නොකළ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු උපුටා දක්වමින්, මෙසේ කියයි: "පැහැදිලි පරීක්ෂණයක් කළේ නම්, චමුදිතගේ නිවසට පහර දීම පිටුපස සිටි අපරාධකරුවන් ප්‍රහාරයෙන් පැය 48කට පසු අත්අඩංගුවට ගත හැකිව තිබුණි. ඔවුන්ගේ මුහුණු වසාගෙන සිටියත්, ඔවුන්ගේ අනන්‍යතාව සොයා ගැනීමට ඕනෑ තරම් අවස්ථා ඇති බව පැහැදිලි ය."[7]

මෙම සිද්ධියේ අපරාධකරුවන් හඳුනාගැනීමේ ප්‍රමාදය, නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් විසින් පරීක්ෂණ පවත්වන ආකාරයෙහි අසාර්ථක වීමක් ද නැතහොත් පූර්ණ පරිමාණ පරීක්ෂණයක් සිදු කිරීමට ඇති කැමැත්ත පිළිබඳ ප්‍රශ්නයක් ද යන ප්‍රහේලිකාව තේරුම් ගත යුතු ය. අපරාධකරුවන් රටේ නීතිය ඉදිරියට ගෙන වීමේ අනිසි ප්‍රමාදය මාධ්‍යවේදීන්, මානව හිමිකම් ආරක්ෂකයින් සහ සිවිල් සමාජය තුළ ප්‍රකාශනයේ නිදහස භාවිත කිරීමේදී ඇති වන අනාරක්ෂිතභාවය පිළිබඳ සැකය වර්ධනය වීමට ස්වභාවිකව ම හේතු වේ. අනෙක් අතට, ජනමාධ්‍යවේදීන්, මානව හිමිකම් ආරක්ෂකයින් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් සඳහා වන ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය තවත් සංකෝචනය වීමක් මෙන් ම ඔවුන් ස්වයං-වාරණයට යොමු කරන කාරණයක් ද වේ. තව ද, අයුක්තියට එරෙහි ව හඬ නගන පුද්ගලයන්ට සහ ආයතනවලට විරුද්ධ ව මෙවැනි කුරිරු ප්‍රහාර එල්ල කිරීම සඳහා අපරාධකරුවන් දිරිමත් කරන වඩාත් පහසු වතාවරණයක් නිර්මාණය කරමින් දණ්ඩමුක්තියේ උපරිම ප්‍රතිලාභ භුක්ති විඳීමට ඔවුන්ට අවකාශය ලැබීමේ පසුබිමක් ද සැකසෙනු ඇත.

මාධ්‍යවේදී චමුදිතගේ නිවසට පහර දීමේ සිද්ධිය සම්බන්ධයෙන් සිදු කෙරෙන පරීක්ෂණ පිළිබඳව අදහස් දක්වමින් සම කැබිනට් ප්‍රකාශක සහ ජනමාධ්‍ය විෂය භාර අමාත්‍ය ඩලස් අලහප්පෙරුම වරක් ප්‍රකාශ කර තිබුණේ "පසුගියදා මාධ්‍යවේදී චමුදිත සමරවික්‍රමගේ නිවසට එල්ල වූ ප්‍රහාරයට වගකිවයුත්තන් සොයා ගැනීමට ශ්‍රී ලංකා පොලිසිය අපොහොසත් වුවහොත්. ජනමාධ්‍ය අමාත්‍යවරයා ලෙස මෙහි දී රජයේ වගකීම භාරගෙන අවශ්‍ය ඕනෑම තීරණයක් ගැනීමට පසුබට වන්නේ නැහැ."[8] යන්න යි.

චමුදිතගේ නිවසට එල්ල කළ ප්‍රහාරය වැනි මාධ්‍යවේදීන්ට එල්ල වන නොනවතින තර්ජන සහ බිය ගැන්වීම් හමුවේ, 2021 දී ලෝක මාධ්‍ය නිදහස පිළිබඳ දර්ශකය මඟින් ලොව පුරා රටවල් 180කින් 127වැනි තැනට ශ්‍රී ලංකාව[9] ස්ථානගත කිරීම පුදුමයක් නොවේ.

ගෝලීය ප්‍රජාතන්ත්‍රවාදයේ දර්ශක Global State of Democracy Indices (GSDI) යනු රටවල් 165ක ප්‍රජාතන්ත්‍රවාදී නිදහස සම්බන්ධ දර්ශක 116ක් නිරීක්ෂණය කරන, ප්‍රජාතන්ත්‍රවාදය සහ මැතිවරණ සහාය සඳහා වන ජාත්‍යන්තර ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන දත්ත ගබඩාවකි. රජයේ මාධ්‍ය වාරණය කරන්නේ ද සහ කෙනෙකුගේ පුද්ගලික සංස්කෘතියේ ප්‍රකාශනය මර්දනය කරන්නේ ද යන්න ඇතුළුව ප්‍රකාශනයේ නිදහස වටා කේන්ද්‍රගත වූ දර්ශක අටක් මෙම GSDI දර්ශකවලට ඇතුළත් වේ. ලකුණු ගණනය කිරීමේ ක්‍රමවේදයට අනුව, මෙම ප්‍රමිතික අවම 0.00 සිට ඉහළ 1.00 දක්වා තනි අගයකට ඒකාබද්ධ කෙරේ. භාෂණයේ නිදහස එම නමට ප්‍රකාරව වාචික සන්නිවේදනයට

7 'චමුදිතගේ පවුල බිය ගන්වා මාසයයි' නමින් තරිඳු උඩුවරගෙදර විසින් ලියන ලද ලිපිය.

8 https://economynext.com/journo-attack-sri-lanka-media-minister-ready-to-accept-govt-responsibility-if-investigations-fail-91673/

9 https://rsf.org/en/sri-lanka

පමණක් විශේෂයෙන් සීමා නොවන අතර, ලිඛිත සන්නිවේදනය, සමාජ මාධ්‍ය පළ කිරීම් (ෆේස්බුක්, ටික්ටොක්, යූටියුබ්), කලා කෘති (ඡායාරූපකරණය, වේදිකා නාට්‍ය, සංගීතය,. ප්‍රසංග, පින්තාරු කිරීම, නැටුම්), පුද්ගලික ක්‍රියා (දේශපාලන විරෝධතා, කොඩි ගිනි තැබීම) වැනි වෙනත් ප්‍රකාශන ආකාර ද එයට ඇතුළත් වේ. ශ්‍රී ලංකාවට ලකුණු 0.5ක් ලෙස සටහන් විය.[10]

අදහස් ප්‍රකාශ කිරීමේ ඇතුළුව භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස ගැඹුරින් අහිතකර විය හැකි අදහස් ඇතුළුව, සියලු වර්ගවල අදහස් සඳහා අදාළ වන බැවින් පරම අයිතිවාසිකමක් නොවන බව ද වටහා ගැනීම වැදගත් වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය සහ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (අයි.සී.සී.පී.ආර්) හා මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය යන ජාත්‍යන්තර ප්‍රකාශන දෙක ම අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ආරක්ෂා කරන අතර, නීත්‍යානුකූලව මෙම නිදහස සීමා කළ හැකි අවස්ථා සඳහන් කර තිබේ. එය අන් අයගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම, වෛරය හෝ වෛරී ස්ථාවරයන් වෙනුවෙන් පෙනී සිටින සහ වෙනස්කොට සැලකීම හෝ ප්‍රචණ්ඩත්වයට අනුබල දීම, ඇවිස්සීම සහ ප්‍රවර්ධනය යනාදියයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15(2) ව්‍යවස්ථාවට අනුව, "14 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (අ) ඡේදයෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම භුක්ති විඳිය හැක්කේ ද, ක්‍රියාත්මක විය හැක්කේ ද, ජනවාර්ගික හා ආගමික සහයෝගිතාව තහවුරු කිරීම සඳහා හෝ පාර්ලිමේන්තු වරප්‍රසාද, අධිකරණයට අධිකරණයට අපහාස කිරීම, අපහාසය හෝ වරදකට පෙළඹවීම හා සම්බන්ධව නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම්වලට යටත්ව ය. ඒ හා සමානව, රාජ්‍ය ආරක්ෂාව ද රටේ යථා පැවැත්ම ද තහවුරු කිරීම පිණිසත්, මහජන සෞඛ්‍යය හෝ සදාචාරය ආරක්ෂා කිරීම පිණිසත්, අන්‍යයන්ගේ අයිතිවාසිකම් හා නන් වැදෑරුම් නිදහස නිසි පරිදි ගරු කරන බවට වගබලා ගැනීම පිණිසත්, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පොදු සුභසාධනය සඳහා යුක්තිසහගතව අවශ්‍ය දෑ සපුරාලීම පිණිසත් නියම කළ හැකි සීමාවන් 15 (7) ව්‍යවස්ථාව මගින් ද පනවයි. කෙසේ වෙතත්, නීතියෙන් සපයා ඇති පරිදි අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට ඇති යම් සීමාවන් භාවිත කළ යුත්තේ, එම කාර්යය සඳහා එසේ කිරීමට අදාළ බලවත් හේතු කාරණා ඇති විට පමණි.

ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාදාමයන් ශක්තිමත් කිරීමේ දී සහ විනිවිදභාවයෙන් යුත් වගකියන පාලනයක් සහතික කිරීමේ දී ගවේෂණාත්මක මාධ්‍යවේදීන් සම්බන්ධ කර ගැනීම, ප්‍රතිපත්තිමය ගැටලු පිළිබඳ වාර්තා කිරීම, සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සහ පොදුවේ ගත් කල හඬක් නොමැති ප්‍රජාවන්ට සිදු විය හැකි අසාධාරණයන් නිරීක්ෂණය කිරීම අත්‍යවශ්‍ය වේ. තව ද මාධ්‍යවේදීන්ගේ, මානව හිමිකම් ආරක්ෂකයින්ගේ සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන්ගේ භූමිකාව සහ රාජ්‍ය සහ ආයතනික අංශ සමඟ ඔවුන්ගේ තිබෙන සහයෝගීතාව, ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කිරීමේ අත්‍යවශ්‍ය අංගයන් ලෙස සැලකිය යුතු ය. මෙම ප්‍රකාශනයට දායක වූ මාධ්‍යවේදීන් විසින් මිනිසුන්ගේ අයිතිවාසිකම් පරාසයක් පිළිබඳ උල්ලංඝනයන් ඉස්මතු කර ඇති අතර ඔවුන්ගේ අයිතිවාසිකම් සහ නිදහසට ඇති විය හැකි තර්ජන පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ දී සහ පුළුල් සමාජයේ අයිතීන් සාක්ෂාත් කර ගැනීමේ දී විශේෂයෙන් ම ගවේෂණාත්මක පුවත්පත් කලාවේ ප්‍රතිලාභ අපට පෙන්නුම් කරයි. එබැවින් අනෙකුත් මානව හිමිකම් සාක්ෂාත් කර ගැනීමටත් ප්‍රජාතන්ත්‍රවාදය සහ යහපාලනය තහවුරු කිරීමටත් එය ඉවහල් වන බැවින් අදහස් ප්‍රකාශ කිරීම ඇතුළු භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස තිබීම අත්‍යවශ්‍ය වේ.

1995 දී දේශප්‍රිය එදිරිව නුවරඑළිය මහ නගර සභාව සහ වෙනත් අය[11] සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව මෙසේ ප්‍රකාශ කළේ ය:

> "දෙවන වගඋත්තරකරු නුවරඑළිය මහ නගර සභාවේ නගරාධිපතිනිය ලෙස කටයුතු කරමින් සිටිය දී ඇයගේ බල ප්‍රදේශයේ "යුක්තිය" පුවත්පත අලෙවි කිරීම වළක්වා ඇත. එබැවින් එය විධායක හෝ පරිපාලනමය ක්‍රියාමාර්ගයක් විය. දේශපාලන අරමුණු වෙනුවෙන් රාජ්‍ය විරෝධී පුවත්පතක් අධෛර්යමත් කිරීම ඇයගේ අරමුණ විය. එලෙස පවරා ගැනීම නිසා "යුක්තිය" සම්පූර්ණයෙන් නොවුව ද ශ්‍රී ලංකාවේ කුඩා ප්‍රදේශයක පමණක් පුවත්පතේ පිටපත් 450කට පමණක් අදාළ එක් කලාපයක් ප්‍රකාශයට පත් කිරීම සෘජුවම වැළැක්වීය.

---

10 https://worldpopulationreview.com/country-rankings/countries-with-freedom-of-speech

11 දේශප්‍රිය එදිරිව නුවරඑළිය මහ නගර සභාව සහ වෙනත් අය, [1995] 1 Sri L.R. https://www.lawnet.gov.lk/wp-content/uploads/2016/11/034-SLLR-SLLR-1995-V-1-DESHAPRIYA-AND-ANOTHER-v.-MUNICIPAL-COUNCIL-NUWARA-ELIYA-AND-OTHERS.pdf

කර්තෘ සහ හිමිකරුගේ අදහස් ප්‍රකාශ කිරීමේ ඇතුළුව භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස මුළුමනින්ම ප්‍රතික්ෂේප නොවුවද එමගින් සීමා විය."

මෙහි දී පෙන්වා දිය යුතු වැදගත් ම දෙය නම් එහි වැඩිදුරටත් සඳහන් වූයේ,

"ආණ්ඩුවලට සහ දේශපාලන පක්ෂවලට, ප්‍රතිපත්තිවලට සහ වැඩසටහන්වලට සහයෝගය දැක්වීමට හෝ විවේචනය කිරීමට ඇති අයිතිය ප්‍රජාතන්ත්‍රවාදී ජීවන රටාවට මූලික වේ; භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස යනු 'සියලු සිවිල් සහ දේශපාලන ආයතනවල මූලික පදනම වන නිදහස සහ යුක්තිය පිළිබඳ මූලික මූලධර්මයන් උල්ලංඝනය නොකර ප්‍රතික්ෂේප කළ නොහැකි එකකි.' ප්‍රජාතන්ත්‍රවාදයට අවශ්‍ය වන්නේ විසම්මුතිය ඉවසා සිටීම පමණක් නොව එය දිරිමත් කිරීමයි." යනුවෙනි. රටේ අර්ථවත් ප්‍රජාතන්ත්‍රවාදයක් සඳහා භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස අත්‍යවශ්‍ය පදනමක් බව එමගින් පැහැදිලි කෙරිණි.

අර්ථවත් ප්‍රජාතන්ත්‍රවාදය අවශ්‍ය වන්නේ විසම්මුතිය ඉවසා සිටීම පමණක් නොව එය ප්‍රවර්ධනය කිරීම බව බොහෝ කාලයක් සිට අපේක්ෂා කරන දෙයකි. විසම්මුතිය දිරිමත් කිරීමේ උදාහරණ වෙනත් වෙනත් දේවලට වඩා වෙනස් ලෙස දැකිය නොහැක. නිදසුනක් වශයෙන්, සුප්‍රසිද්ධ මානව හිමිකම් ක්‍රියාකාරිනියක සහ මානව හිමිකම් ආරක්ෂකවරියක වන අම්බිකා සත්කුනනාදන් මහත්මිය යුරෝපා පාර්ලිමේන්තුවට කළ ප්‍රකාශයක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය[12] විසින් නිකුත් කරන ලද ප්‍රකාශයක් සම්බන්ධයෙන් මානව හිමිකම් සංවිධාන සමූහයක් සිය බලවත් කනස්සල්ල පළ කළේ ය.[13] වැදගත්ම දෙය නම්, අම්බිකා මහත්මිය වර්ෂ 2015 ඔක්තෝබර් 30 සිට 2020 මාර්තු 7 දක්වා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කොමසාරිස්වරියක[14] ලෙස කටයුතු කර තිබීම යි. එහි දී සුජාත උපකල්පනය වනුයේ අම්බිකා මහත්මියගේ මානව හිමිකම් පිළිබඳ ප්‍රගතිශීලී වැඩකටයුතු නිසැකවම ඇයව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස අතීතයේ දී එසේ පත් කිරීම සඳහා නිර්ණායකයක් වන්නට ඇති බව යි. අවාසනාවකට මෙන්, මානව හිමිකම් කොමිසමේ හිටපු කොමසාරිස්වරියගේ භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස පවා ඉහත සඳහන් කළ තීන්දුවේ සඳහන් පරිදි විසම්මුතිය ඉවසා සිටීම වෙනුවට එයට එරෙහිව එකී අදහස් දැක්වීම විවේචනයට ලක් කර ඇත. තවද එකී මානව හිමිකම් සංවිධාන එකමුතුව නිකුත් කළ නිවේදනයේ මෙසේ ද සඳහන් වේ.

"යුරෝපීය පාර්ලිමේන්තුවේ මානව හිමිකම් පිළිබඳ අනුකමිටුවට දුන් සාක්ෂිය වෙනුවෙන් අම්බිකා සත්කුනනාදන්ට එරෙහි ව ශ්‍රී ලංකා රජය කළ ප්‍රකාශය මානව හිමිකම් ආරක්ෂකයින් විශේෂයෙන් විදේශීය හා ජාත්‍යන්තර සංසද සමඟ සම්බන්ධ වන විට මුහුණ දෙන තර්ජන ඉස්මතු කර විදහා දක්වන අතර රට තුළ සිදු වෙමින් පවතින බරපතළ මානව හිමිකම් කඩවීම් තත්ත්වය ආමන්ත්‍රණය කිරීම ප්‍රතික්ෂේප කිරීමකි. මානව හිමිකම් ආරක්ෂා කිරීමට උත්සාහ කරන්නන් නිහඬ කිරීමට උත්සාහ කරනවා වෙනුවට ඔවුන්ගේ දායකත්වය සහ යෝජනා පිළිබඳව දැඩි අවධානයක් යොමු කර ඔවුන්ට පළිගැනීම්වලට බියෙන් තොර ව ආරක්ෂිත පරිසරයක වැඩ කිරීමට හැකි බව සහතික කිරීමට රජය කඩිනම් පියවර ගත යුතු ය."[15]

එබැවින්, අවසාන වශයෙන්, ප්‍රජාතන්ත්‍රවාදී අවකාශයේ පැවැත්ම සහතික කිරීම සඳහා අදහස් ප්‍රකාශ කිරීම ඇතුළුව භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස ආරක්ෂා කිරීමේ නීත්‍යානුකූල වගකීමක් රාජ්‍යයට ඇත. මේ සඳහා තොරතුරු වෙත ප්‍රවේශ වීමේ අයිතිය ඉතා තීරණාත්මක ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනව වන සංශෝධනයේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ අනිවාර්ය අංගයක් ලෙස තොරතුරු දැනගැනීමේ අයිතිය (RTI) හඳුන්වා දීම දීර්ඝකාලීන අරගලයක්

12 https://mfa.gov.lk/fm-refutes-claims-ambika/

13 https://multimedia.europarl.europa.eu/en/webstreaming/droi-committee-meeting_20220127-0900-COMMITTEE-DROI

14 https://www.hrcsl.lk/about/members-of-the-commission/

15 අම්බිකා සත්කුනනාදන් සම්බන්ධයෙන් සහයෝගය දක්වමින් ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සංවිධාන එකමුතුව නිකුත් කළ නිවේදනය, https://www.fidh.org/en/region/asia/sri-lanka/sri-lanka-organisations-express-solidarity-with-human-rights-defender

සහ මානව හිමිකම් ක්‍රියාකාරීන්ගේ තිරසාර උද්දේශනයේ ප්‍රතිඵලයකි.[16] ඉන් අනතුරුව 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත පාර්ලිමේන්තුවේදී සම්මත වූ අතර එහි 41(2) වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද රෙගුලාසිවලට අනුව එම පනත ක්‍රියාත්මක කිරීම 2017.02.03 දින සිට බලාත්මක විය.[17]

මාධ්‍යවේදීන්, මානව හිමිකම් ආරක්ෂකයින් සහ සිවිල් සමාජයේ නියෝජිතයන් ගණනාවක් දැනට පුද්ගලික හෝ පොදු වැදගත්කමක් ඇති තොරතුරු වෙත ප්‍රවේශ වීමට තොරතුරු දැනගැනීමේ අයිතිය භාවිත කරයි. තොරතුරු දැනගැනීමේ අයිතිය ගවේෂණාත්මක පුවත්පත් කලාවේ ද අත්‍යවශ්‍ය අංගයකි. තොරතුරු දැනගැනීමේ පනත හරහා තොරතුරු සොයන්නන්ගේ ප්‍රකාශනයේ නිදහසට පමණක් නොව ආරක්ෂාවට ද මේ වන විට තර්ජනයක් වෙමින් පවතින ප්‍රවණතාව ගැන මාධ්‍යවේදීන්, මානව හිමිකම් ආරක්ෂකයින් සහ සිවිල් සමාජ ආයතන දැඩි අවධානයෙන් සහ කණස්සල්ලෙන් පසු වෙයි.

රාහුල් සමන්ත හෙට්ටිආරච්චි තොරතුරු දැනගැනීමේ අයිතිය ඔහුගේ ලේඛනවල දී පුළුල් ලෙස හා ඵලදායී ලෙස භාවිතා කරන මාධ්‍යවේදියෙකි. රාහුල්, මෙම ප්‍රකාශනයට ලිපියක් සමඟින් දායක වෙමින් මෙසේ පවසයි:[18]

> “පරිසර හානිය පිළිබඳ තොරතුරු විමසීමේ දී අයදුම්කරුවන්ගේ ජීවිත දැඩි අවදානමකට පත් වී ඇති අතර, රාජ්‍ය අධිකාරියේ නිලධාරීන් අයදුම්කරුවන් පිළිබඳ තොරතුරු මෙම නීති විරෝධී ක්‍රියාවන්ට සම්බන්ධ අපරාධකරුවන්ට ලබා දීමෙන් අපරාධකරුවන් සහ රාජ්‍ය නිලධාරීන් අතර පවතින සමීප සබඳතාව නිරාවරණය වේ.
>
> “එලෙසම, වැලි ගොඩදැමීම සඳහා බලපත්‍ර ලබාදීම සම්බන්ධයෙන් පතල් හා භූ විද්‍යා කාර්යාංශයෙන් තොරතුරු ඉල්ලා සිටි අවස්ථා කිහිපයකදී ම අම්බලන්තොට කාර්යාලයේ නිලධාරියකු මගේ තොරතුරු අදාළ වැලි ජාවාරම්කරුවන්ට ලබා දී තිබිණි. වැලි ජාවාරම්කරුවන් අවස්ථා කිහිපයකදීම මගේ නිවසට පැමිණ තොරතුරු හෙළි නොකරන ලෙසත් ඔවුන්ගේ ක්‍රියාකාරකම් හෙළි නොකරන ලෙසත් මගෙන් ඉල්ලා සිටියා. ඒ කාලය තුළ මගේ ජීවිතයට බරපතළ තත්වයක් ඇති වෙන්න තිබුණා.”

රාජ්‍ය බලධාරීන්ගේ ක්‍රියාවන්හි විනිවිදභාවය සහ වගවීම ප්‍රශ්න කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩක් නිර්මාණය කරමින් ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් සහ යහපාලනය ශක්තිමත් කිරීම සඳහා තොරතුරු දැනගැනීමේ අයිතිය සෑම විටම ඵලදායි මෙවලමක් ලෙස සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරයි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා පාලන ක්‍රමයේ රාජ්‍ය බලධාරීන් විසින් තොරතුරු හෙළි නොකිරීමේ හෝ රහස්‍යභාවය පවත්වා ගැනීමේ මුල් බැසගත් සංස්කෘතිය තවමත් ප්‍රධාන අභියෝගයක් ලෙස පවතී. ප්‍රධාන වශයෙන් මාධ්‍යවේදීන් සහ මානව හිමිකම් ආරක්ෂකයින් ඇතුළු තොරතුරු සොයන්නන් මුහුණ දෙන තර්ජන නිසි පරීක්ෂාවකට ලක් කොට විසඳා නොගත හොත්, තොරතුරු දැනගැනීමේ අයිතිය භාවිත කිරීම විශාල ලෙස අඩු විය හැකි අතර එමඟින් තොරතුරු දැනගැනීමේ අයිතිය මූලික අයිතිවාසිකමක් ලෙස හඳුන්වා දීමේ අරමුණු පරාජය වනු ඇත.

---

16 14අ. (1) සෑම පුරවැසියෙකුට ම නීතියෙන් සපයා ඇති ඕනෑ ම තොරතුරකට ප්‍රවේශ වීමේ අයිතිය ඇත. පුරවැසියෙකුගේ අයිතිය ක්‍රියාත්මක කිරීම හෝ ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය තොරතුරු වන්නේ- (අ) රජය, අමාත්‍යාංශයක් හෝ රජයේ දෙපාර්තමේන්තුවක් හෝ කිසියම් නීතියක් මගින් හෝ යටතේ පිහිටුවන ලද හෝ නිර්මාණය කරන ලද ඕනෑම ව්‍යවස්ථාපිත ආයතනයක්, (ආ) පළාතක අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙකුගේ කිසියම් අමාත්‍යාංශයක් හෝ කිසියම් දෙපාර්තමේන්තුවක් හෝ පළාත් සභාවක ප්‍රඥප්තියකින් පිහිටුවන ලද හෝ නිර්මාණය කරන ලද ඕනෑම ව්‍යවස්ථාපිත ආයතනයක්, (ඇ) ඕනෑම පළාත් පාලන ආයතනයක්, සහ (ඈ) මෙම ඡේදයේ (අ), (ආ) හෝ (ඇ) උප ඡේදවල සඳහන් ඕනෑම ආයතනයකට අදාළ එවැනි තොරතුරු සන්තකයේ තබාගෙන සිටින වෙනත් ඕනෑම පුද්ගලයෙක්.

17 Gazette (Extraordinary) No. 2004/66 of 3rd February 2017. http://documents.gov.lk/files/egz/2017/2/2004-66_E.pdf

18 ‘තොරතුරු ඉල්ලන පුරවැසියාගේ ආරක්ෂාව තහවුරු කළ යුතු ය’ යන මාතෘකාව යටතේ ජනමාධ්‍යවේදී රාහුල් සමන්ත විසින් ලියන ලද ලිපිය.

# අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම, රඳවා තබා ගැනීම සහ වධහිංසාව

වධහිංසාවට ලක් නොවී සිටීමේ නිදහස පරම අයිතිවාසිකමක් වන අතර එය කිසිදු හේතුවක් යටතේ යටපත් කළ නොහැකි ය. අයිතියේ සම්පූර්ණ අන්තර්ගතය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාවේ සඳහන් වන අතර වරදකරු වූ අපරාධකරුවන්ට හෝ අපරාධ චෝදනා ලැබූ තැනැත්තන්ට මෙන්ම ඔවුන් ඇතුළු සෑම තැනැත්තකුටම තිබිය යුතු ය. එහි දී සිදු වන ශාරීරික හානිය ඉතා බරපතළ හෝ මාරාන්තික නොවන තත්ත්වයන්හි දී පවා, වින්දිතයින් (සහ ඔවුන්ගේ පවුල්) විසින් මුහුණ දෙනු ලබන මානසික කම්පන තත්ත්වයන් පවා 11 වන ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති වධහිංසාවට ලක් නොවී සිටීමේ අයිතිය උල්ලංඝනය වීම සඳහා ප්‍රමාණවත් විය හැකි ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ "නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තකු සිරභාරයට පත් නොකළ යුත්තේ ය" යනුවෙනි. අත්අඩංගුවට ගත් ඕනෑම පුද්ගලයෙකුට එසේ අත්අඩංගුවට ගැනීමට හේතුව දැනුම් දිය යුතු ය. තවද, අත්අඩංගුවට ගැනීම, රඳවා තබා ගැනීම සහ දඬුවම් කිරීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු නිසි ක්‍රියා පටිපාටිය 13 වැනි ව්‍යවස්ථාවේ අනෙකුත් විධිවිධාන ඔස්සේ පෙන්වා දෙනු ලබයි. කෙසේ වෙතත්, 11 වන ව්‍යවස්ථාවෙහි සහ 13 වන ව්‍යවස්ථාවෙහි සඳහන් මූලික අයිතිවාසිකම්වලට පටහැනි සිදුවීම් විටින් විට සිදු වෙමින් පවතින අතර ඒවා පොදුවේ පුද්ගලික නිදහසට අහිතකර ලෙස බලපානු ලැබේ. එම තත්ත්වය මාධ්‍යවේදීන්ට, මානව හිමිකම් ආරක්ෂකයින්ට සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට ස්වකීය කටයුතු කරගෙන යෑමේ දී අහිතකර ප්‍රතිවිපාක උද්ගත කරනු ලබන අතර ඒ හේතුවෙන් විශේෂයෙන් මානව හිමිකම් වෙනුවෙන් පෙනී සිටීමට ඉදිරිපත් වන එවන් කණ්ඩායම්වලට මෙම තත්ත්වය වඩාත් අහිතකර ලෙස බලපානු ඇත. මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සකස් කරන ලද "බන්ධනාගාර අධ්‍යයන වාර්තාව"[1] ඔස්සේ පිළිගනු ලබන්නේ, පොලිස් අත්අඩංගුවේ සිටිය දී පොලිස් නිලධාරීන්ගේ විෂමාචාරවලට ලක් වූ බවට සිරකරුවන්ගෙන් ලැබුණු පැමිණිලි ප්‍රමාණය ඉතා විශාල සංඛ්‍යාවක් බවයි. එම වාර්තාවේ වැඩිදුරටත් මෙසේ සඳහන් වේ.

> "අත්අඩංගුවට ගැනීමේ දී ඊට අදාළ වරෙන්තු හෝ අත්අඩංගුවට ගැනීමට හේතු, අදාළ රැඳවියන්ට ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම සහ පොලිස් අත්අඩංගුවේ සිටිය දී පවුලේ අය සහ නීති නියෝජිතයන් සමඟ සම්බන්ධ වීම පොලිස් නිලධාරීන් විසින් වැළැක්වීම සිදු කළ බවට වූ චෝදනා ගණනාවක් මෙන්ම අත්අඩංගුවට ගැනීමේ දී සහ රඳවා තබා ගැනීමේ දී නියමිත ක්‍රියා පටිපාටීන් සහ අවම ප්‍රමිතීන් අනුගමනය කිරීමට පොලිසිය අපොහොසත් වීම ඇතුළුව පොලිස් නිලධාරීන්ගේ පාර්ශ්වයෙන් සිදු වන අකටයුතුකම් සම්බන්ධයෙන් චෝදනා ගණනාවන් ඉදිරිපත් විය. සමහර සිරකරුවන් ඔවුන් අධිකරණයට ඉදිරිපත් කළ අවස්ථාවේ දී පමණක් ඔවුන්ට එරෙහි ව ඇති චෝදනා පිළිබඳ ව තමන් දැනගත් බව ප්‍රකාශ කළේ ය. මහේස්ත්‍රාත්වරයා හමුවට

1 බන්ධනාගාර අධ්‍යයන වාර්තාව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, https://www.hrcsl.lk/wp-content/uploads/2020/01/Prison-Report-Final-2.pdf

ඉදිරිපත් කිරීමට පෙර, පැය 24 සීමාවට වඩා වැඩි කාලයක් තමන් පොලිස් අත්අඩංගුවේ තබාගෙන සිටි බවට ද රැඳවියන් විසින් චෝදනා කළ අතර මෙසේ සිදු කරන ලද්දේ පොලිස් වාර්තාවල හෝ උසාවි ලේඛනයේ අත්අඩංගුවට ගත් දිනයන්/වේලාවන් වෙනස් කිරීම මගින් බවට චෝදනා එල්ල කර තිබේ"

තවද එහි සඳහන් වන්නේ,

"රැඳවියන් විශාල සංඛ්‍යාවකගෙන් හිස් කොළ මත අත්සනක් ලබා දෙන ලෙස ඉල්ලා පසුව පොලිසිය විසින් පාපොච්චාරණයක් ලියා හෝ යතුරු ලියනය කරන ලද ලේඛනයක් සකස් කරනු ලබන බව විස්තර කළේ ය. එම ප්‍රකාශයේ අන්තර්ගතය සම්බන්ධයෙන් ද සැකකරුට දන්වා නොමැති බව රැඳවියන් වාර්තා කළේ ය. ඉල්ලා සිටි පරිදි ප්‍රකාශයක් ලබා දීමට විරුද්ධ වන අවස්ථාවන්හි දී, බිය ගැන්වීම් සහ ශාරීරික හිංසන තර්ජන ලක් කිරීම්, අත්අඩංගුවේ දී ආහාර ගැනීම අත්හිටුවීම, ඇප නොමැතිව දීර්ඝ කාලයක් රඳවා තබා ගැනීම සහ ඔවුන්ගේ පවුල්වල ආරක්ෂාවට තර්ජනය කිරීම ආදී තත්ත්වයන් ඇති බවට රැඳවියන්ගෙන් වාර්තා විය. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගැනීම් සහ රඳවා ගැනීම් අතරතුර නීතියෙන් නියම කර ඇති ක්‍රියා පටිපාටීන් අනුගමනය කර නොමැති බව සිරකරුවන් විසින් පුළුල් ලෙස වාර්තා කරන ලදි. මෙම අධ්‍යයනයේ දී සම්මුඛ සාකච්ඡාවන් මෙහෙයවන ලද සමීක්ෂකයන් විසින් ප්‍රකාශ කරන ලද ආකාරයට අදාළ අත්අඩංගුවට ගැනීමේ ක්‍රියාවලියේ දී පවතින ප්‍රවණතාවන්ගේ රටාව අනුව පුද්ගල අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ රජයේ වගකීමට අදාළ නිසි නෛතික පටිපාටිය සම්බන්ධයෙන් නිසි පියවර අනුගමනය කර නොමැති බව නිරීක්ෂණය වේ. නිසි ක්‍රියාපටිපාටියට අදාළ ආරක්ෂාව සහතික නොකොට, බොහෝ දෙනෙකු තම නිවෙස්වලින්, සේවා ස්ථාන හෝ ගමන් බිමන් යන අතරතුර, පැහැරගෙන ගොස් ඇති බව වාර්තා වේ. එකී තැනැත්තන්ගේ පවුල්වලට අත්අඩංගුවට ගැනීමේ කුවිතාන්සියක් හෝ ලබා නොදීම, අනවසර රැඳවුම් ස්ථානවල රඳවා තැබීම, සිටින ස්ථානය පිළිබඳ තොරතුරු නොදීම, වධහිංසාවලට ලක් කිරීම සහ ඔවුන්ට නොතේරෙන භාෂාවකින් සටහන් කර ඇති පාපොච්චාරණ සඳහා අත්සන් කිරීමට බල කිරීම ආදී තත්ත්වයන් සම්බන්ධයෙන් වාර්තා වී තිබේ." යනුවෙන් එකී වාර්තාවේ සඳහන් වේ.

ඇත්ත වශයෙන්ම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ විධිවිධාන යටතේ අත්අඩංගුවට ගැනීමේදී එකී අත්අඩංගුවට ගැනීම සඳහා හේතු පිළිබඳ විස්තර සැපයීම සහතික කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදන එහි නොමැති වීම යනු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) ව්‍යවස්ථාවෙන් සහතික කොට ඇති මූලික අයිතිවාසිකම උල්ලංඝනය වීම සහ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ 9(2) ව්‍යවස්ථාව යටතේ සහතික කර ඇති අයිතිවාසිකම් පිළිපැදීමට ජාත්‍යන්තර වශයෙන් බැඳී ඇති මෙරටේ වගකීම ද උල්ලංඝනය කිරීමකි.

විශේෂයෙන් පාස්කු ඉරිදා ප්‍රහාරය සිදු වීමෙන් පසුව වාර්තා වූ නීති විරෝධී අත්අඩංගුවට ගැනීම් සංඛ්‍යාව වැඩි වන තත්ත්වය සැලකිල්ලට ගෙන, අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම් හා රඳවා තබා ගැනීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පොලිස් දෙපාර්තමේන්තුව වෙත මාර්ගෝපදේශයක් නිකුත් කරන ලදි. වර්ෂ 2019 ජූලි 2 දිනැති මානව හිමිකම් කොමිසමේ 'අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම්' සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශයෙහි අයිතම අංක හතර (4) යටතේ පොලිස් දෙපාර්තමේන්තුවට පෙන්වා දෙනු ලබන්නේ, "අත්අඩංගුවට ගැනීම සිදු කළ යුතු වන්නේ ඒ සම්බන්ධයෙන් අදාළ වන විශේෂඥ විශ්ලේෂණය සහ මතය මත පදනම් වූ සහ සාධාරණ තොරතුරු ලැබීමෙන් පසුව මිස එවන් තොරතුරු ලැබීමට පෙර නොවන" බව යි.[2]

---

2 අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් බව හැම දෙනාම දන්නා නීතියයි. නයෝමි මිචෙල් කෝල්මන් එදිරිව නීතිපති [13612Aru S.C.M 15.11.2017] ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් නඩුවේ තීන්දුව ඉස්මතු කෙරේ. එහි දී බුදුන්වහන්සේගේ පච්චයක් ප්‍රදර්ශනය කිරීම සම්බන්ධයෙන් කෝල්මන් මහත්මිය අත්අඩංගුවට ගැනීම, රඳවා තබා ගැනීම සහ පිටුවහල් කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා 12(1) සහ 13(1) ව්‍යවස්ථාවන්ට පටහැනි බව තීරණය කිරීම නිසා එකී උල්ලංඝනය කිරීම වෙනුවෙන් මුදල් රු 800,000/-ක් වන්දි ගෙවීමට සිදු විය. කෙසේ වෙතත්, එවැනි පච්චයක් ප්‍රදර්ශනය කිරීම හේතුවෙන් පොලිසිය චෝදනා කරන ලෙස මහජන විරෝධයක් ඇති වීමේ හැකියාවක් නොමැති බවට ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළේ ය. අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම් සම්බන්ධයෙන් 2019 ජූලි 2 දිනැති මානව හිමිකම් කොමිසමේ මාර්ගෝපදේශය යටතේ පොලිසියට පෙන්වා දී ඇත. https://www.hrcsl.lk/wp-content/uploads/2020/02/HRCSL-issues-guidelines-on-arrests-_-english.pdf

වධහිංසාවලින් නිදහස් වීමට විශ්වීය වශයෙන් පිළිගත් අයිතිය මේ රටේ උත්තරීතර නීතියේ අනිවාර්ය අංගයකි. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මූලික අයිතිවාසිකම්[3] පිළිබඳ එහි III පරිච්ඡේදයේ කොටසක් ලෙස "වධහිංසාවලින් නිදහස" පිළිගෙන ඇත. මෙම අයිතිය සහජයෙන්ම පුද්ගලයාගේ අභිමානය සමඟ බැඳී පවතී. තවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වැනි ව්‍යවස්ථාවේ දක්වා ඇති අයිතිය උල්ලංඝනය කිරීම සඳහා වන පිළියම් අනුව, යම් මූලික අයිතිවාසිකමක් නැතහොත් භාෂා අයිතිවාසිකම යම් විධායක හෝ පරිපාලන ක්‍රියාවක් මගින් කඩ කිරීමට අත්‍යාසන්නව පැවතීම හා සම්බන්ධ කවර වූ හෝ ප්‍රශ්නයක් විභාග කොට තීරණය කිරීමේ තනි හා අනන්‍ය අධිකරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට ඇති බව 126 වගන්තියෙන් තහවුරු කරන අතර ශ්‍රේෂ්ඨාධිකරණයට අයදුම් කිරීමට සෑම පුද්ගලයෙකුටම හිමිකම් ඇත. කෙසේ වෙතත්, නීතිය බලාත්මක කිරීමේ බලධාරීන් විසින් විශේෂයෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගත් පුද්ගලයින් වෙත නීති නියෝජිතයින් සහ පවුලේ සාමාජිකයින් ප්‍රවේශ වීම වැළැක්වීමේ ප්‍රවණතාව වින්දිතයින් විසින් නීතිමය විසඳුම් සෙවීමේදී බරපතළ ප්‍රශ්නයක් බවට පත්ව ඇත. රැඳවියන්ගේ මූලික මානව අයිතිවාසිකම වන්නේ නීති ආධාර ලබාගැනීමට සහ පොලිසියට එරෙහිව පැමිණිලි කිරීමට හැකි වීම මෙන් ම ඔවුන් රැඳවුම් භාරයේ සිටින අතරතුර ඔවුන්ගේ චෝදනා විමර්ශනයේ ප්‍රගතිය පිළිබඳ තොරතුරු සැපයීම අත්‍යවශ්‍යයෙන් ම සහතික කළ යුතු ය.

නීතිඥ හිජාස් හිස්බුල්ලා[4] මහතා අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් සිවිල් සමාජ ක්‍රියාකාරීන් විසින් නිකුත් කළ ඒකාබද්ධ ප්‍රකාශය මෙසේ ය.

> "අප්‍රේල් 15 වැනිදා ලිඛිත ඉල්ලීමක් කර තිබියදීත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් නොමැතිව ඔහුගේ නීතිඥයින් හමු වීමට හිස්බුල්ලා මහතාට ඉඩ ලබා නොදීම බරපතළ කනස්සල්ලට හේතු වන කරුණක් වන්නේ එය නීත්‍යානුකූල නියෝජනයට ඇති අයිතියේ නියමිත ක්‍රියා පටිපාටියේ වැදගත් අංගයක් වන බැවිනි. මෙය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි ව්‍යවස්ථාව අනුව සෑම පුද්ගලයෙකුට ම හිමිකම් ඇති නියමිත ක්‍රියාවලියකි. නීති උපදෙස් සඳහා බාධාවකින් තොරව ප්‍රවේශ වීම ශ්‍රී ලංකාව තුළ අත්අඩංගුවට ගන්නා ඕනෑම පුද්ගලයෙකුට ව්‍යවස්ථාපිතව සහතික කළ අයිතියකි."

බොහෝ විට, ගවේෂණාත්මක ජනමාධ්‍යකරණයේ නියැලී සිටින මාධ්‍යවේදීන් සහ මානව හිමිකම් කඩවීම් නිරීක්ෂණය කරන නීතිඥයින් ඇතුළු මානව හිමිකම් ආරක්ෂා කරන්නන්, මුර බල්ලන් ලෙස තම භූමිකාව තුළ එවැනි කඩවීම් සිදු වූ විට හෝ කඩ වීමකට අත්‍යාසන්නව පැවතෙන විට ජනතාවට අනතුරු ඇඟවීමට සහ ඒවා හෙළි කිරීමට කටයුතු කරයි. මෙම ප්‍රකාශනයට ලිපියක් ලියන[5] මාධ්‍යවේදිනියක වන රේඛා නිලුක්ෂි හේරත්, අහ්නාෆ් ජසීම් කවියාගේ නඩුව වෙනුවෙන් පෙනී සිටි නීතිඥ සංජය විල්සන් ජයසේකර මහතා දැක්වූ අදහස් උපුටා දක්වයි.

> "ත්‍රස්තවාදය හෝ අන්තවාදය ඇති වන්නේ මේ සමාජයේ පවතින අසාධාරණය සහ අසමානතාව තුළයි. මේ ක්‍රමය නිර්මාණය කළේ මේ පාලකයන්ම යි. ජනතාව පාලක පන්තියට එරෙහිව හඬ නඟන විට එම විරුද්ධ මත තළා පෙළා මර්දනය කර දැමීමට අධිකරණය, පොලිසිය සහ බන්ධනාගාර යොදා ගනී. මෙම ආයතන මහජනතාවට විරුද්ධව පාවිච්චි කෙරේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අයිතිවාසිකම් ගැන කුමක් කීවත්, රාජ්‍ය ආරක්ෂාව මත පදනම්ව, ජනතාවගේ මූලික අයිතිවාසිකම් පවා යටපත් වෙමින් පවතී. මේ නීති ඉවත් කළ යුතුයි."

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වැනි නීතිවල පවතින නීතිමය ප්‍රතිපාදනවලට මුවා වී සිදු වන නිමක් නැති මානව හිමිකම් කඩ කිරීම් නැවැත්වීමට නීති සම්පාදකයන්ගේ ක්‍රියාකාරී මැදිහත්වීමේ දැඩි අවශ්‍යතාව මෙයින් පෙන්නුම් කෙරේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති මූලික අයිතිවාසිකම්වල හරය පිළිබඳ අර්ථවත් ක්‍රියාත්මක වීමක් ඇති කිරීම සඳහා, මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ ඇති නිදහස් සහ අයිතිවාසිකම් උල්ලංඝනයන් වර්ධනය වන අත්දැකීම් සහිත සාමාන්‍ය පසුබිමක් වෙනුවට ඒවා ආරක්ෂා කිරීම සාමාන්‍ය තත්ත්වයක් බවට පත් වීමට නම් සැබෑ දේශපාලන කැමැත්තක් සහ අවශ්‍යතාවක් තිබිය යුතු යි.

3 11 වැනි ව්‍යවස්ථාව, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, https://www.parliament.lk/files/pdf/constitution.pdf

4 අත්අඩංගුවට ගැනීම සහ අත්තනෝමතික ලෙස රඳවා තබා ගැනීම පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශය, ශ්‍රී ලංකා බ්‍රීෆ්, https://srilankabrief.org/sri-lanka-arrest-and-detention-of-attorney-at-law-hejaaz-hizbullah-is-arbitrary-interference-of-his-legal-practice-joint-statement/

5 රේඛා නිලුක්ෂි හේරත් විසින් රචිත "PTA සහ ICCPR හෙවත් අදහස් මර්දනයේ බර අවි" යන මාතෘකාවෙන් යුත් ලිපිය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වැනි ව්‍යවස්ථාව සුවිශේෂී වන්නේ, 83 වැනි ව්‍යවස්ථාවට අනුව 11 වැනි ව්‍යවස්ථාවේ යම් විධිවිධාන සංශෝධනය කිරීම සඳහා වූ හෝ පරිච්ඡින්න කොට ප්‍රතියෝජනය කිරීම සඳහා වූ හෝ ඒ ව්‍යවස්ථාවල යම් විධිවිධානයකට අනනුකූල වන්නා වූ හෝ පනත් කෙටුම්පතක් සම්මත වී නීතිය බවට පත් වීමට නම් ඊට පක්ෂව දෙන ලද ඡන්ද සංඛ්‍යාව (නොපැමිණි මන්ත්‍රීවරුන් ද ඇතුළුව) මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට අඩු නොවිය යුතු අතර, ජනමත විචාරණයක දී එය ජනතාව විසින් අනුමත කිරීමක්ද අවශ්‍ය වීමෙනි. සැබෑ ජීවිතයේදී නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලින් නිසි පිළිගැනීමක් නොලැබුණද වධහිංසාවට ලක් නොවී සිටීමට ඇති අයිතිය මූලික අයිතිවාසිකමක් ලෙස කෙතරම් වැදගත් දැයි එයින් පෙන්නුම් කෙරේ.

ජාත්‍යන්තර වගකීම්[6] සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව දක්වන කැපවීම ලෙස, වධහිංසාවට ලක් නොවී සිටීමට ඇති නිදහස සහතික කිරීම රාජ්‍යයේ වගකීමකි. තව ද, වධහිංසාවලට සහ වෙනත් ක්‍රෑර අමානුෂික හෝ අවමන් සහගත සැලකිලිවලට හෝ දඬුවම්වලට එරෙහි වූ සම්මුතිය[7] 1994 පෙබරවාරි 2 දින සිට ශ්‍රී ලංකාව සඳහා බලාත්මක වී ඇත. මෙම සම්මුතියේ 2(1) වගන්තියට අනුව සියලුම සාමාජික රටවලට එහි බල ප්‍රදේශ[8] යටතේ වධහිංසා පැමිණවීම් වැළැක්වීම සඳහා පරිපාලනමය, අධිකරණමය හෝ වෙනත් ක්‍රියාමාර්ග ගැනීම සඳහා නෛතික වගකීමක් පනවා ඇත. එකී සම්මුතිය ශ්‍රී ලංකාවේ බලාත්මක කිරීම සඳහා ව්‍යවස්ථාදායක ප්‍රතිපාදන සැකසීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව 1994 අංක 22 දරන වධහිංසාවට සහ අනෙකුත් කෲර අමානුෂික හෝ අවමන්සහගත සැලකිලිවලට හෝ දඬුවම්වලට එරෙහි වූ පනත පාර්ලිමේන්තුවේ දී සම්මත කළේ ය.

වධහිංසාවට ලක් නොවී සිටීමට ඇති අයිතියේ ඇති වැදගත්කම 1994 අංක 22 දරන වධ හිංසා සහ වෙනත් ක්‍රෑර, අමානුෂික හෝ නින්දිත සැලකීමට හෝ දඬුවම්වලට එරෙහි වූ සම්මුතිය පනතේ 2(5) වගන්තිය මගින් අවධාරණය කෙරෙන අතර එහි සඳහන් වන්නේ "මෙම පනත යටතේ වූ වරදක් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ පනතේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා සංඥෙය වරදක් සහ ඇප දිය නොහැකි වරදක් විය යුතු බව යි. තවද, එහි 3(අ) සහ (ආ) වගන්තියේ සඳහන් වන්නේ, "...වධහිංසාවට එරෙහි සම්මුතිය සහ 1994 අංක 22 දරන වධහිංසාවට සහ අනෙකුත් කුරිරු අමානුෂික හෝ අවමන්සහගත සැලකීමට හෝ දඬුවම්වලට එරෙහි සම්මුතිය පිළිබඳ පනත යටතේ (අ) යුධමය තත්ත්වයක දී, යුධමය තත්ත්වයක් සම්බන්ධයෙන් තර්ජනයක් පවතින විට දී, අභ්‍යන්තර දේශපාලන අස්ථාවරත්වයක් හෝ (ආ) ඕනෑම හදිසි තත්ත්වයක දී හෝ පොදු අධිකාරියක හෝ ඉහළ නිලධරයකුගේ නියෝගයක් මත කරනු ලබන ඕනෑම ක්‍රියාවක් හරහා මෙම පනත යටතේ වරදක් වන ක්‍රියාවක් සිදු කර ඇති විට එවැනි වරදකට ඉහත කී කිසිදු ආකාරයක තත්ත්වයක් විත්තිවාචකයක් නොවිය යුතු බව ය."

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව යනු මූලික අයිතිවාසිකම්[9] කඩ කිරීම හෝ කඩ වීමකට අත්‍යාසන්නව පැවතෙන විට ඒ සම්බන්ධ පැමිණිලි විමර්ශනය කිරීමට නියම කර ඇති ආයතනයකි. තවද, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් අධිකරණ නියෝගයකින් හෝ වෙනත් ආකාරයකින් රඳවාගෙන සිටින පුද්ගලයන්ගේ ශුභසාධනය, ඔවුන්ගේ රැඳවුම් ස්ථාන නිරන්තර පරීක්ෂා කිරීම මගින් අධීක්ෂණය සහ ඔවුන්ගේ රැඳවුම් ස්ථානවල තත්ත්වයන් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය විය හැකි නිර්දේශ ඉදිරිපත් කිරීම සිදු කරනු ඇති බව 11(ඈ) වගන්තිය මගින් පෙන්වා දෙයි. ඒ අතරම, 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ හෝ මහජන ආරක්ෂක ආඥාපනත[10] යටතේ ඇති රෙගුලාසියක් යටතේ අත්අඩංගුවට ගැනීම් සහ රඳවා තබා ගැනීම් පිළිබඳ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට දැනුම් දීමේ වගකීම සහ තොරතුරු ලබා ගැනීමට[11] පරීක්ෂා කිරීමට කොමිසමට බලය ලබා දීම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 28 වැනි වගන්තිය විස්තර කරන අතර 28(1) වගන්තිය මගින්

6 III කොටසෙහි 7 වැනි වගන්තිය, සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR), https://www.ohchr.org/documents/professionalinterest/ccpr.pdf

7 1984 දෙසැම්බර් 10 දින 39/46 මහා සභා යෝජනාව මගින් සම්මත කර අත්සන් කිරීම සහ 27 (1) වගන්තිය අනුව 1987 ජූනි 26 දින බලාත්මක වීම. https://www.ohchr.org/en/professionalinterest/pages/cat.aspx

8 I කොටසෙහි 2(1) වගන්තිය, .

9 වගන්තිය 10(ඕ), ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත, 1996 අංක 21 https://www.hrcsl.lk/wp-content/uploads/2020/01/HRC-Act.pdf

10 28(1), ibid.

11 28(2), ibid.

පනවන ලද රාජකාරිය හිතාමතාම මග හරින ඕනෑම පුද්ගලයෙකු වරදක් සිදු කරනු ලබන බව පෙන්වා දී ඇත. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙහි නිල දත්තවලට අනුව 2018 වර්ෂයේදී පැමිණිලි 449ක් ලැබී ඇත. ඉන් 400ක් වධහිංසා (ශාරීරික හා මානසික) සිද්ධීන් වන අතර 49ක් අවමන්සහගත සැලකීමේ සිද්ධීන් වේ[12].

නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන්ට, වධ හිංසාවලට ලක් නොවී සිටීමේ අයිතිය තහවුරු කිරීම සඳහා ව්‍යවස්ථාදායක රාමු කිහිපයකින් ප්‍රමාණවත් ඉඩක් සලසා දෙන බව මින් නැවත අවධාරණය කෙරෙයි. මෙම ව්‍යවස්ථාදායක ප්‍රතිපාදන සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වැනි ස්ථාපිත ආයතන ක්‍රියාත්මකව තිබියදීත්, වධහිංසාවට ගොදුරු වූ බොහෝ දෙනෙක් අසරණව සිටින අතර යුක්තිය සඳහා ප්‍රවේශයක් නොමැත. රේඛා නිලුක්ෂි හේරත් විසින් "PTA සහ ICCPR හෙවත් අදහස් මර්දනයේ බර අවි" යන මැයෙන් වූ සිය ලිපියේ වසර කීපයකට පෙර ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට පත් වූ විට නීති ආධාර ලබා ගැනීමේ අත්දැකීම් පිළිබඳව සිවිල් සමාජ ක්‍රියාකාරිකයෙකු වන රුකී ප්‍රනාන්දුගේ අදහස් උපුටා දක්වයි. "මම ඒ වෙලාවෙම මැසේජ් එකක් යැව්වා කිහිප දෙනෙකුටම, ඒ අය ඒ වෙලාවෙම ක්‍රියාත්මක වෙලා විවිධ මැදිහත් වීම් කළා. අපිව අත්අඩංගුවට අරගෙන දවස් කිහිපයකින් නිදහස් කළා. ඒකට හේතු වුණේ අපිට ලංකාවෙන් සහ වෙනත් රටවලින් ලැබුණු සහයෝගය. අපිව ඒ අවස්ථාවේ දී බලන්න ආවා මානව හිමිකම් කොමිසමේ නිලධාරීන් 5 දෙනෙක් විතර. නීතිඥ කණ්ඩායම් 5ක් විතර අපිව හම්බවෙන්න ආවා. ඒත් ඒ අයට අපිව හම්බවෙන්න අවස්ථාවක් දුන්නේ නැහැ."

වධහිංසාවට ලක්වූවන් මුහුණ දෙන එක් තීරණාත්මක ගැටලුවක් වන්නේ පවතින නීති රාමුව තුළ තම දුක්ගැනවිලි අදාළ නීතිය ක්‍රියාත්මක කිරීමේ ව්‍යුහයන් වෙත ප්‍රතිඵලදායී ලෙස ගෙන ඒමට ඉඩකඩ නොමැතිකමයි. මක්නිසාදයත්, වධහිංසාවට ලක් වූවන් සඳහා විමර්ශනාත්මක කාර්යයන් සහ සහන සැලසීම ප්‍රමාණවත් නොවන බැවිනි. ප්‍රධාන වශයෙන් එවැනි වධහිංසා සිදුවීම් බොහොමයක් පොලිසිය, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ ත්‍රස්ත විමර්ශන අංශ වැනි නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලින් ම (නමුත් ඒවාට පමණක් සීමා නොවී) ආරම්භ වන බවට චෝදනා එල්ල වන බැවිනි.

වධහිංසාවලට ලක් නොවී සිටීමේ අයිතිය උල්ලංඝනය කිරීමට එරෙහිව ක්‍රියා කිරීමට පොලිසිය, වෛද්‍ය නිලධාරීන්, නීතිපති දෙපාර්තමේන්තුවේ සහ අධිකරණයේ නිලධාරීන්ගේ සහයෝගිතාව සහතික කිරීම සඳහා මනාව සැලසුම් කළ උපාය මාර්ගයක් සහ ඊට අනුරූප ක්‍රියාකාරී සැලැස්මක් නොමැති වීම තවත් අභියෝගයකි.

සජීව විජේවීර යනු මිනිසුන්ගේ මානව හිමිකම් සහ මහජන අවශ්‍යතා ගැන සැලකිලිමත් වන මාධ්‍යවේදියෙකු වන අතර ගාල්ල, අක්මීමන ප්‍රදේශයේ පුද්ගලයෙකුට වධහිංසා පැමිණවීමට පොලිසියේ සම්බන්ධයක් ඇතැයි කියන සිද්ධියක් ඔහුගේ ලිපියෙන්[13] වාර්තා කරයි. මෙම වාර්තාකරුගේ ලිපියේ, වින්දිතයාගේ මව වන 63 හැවිරිදි ලේකඩ ගමගේ ප්‍රේමවතී උපුටා දක්වමින් කියා සිටියේ තම බාල පුතාට පොලිසිය විසින් අමානුෂික ලෙස පහර දී වධහිංසා පැමිණවීමෙන් පසු ඔහුට කිසිදු රැකියාවක් කිරීමට නොහැකි වී ඇති බව යි.

> "පොලිසිය ඇවිත් පසුගිය 2021 අවුරුද්දේ සැප්තැම්බර් 20 වැනි දා මහ රෑ පුතාව අරගෙන ගියා. අපි හැමෝම නිදාගෙන හිටියේ. නිල ඇඳුම් ඇඳගත්තු හතර දෙනෙක් ඇවිත් පුතාව නැගිට්ටවලා එයා පෙරවගෙන හිටපු රෙද්දෙන්නම අත් දෙක ගැටගහලා පහර දිදී අරගෙන ගියා. මටත් කණුහරුප කියලා බැන්නා. පොලිස් නිලධාරීන් පස් දෙනෙක් ආවා. එයාලා බීමත්ව සිටි බව මට තහවුරු වුණා. අරගෙන යන අතරමග දී පුතාට පොලුවලින් පහර දීලා. මේ දරුවාට හොඳටම අමාරු වෙලා. පහුවදා පොලිස් ඇප දීලා දොස්තර කෙනෙක් ගාවට යවලා. එතැනින් කරාපිටිය ඉස්පිරිතාලෙට යන්න කියලා ඉස්පිරිතාලෙදි ඔපරේෂන් එකක් පවා කරලා. පොලිසියේ ලොකු මහත්තුරු මගේ පුතාව බය කරලා කියල තියෙනවා අපි ගහපු කතාවක් කියන්න එපා උඩකින් වැටිලා තුවාල වුණා කියලා කියන්න කියලා. නැත්නම් මරනවා කියලත් කියල තිබුණා. ඒ නිසා පුතා ඉස්පිරිතාලේ දොස්තර මහත්වරුන්ට කියලා තියෙන්නේ උඩකින් වැටුණා කියලා. නමුත් ඇත්ත කතාව පොලිසිය ගහලා

12 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල වෙත ලැබුණු පැමිණිලි පිළිබඳ විස්තර. https://www.hrcsl.lk/wp-content/uploads/2020/01/Annual-Report-2019.pdf

13 සජීව ජයවීර විසින් ලියන ලද "තර්ජනයෙන් යටපත් කළ පොලිස් හිංසනය" යන මාතෘකාවෙන් යුත් ලිපිය

තමයි පුතාට අමාරු වුණේ. දැන් අපි අසරණ වෙලා ඉන්නේ. කුලී වැඩ කරලා කීයක් හරි හොයාගත්ත පුතාට, දැන් රස්සාවක් කරගන්න බෑ."

අක්මීමන පොලිසියේ ස්ථානාධිපති මධුරංග අරුමප්පෙරුම, ලේඛකයා සඳහන් කරන වධහිංසා සිද්ධිය ප්‍රතික්ෂේප කළද, වින්දිතයාගේ පාර්ශ්වයේ අය කියන ප්‍රකාශවලින් පෙනී යන්නේ ප්‍රචණ්ඩත්වය වූ කලී අපරාධ යුක්ති විනිශ්චය ක්‍රියාවලියේ මුල් බැස ගත් ලක්ෂණයක් බවත්, පොලිස් අත්අඩංගුවට ගන්නා සහ රිමාන්ඩ් බන්ධනාගාරගත කෙරෙන පුද්ගලයින් ප්‍රචණ්ඩත්වයට ලක් වන බවත් ය. මාධ්‍යවේදීන් සහ මානව හිමිකම් ආරක්ෂකයින් විසින් මෙම ප්‍රකාශනයට ලියන ලද ලිපි ගණනාවක් හරහා පොලිස් අත්අඩංගුවේ ප්‍රචණ්ඩත්වය ආවේනික අංගයක් බවට හඳුනාගත හැක. රැඳවියන්ගෙන් තොරතුරු, පාපොච්චාරණ සහ සාක්ෂි ලබා ගැනීම සඳහා වධහිංසා පමුණුවනු ලැබේ. පාපොච්චාරණ පිළිගැනීමේ මෙම අභියෝගය මෑතක දී ගෙන ආ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ සංශෝධනයේ දී පවා ආමන්ත්‍රණය කර නැත.

අත්අඩංගුවට ගැනීම, ප්‍රශ්න කිරීම, රඳවා තබා ගැනීම, සිරගත කිරීම, ප්‍රතිකාර කිරීම සහ සම්බන්ධ කාරණාවලට සම්බන්ධ වන නීතිය ක්‍රියාත්මක කරන ආයතනවල නිලධාරීන්, වෛද්‍ය නිලධාරීන්, අදාළ රාජ්‍ය ආයතනවල නිලධාරීන් සහ වධහිංසාවට එරෙහිව සටන් කරන විවිධ පාර්ශ්වකරුවන්ට ව්‍යවස්ථාදායක රාමුව සහ ජාත්‍යන්තර බැඳීම් පිළිබඳ පුහුණුව හා සංවේදීතාව නොමැතිකම, මෙම ප්‍රශ්න විසඳා ගැනීමට නොහැකි වීමට හේතුවක් වී ඇත.

1994 අංක 22 දරන වධහිංසාවට සහ අනෙකුත් කුරිරු අමානුෂික හෝ අවමන් සහගත සැලකීමට හෝ දඬුවම්වලට එරෙහි සම්මුතිය පිළිබඳ පනතේ විධිවිධාන යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වැනි ව්‍යවස්ථාවේ දක්වා ඇති මූලික අයිතිවාසිකම කඩ කළ පුද්ගලයන්ට එරෙහිව නීතිපති දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කර ඇති නීතිමය ක්‍රියාමාර්ග නොමැතිකම ද වධහිංසාව පිළිබඳ නිරන්තර අත්දැකීම් ලැබීම සඳහා ද දායක වේ.

වධහිංසාවට ලක්වූවන් සඳහා දේශීය හා ජාත්‍යන්තර වගකීම්, වධහිංසාවලට ලක් නොවී සිටීමේ අයිතිය ආරක්ෂා කිරීම සහ වධහිංසා පැමිණවීම්වලට එරෙහිව ඇති විය හැකි සියලු ම නීතිමය ප්‍රතිපාදන සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍යයේ වගකීම පිළිබඳව විනිසුරුවරුන් සහ නීතිඥවරුන් සඳහා පුළුල් දැනුමක් ගොඩනැගීමේ වැඩසටහන් මගින් මෙම ගැටලුවේ බරපතළකම අඩු කළ හැකි ය. වධහිංසා පමුණුවන්නන්ගෙන් වන්දි ඉල්ලා සිවිල් නඩු පැවරීමට වධහිංසාවෙන් දිවි ගලවා ගත් අයට නීතිමය සහාය නොමැතිකම හේතුවෙන් අපරාධකරුවන්ට වග වීමකට යටත් වීමක් සිදු නොවේ.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ ප්‍රතිපාදන අතීතයේ භාවිත කර ඇති අයථා ආකාර නිසා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සම්පූර්ණයෙන්ම අහෝසි කරන ලෙස ඉල්ලා සිටින මාධ්‍යවේදීන්, මානව හිමිකම් ආරක්ෂකයින් සහ සිවිල් සමාජයේ හඬ සාධාරණීකරණය කරන දැවැන්ත උදාහරණ මෙහි දී සපයා ඇත.

රේඛා නිලුක්ෂි සිය ලිපියේ සඳහන් කරන පරිදි, ශ්‍රී ලංකාවේ නැගෙනහිර කවියෙකු සහ ගුරුවරයෙකු වන අහ්නාෆ් ජසීම් 2020 මැයි මාසයේදී 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ අත්අඩංගුවට ගන්නා ලදි. වාර්ගික වෛරය අවුස්සමින් ත්‍රස්තවාදය ප්‍රවර්ධනය කරන බවට බලධාරීන් විසින් චෝදනා කරන ලද නවරසම් නම් වූ ඔහුගේ දෙමළ භාෂා කාව්‍ය සංග්‍රහය සම්බන්ධයෙන් මුල දී අත්අඩංගුවට ගත් ජසීම්ට අවසානයේ ඔහුව අත්අඩංගුවට ගෙන මාස 18කට ආසන්න කාලයකට පසු ඇප ලැබුණි.

තවද, "ද මෝර්නිනිංග්"[14] පුවත්පත සමඟ සම්මුඛ සාකච්ඡාවක කොටසක් ලෙස, ඇප මත නිදහස් වූ පසු, අහ්නාෆ් පහත සඳහන් ප්‍රශ්න දෙකට ප්‍රතිචාර දැක්වූ අතර, එය, නිදහස සඳහා වන මූලික මානව අයිතිවාසිකම ඇතුළු ප්‍රකාශනයේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, නීතියේ ආධිපත්‍යය සහ ගෞරවාන්විතව ජීවත්වීමේ අයිතිය හෑල්ලුවට ලක් කරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ විධිවිධාන භාවිත කිරීමේ නිමක් නැති ගැටලු විසඳීමේ අවශ්‍යතාව නැවත අවධාරණය කරයි.

14 https://www.themorning.lk/tid-officers-said-im-a-terrorist-because-i-didnt-own-buddhist-books-ahnaf-jazeem/

ප්‍රශ්නය: දැන් මොනවද කරන්න හිතාගෙන ඉන්නේ? ඔබ ලිවීම නවත්වන්න ද යන්නේ?

අහ්නාෆ්: "මේ රටේ කතා කරන්න හෝ ලියන්න බෑ. ලිවීම මගේ විනෝදාංශයයි. ඔබට ලිවීමට නොහැකි නම්, ඔබට ජීවත් විය නොහැක. අපිට හරක් වගේ ජීවත් වෙන්න බෑ. මම කවදාවත් ලිවීම නවත්වන්නේ නැහැ. මම රැඳවුම් භාරයේ සිටිය දී ලිව්වා, නිදහස් වූ පසු මම තව තවත් ලියනවා. මම අසාධාරණයට එරෙහි ව දිගටම ලියනවා.

ප්‍රශ්නය: ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ගැන ඔබේ අදහස කුමක්ද?

අහ්නාෆ්. ඔවුන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින සියලු දෙනා නිදහස් කළ යුතු යි. ඔවුන් මිනිසුන් අත්අඩංගුවට ගෙන පසුව ඔවුන්ව වැරදිකරුවන් කරනවා. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත පවතින තාක් අපට ජීවත් වෙන්න බැහැ.

රටේ ප්‍රජාතන්ත්‍රවාදී සාරධර්මවල පිරිහීම පිළිබඳ සැබෑ පිළිබිඹුවක් වන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වැනි නීති හමුවේ අනාරක්ෂිත බවක් දැනෙන බොහෝ අය අතර අහ්නාෆ් ද එවන් කෙනෙකි. අවාසනාවකට, පුළුල් සිවිල් සමාජයෙන් සහ ජාත්‍යන්තර මට්ටමින් දිගු කලක් තිස්සේ එල්ලවූ පීඩනයට ප්‍රතිචාර දැක්වීමේ සංකේතයක් ලෙස, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට මෑතක දී ගෙන ආ සංශෝධනයන් ද ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ මූලික ගැටලු විසඳීමට අසමත් වී ඇත. එබැවින්, මේ සම්බන්ධයෙන් ශක්තිමත් ව්‍යවස්ථාදායක සහ ප්‍රතිපත්ති මට්ටමේ ප්‍රතිසංස්කරණ ගෙන එන තුරු මාධ්‍යවේදීන්ට, මානව හිමිකම් ආරක්ෂකයින්ට සහ සිවිල් සමාජයට ඇති විය හැකි තර්ජන තවදුරටත් නොසලකා හැරිය නොහැක.

# ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ නොවිසඳුණු ගැටලු - සංශෝධන කිරීම ද අවලංගු කිරීම ද?

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පූර්ණ ප්‍රතිසංස්කරණ අවශ්‍ය බවට මානව හිමිකම් සංවිධාන විසින් ජාතික හා ජාත්‍යන්තර වශයෙන් මතු කරන ලද නිරන්තර අවධානය සැලකිල්ලට ගනිමින්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට සංශෝධනයක් ගෙන එන ලදි. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය[1] ඇතුළු සිවිල් සමාජ සංවිධාන ගණනාවක්, නීති විශාරදයින්,[2] මාධ්‍යවේදීන්[3] සහ මානව හිමිකම් ආරක්ෂකයින්[4] තවදුරටත් තම අප්‍රසාදය මතු කර, විශ්ලේෂණයන් කර ඇති අතර, එම සංශෝධනය මගින් මූලික මානව අයිතිවාසිකම් සහ නිදහස තහවුරු කිරීමට සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ අඩුපාඩු සපුරාලීම සඳහා කිසිදු ඵලදායී ප්‍රතිසංස්කරණයක් සිදු කර නොමැති බව පෙන්නුම් කරයි. එබැවින්, බොහෝ පුද්ගලයන් සහ ආයතන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අවලංගු කරන ලෙසත්, ඒ සම්බන්ධයෙන්, පුද්ගල නිදහස අයුක්තිසහගත සහ අත්තනෝමතිකව අහිමි නොකරන අන්දමේ සුදුසු නෛතික විධිවිධානයක් සියලු පාර්ශ්වයන්ගේ උදදේශකත්වයෙන් හඳුන්වා දෙනු ලබන තෙක් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත භාවිතය වහාම අත්හිටුවන ලෙසත් ඉල්ලා සිටිති.

සිවිල් සමාජය පමණක් නොව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවද ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරන ලෙස ඉල්ලා ඇත. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙහි 2022 මාර්ග සිතියම පිළිබඳව එහි මූලස්ථානයේ පැවති 2022 පෙබරවාරි 08 සිට 10 දක්වා රාජ්‍ය තාන්ත්‍රිකයින් දැනුවත් කිරීම පිළිබඳව නිකුත් කළ නිවේදනයක් මගින් මේ බව දන්වා ඇත. එහි සඳහන් වන්නේ, ''ආණ්ඩුව විසින් දැනටමත් යෝජනා කර ඇති සංශෝධන කවරක් වුව ද, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ද ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සම්පූර්ණයෙන් ම අහෝසි කිරීම''[5] වෙනුවෙන් පෙනී සිටින බව යි.

---

1 ත්‍රස්තවාදය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ විවරණයක්, 2022 ජනවාරි, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය. https://www.cpalanka.org/wp-content/uploads/2022/01/Final-PTA-Amendment-2022.docx-1 -1.pdf

2 ත්‍රස්තවාදය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පතට මූලික ප්‍රතිචාරයක්, ප්‍රතිසංස්කරණය කිරීමට අපොහොසත් වීම, අර්මිසා ටෙගාල්
https://www.themorning.lk/initial-reactions-to-pta-amendment-bill-failure-to-reform/

3 ක්වින්ටස් කොළඹගේ විසින් රචිත "අයිතිවාසිකම් ආරක්ෂකයින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරන ලෙස අයිතිවාසිකම් ආරක්‍ෂකයෝ බල කරති" යන මාතෘකාවෙන් යුත් ලිපිය

4 ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ප්‍රතිසංස්කරණය, බහු ආකාර රැවටීමක්, අම්බිකා සත්කුනනාදන්
https://www.themorning.lk/pta-reform-a-farce-in-multiple-acts/

5 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරන ලෙස ඉල්ලා සිටී Ada Derana.lk, http://www.adaderana.lk/news/80637/hrcsl-calls-for-abolition-of-prevention-of-terrorism-act

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වෙත ගෙන එන ලද සංශෝධනය සම්බන්ධයෙන් ඉදිරිපත්ව ඇති සමස්ත අදහස් සහ යෝජනා, විශේෂයෙන් ම මාධ්‍යවේදීන්, මානව හිමිකම් ආරක්ෂකයින් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන්ගේ භාෂණයේ නිදහස, ප්‍රකාශනය ඇතුළු අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට ඇති අයිතියට නිර්දය ලෙස බාධා කරන මූලික කරුණු එපරිද්දෙන් ම පවතින බව නැවත නැවතත් ඉස්මතු වන සිවිල් සමාජ හඬ ඔස්සේ තහවුරු වේ.

පාපොච්චාරණ පිළිගැනීම, විමර්ශනවලදී අධිකරණ අධීක්ෂණය නොමැතිකම, නීතිමය සහාය සඳහා ප්‍රවේශය සහතික කිරීමේ සහතිකයක් නොමැතිකම, වධහිංසා පැමිණවීමේ ප්‍රතිඵලයක් ලෙස විමර්ශන සඳහා පුද්ගලයන් අධිකරණ භාරයෙන් පිටතට ගෙන යෑමට ඇති හැකියාව ඇතුළුව සිවිල් නිදහස සඳහා සීමා පැනවීමේ නියෝග නිකුත් කිරීමට ඇමතිවරයාට ඇති හැකියාව ආදී ගැටලු සහිත ක්ෂේත්‍ර ගණනාවක් ඉදිරිපත්ව ඇති සංශෝධනය යටතේ ද එලෙසම පවතී.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සම්බන්ධයෙන් පවතින දැඩි ගැටලුකාරී තත්ත්වය හේතුවෙන් ම එය අහෝසි කිරීම සඳහා නිසි දේශපාලන අභිලාෂයක වැදගත්කම සහ හදිසි අවශ්‍යතාව යළිත් අවධාරණය කෙරේ. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසන් සභාව විසින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරමින් මෑතක දී නිකුත් කරන ලද ප්‍රකාශයක සඳහන් වන්නේ,

> "ත්‍රස්තවාදයට නව නිර්වචනයක් සහිතව 'ත්‍රස්තවාදී වරද' දණ්ඩ නීති සංග්‍රහයට ඇතුළත් කළ යුතු බව කොමිසම විශ්වාස කරනු ලබයි. එය පැහැදිලිවම දේශපාලන-මතවාදී හෝ ආගමික අරමුණක් සඳහා බිය පතුරුවා හැරීමෙන් සිවිල් ජනතාව ඉලක්ක කර ගැනීම සඳහා නීතිවිරෝධී ලෙස ප්‍රචණ්ඩත්වය හරහා හෝ තර්ජනය කරන්නන්ට අදාළ වේ. ත්‍රස්තවාදය යන්න මේ රටේ පවතින සාමාන්‍ය නීතිය යටතේ අවශ්‍ය සංශෝධන සහිතව විමර්ශනය කළ යුතු බව කොමිසම යෝජනා කරයි. ත්‍රස්තවාදී වරදවල් සම්බන්ධයෙන් සාක්ෂි ආඥාපනත අදාළ කර ගැනීමෙන් බැහැර කිරීම අවශ්‍ය නොවන බවට වන ස්ථාවරයට ද කොමිසම ස්වකීය සහාය දක්වයි. දින නියමයක් නොමැතිව රඳවා තබා ගැනීම ඔස්සේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරනු ලැබේ"[6] යනුවෙනි.

6 ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ආණ්ඩුවේ මතයට ප්‍රතිවිරුද්ධ මතයක් දරයි, ද අයිලන්ඩ් https://island.lk/pta-hrcsl-takes-a-contrary-view-to-that-of-the-govt/

# වෙනස්කොට සැලකීම, සාමකාමී රැස්වීම සහ නීතියේ සමාන රැකවරණය පිළිබඳ ගැටලු

වර්ෂ 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III පරිච්ඡේදයේ 12 (2) ව්‍යවස්ථාවේ සඳහන් වන පරිදි කිසිම පුරවැසියකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂයකට හෝ භාජන නොවිය යුත්තේ ය: 12(1) ව්‍යවස්ථාවේ සමානාත්මතාවයට ඇති අයිතිය ආරක්ෂා කරන අතර නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද, නීතියේ රැකවරණය ද, සර්ව සාධාරණ විය යුත්තේ ය යන්න සඳහන් වේ. 14(1)(ආ) ව්‍යවස්ථාවේ සාමකාමීව රැස්වීමේ නිදහස සහතික කරනු ලබයි. මෙම සියලු ව්‍යවස්ථානුකූල සහතිකයන් සහ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ සහ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (අයි.සී.සී.පී.ආර්) යටතේ අදාළ වගකීම් සමඟ ඒකාබද්ධව ඇති වාතාවරණය තුළ විශේෂයෙන් මාධ්‍යවේදීන්, මානව හිමිකම් ආරක්ෂකයින් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් හට ප්‍රකාශනය ඇතුළුව අන්‍යෝන්‍ය වශයෙන් භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස භාවිතා කිරීමට ඇති අයිතිය අතිශයින් වැදගත් වේ. මූලික මානව හිමිකම් සම්බන්ධයෙන් සඳහන් කරන ඕනෑම බාධාවක් පුළුල් සිවිල් සමාජයට තර්ජනයක් විය හැකි බවට සැකයක් නැත.

ජනතාවගේ ජීවිත සහ ජීවනෝපාය සංවර්ධනය හා යහපැවැත්ම සම්බන්ධ තීරණ ගන්නා රැස්වීම්වලින් මාධ්‍යවේදීන් බැහැර කිරීමට හෝ වැළැක්වීමට රජය ගන්නා ඕනෑම තීරණයක් මාධ්‍ය නිදහසට තර්ජනයක් ලෙස අර්ථ දැක්විය හැකි ය. දිස්ත්‍රික් සංවර්ධන රැස්වීම්වල දී මාධ්‍ය සඳහා ඇති ඉඩකඩ සීමා කිරීම සම්බන්ධයෙන් වර්ධනය වන තත්ත්වය ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ කඩිනම් අවධානයට යොමු විය යුතු අත්‍යවශ්‍ය කරුණක් වී ඇත. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ සන්දර්භය තුළ ඇති පරස්පරය නම්, එක් අතකින් ජනතා කේන්ද්‍රීය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සංවර්ධන රැස්වීම්වලට සහභාගි වීමට තීරණ ගැනීමේ බලතල ඇති නිලධාරීන්ට පැමිණෙන ලෙස ජනාධිපති ලේකම් කාර්යාලය[1] ප්‍රකාශ කරන අතර අනෙක් අතට මාධ්‍යවේදීන් එවැනි රැස්වීම්වලට පැමිණීම වළක්වාලීම යි. එමගින්, ජනතාවගේ ජීවිතයට බලපානු ලබන කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීම් සිදු කරන එවැනි සභාවන්හි සිදු වන දෑ පිළිබඳව දැන ගැනීමට ජනතාවට ඇති අයිතිය හුදෙක් සීමා කිරීමක් පමණක් සිදු වේ.

මෙම ප්‍රකාශනයට ලිපියක් ලියන මාධ්‍යවේදිනියක වන රේඛා නිලුක්ෂි හේරත් පවසන්නේ, "2022 මාර්තු මාසයේ දී අප කළ පර්යේෂණවලට අනුව ශ්‍රී ලංකාවේ ඇතැම් දිස්ත්‍රික්කවල සම්බන්ධීකරණ කමිටු රැස්වීම් ආවරණය කිරීමට මාධ්‍යවේදීන්ට අවසර දී ඇත. කෙසේ වෙතත්, ඇතැම් දිස්ත්‍රික්කවල තවමත් රැස්වීම් පැවැත්වෙන්නේ මාධ්‍යවේදීන් දොරගුළු පිටුපස තබා හෝ මාධ්‍යවේදීන් පිටමං කළ පසුව යි."

1 https://www.presidentsoffice.gov.lk/index.php/2021/02/20/it-is-mandatory-for-officials-with-decision-making-powers-to-attend-district-and-regional-development-committee-meetings/

රේඛා නිලුක්ෂි තවදුරටත් පෙන්වා දෙනු ලබන්නේ, “ඒ සම්බන්ධයෙන් නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් ජී.කේ.ජී.ඒ.ආර්.පී.කේ. නන්දන ගෙන් විමසීමේදී ඔහු පැවසුවේ, මාධ්‍යවේදීන්ට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලට ප්‍රවේශ වීම ප්‍රතික්ෂේප කිරීම නුවරඑළියේ ප්‍රශ්නයක් නොවේ. ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු වෙත පැමිණීමට මුල සිටම මාධ්‍යවේදීන්ට අවසර ලැබුණේ නැත. සම්බන්ධීකරණ කමිටුව අවසන් කර සම්බන්ධීකරණ කමිටු සභාපතිවරයා ඇතුළු කණ්ඩායම සමඟ දැනුවත් කිරීම සඳහා මාධ්‍යවේදීන් කැඳවන ලෙස අපට දැනුම් දී තිබෙනවා. ඒක තමයි ක්‍රියාවලිය.” යනුවෙනි. එම උපදෙස් මාධ්‍යවේදීන්ට ඉඩ නොදෙන ලෙස නම්, තීරණ ගන්නා ආකාරය දැන ගැනීමට මිනිසුන්ට ඇති අයිතියට එය බාධාවක් වේ. තව ද, මාධ්‍යවේදීන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය ද එමගින් හෑල්ලුවට ලක් කෙරෙයි.

මාධ්‍යවේදීන්ට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලට පැමිණීමට මෑතක් වන තුරුම අවසර ලැබිණි. ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද වර්ෂ 2017 මැයි 22 දිනැති ස්වදේශ කටයුතු චක්‍රලේඛ අංක 06/2017 යටතේ නිකුත් කරන ලද “දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සහ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු පැවැත්වීම” යන මාතෘකාව යටතේ එවකට ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් නීල් ද අල්විස් විසින් අත්සන් කරන ලද චක්‍රලේඛයේ 25 වන විධිවිධානය ප්‍රකාරව, ඒ සම්බන්ධයෙන් තත්ත්වය පහත පරිදි වේ.

> “අදාළ කොට්ඨාසයේ හෝ දිස්ත්‍රික්කයේ මාධ්‍යවේදීන්ට ප්‍රාදේශීය/දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම්වලට සහභාගි විය හැක. එම මාධ්‍යවේදීන්ගේ නම් ලැයිස්තුවක් ප්‍රාදේශීය/දිස්ත්‍රික් තොරතුරු නිලධාරීන් වෙත ලබා දිය යුතුය. එම මාධ්‍යවේදීන්ට අවශ්‍ය පහසුකම් නිවැරදිව ලබාදීම ප්‍රාදේශීය/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ යුතුකමකි.”

කෙසේ වෙතත්, අපට නිරීක්ෂණය වන්නේ ප්‍රාදේශීය හෝ දිස්ත්‍රික් මට්ටමේ සම්බන්ධීකරණ කමිටු රැස්වීම්වලට මාධ්‍යවේදීන් ඇතුළත් කිරීම හෝ බැහැර කිරීම ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වන බවයි. ජනතාවට මහජන නියෝජිතයින්ගේ සහ රාජ්‍ය නිලධාරීන්ගේ තීරණවල තොරතුරු සඳහා මූලාශ්‍රය මාධ්‍යවේදීන් විය හැකි බැවින්, එම තොරතුරු ආවරණයට බාධා කිරීම මාධ්‍ය නිදහසට අහිතකර ලෙස බලපානු ඇත.

මාධ්‍යවේදියෙකු වන මංගලනාත් ලියනආරච්චි මෙම ප්‍රකාශනයට ලියන ලද ඔහුගේ එක් ලිපියක,[2] වර්ෂ 2021 නොවැම්බර් මස ත්‍රිකුණාමලයේ කුරුඤ්ඤන්කේනි ප්‍රදේශයේ දී කින්නියා කලපුවේ මගී යාත්‍රාවක් පෙරළීමේ ඛේදජනක තත්ත්වය වාර්තා කරන මාධ්‍යවේදීන්ට පහර දීමේ සිද්ධියකට අදාළ ව නීතිය ක්‍රියාත්මක කිරීමේ දී, යුක්තිය සහ නීතියේ සමාන ආරක්ෂාවේ ඇති හිඩැස් ඉස්මතු කරයි. මෙම ලිපියේ සඳහන් වන්නේ,

> ‘‘මාධ්‍යවේදීන්ට පහරදීම් අපට අලුත් දෙයක් නොවේ, නමුත් මේ වන විට වාර්තා වන සිදුවීම්වල නිශ්චිත වශයෙන්ම වර්ධනයක් දක්නට ලැබේ. මේ වසරේ ජනවාරි මාසයේ සිට මුලතිව්, හලාවත, හම්බන්තොට, මඩකලපුව, කුරුණෑගල සහ කොළඹ යන ප්‍රදේශවලින් සිදුවීම් මාලාවක් වාර්තා වී ඇති බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය නිකුත් කරන මාසික වාර්තාවලින් හෙළි වේ.’’

කින්නියා සිද්ධිය පිළිබඳව අදහස් දක්වමින් නීතිඥ ජගත් ලියන ආරච්චි ප්‍රකාශ කරන්නේ ‘ජනතාවට නිවැරදි පුවත් ලැබෙන්නේ මාධ්‍යවේදීන්ට නිවැරදි තොරතුරු ලබා ගැනීමට අවස්ථාව ඇත්නම් පමණක් වන අතර, රජය හෝ දේශපාලන යාන්ත්‍රණය බොහෝ විට මාධ්‍යවේදීන්ට බාධා කළ ද, කින්නියා තත්ත්වය තුළ තොරතුරු දැනගැනීමේ අයිතිය උල්ලංඝනය කර ඇත්තේ ජනතාවම වන බව’ යි. මෙය දුක්ඛිත තත්වයක් වන සේම මෙහි දී මාධ්‍යවේදීන්ට තොරතුරු ලබාගැනීමට බාධා කිරීම සහ මහජනතාවගේ තොරතුරු දැනගැනීමේ අයිතිය උල්ලංඝනය කිරීම යන දෙකම මානව හිමිකම් කඩවීම් ලෙස අර්ථ දැක්විය හැකි ය. එසේම මාධ්‍යවේදීන්ට පහර දුන් පුද්ගලයන් අත්අඩංගුවට නොගැනීම නීතිය ඉදිරියේ මාධ්‍යවේදීන්ට සමාන ආරක්ෂාව අහිමි කිරීමක් බව ද ඔහු පෙන්වා දෙයි.

නීතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වන අසාධාරණ ක්‍රියාදාමයන් නීති පද්ධතිය තුළ ඵලදායි ලෙස, සමානව සහ සාධාරණව ආමන්ත්‍රණය නොකෙරෙන සන්දර්භය තුළ, මාධ්‍යවේදීන්, මානව හිමිකම් ආරක්ෂකයින් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් ගණනාවකට තම දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යෑමට සිදු

2 ‘ජනමාධ්‍යයට එරෙහි ප්‍රචණ්ඩත්වය හා නීතියේ ගොළුවත’ යන මාතෘකාව යටතේ ජනමාධ්‍යවේදී මංගලනාත් ලියනආරච්චි විසින් රචිත ලිපිය

වී ඇත. බොහෝ අවස්ථාවන්හිදී, අවසාන විසඳුම ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව තෝරා ගැනීමෙන් පිළිබිඹු වන්නේ මානව හිමිකම් කඩ වූ බොහෝ පුද්ගලයන්ට ශ්‍රේෂ්ඨාධිකරණයේ විධිමත් මූලික අයිතිවාසිකම් නඩු හරහා අභියෝග කිරීමට මූල්‍යමය වශයෙන් ශක්තිමත්භාවයක් නොමැති වීමයි. තවද, මෙය පොලිස් දෙපාර්තමේන්තුව තුළ වර්ෂ 2002 අප්‍රේල් මස පිහිටුවන ලද මානව හිමිකම් කොට්ඨාශයේ[3] කටයුතු පිළිබඳව ප්‍රශ්නයක් මතු කරයි. නීතියේ ආරක්ෂාව සැමට සමාන වන පරිදි නීතිය ක්‍රියාත්මක කිරීම සහ සහතික කිරීම පොලිසියේ වගකීමකි. පොලිසියේ රාජකාරියම මානව හිමිකම් කඩ වීමට හේතු වන්නේ නම් පොලිස් මානව හිමිකම් අංශයේ ක්‍රියාකාරීත්වය හා ප්‍රගතිය සමාලෝචනය කර එහි ක්‍රියාකාරීත්වය පිළිබඳව විමසා බැලිය යුතු ය. මක්නිසාද යත්, පොලිස් නිලධාරීන් සිය දෛනික රාජකාරි ඉටු කිරීමේදී සිදු කරන මානව හිමිකම් කඩවීම් වැළැක්වීම සහ සාමාන්‍ය මහජනතාවට හිමි මානව හිමිකම් වරප්‍රසාද සුරැකීම මෙම පොලිස් මානව හිමිකම් කොට්ඨාශයේ මූලික අරමුණ වන බැවිනි.

මංගලනාත් ලියනාරච්චි, කින්නියා හි දී මාධ්‍යවේදීන්ට එල්ල වූ ප්‍රහාරය සම්බන්ධයෙන් වර්ෂ 2021 නොවැම්බර් 20 වන දින CIB(1) 10/291 යොමු අංකය යටතේ කින්නියා පොලිසියට පැමිණිල්ලක් සටහන් කර ඇති අබ්දුල් සලාම් යාෂින්ව ඔහුගේ ලිපියේ උපුටා දක්වයි. නීතිය ක්‍රියාත්මක කිරීමේ උදාසීනත්වය පිළිබඳව තම කලකිරීම ප්‍රකාශ කරන යාෂින් කියා සිටියේ, “මම මේ ගැන පොලිසියට පැමිණිලි කළත් ඔවුන්ට කිසිවෙකු අත්අඩංගුවට ගැනීමට හැකි වී නැහැ. කින්නියා පොලිසිය මා කළ පැමිණිල්ලටවත් ප්‍රතිචාරයක් දක්වා නැහැ.” යනුවෙනි

සාධාරණ කාලයක් තුළ අපරාධකරුවන් නීතිය හමුවට ගෙන ඒමට කැප නොවීම, විමර්ශනවල මන්දගාමීභාවය හෝ ප්‍රගතියක් නොමැති බව පෙනීම, නීතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය සහ ආයතන කෙරෙහි මහජන විශ්වාසය හීන වීමට හේතු වේ. මීට අමතරව, අත්අඩංගුවට ගැනීම් සහ රඳවා තබා ගැනීම්වල දී නිසි ක්‍රියා පටිපාටියට අනුකූල නොවීම, විශේෂයෙන්ම එය අයුක්තියට එරෙහිව හඬ නගන සහ එවැනි අසාධාරණයන් ජනතාව වෙත ගෙන ඒම සඳහා අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස භාවිත කරන පුද්ගලයින්ගේ භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහසට මෙන් ම ඔවුන්ගේ ජීවිත ආරක්ෂාවට ද තර්ජනයක් වේ.

මෙම ප්‍රකාශනයට ලිපියක් සපයන මාධ්‍යවේදී ප්‍රියන්ජිත් ආලෝකබණ්ඩාර උපුටා දක්වන්නේ පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳව  කළ ප්‍රකාශයක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් සමාජ ක්‍රියාකාරිකයකු වන ෂෙහාන් මාලක ගමගේ වෙනුවෙන් පෙනී සිටි නීතිඥ අමිල එගොඩමහවත්ත ගේ ප්‍රකාශයයි.

“මීට පෙර ෂෙහාන් මාලකට රහස් පොලිසිය හමුවේ පෙනී සිටින ලෙස දැනුම් දුන් අවස්ථාවේදී ඔහු වෙනුවෙන් නීතිඥවරුන් කිහිප දෙනෙකු පෙනී සිටියා. කතෝලික පල්ලියේ පියවරුන් ඔහු වෙනුවෙන් පෙනී සිටියා. ඒ නිසා ඔවුන් හරහා ෂෙහාන් සම්බන්ධ කර ගැනීමට රහස් පොලිසියට ඕනෑ තරම් අවස්ථාව තිබුණා.

නීතිය ඉදිරියේ සෑම පුරවැසියෙකුටම එක හා සමානව සැලකුවේ නම් ෂෙහාන් මාලක ගමගේට සමාන අවස්ථා හිමි වනු ඇත. ඉතා ත්‍රාසජනක ලෙස මහමග දී ඔහු අත්අඩංගුවට ගෙන ඇත. ඒ නිසා පැහැදිලිවම නීතියට ගරු කරන කෙනෙක් විදියට- ෂෙහාන් මාලකට එක හා සමානව සලකලා නැහැ. ඔහුගේ චෝදනාව පවා ඔහුට සම්පූර්ණයෙන් ප්‍රකාශ කරන්නේ ඔහුව බලහත්කාරයෙන් වාහනයට නංවාගත් පසු නැවත නැවතත් ඔවුන්ගෙන් තමන්ට එරෙහිව ඇති චෝදනාව කුමක්දැයි අසා සිටින විට පමණයි.”

නීතිඥ විරංජන හේරත්, වර්ධනය වන මාධ්‍ය නිදහසට තර්ජනයක් වීමේ ප්‍රවණතාව සිය ලිපියේ ඉස්මතු කරමින් පවසන්නේ, “නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ 2020 වාර්තාවට අනුව මාධ්‍ය නිදහසට අදාළ තර්ජනාත්මක සිදුවීම් 58ක් හඳුනාගෙන ඇති අතර, 2021 දී එම තත්වය තවත් වර්ධනය වී ඇත්තේ එවැනි සිදුවීම් 80 ඉක්මවා වාර්තා වීමත් සමග යි. 2021 වර්ෂයට අදාළව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සකස් කළ මාසික මාධ්‍ය නිරීක්ෂණ වාර්තා අනුව මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතභාවයට අදාළ සිදුවීම් 40ක් ඇතුළුව සිදුවීම් 80කට වැඩි සංඛ්‍යාවක් මාධ්‍ය නිදහසට අදාළ තර්ජනාත්මක හෝ ඊට අහිතකර බලපෑම් ඇති කරන තත්ත්වයන් ලෙස හඳුනාගත හැකි” බව යි.

3 2003 අගෝස්තු මස 27 වන දිනැති අංක (II) 1304 දරන පොලිස් ගැසට් නිවේදනයෙන් ස්ථාපිත පොලිස් දෙපාර්තමේන්තුවේ මානව හිමිකම් අංශය. https://www.police.lk/index.php/item/21

තවද, අගතියට පත් පාර්ශ්වයන්ට නීතියේ සමාන ආරක්ෂාව ලබා ගැනීමේ දී භාෂා ප්‍රශ්නය විශේෂයෙන් උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල දැඩි අවධානයට යොමු වී ඇති බව ද නිරීක්ෂණය විය. මේ කාරණය ඉස්මතු කරන මාධ්‍යවේදියෙකු වන ජෝසප් නයා මෙම ප්‍රකාශනයට ඉදිරිපත් කරන සිය ලිපියේ මෙසේ සඳහන් කරයි.

> “ඉතා වැදගත් ම දෙපාර්තමේන්තුවක් තමයි පොලිසිය. කෙසේ වෙතත්, මන්නාරම දිස්ත්‍රික්කයේ බොහෝ පොලිස් නිලධාරීන් සහ පොලිස් ස්ථාන භාර නිලධාරීන් (*OIC*) ලෙස සේවය කරන්නේ සිංහල කතා කරන නිලධාරීන්. ඔවුන්ගෙන් බහුතරයකට ප්‍රදේශයේ ජනතාව කතා කරන භාෂාවෙන් කටයුතු කිරීමට හැකියාවක් නොමැති නිසා මහජනතාවට තම රාජකාරී කටයුතුවලට හෝ පැමිණිලි කිරීමට පොලිස් ස්ථාන වෙත පැමිණීමට අපහසු වී තිබෙනවා. මේ නිසා පොලිසිය සමඟ කටයුතු කිරීමේ දී ඔවුන් දැඩි දුෂ්කරතාවන්ට මුහුණ පා සිටිනවා.”

සෑම පුරවැසියෙකු ම සමාන බව මානව හිමිකම් පිළිබඳ විශ්වීය වශයෙන් පිළිගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය මගින් තහවුරු කර ඇති තත්ත්වයක් තුළ වෙරළබඩ ආදිවාසීන්ට වෙනස් කොට සැලකීම සහ ඔවුන්ගේ ජීවත්වීමේ අයිතිය අහිමි කිරීමේ තත්ත්වයකට පවා යා හැකි බරපතළ කාරණයක් බව නීතිඥ විරංජන හේරත් අවධාරණය කළේ ය. වෙරළබඩ ආදිවාසීන්ගෙන් පැවත එන අයගේ උරුමයන් ආරක්ෂා කිරීම සහ ඔවුන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් ලෙස භේදයකින් තොරව සැලකීම සම්බන්ධයෙන් රජය වගකිව යුතු බව යි.

වෙරළබඩ ආදිවාසීන්ගේ ගැටලුව වෙනස්කම් කිරීම් සඳහා සාක්ෂි සපයන අතර එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) සහ (2) යන ව්‍යවස්ථාවලට පටහැනිය. වෙනස් කොට සැලකීම මගින් යටපත් කර ඇති මිනිසුන්ගේ හඬ ප්‍රධාන වශයෙන් පරිපාලන තීරණ හේතුවෙන් නැවත නැවත සිදු වන බව අවධාරණය කර ඇත. පුද්ගලයන්ගේ මූලික මානව හිමිකම් පිළිබඳ සංවේදී නොවන නිසා සහ තීරණ ගැනීමේ බලධාරීන් විවිධත්වයට ගරු නොකිරීම නිසා ආදිවාසී ප්‍රජාවක අනන්‍යතා වඳ වී ගොස් ඇත. මිනිසුන්ගේ බහු සංස්කෘතික හැඟීම්වලට බලපාන තීරණ ගැනීමට නියම කර ඇති විශේෂිත රාජ්‍ය ආයතනවල සංයුතිය පිළිබඳව ප්‍රවේශමෙන් අවධානය යොමු නොකිරීම, එවැනි ආයතනවල දී අදාළ ප්‍රජාවන්ට තීරණ ගැනීමේ තනතුරු නියෝජනය කිරීමට සහ දැරීමට සමාන අවස්ථා සඳහා ඉඩකඩ නොමැතිකම බරපතළ කාරණයකි. තවද, රාජ්‍ය සේවයේ සුළුතර නියෝජනය සංකේතාත්මක හා පක්ෂග්‍රාහී නොවිය යුතු අතර, එය රජයේ තීරණ පිළිබඳ නීත්‍යානුකූලභාවය වැඩි කරන සහ සුළුතර ජාතීන් රජය කෙරෙහි විශ්වාසය වැඩි කරන ක්‍රියාකාරී හා අපක්ෂපාතී සමානුපාතික නියෝජනයක් විය යුතු ය.

නීතිය ක්‍රියාත්මක කිරීම දේශපාලනීකරණය කිරීම නීතියේ ආධිපත්‍යය යටපත් වීමට හේතු වන අතර නීතිය ක්‍රියාත්මක කිරීමේ බලධාරීන් සහ පරිපාලන පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය හීන කරයි. චේතනාන්විත හෝ නොසැලකිලිමත් ලෙස හෝ වෙනස් කොට සැලකීමට තුඩු දෙන රාජ්‍ය තීරණ ශ්‍රී ලංකාව වැනි බහු-සංස්කෘතික සමාජයක සියලුම ප්‍රජාවන්ට නීතිය යටතේ සමාන ආරක්ෂාව යටපත් කෙරන සංජානනයක් දිගටම නිර්මාණය කරයි.

සාමකාමීව රැස්වීමේ නිදහස ප්‍රජාතන්ත්‍රවාදයට මූලික වේ. සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් රාමුව තුළ පමණක් නොව සංස්කෘතික, සමාජීය සහ ආර්ථික අයිතීන් සාක්ෂාත් කර ගැනීම සඳහා ද මෙම අයිතිය ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම එයින් අවධාරණය වේ. විශේෂයෙන්ම ශ්‍රී ලංකාව වැනි බහු-වාර්ගික රටක මිනිසුන්ගේ අදහස් ප්‍රකාශ කිරීම සහ බෙදා ගැනීම, විසම්මුතිය සහ විවිධත්වයට ගරු කිරීම, එකට රැස්වීම, සාමකාමී විරෝධතා හරහා විසම්මුතිය පෙන්වීම වැනි ප්‍රජාතන්ත්‍රවාදී අවකාශයන් තවදුරටත් වැඩි දියුණු කරයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(ආ) ව්‍යවස්ථාව සාමකාමීව රැස්වීමේ නිදහස ආරක්ෂා කරන අතර සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියෙහි (අයි.සී.සී.පී.ආර්) 21 වැනි ව්‍යවස්ථාව යටතේ ශ්‍රී ලංකාවට ඒ සඳහා වගකීමක් සහ බැඳීමක් ඇත. මෙම ආරක්ෂාව තිබියදීත්, මෑත අතීතයේ, විශේෂයෙන් කෝවිඩ්-19 වසංගතය මධ්‍යයේ රට තුළ සාමකාමීව රැස්වීම සඳහා ඇති ඉඩකඩ සීමා කිරීම් ගණනාවකට මුහුණ දී තිබේ.[4] මීට අමතරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15(3) සහ 15(7) වගන්ති අනුව නීතියෙන් නියම කර ඇති පරිදි පමණක් සීමා කළ යුතු, රැස්වීමේ නිදහස මූලික අයිතිවාසිකමක් වන බැවින් එවැනි සීමා කිරීම්වල නීත්‍යානුකූලභාවය ප්‍රශ්නකාරී වේ.[5]

4 විරෝධතාවන් සහ රැස්වීම් ශ්‍රී ලංකාව විසින් තහනම් කරයි, 2021 ජූලි 6, Colombopage. http://www.colombopage.com/archive_21A/Jul06_1625587252CH.php

5 කොවිඩ් 19 වසංගතය මධ්‍යයේ විරෝධතා දැක්වීමේ අයිතිය සම්බන්ධයෙන් රජයේ ප්‍රතිචාරයෙහි නීත්‍යානුකූලභාවය පිළිබඳ විග්‍රහයක්, 2021 නොවැම්බර්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය. https://www.cpalanka.org/wp-content/uploads/2021/11/CPA-comment-on-right-to-protest-2.pdf

පවුලේ සාමාජිකයෙකු සිරගතව සිටිය දී ඔහු හෝ ඇය වෙනුවෙන් යුක්තිය ඉටු කර ගැනීමට කටයුතු කරන අතරතුර ජීවන අරගලය ජය ගැනීමට කරනු ලබන කැපවීම අගය කරමින් මෙවර සිරගත වූවන්ගේ පවුල්වල සාමාජිකයින් 22 දෙනෙකු ඇගයීමට ලක් කිරීමට මහනුවර මානව හිමිකම් කාර්යාලය සැලසුම් කර තිබිණි. මෙම පවුල්වල සාමාජිකයින් 22 දෙනාගෙන් එක් අයෙකු වූ රාමචන්ද්‍ර මේබලාට වෙනස් කොට සැලකීම පිළිබඳව ජනමාධ්‍යවේදී අසේල කුරුළුවංශ මෙම ප්‍රකාශනයට ඉදිරිපත් කරන ලිපියෙන්[6] පැහැදිලි කරනු ලබයි.

"සිරගත වූවන්ට යුක්තිය ඉල්ලා. ලෝක මානව හිමිකම් දිනයට සමගාමීව පැවැත්වෙන එම වාර්ෂික උත්සවයේ දී මේ සියලු බාධක මැද ජීවිතයට මුහුණ දුන් ධෛර්යය වෙනුවෙන් මේබලාට ද උපහාර දැක්වීමට මහනුවර මානව හිමිකම් කාර්යාලය සැලසුම් කළේ ය. පොලිසිය විසින් අධිකරණයෙන් වාරණ නියෝගයක් ගෙන උත්සවය තහනම් කරන්නට කටයුතු කළේ මේබලා මූලික කරගෙනයි. අධිකරණය මගින් ලබාදුන් වාරණ නියෝගය පදනම් කරගනිමින් පොලිසිය විසින් ඇය ශ්‍රී දළදා මාලිගාවට බෝම්බ ප්‍රහාරයක් එල්ල කිරීම සම්බන්ධයෙන් සිර දඬුවම් විඳිමින් සිටින ක්‍රිෂ්ණසාමි රාමචන්ද්‍රන්ගේ දියණිය වීම හේතුවෙන් මේ අන්දමට එකී වැඩසටහන අත්හිටුවීමට කටයුතු කරන ලදි'

මානව හිමිකම් ක්‍රියාධරයෙකු වන නීතිඥ සුරේන් ඩී. පෙරේරා මේ පිළිබඳව සිදු කළේ මෙවන් විග්‍රහයකි. "මේ උත්සවය පැවැත්වීමට නොදීමෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහවුරු කර තිබෙන මූලික අයිතිවාසිකම් කිහිපයක් කඩ වී තිබෙනවා. භාෂණය හා අදහස් ප්‍රකාශනය සඳහා ලබා දී තිබෙන අයිතිය ඉන් ප්‍රධානයි. රැකියාවක නියැලීමේ නිදහසද උල්ලංඝනය වී තිබෙනවා. මේක සංවිධානය කළ කෙනාගේ වෘත්තියේ කොටසක්, එවන් වැඩසටහන් පැවැත්වීම."

තවද, මානව හිමිකම් ක්‍රියාකාරිකයෙකු වන රුකී ප්‍රනාන්දු උපුටා දක්වමින් ජනමාධ්‍යවේදී අසේල විසින් පෙන්වා දෙනු ලබන්නේ"මේ සිදුවීම එක පැත්තකින් වෙනස් කොට සැලකීමක්. අනිත් පැත්තෙන් බොහොම අමානුෂික දෙයක්. යම් පුද්ගලයෙකු විසින් සිදු කරන්නට ඇති හෝ සිදු කළ බවට සැක කෙරෙන ඕනෑම අපරාධයක් වෙනුවෙන් ඔහුගේ හෝ ඇයගේ පවුලේ සාමාජිකයින් වගකිවයුතු හෝ දඬුවම් නොලැබිය යුතු බවට මූලධර්මයක් තිබෙනවා. මේබලා ජීවිතයේ අවස්ථා කිහිපයක දී ම පියාට හිමිවූ දඬුවම පදනම් කර ගනිමින් සමාජය වෙතින් වෙනස් කොට සැලකීමේ අත්දැකීම දරුණු විදියට අත්විඳ තිබෙනවා."

වෙනස් කොට සැලකීමට ලක් නොවීමේ නිදහසට, සාමකාමීව රැස්වීමේ නිදහසට සහ නීතියේ සමාන ආරක්ෂාවට ඇති අයිතියට ඇති තර්ජන ඉහත පෙන්වා දෙන ලද සිදුවීම්වලින් සංකේතවත් කරයි. ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය පිළිබඳ පවතින ගැටලුකාරී තත්ත්වයන් සඳහා සාක්ෂි සපයන මෙම තනි සිද්ධීන් කිසිවක් වර්තමානයෙහි මානව හිමිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් ඇති අභියෝග ආමන්ත්‍රණය කිරීමේ දී නොසලකා හැරිය නොහැක.

6 'සිරගත වූ පියා වෙනුවෙන් දඬුවම් විඳින දියණියක්' තේමාව යටතේ ජනමාධ්‍යවේදී අසේල කුරුළුවංශ විසින් රචිත ලිපිය.

# භාෂා අයිතිවාසිකම උල්ලංඝනය කිරීම සහ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය නිසි පරිදි ක්‍රියාත්මක නොවීම

මානව සන්නිවේදනයේ එක් මූලික ක්‍රමවේදයක් වනුයේ වනුයේ මානව භාෂාවයි. වර්තමානය වන විට මානව භාෂාව මිනිසාගේ ජන ජීවිතය හා සහසම්බන්ධ වන ආර්ථික, සමාජීය, දේශපාලනික සහ සංස්කෘතික සාධක සමග සමීප සම්බන්ධතාවක් සහිත විෂයයක් බවට පත්ව ඇත. එපරිද්දෙන්, භාෂාව මිනිසාගේ මූලික අයිතීන් හා ගරුත්වය පෙන්නුම් කරනු ලබන ප්‍රධාන ලක්ෂණයක් බවට පත්ව ඇත.

1978 ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(2) ව්‍යවස්ථාව මගින් දක්වා ඇති පරිදි, "කිසිම පුරවැසියකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලනික මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර හෝ හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂයකට හෝ භාජනය නොවිය යුත්තේය." ආණ්ඩුක්‍රම ව්‍යවස්වේ IV වන පරිච්ඡෙදයේ 18 සිට 25 දක්වා වන ව්‍යවස්ථාවන්හි රාජ්‍ය හා ජාතික භාෂා භාවිතය පිළිබඳව වූ ප්‍රතිපාදන දක්වා ඇත. තවද 2009.09.25 දින 1620/27 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය සහ 2009.11.25 දින ප්‍රකාශයට පත්කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් ද රජය විසින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ මූලික වගකීම් පිළිබඳ සඳහන් කර ඇත.

භාෂා අයිතිය, තොරතුරු දැනගැනීමේ අයිතිය සහ භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස ආදිය එකිනෙක සමග සමීපව අන්‍යොන්‍ය වශයෙන් බැඳී පවතී. දහනවවන[1] ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හඳුන්වාදීමත් සමග තොරතුරු වෙත ප්‍රවේශය සඳහා වන අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ වන මූලික අයිතියක් බවට පත් කරන ලදි. තොරතුරු දැනග ැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ පූර්විකාවෙහි තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳව පහත ආකාරයෙන් සඳහන් වේ.

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(අ) ව්‍යවස්ථාව මගින් තොරතුරු සඳහා ප්‍රවේශ වීමේ අයිතිය තහවුරු කර ඇති බැවින්, සහ තොරතුරු ලබාගැනීමේ අයිතිවාසිකම බලාත්මක කිරීම මගින් පොදු අධිකාරීවල විනිවිදභාවය සහ වගකීම පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කිරීමේ අවශ්‍යතාවක් පැන නැගී ඇති බැවින් ද, එමගින් ශ්‍රී ලංකාවේ මහජනතාවට යහපාලනය සඳහා වැඩි වශයෙන් සහභාගී විය හැකි, රටේ පොදු ජන ජීවිතයේ දී සක්‍රීය ලෙස සහභාගී විය හැකි සමාජයක් ප්‍රවර්ධනය වන බැවින් ද"[2] යනුවෙනි.

1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකරන ලද 19 වන සංශෝධනයේ 02 වන වගන්තිය, 2015 මැයි 15 https://www.parliament.lk/uploads/acts/gbills/sinhala/5974.pdf

2 පූර්විකාව, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත. http://www.rticommission.lk/web/images/pdf/act/rti-act-si-13122018.pdf

එසේ හෙයින් සහ ශ්‍රී ලංකාවේ ජනවිකාසනය පැහැදිලිව බහු භාෂා කථාකරන සංදර්භයක පවතින බැවින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති පරිදි භාෂා අයිතිවාසිකම් පිළිබඳ සලකා බැලීමේ දී ඉහත කී පූර්විකාවේ 'ශ්‍රී ලංකාවේ ජනතාව' ලෙස හඳුන්වනු ලැබීමෙන් ම, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම භුක්ති විඳීම උදෙසා මූලික පූර්ව අවශ්‍යතාවක් වශයෙන් භාෂා අයතිය සැලකිය හැකි ය. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 24 වන වගන්තිය මගින් නියම කර ඇති පරිදි තොරතුරු ලබා ගැනීමට අදාළ ක්‍රියා පටිපාටිය තුළ දී එකී පුරවැසියා විසින් තොරතුරු සඳහා ප්‍රවේශ වීමට බලාපොරොත්තු වන ආකෘතිය හා භාෂාව හඳුනා ගත යුතු බව[3] දක්වා තිබීම තුළින්, තොරතුරු දැනගැනීමේ අයිතිය ඵලදායී ලෙස යොදා ගැනීමට පුරවැසියාට හිමි විය යුතු භාෂා අයිතිය තහවුරු කිරීමේ නිශ්චිත අවශ්‍යතාව පිළිබඳ ව වක්‍රව ඇඟවුම් කරනු ලබයි. පුරවැසියන්ට තොරතුරු ලබාගැනීම සඳහා කැමති භාෂාවකින් සිය ඉල්ලීම කළ හැකි වුව ද, තොරතුරු දැනගැනීමේ පනතේ නීතිමය රාමුව තුළ පොදු අධිකාරීන්හි නිලධාරීන් හට අයදුම්කරු කැමති භාෂාවෙන් තොරතුරු සැපයීම සඳහා අවශ්‍ය බලගතු සහ අනිවාර්ය විධිවිධාන නොමැති වීම හේතුවෙන් බහුභාෂා සමාජයක පුරවැසියන් තොරතුරු සඳහා ප්‍රවේශ වීමේ මූලික අයිතිය සමාන ව ක්‍රියාත්මක කිරීමට එය පවතින නිරන්තර බාධාවකි. මෙය අනෙක් අතට 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙන් සහතික කර තිබෙන සමානාත්මතාව සඳහා වන මූලික අයිතිය සමග ද සම්බන්ධ වේ.

පොදු අධිකාරීන්හි නිලධාරීන්ගේ නෛතික වගකීම වනුයේ එම තොරතුරු පවත්වාගෙන යනු ලබන භාෂාවෙන් ම අදාළ තොරතුරු ලබාදීම වේ. ඒ අනුව, සියලුම පුරවැසියන් වෙත ලැබෙන තොරතුරු ඔවුන් අභිමත පරිදි එකම භාෂාවෙන් නොතිබිය හැකි අතර, එය මූලික අයිතිවාසිකමක් වශයෙන් පවතින මෙම තොරතුරු දැනගැනීමේ අයිතියේ ප්‍රතිලාභය උපරිම ලෙස භාවිත කිරීමට අපහසු කරනු ලබන සාධකයක් වේ.

මෙම තත්ත්වය යටතේ භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස සහ මාධ්‍යවේදීන්, මානව හිමිකම් ආරක්ෂකයින් සහ සිවිල් ක්‍රියාධරයන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හා සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය පනත යටතේ අත්අඩංගුවට ගන්නා අවස්ථාවල දී නීතිය ක්‍රියාත්මක කරන ආයතනයන්හි නිලධාරීන් හා විමර්ශනයන්ට පාත්‍ර වන තැනැත්තන් අතර භාෂා භාවිතයේ දී උද්ගත වන බාධක හේතුවෙන් ඇති වන පුද්ගලික නිදහස අහිමි වීමට හෝ සීමා වීමට හේතු පාදක වන තත්ත්වයන් පිළිබඳ දැඩි සැලකිල්ලක් දැක්විය යුතු වේ.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සිදු කරන ලද 'බන්ධනාගාර සම්බන්ධයෙන් වන අධ්‍යනය'[4] මගින් පෙන්වා දෙනු ලබන්නේ, "කෙසේ වුවද, අධිකරණ වෛද්‍ය නිලධාරීන් හා පොලිස් නිලධාරීන් අතර පවතින කුමන්ත්‍රණ හෝ භාෂා භාවිතයේ දී මතු වන බාධා හේතුවෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්තඩංගුවට ගනු ලබන සිරකරුවන් සමග අධිකරණ වෛද්‍යවරයාට සන්නිවේදනය කිරීමට නොහැකි වීම සම්බන්ධයෙන් වූ චෝදනා රාශියක් කොමිෂන් සභාව වෙත ලැබේ. මේ අනුව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගනු ලැබූ සිරකරුවන්ට ඔවුන් පරිපාලනමය වශයෙන් රඳවා තබා ගනු ලබන කාල සීමාව තුළ දී පවතින අකාර්යක්ෂම ආරක්ෂක සන්දර්භයන් මත සාධාරණ නඩු විභාගයන් සඳහා ඔවුන්ට ඇති අයිතිය භුක්ති විඳීමට නොහැකි වන අතර, එකී තත්ත්වයන් හේතුවෙන් වදහිංසනයට බඳුන් කිරීම තුළින් ලබාගනු ලබන පාපොච්චාරණයන් අධිකරණයේ දී ආවේශ්‍ය සාක්ෂියක් බවට පත්වනු ඇත." යනුවෙනි.

තවද, තොරතුරු ඉල්ලුම් කරන්නන්, මාධ්‍යවේදීන් සහ මානව හිමිකම් ආරක්ෂා කරන්නන් ඔවුන්ගේ තොරතුරු දැනග ැනීමේ අයිතිය ක්‍රියාත්මක කිරීමේ දී භාෂා ප්‍රශ්නය හේතුවෙන් තවත් අභියෝගයකට මුහුණ දෙනු ලබයි. ජනමාධ්‍යවේදියකු වන සනත් ප්‍රියන්ත ඔහුගේ ලිපියක[5] පළ කර ඇති අදහස මෙසේ යඃ

'මගේ භාෂා මාධ්‍යය සිංහල වුව ද මා පදිංචිව සිටිනුයේ දෙමළ භාෂාව බහුලව භාවිත කරනු ලබන ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයක ය. මෑත දී මම එකී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත තොරතුරු අයදුම්පතක් යොමු කළෙමි. දින

3 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත, 24(5)(ආ) වගන්තිය.

4 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සිදු කරන ලද 'බන්ධනාගාර අධ්‍යයනය, https://www.hrcsl.lk/wp-content/uploads/2020/01/Prison-Report-Final-2.pdf

5 'රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේ අභියෝග' යන තේමාව යටතේ ජනමාධ්‍යවේදී සනත් ප්‍රියන්ත විසින් රචිත ලිපිය

කිහිපයකින් අනතුරුව මා වෙත තොරතුරු දැනගැනීමේ පනතේ 2 වන ආකෘතිය යටතේ පිළිතුරු ලැබුණි. එය දෙමළ භාෂාවෙන්ම ලියා තිබුණි. එබැවින් එය කියවාගැනීම සඳහා මට දෙමළ භාෂාව දන්නා අයෙකු සොයා යෑමට සිදු විය. එහි මා හට අවශ්‍ය තොරතුර නොතිබීම හේතුවෙන්, නැවතත් සිංහල භාෂාවෙන් අභියාචනයක් සකස් කර ලියාපදිංචි තැපෑලෙන් ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කළෙමි. දින කිහිපයකට පසු එකී අභියාචනයට පිළිතුරු ලැබුණු අතර එය ද දෙමළ බසින් ලියා තිබුණි.'

මෙම ගැටලුවේ අනෙක් බරපතළ පැතිකඩ වනුයේ නුවරඑළිය, ගම්පහ, කුරුණෑගල, අනුරාධපුර, පොළොන්නරුව වැනි අනෙකුත් ප්‍රදේශයන්හි දිවිගෙවන දෙමළ භාෂාව කතා කරන හෝ භාවිත කරනු ලබන ජනයා තොරතුරු වෙත ප්‍රවේශ වීමේ දී මෙකී ගැටලුවට මුහුණ දෙන ආකාරයයි. එමෙන්ම, උතුරු හා නැගෙනහිර ප්‍රදේශයන්හි මෙකී ගැටලුව වඩාත් බරපතළ වන්නේ සිංහල භාෂාව කතා කරන සහ දෙමළ භාෂාවෙන් සේවා කටයුතු සිදු කිරීමේ භාෂා ප්‍රවීණත්වයක් සහිත නිලධාරීන් නොමැති පොදු අධිකාරීන්හි දෙමළ භාෂාවෙන් තොරතුරු අපේක්ෂිත ජනයා මුහුණදෙන ගැටලුකාරී තත්ත්වයන්ට කඩිනම් අවධානය යොමු විය යුතු බව පෙන්වා දීම වැදගත් වේ.

මෙම තත්ත්වය හරහා තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳව රට තුළ බලාත්මක නීතිය ක්‍රියාත්මක කිරීමේ සමස්ත සන්දර්භය තුළ බහුවිධ ප්‍රතිපත්ති සහ ප්‍රායෝගික ප්‍රතිසංස්කරණවල අවශ්‍යතාව අවබෝධ කර ගැනීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ අවධානය යොමු කරනු ලබයි. තොරතුරු දැනගැනීමේ අයිතිය සහ භාෂණයේ නිදහස භුක්තිවිඳීම සඳහා පුරවැසියන් හට අවස්ථාව සැලසීම සඳහා සකස් කළ යුතු පූර්ව අවශ්‍යතාවයක් වශයෙන් භාෂා අයිතිය සහතික කිරීම පෙන්වා දිය හැකි ය. නමුත් මෙහි දී කනස්සල්ලට කරුණ වනුයේ, තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිෂන් සභාවේ බලසීමාව[6] තුළ ඒ සම්බන්ධව විධිවිධාන සැලසීමට තරම් ප්‍රමාණවත් පරිදි පුළුල් නොවීමයි.[7] කෙසේ වුවද, මෙම පනතේ 37 වැනි වගන්තියේ විධිවිධානයන්ට අනුව තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිෂන් සභාව විසින් වාර්ෂිකව පිළියෙල කරනු ලබන වාර්තාව මගින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය හා නීති සම්පාදකයින් හට සිදු කළ හැකි විභව ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් වෙනත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී පැනනගින පරස්පරතාවල බලපෑම පිළිබඳ නිර්දේශ ලබාදිය හැකි ය.[8] එබැවින් භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස වඩාත් අර්ථවත්ව භාවිතයට යෙදිය හැකි සමාජ දේශපාලන වටපිටාවක් නිර්මාණය සහතික කිරීම සඳහා ප්‍රතිපත්ති සැකසීමේ හා ක්‍රියාත්මක කිරීමේ ක්ෂේත්‍රයන් තුළ වඩාත් ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දීම මෙකී භාෂා අයිතිවාසිකම් පිළිබඳව වන ගැටලු හා අභියෝගයන් ආමන්ත්‍රණය කිරීමට හේතු වනු ඇත.

6 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත, 11 වන වගන්තිය

7 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත, 15 වන වගන්තිය

8 කොමිෂන් සභාව විසින් ස්වකීය කටයුතු පිළිබඳ වාර්තාවක සකස් කළ යුතු බව. 37 වන වගන්තිය, එම

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කරන ලද පැමිණිලි සම්බන්ධයෙන් වන සාරාංශගත විශ්ලේෂණය

මානව හිමිකම් සහ සිදු විය හැකි මානව හිමිකම් උල්ලංඝනයන්ගේ ආකාර පිළිබඳවත්, පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සහ නීතිමය රාමුව තුළ වින්දිතයන්ට තිබෙන පිළියම් යාන්ත්‍රණ පිළිබඳවත්, පුළුල් පුහුණුවක් සහ දැනුම ගොඩ නැගීමක් සඳහා මෙම ව්‍යාපෘතිය මගින් පහසුකම් සපයනු ලැබී ය. එහි ප්‍රතිඵලයක් ලෙස, මාධ්‍යවේදීන්ගේ, මානව හිමිකම් ආරක්ෂකයින්ගේ සහ පුරවැසියන්ගේ මානව අයිතීන් සහ මූලික නිදහස පිළිබඳ ගැටලු ගණනාවක් ඒ සම්බන්ධයෙන් පැවති සාකච්ඡාවල දී ඉස්මතු වී ය.


යුක්තිය පිළිබඳ බලාපොරොත්තු දල්වා ගනිමින්, පිළියම් සඳහා මානව හිමිකම් කොමිසමට පැමිණිලි කිරීම වැනි පවතින යාන්ත්‍රණ භාවිත කිරීමට ඇතැමුන් අධිෂ්ඨානශීලී වුව ද, පැමිණිලිවලට ලැබුණු සතුටුදායක නොවන ප්‍රතිඵල නිසා අනෙක් අය තුළ නීති ක්‍රියාත්මක කිරීමේ ආයතන කෙරෙහි විශ්වාසය බිඳවැටුණු බව පෙනෙන්නට තිබිණි.

කෙසේ වෙතත්, මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳව මානව හිමිකම් කොමිසමට කළ විවිධ වූ පරාසයක පැමිණිලි අතරින්, මාධ්‍යවේදීන්ට, මානව හිමිකම් ආරක්ෂකයින්ට සහ මධ්‍යම, නැගෙනහිර උතුරු සහ දකුණු පළාත්වල සිවිල් ක්‍රියාකාරීන්ට මෙන්ම පුරවැසියන්ට එල්ල වූ ප්‍රධාන තර්ජන හා අභියෝග හඳුනාගැනීම සඳහා අදාළ සිද්ධීන් 237ක් මෙම ප්‍රකාශනයේ දී සැලකිල්ලට ගනු ලැබීය.

පුළුල් පරාසයක ඉස්මතු වූ ප්‍රශ්න ප්‍රධාන තේමා හයක් යටතේ වෙන් කොට දක්වා ඇති අතර වින්දිතයන් විසින් මානව හිමිකම් කොමිසමට ඉදිරිපත් කළ විස්තරාත්මක ප්‍රශ්න, මෙම ප්‍රකාශනයේ පසු කොටසේ විස්තර කොට ඇත. ප්‍රකාශනයේ නිදහස ඇතුළු අදහස් ප්‍රකාශ කිරීමේ සහ භාෂණයේ නිදහස, ඉඩම් සඳහා අයිතිය, ගමන් බිමන් යෑමේ නිදහස සහ කෙනෙකුගේ වාසස්ථානය තෝරාගැනීමේ නිදහස, සාමකාමී ලෙස රැස්වීමේ සහ සමාගමයේ යෙදීමේ අයිතිය, මානව හිමිකම් සම්බන්ධයෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ අහිතකර බලපෑම්, අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම් සහ වධ හිංසා සහ භාෂා අයිතිය ආදියට එල්ල වූ තර්ජන සහ උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් මාධ්‍යවේදීන්, මානව හිමිකම් ආරක්ෂකයින් සහ සිවිල් සමාජයේ ක්‍රියාධරයන් මානව හිමිකම් කොමිෂන් සභාවෙන් පිළියම් ඉල්ලා ස්වකීය පැමිණිලි ඉදිරිපත් කර ඇත.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරය 2022 දී මානව හිමිකම් ආරක්ෂකයින් සඳහා මධ්‍යම, නැගෙනහිර, උතුර සහ දකුණු පළාත්වල පැවැත් වූ උපදේශාත්මක සාකච්ඡා මාලාව ඔස්සේ ඉස්මතු වූයේ මාධ්‍යවේදීන්ට, මානව හිමිකම් ආරක්ෂකයින්ට සහ සිවිල් ක්‍රියාකාරීන්ට මෙන්ම පොදුවේ සිවිල් ප්‍රජාවට ස්වකීය මූලික අයිතිවාසිකම් සහ නන්වැදෑරුම් නිදහස භුක්ති විඳීමේ දී විවිධාකාර තර්ජනයන්ට මුහුණ දීමට සිදු වන බවත් ඒ ඒ තත්ත්වයන් යටතේ එලෙස සිදු වන අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම්වල ප්‍රබලත්වය වෙනස් වුවද එසේ සිදු වීමේ ප්‍රවණතාව පොදුවේ මෙරට පුරා පවතින බව යි.


කෙසේ වෙතත්, මානව හිමිකම් කොමිසමට ඉදිරිපත් වූ සිදුවීම් අතරින් සිදුවීම් 74ක් නැගෙනහිර පළාතෙන් වූ අතර උතුරු පළාතෙන් වාර්තා වූ මානව හිමිකම් සම්බන්ධයෙන් වන තර්ජන පිළිබඳ පැමිණිලි 77ක් අධ්‍යයනය කෙරුණි. තව ද, මධ්‍යම පළාතේ මාධ්‍යවේදීන් සහ මානව හිමිකම් ආරක්ෂකයින් විසින් මානව හිමිකම් සම්බන්ධයෙන් වන තර්ජනයන් පිළිබඳ සිදුවීම් 45ක් වාර්තා කොට තිබූ අතර දකුණු පළාතෙන් එබඳු සිදුවීම් 41ක් වාර්තා කොට තිබිණි.




ප්‍රධාන වශයෙන් මාධ්‍යවේදීන් සහ මානව හිමිකම් ආරක්ෂකයින් විසින් මතු කරන ලද කේන්ද්‍රීය ප්‍රශ්න වර්ග ඉහත රූපසටහන මගින් විස්තර කොට ඇත. මෙය සියලු මානව හිමිකම් උල්ලංඝනයන් සහ මූලික නිදහසට එල්ල වූ තර්ජන පිළිබඳව විස්තරාත්මක ලැයිස්තුවක් නොවුව ද, රටේ ඉස්මතු වෙමින් පවතින මානව හිමිකම් ක්ෂේත්‍රයේ අභියෝග යන්ගේ ස්වභාවයන් මගින් ප්‍රශ්නයේ බරපතළකම පෙන්නුම් කරයි. විශේෂයෙන් ම භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස, අත්තනෝමතික අත්අඩංගුවට ගැනීමෙන් නිදහස, වධ හිංසාවෙන් නිදහස, නීතියේ සමාන ආරක්ෂාව සඳහා අයිතිය, තොරතුරු ලබා ගැනීමේ අයිතිය, භාෂා අයිතිය, ඉඩම් අයිතිය, ගමන් බිමන් යෑමේ සහ කෙනෙකුගේ වාසස්ථානය තෝරාගැනීමේ නිදහස ආදිය සම්බන්ධයෙන් හැකිළෙන අවකාශය පිළිබඳව මෙමගින් හඬ ගා කියයි. සාධාරණ සහ ඵලදායී ලෙස නීතිය ක්‍රියාත්මක වීම පිළිබඳ විශ්වාසය විශාල ලෙස අඩු වීම, මාධ්‍යවේදීන්, මානව හිමිකම් ආරක්ෂකයින් සහ සිවිල් ක්‍රියාකාරීන් විසින් අවධාරණය කරනු ලැබූ අතර මානව හිමිකම් උල්ලංඝනයන් රට පුරා පැතිරීම දිරිමත් කරන දණ්ඩන මුක්තිය, නීතියේ ආධිපත්‍යය, යුක්තිය සහ නීතිය ඉදිරියේ සමාන ආරක්ෂාව පතන බොහෝ දෙනා මුහුණ දෙන තිත්ත යථාර්ථයක් ලෙස අඛණ්ඩවම පවතියි.

මෙම ප්‍රකාශනයට දායක වෙමින් ලිපියක් ඉදිරිපත් කරනු ලබන ජනමාධ්‍යවේදියෙකු වන මංගලනාත් ලියනාරච්චි විසින් උක්ත තත්ත්වයන් සියල්ල සම්පිණ්ඩනය කරමින් විශේෂයෙන්ම භාෂණයේ සහ ප්‍රකාශනයෙහි නිදහස සම්බන්ධයෙන් පසුගිය වසරේ නොවැම්බර් මස ත්‍රිකුණාමලයේ කින්නියා කුරුඤ්ඤංකර්නි කලපුවේ ඛේදජනක ලෙස මඟී යාත්‍රාවක් පෙරළී යෑමෙන් පසුව ඇති වූ නොසන්සුන් තත්ත්වය වාර්තා කරන ලද මාධ්‍යවේදීන්ට පහර දීමේ සිද්ධියක් ඇසුරින් නීතිය ක්‍රියාත්මක කිරීම, යුක්තිය සහ නීතියේ සමාන ආරක්ෂාව පිළිබඳ පවතින නොනවතින අතෘප්තිමත්භාවය පිළිබඳව මෙසේ සටහන් කරනු ලබයි,

"මාධ්‍යවේදීන්ට පහරදීම් අපට අලුත් දෙයක් නොවුණත් මෙතෙක් වාර්තා කර ඇති සිදුවීම්වල ක්‍රමවත් වර්ධනයක් තිබෙන බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විසින් නිකුත් කරන මාසික වාර්තාවලින් හෙළි වේ. මේ වසරේ ජනවාරි සිට මඩකලපුව, කුරුණෑගල සහ කොළඹ, මුලතිව්, හලාවත, හම්බන්තොට, ප්‍රදේශවලින් වාර්තා වූ සිද්ධීන් මාලාවකි."




ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට මාධ්‍යවේදීන්, මානව හිමිකම් අරක්ෂයින් සහ සිවිල් සමාජ සාමාජිකයින් මෙන්ම සිවිල් වැසියන් විසින් ඉදිරිපත් කළ විවිධ මානව හිමිකම් උල්ලංඝනය වීම් වශයෙන් චෝදනා කෙරෙන තත්ත්වයන් බොහෝමයක් සාරාංශගත කිරීම හරහා පහත සඳහන් මූලික ගැටලු හඳුනාගත හැකි විය.

| **මාධ්‍යවේදීන්, මානව හිමිකම් අරක්ෂයින් සහ සිවිල් සමාජ සාමාජිකයින් මෙන්ම සිවිල් වැසියන් විසින් ඉදිරිපත් කළ පැමිණිලිවලින් ඉස්මතු වූ ප්‍රධාන ගැටලු** |
|---|
| තොරතුරු ලබා ගැනීමට අයිතීන් උල්ලංඝනය කිරීම, තොරතුරු වෙත ප්‍රවේශ වීමේ දී සහ එකී තොරතුරු මත පදනම්ව අයුක්තිසහගත දෑ මහජන අවකාශය තුළ හෙළිදරව් කිරීමේ දී, ප්‍රධාන වශයෙන් මාධ්‍යවේදීන් සහ මානව හිමිකම් ආරක්ෂකයින් මුහුණ දුන් තර්ජනය කිරීම් සහ බිය ගැන්වීම්. |
| තර්ජන සහ බියගැන්වීම් මගින් භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස උල්ලංඝනය කිරීම ඇතුළුව මාධ්‍ය නිදහසට ඇති බාධාවන්. මාධ්‍යවේදීන්ගේ සහ මානව හිමිකම් ආරක්ෂකයින්ගේ ජීවිත අවදානමේ හෙළමින්, තොරතුරු දැන ගැනීමේ පනත යටතේ තොරතුරු විමසීම් කළ මාධ්‍යවේදීන්ගේ අනන්‍යතාවය රාජ්‍ය ක්‍රියාකාරීන් විසින් නීති විරෝධී ක්‍රියාකාරීන්ට/ ජාවාරම්කරුවන්ට / අපරාධකරුවන්ට හෙළිකරනු ලැබීම.<br><br>ආණ්ඩුවේ ප්‍රාදේශීය/දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීම්වලට සහභාගී වීමෙන් මාධ්‍යවේදීන් වැළැක්වීම සහ එමගින් මහජනයාට වැදගත් වන තොරතුරුවලට ප්‍රවේශය සහ දිස්ත්‍රික් පරිපාලනයන්හි තීරණ මහජනයාට වාර්තා කිරීම සීමා කිරීම. තමන්ගේ ජීවිත සහ ජීවනෝපායට බලපාන තීරණ ගැන දැනගැනීමට සමාජයේ ජනතාව විශාල පිරිසකට ඇති අයිතිය අහිමි කරනු ලැබීම. |
| සාමකාමී රැස්වීමේ අයිතිය සහ සංවිධානය වීමේ නිදහස ද උල්ලංඝනය වූ තත්ත්වයක පවතිද්දී භාෂණයේ සහ ප්‍රකාශනයේ අයිතිය ද උල්ලංඝනය කිරීම. |
| සමානත්මතාවය සඳහා ඇති අයිතිය උල්ලංඝනය කිරීම සහ එමගින් "නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේ ය" යන සර්ව සාධාරණත්වයේ අයිතිය ආණ්ඩුව විසින් උල්ලංඝනය කරනු ලැබීම. |

| |
|---|
| සමාජ මාධ්‍ය මගින් තොරතුරු හෙළිදරව් කිරීම, මත ප්‍රකාශනය, අනවශ්‍ය පරීක්ෂණ සඳහා කැඳවීමට හේතු වීම සහ එමගින් තමන්ගේ භාෂණයේ නිදහසේ අයිතිය සඳහා ස්වයං වාරණයක් පනවා ගැනීමට සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට සහ මානව හිමිකම් ආරක්ෂකයින්ට ව්‍යංගයෙන් බල කරනු ලැබීම. |
| තර්ජනයෙන්, බිය ගැන්වීමෙන් සහ මහජනයාට තොරතුරු ප්‍රවේශය වැළක්වීමෙන් මාධ්‍ය නිදහසට අවහිර කිරීම සහ එකී නිදහස අහිමි කිරීම. |
| බලය අයුතු ලෙස භාවිතයෙන් සහ අසාධාරණ ලෙස ප්‍රජාවන් බලහත්කාරයෙන් ස්වකීය වාස භූමි වලින් ඉවත් කිරීම මගින් රාජ්‍ය නිලධාරීන් විසින් ජනතාවගේ ඉඩම් සහ දේපළ අයිතිය උල්ලංඝනය කරනු ලැබීම. |
| ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ *III* පරිච්ඡේදයේ 10 වන ව්‍යවස්ථාවේ සඳහන් කර ඇති තමන් කැමති ආගමක් ඇදහීමේ හෝ වැළඳ ගැනීමේ නිදහස ද ලබ්ධියක් හෝ දැරීමේ හෝ පිළිගැනීමේ නිදහස ඇතුළුව සිතීමේ නිදහසට, හෘද සාක්ෂියේ නිදහසට සහ ආගමික නිදහසට ඇති හිමිකම සම්බන්ධයෙන් ඇති තර්ජනයන්. |
| දේශපාලන සම්බන්ධතා ඇති තැනැත්තන් විසින් ජනමාධ්‍යවේදීන්ට පහරදීම සහ ඔවුන්ගේ මාධ්‍ය උපකරණ විනාශ කිරීම ඇතුළුව ජනමාධ්‍යවේදීන්ට අයථා බලපෑම් කිරීම මගින් ඔවුන්ගේ භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස අහිමි කරනු ලැබීම. |
| මානව හිමිකම් උල්ලංඝනයන්ට එරෙහිව සහ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයක් වෙනුවෙන් හඬ නැගීමේ දී සහ පෙනී සිටීමේ දී මානව හිමිකම් ආරක්ෂකයින්ට, සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට සහ මාධ්‍යවේදීන්ට බලපෑම් කරමින් සහ ඔවුන් අධෛර්යමත් කරමින් භාෂණයේ සහ ප්‍රකාශනයේ අයිතිය උල්ලංඝනය කිරීම. |
| අසාධාරණය මගින් සමානත්වය සඳහා අයිතිය ද උල්ලංඝනය වෙමින් පවතින අතර රටේ බැහැර කරනු ලැබූ සහ දේශීය ප්‍රජාවන්ගේ ඉඩම් අයිතිය සහ ගමන් බිමන් යෑමේ නිදහස උල්ලංඝනය කිරීම. තමන්ගේ ඉඩම් වගාව/ජීවනෝපාය සඳහා භාවිතා කිරීමේ ගොවීන්ගේ/නිෂ්පාදකයින්ගේ අයිතියට බාධා කොට ඇත. නීති ක්‍රියාත්මක කිරීමේ අධිකාරීන් විසින් නීතිය අසාධාරණ ලෙස ක්‍රියාත්මක කිරීම මගින් ප්‍රශ්නය තව දුරටත් උග්‍ර වී ඇත. |
| රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා හේතුවෙන් දෙමළ ප්‍රජාවගේ භාෂා අයිතිය උල්ලංඝනය වීම සහ එමගින් දරුවන්ගේ අධ්‍යාපනයට ඇති අයිතිය උල්ලංඝනය වීම. |
| සිදුවිය හැකි දූෂණ සහ බලය අයුතු ලෙස භාවිත කිරීම හෙළිදරව් කිරීම ගැන රාජ්‍ය නිලධාරීන් මාධ්‍යවේදීන්ට බලපෑම් කිරීම. |
| පදිංචි වීම සඳහා ඉඩම් බෙදා දීමේ දී ජනවාර්ගිකත්වය පදනම් කරගත් අසාධාරණයන් සහ නැගෙනහිර පළාතේ ගම්වල වාර්ගික සංයුතිය වෙනස් කිරීම සඳහා ඉඩම් බලහත්කාරයෙන් අත්පත් කර ගැනීම. |
| ප්‍රධාන වශයෙන්, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක නොකිරීම නිසා, තමන් කැමති භාෂාවකින් ලේඛන (උදා: උප්පැන්න සහතිකය) ලබාගැනීමේ අයිතිය උල්ලංඝනය වීම. භාෂාව මත පදනම් වූ අසාධාරණය. |
| වතු ක්ෂේත්‍රයේ ප්‍රජාවන්ගේ ලිපි ලැබීමේ අයිතිය උල්ලංඝනය වීම. |
| වතු ක්ෂේත්‍රයේ දී සෞඛ්‍ය ක්ෂේත්‍රයට ප්‍රවේශය සහ සමාන සැලකිලි ලබාගැනීමේ අයිතිය උල්ලංඝනය වීම සහ තොරතුරුවලට ප්‍රවේශවීමේ අයිතිය භාවිත කිරීමට බාධා සිදු කිරීම. |
| යටිතල පහසුකම් සංවර්ධනයේ ප්‍රතිලාභ ලබාගැනීම සහ භාවිතය සම්බන්ධයෙන් වතු ක්ෂේත්‍රයේ ප්‍රජාවන්ට ආසාධාරණ සිදු වීම. යටිතල පහසුකම් සංවර්ධන ක්‍රියාවන්ට සම්බන්ධ තොරතුරු රාජ්‍ය බලධාරීන් විසින් ලබා නොදීම සහ රාජ්‍ය බලධාරීන්ගේ තොරතුරුවලට ප්‍රවේශයේ දී සහ තම භාෂණයේ නිදහස භාවිතයේ දී අනවශ්‍ය බලපෑම් සහ ප්‍රශ්න කිරීම් සිදු කිරීම. |

වතු ක්ෂේත්‍රයේ පොහොර බෙදා හැරීම විධිමත් කිරීම සම්පූර්ණයෙන් නොතකා හැරීම මගින් ගොවීන්ගේ රැකියාවේ නිදහස සඳහා අයිතිය උල්ලංඝනය කිරීම. වතු ක්ෂේතයේ ජනයාගේ සමානත්වයේ අයිතිය උල්ලංඝනය කරමින් රාජ්‍ය බලධාරීන් අසාධාරණ සහ වෙනස් කොට සැලකීම සිදු වන පරිදි තීරණ ගැනීම.

**පොදු නිරීක්ෂණ**

- භාෂාව, ජන වර්ගය සහ ආගම මත පදනම් වූ "වෙනස් කොට සැලකීමේ" ප්‍රශ්නයේ බරපතළකම මධ්‍යම, උතුරු, සහ නැගෙනහිර කලාපවල වැඩි වශයෙන් දක්නට ලැබිණි. සුළුතර ප්‍රජාවන්ගේ අනාරක්ෂිත බව පිළිබඳ හැඟීම ද ප්‍රජාවන් විසින් මතු කරනු ලැබී ය.

- නීතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් එලදායී බව, සාධාරණ බව, අපක්ෂපාත බව සහ සමානත්වය, අසතුටුදායක වන අතර සමාජ අසාධාරණය සම්බන්ධයෙන් හඬ නගන පුද්ගලයින් සහ සංවිධාන මර්දනයේ අවදානමට ලක් වෙයි.

- මහජනයාගේ මානව හිමිකම් සම්බන්ධ සිදුවීම් සහ රජයේ බලධාරීන්ගේ අයථා ක්‍රියා සහ දූෂණ හෙළිදරව් කරන මාධ්‍යය/මාධ්‍යකරණ කාර්යභාරය බරපතළ ලෙස සීමා කරනු ලබයි. මහජනයාගේ අයිතීන් පිළිබඳව, ඔවුන්ගේ වැඩ කටයුතුවල දී සහ ඔවුන්ට මුහුණ දීමට වන අසාධාරණ සම්බන්ධයෙන් මාධ්‍යවේදීන්ට, මානව හිමිකම් ආරක්ෂකයින්ට සහ සිවිල් සමාජයේ නියෝජිතයින්ට එරෙහිව දේශපාලන වශයෙන් අභිප්‍රේරණය කළ සහ මෙහෙයවන කණ්ඩායම් ක්‍රියා කරයි.

- 'ඉඩම් අයිතියට' සහ 'භාෂා අයිතියට' සම්බන්ධ ප්‍රශ්න නැගෙනහිර පළාතේ වඩාත් පොදු වන අතර එමගින් ඔවුන්ගේ ජීවනෝපාය සහතික කර ගැනීමේ දී ප්‍රජාවන් බරපතළ හිරිහැරවලට ගොදුරු වෙති. එමගින් ඔවුන්ගේ යහ පැවැත්ම, සාමය සහ දරුවන්ගේ අධ්‍යාපනය ආදියට බරපතළ බලපෑම් ඇති කරන අතර ඒවාට වගකීම් සහිත පිළියම් නොමැති වීම නිසා සිදුව ඇත්තේ නීතිය ක්‍රියාත්මක කරන ආයතන සහ රටේ රාජ්‍ය සේවය සම්බන්ධයෙන් ඔවුන්ගේ විශ්වාසය අඩු වීම යි.

- මාධ්‍යවේදීන්, මානව හිමිකම් ආරක්ෂකයින් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් බොහෝ දෙනෙකුට ඔවුන්ගේ ක්‍රියාකාරීත්වයේ දී ප්‍රමාණවත් පිළිගැනීමක්, සාධාරණ බවක්, සහ යුක්ති සහගත බවක් පෙන්නුම් නොකළ පිළියම් යාන්ත්‍රණ සහ නීති ක්‍රියාත්මක කිරීමේ ආයතන සම්බන්ධයෙන් විශ්වාසයක් නොමැති වීම, මානව හිමිකම් සිද්ධි හරහා  වැඩි වශයෙන් පෙන්නුම් කෙරුණි.

- නීති විරෝධී හෝ අත්තෝනමතික අත් අඩංගුවට ගැනීම්, රඳවා ගැනීම්, ප්‍රශ්න කිරීම්, බලහත්කාර පාපොච්චාරණ, වධහිංසාවලට ලක් කිරීම්, තර්ජන සහ බිය ගැන්වීම් වැනි අසාධාරණයන්ට එරෙහිව අභියෝග කිරීමට ඔවුන් ක්‍රියා කිරීම සහතික කරන, මානව හිමිකම් උල්ලංඝනය වීම්වල වින්දිතයන්ට ඇති පිළියම් යාන්ත්‍රණ සහ නීතිමය රැකවරණ පිළිබඳ පවතින දැනුම සම්බන්ධයෙන් අඩුවක් දක්නට තිබිණි.

- මහජනයාගේ සිවිල්, දේශපාලන, ආර්ථික, සමාජ සහ සංස්කෘතික අයිතීන්ට බලපාන තොරතුරු ලබා ගැනීමෙන් සහ තොරතුරු හෙළිදරව් කිරීමෙන් මාධ්‍යවේදීන්, මානව හිමිකම් ආරක්ෂකයින් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් වළක්වන දේශපාලඥයන්ගේ සහ රාජ්‍ය නිලධාරීන්ගේ අයථා බලපෑම් අගතිගාමී තත්ත්වයක් ලෙස හඳුනාගනු ලැබී ය.

- තොරතුරු ඉල්ලා සිටින්නන් සහ විශේෂයෙන් ම ගවේෂණාත්මක මාධ්‍යකරණයේ යෙදෙන්නන්ගේ අනන්‍යතාවය රජයේ ආයතනවල නිලධාරීන් විසින් තුන්වන පාර්ශ්වයන්ට සහ විශේෂයෙන්  නීති විරෝධී කටයුතු කරන බවට චෝදනා ලබන්නන් වෙත හෙළිදරව් කරනු ලැබීම මගින්  එම තැනැත්තන්ගේ ජීවිත අවදානමට ලක්වෙයි. පුළුල් පරාසයක් ප්‍රශ්න සඳහා  තොරතුරු දැනගැනීමේ මූලික අයිතිය නිතර ම පාහේ භාවිත කරන මාධ්‍යවේදීහු සහ මානව හිමිකම් ආරක්ෂකයෝ  ඉන් පසුව රාජ්‍ය බලධාරීන්ගෙන් සිදුවිය හැකි වගවීම් රහිත ක්‍රියාකාරකම් හෙළිදරව් කරති. අවාසනාවකට, එබඳු රාජ්‍ය ආයතනවල නිලධාරීන් අතර වර්ධනය වෙමින් පවතින ප්‍රවණතාවයක් වී

ඇත්තේ, මාධ්‍යවේදීන්ගේ, මානව හිමිකම් ආරක්ෂකයින්ගේ සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන්ගේ අනන්‍යතාව, එබඳු වගවීම් රහිත ක්‍රියාවන්ට සම්බන්ධ පාර්ශ්වයන්ට හෙළි කිරීම යි. මෙය බරපතළ ප්‍රශ්නයක් ලෙස හඳුනාගෙන ඇත්තේ එමගින් තොරතුරු දැනගැනීමේ අයිතියේ අරමුණ වන තොරතුරු වෙත ප්‍රවේශ වීමේ අයිතියට අවස්ථාව දීම මගින් රජයේ නිලධාරීන් අතර විනිවිදභාවයේ සහ වගවීමේ සංස්කෘතියක් වර්ධනය කිරීමත්, එමගින් දූෂණයට එරෙහිව සටන් කිරීමට වගවීමට සහ යහපාලනය වර්ධනය කිරීම සඳහා පුරවැසි දායකත්වය ලබා දීමත් යන අරමුණ අවලංගු සාධක බවට පත්කිරීම මගින් එහි වටිනාකම පැහැදිලිව ම යටපත් කරන හෙයිනි.

# යෝජිත නිර්දේශ

මාධ්‍යවේදීන් සහ මානව හිමිකම් ආරක්ෂකයින් විසින් ඔවුන්ගේ අදාළ ලිපිවලින් උද්දීපනය කරන ලද මූලික ගැටලු සහ අභියෝග මත පදනම්ව මෙම නිර්දේශ ඉදිරිපත් කර ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III පරිච්ඡේදයේ දක්වා ඇති ප්‍රකාශනයේ නිදහස, වෙනස් කොට සැලකීමෙන් තොර වීමේ නිදහස, සමානාත්මතාවයට ඇති අයිතිය, තොරතුරු දැනගැනීමේ අයිතිය සහ සාමකාමීව රැස්වීමේ නිදහස ඇතුළු භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස ප්‍රධාන වශයෙන් සලකා බලමින් මූලික අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට ප්‍රජාතන්ත්‍රවාදී අවකාශයට පවතින සහ බාධා කරන තර්ජනවල ස්වභාවයන් මෙම නිර්දේශ ඉදිරිපත් කිරීමේදී සලකා බලන ලදී.

මෙම දළ විශ්ලේෂණය ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්ත්වය පිළිබඳ සවිස්තරාත්මක විග්‍රහයක් නොවන බැවින්, ඊට අනුරූප නිර්දේශ ද මාධ්‍යවේදීන්, මානව හිමිකම් ආරක්ෂකයින් සහ සිවිල් සමාජයේ සාමාජිකයන් විසින් මතු කරන මූලික කරුණුවලට අදාළ විෂය පථය තුළට සීමා වූ කාරණා මත පමණක් සකස් කර ඇත.

## අදහස් ප්‍රකාශ කිරීම ඇතුළුව භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස

- අදහස් ප්‍රකාශ කිරීම ඇතුළු භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස උල්ලංඝනය කිරීම සම්බන්ධ සිද්ධීන් තක්සේරු කිරීමට රජය වහා පියවර ගත යුතු ය. මේ සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ජාතික මට්ටමේ අධ්‍යයනයක් සිදු කළ යුතු අතර අදහස් ප්‍රකාශ කිරීම ඇතුළුව භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස ක්‍රියාත්මක කිරීමේ ගැටලු සහ අභියෝග ලේඛනගත කර රටේ ජාත්‍යන්තර වගකීම් සහ බැඳීම්වලට අනුකූලව නිර්දේශ ලබා දිය යුතු ය. මෙම ක්‍රියාවලියේ කොටසක් ලෙස, ජනමාධ්‍ය ප්‍රජාවගේ මූලිකත්වයෙන් හා රජයේ පාර්ශ්වයේද නියෝජනයෙන් "ජාතික මාධ්‍ය ප්‍රතිපත්තියක්" සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කළ යුතු ය.

- අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට එරෙහි ප්‍රහාර සිදු වීමේ අවදානමක් පවතින අවස්ථාවන්හි දී සහ නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් එවැනි උල්ලංඝනයන් පිළිබඳ සැබෑ සහ ආසන්න අවදානමක් පවතින බව දන්නා හෝ දැන සිටිය යුතු විශේෂිත අවස්ථාවන්හි දී, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට එරෙහි ප්‍රහාර වැළැක්වීමට රජය පියවර ගත යුතු ය.

- ජනමාධ්‍ය අමාත්‍යාංශය, නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන්, විශේෂයෙන්ම පොලිස් දෙපාර්තමේන්තුවේ මානව හිමිකම් අංශය සහ මානව හිමිකම් කොමිසම සමඟ එක්ව මාධ්‍යවේදීන්, මානව හිමිකම් ආරක්ෂකයින් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට තර්ජනයක් විය හැකි කාරණා මතු කර සාකච්ඡා කළ හැකි යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතු ය.

- අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස උල්ලංඝනය කිරීම සම්බන්ධ චෝදනා ඉහළ ප්‍රමුඛතාවකින් යුතුව සැලකිය යුතු අතර, අගතියට පත් වූවන්ට පැමිණිලි කිරීමට ඉඩ සැලසීමට නීතිය ක්‍රියාත්මක කරන ආයතන වඩාත් සංවේදීව ක්‍රියා කළ යුතු ය. තවද, මාධ්‍ය නිදහසට එල්ල වී ඇති බව කියන උල්ලංඝනයන් හෝ තර්ජන සම්බන්ධයෙන් පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අපක්ෂපාතී පරීක්ෂණ පවත්වා අපරාධකරුවන් නීතිය ඉදිරියට ගෙන ආ යුතු ය.

- මිනිසුන්ගේ අයිතිවාසිකම් සහ මූලික නිදහසට බලපාන ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් රජය විවේචනය කිරීමේ නිදහස ඇතුළුව අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට සහ විරුද්ධ මතවලට හානිදායක ලෙස බලපාන කිසිදු දණ්ඩනීය හෝ මර්දනකාරී ක්‍රියාමාර්ගයක් නොගන්නා බවට රජය සහතික විය යුතු ය.

- මාධ්‍යවේදීන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේ මූලික අයිතිය තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ වගකීම "ස්වාධීන මාධ්‍ය කොමිෂන් සභාවක්" දක්වා පුළුල් කිරීමට ජනමාධ්‍ය අමාත්‍යාංශය නායකත්වය ගෙන ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළ යුතු ය. එවැනි ස්වාධීන කොමිෂන් සභාවක් පාර්ලිමේන්තුවට පමණක් වග කිව යුතු අතර වගකීම් සහ බලතල මාධ්‍ය නිදහස සක්‍රීය කරමින් මාධ්‍ය ක්ෂේත්‍රයේ ගැටලු සහ දුක්ගැනවිලි විසඳීමට ප්‍රමාණවත් විය යුතු ය.

## අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම, රඳවා තබා ගැනීම සහ වධහිංසා පැමිණවීම

- රජය පසුගියදා සංශෝධන ගෙන ආවද 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත අහෝසි කිරීමට කටයුතු කළ යුතු ය. එතෙක් අත්අඩංගුවට ගැනීම සඳහා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ ප්‍රතිපාදන ක්‍රියාත්මක නොකිරීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගත යුතු ය.

- භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස ආරක්ෂා කිරීම සහතික කිරීම සඳහා අතුරු විධිවිධානයක් ලෙස පුද්ගලයන් රඳවා තබාගෙන නඩු පැවරීම, විශේෂයෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ විවිධ මතභේදාත්මක විධිවිධාන අසාධාරණ ලෙස භාවිත කිරීම සමාලෝචනය කිරීම හා සමගාමීව අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම් සහ වධහිංසා පැමිණවීම් පිළිබඳ සමාලෝචනය කිරීමට, රජය වහා ම පියවර ගත යුතු ය. ඒ අනුව, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිටින සියලුම රැඳවියන්ට ඔවුන්ගේ නීති උපදේශකවරුන් සමඟ උපදේශන සඳහා අවශ්‍ය අවසරලත් ප්‍රවේශය සඳහා පහසුකම් සැලසිය යුතු ය.

- ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගෙන රඳවා සිටින පුද්ගලයින් ස්වාධීන ව නිරීක්ෂණය කිරීම සඳහා පැමිණීමට මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන්ට බාධාවක් වන ගැටලු විසඳීමට රජය ක්‍රියා කළ යුතු ය.

- මානව හිමිකම් කොමිෂන් සභාව වධහිංසාවට ලක් වූ වින්දිතයන් සඳහා පවතින නීතිමය ප්‍රතිපාදන පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සහ වධහිංසාවට ලක් නොවන ප්‍රතිපත්තියක් ප්‍රවර්ධනය කිරීම සිදු කළ යුතු ය. එවැනි මුලපිරීමක් මගින් අත්අඩංගුවට ගැනීම්, රඳවා තබා ගැනීම්, ප්‍රශ්න කිරීම්, නඩු පැවරීම් සහ සිරගත කිරීම්වලට යොමු කිරීමට බලය ඇති නීතිය ක්‍රියාත්මක කරන ආයතනවල නිලධාරීන් පුහුණු කිරීමේ ප්‍රබල උපාය මාර්ගයක් ඇතුළත් විය යුතු ය.

- ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ක්‍රියාත්මක කිරීමේදී සිදු වන මානව හිමිකම් උල්ලංඝනය කිරීම් අවම කිරීම සඳහා 2019 වසරේ "අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම් සහ රඳවා තබා ගැනීම" පිළිබඳ මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ එලදායී ලෙස ක්‍රියාත්මක කළ යුතු ය.

- මූලික අයිතිවාසිකම් සහ නිදහස උල්ලංඝනය කරන අපරාධකරුවන්ට එරෙහිව කඩිනම් සහ අපක්ෂපාතී පරීක්ෂණ සහ පරිපාලන හා දණ්ඩන සම්බාධක බලාත්මක කිරීම සිදු කළ යුතු අතර අඛණ්ඩ දණ්ඩමුක්තියට ඉඩ සලසන, නීතිය ක්‍රියාත්මක කිරීමේ දී ඇති විය හැකි සියලු හිඩැස් වසා දැමිය යුතු ය.

- මානව හිමිකම් කොමිෂන් සභාව පොලිස් දෙපාර්තමේන්තුවේ මානව හිමිකම් අංශයට සහාය විය යුතු අතර එමඟින් එහි නියම කරන ලද කාර්යයන් අර්ථවත් ලෙස ක්‍රියාත්මක කිරීමට හැකි වේ. අත්අඩංගුවට ගැනීම්,

රඳවා තබා ගැනීම්, ප්‍රශ්න කිරීම් සහ නඩු පැවරීම් වැනි කටයුතුවලදී සිදු වන මානව අයිතිවාසිකම් උල්ලංඝනයන් අවම කිරීම් සහතික කිරීම සඳහා වරින් වර සමාලෝචන සිදු කළ යුතු ය.

- 2007 අංක 56 දරන අයි.සී.සී.පී.ආර්. පනත සංශෝධනය කිරීමටත්, එහි දක්වා ඇති සියලුම සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් දේශීය නීතියට ඇතුළත් කර ඇති බව සහතික කිරීම සඳහා එහි විෂය පථය පුළුල් කිරීමටත් රජය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු ය.

- අයි.සී.සී.පී.ආර්. පනත සහ 3(1) සහ (2) වගන්ති වැරදි ලෙස යොදාගැනීම වැළැක්වීම සඳහා ගත හැකි සියලුම ක්‍රියාමාර්ග පිළිබඳව පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඉලක්ක කර ගනිමින් මනාව සැලසුම් කරන ලද පුහුණු සහ සංවේදීතා වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු ය.

- අපරාධකරුවන්ට අධිචෝදනා ඉදිරිපත් කරන්නේ ද යන්න තීරණය කිරීමට නීතිපතිවරයාට පැවරී ඇති අභිමතය පරිදි ක්‍රියා කිරීමේ හැකියාව ප්‍රතිපත්ති සම්පාදකයින් තරයේ තක්සේරු කළ යුතු ය: ඒ අනුව, විශේෂයෙන් ම දේශපාලන හිතවත්කම් සහ බලපෑම් නිසා සමහර වැරදිකරුවන්ට චෝදනා එල්ල නොකිරීමට නීතිපතිවරයාගේ තීරණ අධීක්ෂණය සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම.

- තමන්ගේ ම යෝජනාවක් වන මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 14 වැනි වගන්තිය මගින් සපයනු ලබන වධහිංසාවලින් නිදහස් වීමට ඇති අයිතිය කඩකිරීම් හෝ උල්ලංඝනය වීමට පෙර ඇති ආසන්න අවස්ථාවන් සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීමට මානව හිමිකම් කොමිසම තවදුරටත් ශක්තිමත් කළ යුතු ය. 2016 දී මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පත් කරන ලද "වධහිංසා සහ රඳවා තබා ගැනීමේ උල්ලංඝනයන් අවම කිරීමේ" අනු කමිටුවට, ශ්‍රී ලංකාවේ වධහිංසා පැමිණවීමේ තත්ත්වය පිළිබඳව දැඩි තක්සේරුවක් කිරීමට සහ වධහිංසාවට එරෙහි ව මානව හිමිකම් කොමිසමේ කාර්යභාරය වැඩිදියුණු කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට තවදුරටත් සම්පත් ලබා දිය යුතුය.

## වෙනස් කොට සැලකීම, රැස්වීමේ නිදහස සහ නීතියේ සමාන ආරක්ෂාවක් නොමැතිකම

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය මගින් තහවුරු කර ඇති සමානාත්මතාවයේ අයිතිය ආරක්ෂා කිරීමට රජය අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගත යුතු ය. විශේෂයෙන් ම නීතිය ක්‍රියාත්මක කරන ආයතන සහ විධායක සහ පරිපාලන අංශවලින් මාධ්‍යවේදීන්, මාධ්‍යවේදී සංගම්, මානව හිමිකම් ආරක්ෂකයින් සහ සිවිල් සමාජයේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, ප්‍රකාශනය, සංචරණය, සාමකාමී ව එක්රැස් වීම සහ වෙනස් කොට සැලකීම සම්බන්ධ සියලු ගැටලු ආමන්ත්‍රණය කළ යුතු ය.

- ජනමාධ්‍ය අමාත්‍යාංශය ස්වදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ එක්ව ප්‍රාදේශීය/දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් සංවිධානය කරන විවිධ නිලධාරීන් අනුගමනය කරන විවිධ ප්‍රතිපත්ති, තීරණ සහ ක්‍රමවේද සමාලෝචනය කර මාධ්‍යවේදීන්ට එවැනි රැස්වීම්වලට සහභාගි වීමට ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය සහ අවස්ථාව ලබා දීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගත යුතු ය. ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමේ සංවර්ධන සැලසුම් සහ තීරණ පිළිබඳ තොරතුරු දැනගැනීමේ අයිතිය සහ ප්‍රකාශනය ඇතුළු අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස තහවුරු කළ යුතු ය.

- ජනමාධ්‍ය අමාත්‍යාංශය තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව සමඟ එක්ව තොරතුරු සොයන්නන්ගේ අනන්‍යතාව තුන්වන පාර්ශ්වයන්ට හෝ නීතිවිරෝධී ව්‍යාපාර කටයුතුවල නියැලී සිටින බව කියන අපරාධකරුවන්ට හෙළිදරව් කරන රාජ්‍ය බලධාරීන්ට එල්ල වන චෝදනාවලට අදාළ කරුණු සමාලෝචනය කළ යුතු ය. විශේෂයෙන්ම මාධ්‍යවේදීන්, මානව හිමිකම් ආරක්ෂකයින් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් විසින් තොරතුරු වෙත ප්‍රවේශ වීමේ මූලික අයිතිය සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස භාවිත කිරීම නිසා ඇති වන තර්ජන වැළැක්වීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු ය.

- රජය, නැඟෙනහිර පළාත් පරිපාලනය මඩකලපුව දිස්ත්‍රික් පරිපාලනය සමඟ එක්ව මුහුදු ආදිවාසීන් (වැද්දන්) ඔවුන්ගේ අනන්‍යතාව, ඉඩම් අයිතිය සහ සංචරණය කිරීමේ නිදහස සම්බන්ධයෙන් මුහුණ දෙන ගැටලු විසඳීමට

කඩිනම් පියවර ගත යුතු ය. මානව හිමිකම් කොමිෂන් සභාව සමඟ සමීප සහයෝගයෙන් ස්වාධීන කොමිෂන් සභාවක් මගින් මුහුදු ආදිවාසී ප්‍රජාවගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වන චෝදනා පිළිබඳ පුළුල් හා විනිවිදභාවයෙන් යුතු පරීක්ෂණයක් ආරම්භ කළ යුතු අතර ඔවුන් තවදුරටත් වෙනස් කොට සැලකීමට ලක් නොවන බවට සහතික විය යුතු ය.

- බහු සංස්කෘතික ජනතාවගේ හැඟීම්වලට බලපාන තීරණ ගැනීමට නියම වී ඇති විශේෂිත රාජ්‍ය ආයතනවල සංයුතිය පිළිබඳව බලධාරීන්ගේ අවධානය යොමු කළ යුතුය. එබැවින්, එවැනි ආයතනවලට බඳවා ගැනීම් වලදී (පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කෞතුකාගාරය, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, බෞද්ධ, හින්දු, මුස්ලිම් සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තු, ජාතික සමගිය හා සංහිඳියාව සඳහා වූ කාර්යාලය, මධ්‍යම සංස්කෘතික අරමුදල,. ජාතික චිත්‍රපට සංස්ථාව සහ රාජ්‍ය භාෂා කොමිෂන් සභාව ඇතුළු- නමුත් මෙම ආයතනවලට පමණක් සීමා නොවූ) තීරණ ගැනීමේ තනතුරු නියෝජනය කිරීමට සහ දැරීමට සමාන අවස්ථා සඳහා ඇති ඉඩකඩ ප්‍රදර්ශනය කළ යුතු ය.

## භාෂා අයිතීන් උල්ලංඝනය කිරීම සහ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක නොකිරීම

- විශේෂයෙන් උතුරු, නැගෙනහිර සහ මධ්‍යම පළාත්වල රාජ්‍ය ආයතන විසින් නිකුත් කරන ලද අයදුම්පත්, මාර්ගෝපදේශ සටහන්, උපදෙස්, නිවේදන සහ වෙනත් ආකෘති පත්‍ර වැනි සියලුම ලියකියවිලි ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූල වන බවට සහ 1991 ජූනි 17 දිනැති අංක 22/91 දරන පී. ඒ. චක්‍රලේඛය සහ එහි දක්වා ඇති විධිවිධානවලට අනුකූල බව සහතික කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ.

- ජනමාධ්‍ය අමාත්‍යාංශය, තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව සමඟ එක් ව, තොරතුරු වෙත ප්‍රවේශ වීමේ අයිතිය ක්‍රියාත්මක කිරීමේ දී රාජ්‍ය බලධාරීන්ගේ භාෂා ප්‍රශ්න හේතුවෙන් ප්‍රධාන වශයෙන් ජනතාව මුහුණ දෙන අභියෝග සමාලෝචනය කළ යුතු ය. තව ද, භාෂාව මත පදනම් ව වෙනස් කොට සැලකීම සහ සමානාත්මතාවයට ඇති අයිතිය පිළිබඳ ගැටලු විසඳීම සඳහා රාජ්‍ය භාෂා කොමිෂන් සභාව සමඟ එක් ව කටයුතු කළ යුතු ය.

- 2007 මැයි 28 දිනැති පී. ඒ. චක්‍රලේඛන අංක 07/2007 සහ 21 ජනවාරි 2014 දිනැති පී. ඒ. චක්‍රලේඛන අංක 01/2014 දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව අවශ්‍ය ද්විභාෂා නිපුණතා සහිත කාර්ය මණ්ඩල හිඟ වීමේ අභියෝගය කළමනාකරණය කිරීමට දිගුකාලීන හා කෙටි කාලීන ක්‍රියාමාර්ග ගත යුතු අතර සියලුම රාජ්‍ය ආයතනවල, විශේෂයෙන් නීතිය ක්‍රියාත්මක කරන ආයතනවල පුරප්පාඩු වූ සියලුම පරිවර්තක තනතුරු පිරවීම සඳහා කටයුතු කළ යුතුය. විශේෂයෙන් මාධ්‍යවේදීන්, මානව හිමිකම් ආරක්ෂකයින්, කලාකරුවන්, ලේඛකයින් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම්වලට හෝ රඳවා තබා ගැනීමට නීතිය ක්‍රියාත්මක කරන ආයතනවල නිලධාරීන්ගේ භාෂා ප්‍රශ්න දායක වන සාධකයක් නොවිය යුතු ය.

- 2009 සැප්තැම්බර් 25 දිනැති 1620/27 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය සහ නොවැම්බර් 25, 2009 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන අංක 18/2009 ට අනුව සියලුම රාජ්‍ය ආයතනවල ප්‍රධාන රාජ්‍ය භාෂා ක්‍රියාත්මක කිරීමේ නිලධාරී (COLIO) සහ නිල භාෂා ක්‍රියාත්මක කිරීමේ නිලධාරී (OLIO) ගේ කාර්යයන් විධිමත් කළ යුතු ය.

- බලධාරීන් විසින් රාජ්‍ය භාෂා කොමිෂන් සභාව ස්වාධීන කොමිෂන් සභාවක් බවට පත් කර එහි ආයතනික රාමුව ශක්තිමත් කළ යුතු ය. එවැනි ස්වාධීන කොමිෂන් සභාවකට පැහැදිලි වගකීම් රාමුවක් සහිත බලාත්මක කිරීමක් සමඟ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමට අවනත නොවන නිලධාරීන්ට එරෙහි ව කටයුතු කිරීමේ වගකීම් දැරීමට බලය ද ලබා දිය යුතු ය.

**තුසිත සිරිවර්ධන**
නීතිඥ

# ශක්තික සත්කුමාර: සිතීමේ නිදහස සිරගත කිරීම

"හිතන්න නිදහස- ලියන්න කියන්න නිදහස

බණින්න නිදහස ඇති රට- මේ උත්තම රට"

නන්දා මාලනිය එලෙස උත්ප්‍රාසයෙන් ගැයුවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගෙන ඇති එම අයිතිවාසිකම් බරපතළ ලෙස උල්ලංඝනය වෙමින් පැවති යුගයකදීය. එයින් දසක තුනකට වැඩි කාලයක් ගෙවී ඇතත්, මේ උත්ප්‍රාසය තවමත් එලෙසම වලංගු බව විටින් විට කරළියට එන සිදුවීම්වලින් අපට සිහිපත් කර දෙයි. විශේෂයෙන් මෙහිදී අපගේ අවධානය යොමු වන්නේ, කලා කෘති ඇතුළුව විවිධාකාර නිර්මාණාත්මක ප්‍රකාශනයන්ට එරෙහිව නීතිය අවියක් ලෙස යොදාගැනුණු අවස්ථා සම්බන්ධයෙනි.

ලේඛක ශක්තික සත්කුමාර සම්බන්ධ සිදුවීම, මේ පිළිබඳ ප්‍රබල නිදර්ශනයකි. කෙටි කතාවක් ලියා, සමාජ මාධ්‍යයක පළ කිරීම හේතුවෙන් දිගු කාලයක් ඇප නොමැතිව රිමාන්ඩ් භාරයේ සිටීමට ඔහුට සිදු විය. එවැනි සිද්ධියක් මෙරට වාර්තා වන්නේ පළමු වතාවටයි.

භාෂණයේ, ලේඛනයේ සහ ප්‍රකාශනයේ නිදහස ශ්‍රී ලංකාව තුළ කොතෙක් අභියෝගයට ලක්ව ඇත්දැයි එමගින් හෙළි වූ අතර සාහිත්‍යකරණය ඇතුළුව නිර්මාණකරණයට සම්බන්ධ දැනුවත් පුරවැසියන් තුළ එය දැඩි කම්පනයක් ඇති කළේය.

## ICCPR පනත අවභාවිත කිරීම

ශක්තික සත්කුමාර නිර්මාණය කළ 'අර්ධ' නම් කෙටි කතාව ඔහු සිය ෆේස්බුක් ගිණුමේ පළ කරන්නේ 2019 මාර්තු මාසයේදීය. කෙටිකතාව පළ වී සති දෙකකට පමණ පසු අදාළ කතුවරයා කුරුණෑගල පොල්ගහවෙල පොලිසියට කැඳවනු ලබන්නේ අප්‍රේල් මස පළමුවන දිනය. ඒ අදාළ කෙටිකතාවෙන් බෞද්ධාගමට අපහාසයක් සිදු වී යැයි භික්ෂුවක් විසින් කරනු ලැබූ පැමිණිල්ලකට අනුවය. එහිදී ඔහු අත්අඩංගුවට ගන්නා අතර මහේස්ත්‍රාත්වරයා හමුවට ඉදිරිපත් කිරීමෙන් පසුව රක්ෂිත බන්ධනාගාරගත කරන ලදි.

B7073/19 දරන B වාර්තාවට අනුව ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 291 (ආ) වගන්තිය යටතේ සහ 2007 අංක 56 දරන සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR) පනතේ 2(1) සහ 3(1) වගන්ති යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති බව ඔහුට නගා තිබූ චෝදනාවයි.

එලෙස බන්ධනාගාරගත කිරීමෙන් පසුව දින එකසිය තිහක් (130) රක්ෂිත බන්ධනාගාරගතව සිටින ඔහුට 2019 අටවෙනි මාසයේ 05 දින මහාධිකරණය මගින් ඇප නියම කෙරුණු අතර අගෝස්තු 08 වැනිදා ඔහු ඇප මත මුදාහැරිණි.

ඒ වන විට ඔහුගේ බිරිඳ වන යනුෂා ලක්මාලි මහත්මිය විසින් මෙම අත්අඩංගුවට ගැනීමට එරෙහිව 2019 අප්‍රේල් මස විසි දෙවැනි දින HRC 1140/2019 අංකය යටතේ මානව හිමිකම් කොමිසමට පැමිණිල්ලක් ඉදිරිපත් කොට තිබූ අතර 2019 අප්‍රේල් මස 29 වැනිදා SCFR 167/2019 යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ මූලික අයිතිවාසිකම් පෙත්සමක්ද ගොනු කරනු ලැබ තිබිණි.

## ඇප ලැබීම හා නිදෙස් කොට නිදහස් කිරීම

ශක්තික සත්කුමාරට ඇප ලබාගත හැකි වූයේ ඔහුගේ බිරිඳ විසින් කුරුණෑගල පළාත්බද මහාධිකරණයේ HBA/46/2019 අංක යටතේ 2019 මැයි 8 දින ඇප අයදුම්පතක් ගොනු කිරීමෙන් අනතුරුවය.

ඒ වන විට ඔහු බන්ධනාගාර ගතව සිටි කාලය දින එකසිය තිහක් ඉකුත්ව ගොස් තිබූ අතර ඔහුගේ රැකියාව ඔහුට අහිමි වන තත්ත්වයට පත්ව තිබුණි. මේ කාලය තුළදී පවුලේ ආර්ථිකය පමණක් නොව සාමාන්‍ය දිවි පැවැත්මද අඩාළ වී තිබුණි.

ලේඛක සත්කුමාරට එරෙහි නඩුව පොල්ගහවෙල මහේස්ත්‍රාත් අධිකරණයේදී නැවත වරක් 2021 පෙබරවාරි මස 9 වන අඟහරුවාදා විභාගයට ගත් අවස්ථාවේදී නීතිපතිවරයා විසින් අධිකරණය වෙත යොමු කළ වාර්තා සලකා බැලූ මහෙස්ත්‍රාත් අධිකරණය ලේඛක ශක්තික සත්කුමාර නිදොස් කොට නිදහස් කළේය.

"නීතිපති විසින් 2021 ජනවාරි 25 දා ඉදිරිපත් කරන ලද වාර්තාව පදනම් කොටගෙන පොල්ගහවෙල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවෙන් ලේඛක ශක්තික සත්කුමාර නිදහස් කරනු ලබන අතර නඩුව අවසන් කරන ලදි. කිසිදු අධිචෝදනාවක් ගොනු කෙරෙන්නේ නැත," යි ඔහු වෙනුවෙන් පෙනී සිටි නීතිඥ සංජය විල්සන් ජයසේකර පැහැදිලි කරයි.

බන්ධනාගාරගත වන විට සංවර්ධන නිලධාරියකු ලෙස රාජ්‍ය සේවයේ කටයුතු කළ ශක්තික සත්කුමාර ඇප ලැබීමෙන් පසු නැවත රාජ්‍ය සේවයේ පිහිටුවා තිබුණේ 2019 දෙසැම්බර් 2 දිනයි.

## ශක්තිකගෙන් වන්දි නඩුවක්

ඔහු රාජ්‍ය සේවකයෙක් ලෙසත්, ස්වාධීන ලේඛකයකු ලෙසත්, ඔහුට සිදු වූ හානිය පිළිබඳව වන්දි නඩුවක් පැවරීමට කටයුතු කර තිබේ.

අනීතික ලෙස අත්අඩංගුවට ගැනීම, රඳවා තැබීම, ද්වේෂසහගතව නඩු පැවරීම, කීර්තිමත් චරිතයට, කීර්තිනාමයට හා සමාජ තත්ත්වයට හානි කිරීම යන කාරණා යටතේ ඔහු කළ පැමිණිල්ලට අනුව වන්දිය වශයෙන් රුපියල් මිලියන 20ක අගයක් ඔහු ඉල්ලා සිටියි. ස්වාධීන නිර්මාණයක් ඉදිරිපත් කිරීමෙන් සිරගත වීමට සිදු වූ වර්තමානයේ ප්‍රථම නිර්මාණකරුවා ලෙස එය මානසික සෞඛ්‍යයට මෙන්ම ජීවිතයටම බලපෑ හැකි බව මෙම පැමිණිල්ලේ දී ඔහු සඳහන් කරයි.

මෙම අනීතික අත්අඩංගුවට ගැනීම හා ඒ ආශ්‍රිත ක්‍රියාදාමය නිසා තමන් මානසික වශයෙන් දැඩි පීඩාවට පත් වූ බව අවධාරණය කරන ලේඛක ශක්තික සත්කුමාර කියා සිටින්නේ ස්වතන්ත්‍ර නිර්මාණ බිහි වීමට නම් ආගමික වශයෙන්, දේශපාලන වශයෙන්, එක් රාමුවකට කොටු නොවී නිදහසේ සිතිය හැකි අවකාශයක් සමාජය තුළ පැවතිය යුතු බවයි.

■ **චාන්දනී දිසානායක**

# චමුදිතගේ පවුල බිය ගන්වා මාසයයි!

● විත්තිකරුවන් තවමත් නිදැල්ලේ

"ගල්වලට හා අසූචිවලට අපහාස කළ අය හෙළා දකිමු." පෙබරවාරි 14 වැනිදා ආදරවන්තයන්ගේ දිනයේ ශ්‍රී ලංකාවේ පොලීසිය භාර මහජන ආරක්ෂක අමාත්‍ය සරත් වීරසේකරගේ පුත් සචිත්‍ර වීරසේකර ෆෙස්බුක් සටහනක ලියා තිබුණා. ඔහු නිකම්ම ඇමති පුතකු නොව නිලයෙන් සහකාර පොලිස් අධිකාරීවරයකුද වන වෛද්‍යවරයෙක්.

"හරියට විමර්ශන කළා නම් චමුදිතට ඔය ප්‍රහාරය එලල් වී පැය 48ක් යද්දී විත්තිකරුවන් අත්අඩංගුවට ගැන්න තිබුණා. මුහුණ වහගෙන හිටියත් ඔතැන පන්නන්න තැන් ඕනෑ තරම් තියෙන බව බැලූ ගමන් තේරෙනවා." ලියුම්කරු සමඟ එසේ කීවේ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙක්.

අපරාධ විමර්ශනය ගැන අත්දැකීම් මෙන්ම විද්‍යාත්මක අධ්‍යාපන පසුබිමකුත් තිබෙන මේ විශ්‍රාමික නිලධාරියා අප සමඟ උක්ත අදහස බෙදා ගත්තේ 2022 පෙබරවාරි 14 වැනිදා පාන්දර 2.00ට පමණ මාධ්‍යවේදී චමුදිත සමරවික්‍රමගේ නිවසට එල්ල වූ ප්‍රහාරය ගැන ඊට දින දෙකකට පමණ පසුයි. මුහුණ වසාගත්, වැගන්ආර් මෝටර් රියකින් පැමිණි තිදෙනෙකු එල්ල කළ එම ප්‍රහාරයට ගල් සහ අසූචි පාවිච්චි කරලා තිබුණා.

මේ සටහන ලියැවෙන මොහොත වෙද්දී සිදුවීමෙන් මාසයක් ගෙවෙන්නට දිනක් අඩුයි. ඕනෑ නම් පෙබරවාරිය දින 28ක් නිසා දින දෙකතුනක් අඩුයි කියා කියන්නත් පුළුවන්.

එහෙත් වැදගත් කාරණය වන්නේ චමුදිත මෙන්ම ඔහුගේ බිරිඳ සහ දරුවන් පාන්දර බිය ගැන්වූ ඒ භයානක තර්ජනය කළ උදවිය තවමත් අත්අඩංගුවට ගෙන නොමැති වීම. මෙවැනි තර්ජන සුළුකොට තකන්න බැරි බව මාධ්‍යවේදියෙකු ලෙස ලියුම්කරුට පැහැදිලිව කියන්න පුළුවන්. ඇතැම් කෙනෙකුට මෙවැනි තර්ජන සරල විය හැකියි. එහෙත් මාධ්‍යවේදීන් වන අපි 'කරාතේ' දන්නේ නැහැ. අතේ පයේ හයිය වෙනුවට අපට හුරු කතා කිරීම, ලිවීම ආදිය. අප බොහෝ දෙනෙකුගේ ජීවිත ඉතා සාමකාමී, සරල, නිවුණු ඒවා. ඒ නිසා නිවෙසට යම් පිරිසක් පැමිණ මෙවැන්නක් කිරීම අපේ ජීවිත කළඹන, ඉන් පසු කතා කරද්දී වුණත් බිය ගෙන දෙන අත්දැකීමක්.

අප කලින් කී පොලිස් නිලධරයා කී පරිදි පැය 48ක් තුළ සොයාගැනීම කෙසේ වෙතත්, පැය 648ක් ගිය පසුත් අත්අඩංගුවට ගැනීමක් සිදුව නොමැති නම් ශ්‍රී ලංකා පොලිසීය කෙතරම් දුර්වල විය යුතුද? නොඑසේ නම් ජනමාධ්‍ය අමාත්‍ය ඩලස් අලහපෙරුම ප්‍රකාශ කළ පරිද්දෙන්, කිසිවෙක් අත්අඩංගුවට නොගැනීමෙන් පෙනෙන්නේ මේ ප්‍රහාරයට ආණ්ඩුව වගකිවයුතු බවද?

### විමර්ශනයට ලක් විය යුතු පැති

මෙම පරීක්ෂණවලදී තර්ජනය එල්ල කළ පුද්ගලයන් සොයාගත හැකි ප්‍රධාන දොරටු දෙකක් ගැන කලින් අදහස් දැක්වූ හිටපු විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා අප සමඟ කරුණු බෙදා ගත්තා.

ඉන් එකක් වෙන්නේ දුරකථන ඇමතුම් පරීක්ෂාව. සිදුවීම පාන්දර දෙකට සිදුවූවක්. මෙම කාලසීමාව දුරකථන ඇමතුම් ඉතා අඩුවෙන් සිදුවන කාලසීමාවක්. විශ්‍රාමික නිලධාරියා කීවේ "අනිවාර්යයෙන් ඔය වෙලාවේ ආපු අයගෙ න් කෝල් එකක් හුවමාරු වෙනවාමයි. ඕක තමයි අපරාධවල සාමාන්‍ය පැටර්න් එක. ඒ නිසා ඔය ආසන්න ප්‍රදේශයේ දුරකථන කුලුනු හරහා ඔය කියන වෙලාවේ හුවමාරු වූ දුරකථන ඇමතුම් ගන්නයි තියෙන්නේ. ඒ ලැයිස්තුවක් අරන් ඒ ඒ අංක පරීක්ෂා කරමින් සැකකරුවන් ප්‍රමාණය සීමා කරන්න පුළුවන්." යනුවෙන් විශ්‍රාමික අපරාධ පර්යේෂකයා පෙන්වා දුන්නා.

"ඒක දීර්ඝ කාලයක් ගතවෙන වැඩක් නෙවෙයි." යනුවෙන්ද ඔහු පැවසුවා.

ඒ පර්යේෂකයා පෙන්වා දුන් අනෙක් කාරණය තමයි සීසීටීවී කැමරා.

දැනට සිදු කෙරෙන පරීක්ෂණ ගැන පොලිස් මාධ්‍ය ප්‍රකාශක නිහාල් තල්දූවගෙන් අප මාර්තු 10 වැනිදා කළ විමසීමකදී ඔහු මෙසේ කීවා.

"දැනට අත්අඩංගුවට ගැනීමක් මට වාර්තා කරලා නැහැ. තිබෙන දත්ත එක්ක පරීක්ෂණ යනවා. අලුත් තත්වයන් මහේස්ත්‍රාත් උසාවියට වාර්තා කරනවා. පරීක්ෂණ සිදු කරන්නේ පිළියන්දල පොලිසියෙන්. මොරටුව විශ්වවිද්‍යාලයට යවපු සීසීටීවී කැමරා දර්ශන ගැන තවම වාර්තා ලැබිලා නැහැ. දින දෙකකට කලිනුත් පරීක්ෂා කරලා තියෙනවා. දැනට ටෙලිෆෝන් අංක ලැබුණ ආයතනවලින් පරීක්ෂා කරනවා. අලුතින් ලැබෙන ඇමතුම් පවා නැවත පරීක්ෂාවට ලක් කරනවානේ. ඒ ක්‍රියාවලියේ තමයි ටෙලිෆෝන් අංක තියෙන්නේ. තවත් දුරකථන දත්ත ලැබෙන්නත් නියමිතව තියෙනවා."

ඒ අනුව මාර්තු 10 වැනිදා වනතුරුත් මෙම පරීක්ෂණවල සැලකිය යුතු ප්‍රගතියක් ලැබී නැහැ.

## චමුදිතගේ නිරීක්ෂණ

මාධ්‍යවේදී චමුදිත සමරවික්‍රමගෙන් අප මේ ගැන විමසීම් කළා. ඔහු මෙසේ අදහස් දැක්වුවා.

"ආරක්ෂාව සම්බන්ධව අපි උසාවියට ගිහින් මෝෂන් එකක් දැම්මා. ඒකේ ප්‍රතිඵලයක් විදියට මට නිලධාරියෙක් දුන්නා. පොලීසිය දුන්න එකක් නෙවෙයි. උසාවි තීන්දුව මත වින්දිතයන් ආරක්ෂා කිරීමේ කොට්ඨාශයට අධිකරණය නියෝග කළා ආරක්ෂාව දෙන්න කියලා. ඒක දුන්නා.

"ඊට දවස් තුන හතරකට කලින් පොලීසියේ දෙන්නෙක් දුන්නා. ඒක දුන්නේ පාර්ලිමේන්තුවෙන් අහනකොට දෙන්න උත්තරයක් නොතිබුණ නිසා. ඒත් ඒ නිලධාරීන් දෙන්නාව ඉවත් කළා.

"පරීක්ෂණයක් කෙරෙනවාද කියලා දන්නේත් නැහැ. සීසීටීවී අසූ ගාණක් පරීක්ෂා කළ බව කීවා. ඉන් 22ක් මගේ ගෙදර. ඒවායේ තමයි ගහන ඒවා ආදිය තියෙන්නේ. ප්‍රශ්නය තිබුණේ මුහුණ වහගෙන ආපු එක.

"මාව අප්ඩේට් කරලා නැහැ දැන් වෙන තත්ත්වය ගැන. දැන් නම් ඉතින් පරීක්ෂණයක් කෙරෙනවා කියලා කිසිම විශ්වාසයක් නැහැ.

"ඩලස් අලහපෙරුම දැනටමත් කියා ඉවරයි පරීක්ෂණයකින් අහු වුණේ නැත්නම් ආණ්ඩුව වගකියන්න ඕනෑ බව. ඒකම ඇති. ඊට වඩා දෙයක් අවශ්‍ය නැහැ.

"ඒගොල්ලන් මගෙන් අහනවා කවුද සැක? කවුද සැක? ඔච්චරයි. මම කියා තියෙන්නේ මට එහෙම කියන්න බෑ. අහවලා ඉලක්ක කරන්න බෑ. අපි වැඩසටහන් ගොඩක් කරනවා. අපේ ඉලක්කයට ලක් වෙන අය තරහා වෙනවා. මිනිස්සු මඩ ගහනවා සල්ලි අරගෙන කරන්නේ කියලා. ඒත් අපි සල්ලි අරන් තියෙන්නේ වැඩසටහන් ඉතා සුළු ප්‍රමාණයකට. සුදුලූනු වංචාවේ ඉඳන් බොහෝ දේවල් ගැන මම කතා කළා.

"සාමාන්‍යයෙන් ගොඩක් අය කරන්නේ යම් ඉෂූ එකක් ටච් කරලා ඉවර කරනවා. ඒත් අපි ඒ ඉෂූ එක් ගැන වැඩසටහන් මාලාවක් කරනවා. සුදුලූනු, ගෑස් ආදී ප්‍රශ්න ඒ විදියට පෙන්වන්න පුළුවන්.

"සමහරුන් හොයනවා මොකක්ද සම්බන්ධය. සල්ලිවලටද කරන්නේ. කවුරුහරි මෙහෙයවනවාද කියලා. ඒත් එහෙම දෙයක් තියෙනවා නම්, දැනට හෙළි වෙන්න එපායැ.

"සැක කරන්න පුළුවන් පාර්ශ්වයක් නැහැ. සැකයි කියනවා නම් සිය ගණනක් කියන්න පුළුවන්. ඒත් එහෙම "කියලා වැඩක් නැහැනේ.

"මම දන්න විදියට මගේ වැඩසටහන්වලට ආ සමහරුන්ගෙන් ප්‍රශ්න කරලා තියෙනවා. ඉඩම් වංචාවක් ගැන කතා කරපු අය හෙම කියා තියෙනවා ඔවුන්ගෙන් ප්‍රශ්න කළා කියලා.

"ගෑස් ප්‍රශ්නය උදාහරණයට ගත්තොත් ලිට්‍රෝ සභාපති තෙෂාර ජයසිංහම මම තවම නිදැල්ලේ ඉන්නේ කොහොමද කියලා, වෙන කෙනෙක් අහලා දාපු පෝස්ට් එකක් මමත් ඉන්න ගෲප් එකකට ෂෙයා කළා. ඒත් එවැන්නක් මට අපට සැක කරන්නත් බෑ. ඇත්තටම එහෙම එක් කෙනෙක්ව සැක කරන්න බැහැ."

## සීඅයිඩීයට හෝ සීසීඩීයට නොදෙන්නේ ඇයි?

කෙසේ වෙතත් චමුදිත ඉතා වැදගත් ප්‍රශ්නයක් මතු කළා.

"මේක සීඅයිඩී හෝ සීසීඩී බාර නොගන්නේ මොකද කියන එක ප්‍රශ්නයක්."

සීඅයිඩී හෙවත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හෝ සීසීඩීය හෙවත් කොළඹ අපරාධ කොට්ඨාශය කියන ආයතන දෙකම දුරකථන දත්ත විමසීම සඳහා නිතර දුරකථන සේවා සපයන සමාගම් එක්ක ගනුදෙනු කරන බව නම සඳහන් කිරීමට අකමැති වූ ඉහළ පොලිස් නිලධාරියෙකු පෙන්වා දුන්නා. ඔහු කීවේ ඇතැම් විටෙක යම්කිසි අපරාධයක් නොකළ පුද්ගලයන්ගේ තොරතුරු පවා, ක්ෂණිකව ලබා ගැනීමට එම ආයතනවලට සම්බන්ධතා තිබෙන බව.

ඔහු වැඩිදුරටත් පෙන්වා දුන්නේ සාමාන්‍ය පොලිස් ස්ථානයකින් දුරකථන දත්ත පිළිබඳව කරන විමසීමකදී ලැබෙන ප්‍රතිචාරවලට වඩා සීඅයිඩීය, සීසීඩීය වැනි ආයතනයක් එවැනි දත්ත විමසුවොත් ප්‍රතිචාර ඉක්මනින් ලැබෙන බව.

එතැනින් එහාට අපරාධ පර්යේෂණ කටයුතු සඳහා වඩා පුහුණුවක් ඇති, විශේෂ නිලධාරීන්ගෙන් සමන්විතව තමයි එවැනි ආයතන පැවතිය යුත්තේ. එවැනි ආයතනවල සිටි දක්ෂ නිලධාරීන්ව ඉවත් කොට ආණ්ඩුවට අවශ්‍ය හෙංචයියන් පත් කර නොමැති නම්, බරපතළ සිදුවීම් පිළිබඳ ඔවුන් විමර්ශන කිරීමයි සුදුසු.

ශ්‍රී ලංකාවේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මීට පෙර චමුදිත සමරවික්‍රමත් මැදිහත් වූ සිදුවීමකදී ඇමතිවරයෙකුගේ නමට හානි වුණා කියලා පත්තර කතෘවරුන්වත් ගෙන්වා ප්‍රශ්න කරන්නට ලෑස්ති වුණා. ඒ සුදුලූනු වංචාව පිළිබඳ තුෂාන් ගුණවර්ධන සිදු කළ හෙළිදරව් කිරීම් මාධ්‍යවල පළවීමෙන් පසු එය බන්දුල ගුණවර්ධන අමාත්‍යවරයාගේ 'කීර්තිනාමයට' හානි වුණායැයි සිදු කළ පරීක්ෂණයකට.

## අදහස් ප්‍රකාශනය අපරාධකරණය වීම

ෆෙස්බුක්හි හාස්‍යජනක 'මීම්' එකක් හැදුවා කියා කුරුණෑගල පදිංචි තරුණයෙක් වූ සාලිය කණුගලව ප්‍රශ්න කිරීමට සීඅයිඩීය ගෙන්වුවා. චමුදිත වැඩ කරන අවකාශය වූ යූටියුබ් අවකාශයේම අදහස් පළ කළ සුදත්ත තිලක්සිරි ගැන කවුදෝ ලියූ ලියුමක් මත සීඅයිඩීයෙන් ප්‍රශ්න කරනු ලැබුවා. අදහස් ප්‍රකාශනය හෙවත් 'කතා කිරීමේ වරදට' සීඅයිඩීයෙන් මෑත කාලයේ ප්‍රශ්න කිරීමට ලක්වූ අයගේ ලැයිස්තුව මේ සටහනේ ලීවොත් කෙළවරක් නැති වේවි.

එහෙත් මාධ්‍යවේදී චමුදිත සමරවික්‍රමට එල්ල වූ භයානක තර්ජනය සාලිය කණුගලගේ ෆෙස්බුක් පෝස්ටුව හෝ මෙතැන කී නොකී අදහස් ප්‍රකාශනයන් තරම් භයානක බවක් නොසිතූ නිසාදෝ, චමුදිතගේ පවුල බිය ගැන්වූ සිදුවීම බන්දුල ගුණවර්ධනට චෝදනා එල්ල කිරීමේ සිදුවීම තරම් 'අපරාධයක්' ලෙස නොදැනුණ නිසාදෝ සිදුවීම සම්බන්ධ පරීක්ෂණය ජාතික මට්ටමේ විශේෂ අපරාධ විමර්ශන ඒකකයකට බාර දී නැහැ.

ඇත්තම ප්‍රශ්නය එයයි. මේ ආණ්ඩුව 'වරදක් ලෙස' දකින්නේ අදහස් ප්‍රකාශනය මිසක් අදහස් ප්‍රකාශනයේ අයිතියට එල්ල කෙරෙන තර්ජනයක් නෙවෙයි. කතා කරන අය පසුපස ඉහළම පොලිස් විමර්ශන ආයතනවලින් පැන්නීමත්, අදහස් දැක්වීමෙන් පසු තර්ජනයකට ලක් වූ අය ගැන කොහේ හෝ පොලිස් ස්ථානයකින් මන්දගාමී විමර්ශනයක් සිදු කිරීමත් සම්ප්‍රදාය බවට පත් වෙලා.

## ඇමතිට ඒකත් 'සුළු දෙයක්'

මේ සිදුවීම තමන් 'සුළුකොට තකන' බව පාර්ලිමේන්තුවේදී විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස කළ විමසීමකට පිළිතුරු සපයන අවස්ථාවේදී මහජන ආරක්ෂක අමාත්‍ය සරත් වීරසේකර ඉතා පැහැදිලිව පෙන්වා සිටියා. අප මුලින්ම සඳහන් කළ අමාත්‍යවරයාගේ පුතා මේ සිදුවීම විහිළුවට ගත් ආකාරයත් පැහැදිලියි.

මාධ්‍යවේදීන්ට සිදු වූ තර්ජනවල සිට පැහැරගැනීම්, පහරදීම්, අතුරුදන් කරවීම්, ඝාතන සිදුවීම් බොහොමයක් ශ්‍රී ලංකාවේ නූතන ඉතිහාසය තුළ සිදුව තිබෙනවා. එහෙත්, ප්‍රධාන ධාරාවේ කිසිදු සිදුවීමකට ප්‍රමාණවත් තරම් යුක්තිය ඉටු වී නැහැ. මාධ්‍යවේදී පෝද්දල ජයන්ත පැහැරගෙන ගොස් වධහිංසා කිරීමේ සිදුවීම ප්‍රමුඛව බොහෝ සිදුවීම්වලට හරිහමන් පරීක්ෂණයක්වත් නැහැ. තවත් සිදුවීම් ගැන පරීක්ෂණ පවත්වමින් මහේස්ත්‍රාත් අධිකරණවලට කරුණු වාර්තා කළාට මහාධිකරණයක නඩු ගොනු කිරීමක් නැහැ. මහාධිකරණය දක්වා ගිය යම් සිදුවීමක වරදකරුවන් හඳුනාගෙන දඬුවම් නියම කර නැහැ.

ඇත්තටම මෙවැනි සිදුවීම් ගැන දඬුවම් කරද්දී හුදෙක් අපරාධ වරද සිදු කළ අයව විතරක් සොයා වැඩක් නෑ. මිනීමැරුමක් නම් ඒක සිදු කළ කුලී මිනීමරුවන් ගැන විතරක් සොයා වැඩක් නැහැ. ඒ වාගේම චමුදිතට පහරදීමට පැමිණි අය ගැන විතරක් සොයා වැඩක් නෑ.

ඇත්තටම සොයාගත යුත්තේ එය මෙහෙයවූ කෙනාවයි. කරපු කෙනාව සොයාගන්නත් උනන්දුවක් නොමැති නම්, මෙහෙයවූ අය සොයා ගන්නේ කෙලෙසද?

ඇත්තටම මේ සටහනේ අරමුණ ඩලස් අලහප්පෙරුම නම් වූ ජනමාධ්‍ය අමාත්‍යවරයාගේ ටිකක් 'අන්තගාමී' මතය තහවුරු කිරීම නෙවෙයි. ඒ කියන්නේ මේ ප්‍රහාරය ගැන පරීක්ෂණයක් සිදු නොකෙරුණොත් ආණ්ඩුව සම්බන්ධ බව අනුමාන කරන්න වෙනවා කියා අපි තර්ක කරන්නේ නැහැ. ඒ අනුමානය ඇත්ත වෙන්නත් පුළුවන්, නොවෙන්නත් පුළුවන්.

එහෙත් මෙවැනි සිදුවීම්වලට යුක්තිය ඉටු කරලා ප්‍රකාශනයේ අයිතිය තහවුරු කිරීම වැදගත් රාජකාරියක් ලෙස ඔවුන් නොතකන බව නම් පැහැදිලියි.

**■ තරිඳු උඩුවරගෙදර**

# තොරතුරු ඉල්ලන පුරවැසියාගේ ආරක්ෂාව තහවුරු කළ යුතුයි

තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනතේ මූලික පරමාර්ථය වන්නේ පුරවැසියන් සවිබල ගැන්වීමයි. එමෙන්ම රජයේ වැඩ කිරීමේදී විනිවිධභාවය සහ වගවීම ප්‍රවර්ධනය කිරීම, දූෂණය පාලනය කිරීම සහ ප්‍රජාතන්ත්‍රවාදය ජනතාව වෙනුවෙන් සැබෑ අර්ථයෙන් ක්‍රියාත්මක කිරීමයි. එමෙන්ම පුරවැසියෙකු ලෙස පාලක ක්‍රියාවලින් පිළිබඳ අවදියෙන් සිටීම සහ රාජ්‍ය පාලනය තුළ ඇති වගකීම් වගවීම් ඇති කිරීම සඳහා පුරවැසියන්ට තොරතුරු පනතින් අවකාශය උදා වේ. තොරතුරු පනත රජයේ ක්‍රියාකාරකම් පිළිබඳව පුරවැසියන්ට දැනුම්වත් වීම සඳහා විශාල පිටුබලයකි.

එසේ වුවද දිවයිනේ බොහොමයක් පොදු අධිකාරීන් තොරතුරු දැනගැනීමේ පනතේ ඇති නියමයන්ට අනුව කටයුතු නොකරන බව පසුගිය වසර 04ක පමණ කාලය තුළ විවිධ පොදු අධිකාරීන් වෙත තොරතුරු ඉල්ලීම් 3,300කට අධික ප්‍රමාණයක් ඉදිරිපත් කොට ඇති මෙම ලියුම්කරුගේ අත්දැකීමයි. මෙහිදී මෑතක සිට වර්ධනය වෙමින් පවතින, තොරතුරු පනතේ අරමුණුවලට දැඩි ලෙස හානි කරන ප්‍රවණතාවක් පිළිබඳව අවධානය යොමු කරවීම මෙම ලිපියේ අරමුණයි. එනම් පොදු අධිකාරීන්ගෙන් තොරතුරු ඉල්ලා සිටින පුරවැසියන් විවිධ පාර්ශ්වවල ප්‍රශ්න කිරීම් හා තර්ජනවලට ලක් වීමයි.

### තර්ජන හා ප්‍රශ්න කිරීම්

තොරතුරු ඉල්ලුම් කිරීමේදී මෙන්ම එම තොරතුරු මගින් මාධ්‍ය වාර්තා පළකිරීම හේතුවෙන් මාධ්‍යවේදියෙකු ලෙස මෙම ලියුම්කරුට විවිධ තර්ජන හා යම් ආකාරයක ප්‍රශ්න කිරීම්වලට ලක් වීමට වීමට සිදු වූ අතර එය තොරතුරු පනත භාවිතයේදී ඇති වූ බරපතළ තත්වයකි.

එයට එක් නිදසුනක් ලෙස පොලිස්පති කාර්යාලය හා අදාළ අනෙකුත් පොලිස් අධිකාරී කාර්යාල මගින්, පසුගිය 2020 පාර්ලිමේන්තු මැතිවරණ සමයේ සෞඛ්‍ය අමාත්‍යංශය නිකුත් කරන ලද ගැසට් පත්‍රය ප්‍රකාරව නිසි පරිදි අවසර ගැනීමෙන් තොරව මැතිවරණ ප්‍රචාරක රැලි පැවැත්වූ අවස්ථා හා එහිදී සෞඛ්‍ය මාර්ගෝපදේශ උල්ලංඝනය කිරීම හේතුවෙන් අත්අඩංගුවට ගත් පුද්ගල සංඛ්‍යාව ගැන තොරතුරු විමසීමේදී වවුනියාව පොලිස් අපරාධ පරීක්ෂණ අංශයේ පොලිස් පරීක්ෂක අසංග ඉදුනිල් යන නිලධාරියා 2020 සැප්තැම්බර් 23 දින තොරතුරු ඉල්ලීමට හේතුව ගැන පොලිස් පරීක්ෂණයක් සිදු කළ යුතු බවත් ඒ සඳහා තමන්ට ඉහළ නිලධාරියෙකුගෙන් උපදෙස් ලැබුණු බවත් පවසමින් මගෙන් ප්‍රශ්න කළේය.

### අයදුම්කරුගේ තොරතුරු හෙළි කිරීම

එමෙන්ම 2020 පාර්ලිමේන්තු මැතිවරණ සමයේ සෞඛ්‍ය අමාත්‍යංශය මගින් නිකුත් කරන ලද ගැසට් පත්‍රයට අදාළව අවසර නොගෙන මැතිවරණ ප්‍රචාරක රැලි පැවැත්වූ දේශපාලන පක්ෂ ගැන ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා කාර්යාල

මගින් තොරතුරු විමසීමේදී ප්‍රබල දේශපාලන පක්ෂයක හම්බන්තොට සම්බන්ධීකරණ නිලධාරියෙක් තම දේශපාලන පක්ෂයට අදාළව තොරතුරු රැස් කරන්නේ කුමන කාරණාවකට යන්න අවස්ථා කීපයකදී මගෙන් දුරකතනය ඔස්සේ ප්‍රශ්න කළේය. පසුව දැනගැනීමට ලැබුණේ මගේ තොරතුරු අයදුම්පත පිළිබඳ විස්තර හා මගේ තොරතුරු ඔහුට ලබාදී ඇත්තේ තොරතුරු අයදුම්පත යොමු කළ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා කාර්යාලක නිලධාරියෙකු බවයි.

විශේෂයෙන්ම රටේ සිදුවන දූෂණ වංචා මෙන්ම පරිසර විනාශයන් සම්බන්ධයෙන් තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ තොරතුරු විමසීමේදී මේ ආකාරයෙන් අදාළ පොදු අධිකාරීන් තුළ සිටින නිලධාරීන් විසින් තොරතුරු ඉල්ලුම්කරුගේ තොරතුරු එම වංචාව හෝ පරිසර විනාශය සිදු කරන පුද්ගලයින්ට ලබාදීම තොරතුරු ඉල්ලුම්කරුගේ ජීවිතයට තර්ජනයකි.

මේ ආකාරයෙන්ම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මගින් වැලි කැණීම් සම්බන්ධයෙන් බලපත්‍ර නිකුත් කිරීම් ගැන මා තොරතුරු ඉල්ලා සිටි අවස්ථා කීපයකදීම අම්බලන්තොට කාර්යාලයේ නිලධාරියෙකු මගේ තොරතුරු අදාළ වැලි ජාවාරම්කරුවන්ට ලබා දී තිබුණි. පසුව අදාළ වැලි ජාවාරම්කරුවන් මාගේ නිවසට අවස්ථා කීපයකදීම පැමිණ තමන්ගේ වැලි කැණීම ගැන තොරතුරු හෙළි නොකරන ලෙස මගෙන් ඉල්ලා සිටි අතර එය මගේ වෘත්තීය නිදහසට මෙන්ම ජීවිතයටද එල්ල වූ තර්ජනයකි.

එමෙන්ම වීරකැටිය කසාගල ප්‍රදේශයේ විහාර භූමියක සිදු කරන නීති විරෝධී වැලි කැණීම සම්බන්ධයෙන් 20222 ජනවාරි මාසයේදී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මගින් තොරතුරු ඉල්ලා සිටි අවස්ථාවකදී අදාළ වැලි කැණීමට ආධාර උපකාර කරන ලංකාවේ ප්‍රබල දේශපාලඥයෙකුගේ ආරක්ෂක නිලධාරියෙකුට අදාළ පොදු අධිකාරියේ ඉහළ නිලධාරියෙකු විසින් මාගේ තොරතුරු ලබාදී පසුව වෙනත් පුද්ගලයෙකු ලවා අදාළ තොරතුරු ඉල්ලීමට හේතුව විමසීම මෙන්ම භික්ෂූන් වහන්සේ නමක් නිවසට පැමිණ එම පුවත පළ නොකරන ලෙස මාගෙන් ඉල්ලා සිටීමද ඉහත තත්ත්වයට තවත් උදාහරණයි.

මේ ආකාරයෙන්ම කුඹුරු ඉඩම්වල නීති විරෝධී වැලි කැණීම් සඳහා අවසර ලබාදීම සම්බන්ධයෙන් මා විසින් තොරතුරු දැනගැනීමේ අයිතිය මගින් දිගින් දිගටම තොරතුරු ලබාගනිමින් මාධ්‍ය වාර්තා ගණනාවක් පළ කළ අතර එහිදී අවස්ථා කීපයකදී හම්බන්තොට ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලයේ නිලධාරියෙකු අදාළ වැලි කැණීමට තමන් විරුද්ධ නොමැති බවත් ඒවා මාධ්‍යවල දැමීම ප්‍රබල ප්‍රශ්නයක් බවත් පවසමින් මගේ විස්තර අදාළ වැලි කැණීම් සිදු කරන පුද්ගලයින්ට ලබා දී තිබේ. මෙම තත්ත්වය මාධ්‍ය නිදහසට පමණක් නොව තොරතුරු පනත මගින් අපේක්ෂිත අරමුණුවලටද බරපතළ තර්ජනයකි.

එම නිසා තොරතුරු ඉල්ලුම්කරුවන්ගේ අයිතීන් ආරක්ෂා කරමින් ඊට පටහැනිව කටයුතු කරන රාජ්‍ය නිලධාරීන්ට විරුද්ධව නීතිමය පියවර ගැනීමට විධිවිධාන සැලසීම දැඩි අවශ්‍යතාවකි.

■ **රාහුල් සමන්ත හෙට්ටිආරච්චි**

# ජනමාධ්‍යයට එරෙහි ප්‍රචණ්ඩත්වය හා නීතියේ ගොළුවත

ත්‍රිකුණාමලය කින්නියා කුරුඤ්ඤංකර්නි කලපුවේ ඉකුත් නොවැම්බරයේ පාලම්පාරුවක් පෙරළී එහි ගමන් ගත් මගීන් හත් දෙනකු මියයෑමේ සිද්ධියට මේ වන විටත් මාස තුනක් ගත වී හමාරය. කුරුංඥන්කේනිහිදී සිදු වූ එම සිද්ධිය සහ එම අනතුරත් සමග කින්නියා ප්‍රදේශයේ ඇති වූ නොසන්සුන්කාරී තත්ත්වය වාර්තා කිරීමේ යෙදුණු මාධ්‍යවේදීන් ඉලක්ක කර ගනිමින් එල්ල වූ ප්‍රහාරය හා ඔවුන්ගේ උපකරණ උදුරා ගැනීම සම්බන්දයෙන් මේ වන තුරුත් නීතිය හරිහැටි ක්‍රියාත්මක වීමක් හෝ පහර කෑමට හා හිරිහැරයට ලක් වූ මාධ්‍යවේදීන්ට නීතියේ සාධාරණය ඉටු වීමක් හෝ නොවුන බව පහර කෑමට ලක් වූ මාධ්‍යවේදීයකු වන ඒ.එල්. රෆයිදීන් පවසයි.

ඒ හැරුණු විට මාධ්‍යවේදීන්ට එරෙහිව කින්නියාවේ දී සිදු වූ මෙම ප්‍රහාරයට මේ වන විට මාස තුනක් ගත වී ඇතත්, මේ වන තෙක් කිසිදු සැකකරුවකු අත්ඩංගුවට ගැනීමට කින්නියා පොලිසිය සමත් වී නැති බව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මාධ්‍යවේදීන්ගේ සංගමයේ ලේකම් ඒ.එම්. සාලි පෙන්වා දෙයි. රටක හතරවන ආණ්ඩුව ලෙස සැලකෙන මාධ්‍ය අරභයාද, නීතියේ ක්‍රියාකාරීත්වය එබඳු නම්, රටේ සාමාන්‍ය මහජනතාව කෙරෙහි නීතියේ සාධාරණත්වය කෙබඳු දැයි විමසා බැලීම වටී. මාධ්‍යවේදීන් ඉලක්ක කර ගනිමින් ප්‍රහාර එල්ලවීම අපට අලුත් අත්දැකීමක් නොවුණද, මේ වන විට එහි යම් ප්‍රමාණාත්මක වර්ධනයක් සිදුව ඇති බව පෙනේ. විශේෂයෙන් මේ වසරේ ජනවාරියේ සිට මේ දක්වා එවැනි සිදුවීම් රැසක්ම මුලතිව්, හලාවත, හම්බන්තොට, මඩකලපුව, කුරුණෑගල, කොළඹ වැනි ප්‍රදේශ ප්‍රදේශවලින් වාර්තා වී ඇති බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විසින් නිකුත් කරනු ලබන මාසික වාර්තාව මගින් හෙළිදරව් වේ.

**පොලිස් පරීක්ෂණවල දුර්වලතා**

ජනමාධ්‍යවේදීන්ට එරෙහිව සිදු වන මෙවැනි පහරදීම් හා අකටයුතුකම් සම්බන්ධයෙන් පොලිස් පරීක්ෂණයන්හි පවතින දුර්වලතා සහ මන්දගාමීත්වය එම තත්ත්වය වර්ධනයෙහිලා තීරණාත්මක සාධකය වී ඇති බව ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදියෙකු වන මොහාන් සමරවික්‍රම මහතාගේ අදහසයි. කලකට පෙර දෙපානම පිහිටි සිරස ආයතනයට පහරදීම මෙන්ම මෑතකදී මාධ්‍යවේදී චමුදිත සමරවික්‍රමගේ නිවසට එල්ල වූ ප්‍රහාරයද මීට කදිම නිදසුන් ලෙස දැක්විය හැකිය. ඉතාමත් සංවෘත වටපිටාවක සිදු වූ මෙම සිදුවීම් සම්බන්ධයෙන් සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට පොලිසිය කටයුතු නොකිරීම කනගාටුදායක මෙන්ම බරපතළ තත්ත්වයක් බව මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනයේ ප්‍රධාන ලේකම් ධර්මසිරි ලංකාපේලි කියාසිටී. ඔහු පෙන්වා දෙන අන්දමට ජනමාධ්‍ය අමාත්‍යවරයා මෙන්ම ප්‍රවෘත්ති දෙපාර්මේන්තුවද මෙවැනි තත්ත්වයන් නැවැත්වීමට වහා මැදිහත් විය යුතුය. කින්නියා කුරුඤ්ඤංකර්නි ප්‍රහාරයේ සැකකරුවන් මෙතෙක් අත්අඩංගුවට නොගැනීමද මෙහි තවත් නිදසුනක් බව ඔහු පෙන්වා දෙයි.

කින්නියා ප්‍රදේශයේ සිදු වූ ආපදා තත්ත්වය සහ අනෙකුත් සිදුවීම් ආවරණය කරමින් සිටියදී මෙසේ හිරිහැරයට ලක්වූයේ, කුණාමලය රොටවැව ප්‍රදේශයේ පදිංචි අබ්දුල් සලාම් යාෂීන්, ත්‍රිකුණාමලය ජමාලියාහි පදිංචි ඒ.එල්.එම්.

රෆයිදීන්, කින්නියා පදිංචි හයාතු මොහොමදු හලාල්දීන් යන ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ය. මේ අතරින් අබ්දුල් සලාම් යාෂීන් දැඩි පහර කෑමට ලක් වූ අතර, ඔහුගේ වටිනා ජංගම දුරකථනයක්ද එහිදී කලහකාරීන් විසින් උදුරා ගෙන තිබුණි.

## කින්නියා සිදුවීමේ නිරීක්ෂණ

අබ්දුල් සලාම් යාෂීන් කියන අන්දමට කින්නියා ප්‍රදේශයේදී ඔහුට එල්ල වූ ප්‍රහාරය සම්බන්ධයෙන් එදිනම එනම් 2021/11/23 වන දින සීඅයිබී (1) 10/291 දරන යොමු අංකය යටතේ කින්නියා පොලිසියට පැමිණිලි කර තිබේ. මෙම සිද්ධිය සිදු වී මේ වන විට මාස තුනක් පමණ ගතවී ඇතත්, කින්නියා පොලිසිය මේ සම්බන්ධයෙන් සාධනීය පියවරක් ගෙන නොමැති බව යාෂීන් වැඩිදුරටත් කියා සිටී.

"මම එදා ඒ සිද්ධිය වාර්තා කරන්න කින්නියා නගරයට ගිය අවස්ථාවේ එක්තරා පිරිසක් කෑකෝ ගසමින් විරෝධතා දක්වමින් කුරුඤ්ඤංකර්නි ඉදලා කින්නියා පැත්තට එමින් හිටියා. මම ඒක ඡායාරූපගත කළා. ඒක දැකපු ඒ පිරිස මට හොදටම පහර දීලා මගේ ජංගම දුරකථන දෙක උදුර ගත්තා. ඒ වෙලාවේ, මම දන්න හදුනන තරුණයෙකුත් එතන හිටියා. එයා මැදිහත්වෙලා එක දුරකථනයක් ලබා දුන්නත්, අනිත් එක එයාලා අරන් යන්න ගියා. මම මේ සම්බන්දයෙන් කින්නියා පොලිසියට පැමිණිලි කළත්, මේ වන තුරුම කිසිදු සැකකරුවෙකු අත්අඩංගුවට ගන්න පොලිසියට හැකි වෙලා නැහැ.. අනික මම කරපු පැමිණිල්ලට මේ වන තුරුත් කින්නියා පොලිසියෙන් කිසිම ප්‍රතිචාරයක් නෑ.."

අබ්දුල් සලාම් යාෂීන් කියන අන්දමට කලහකාරීන් විසින් පැහැර ගත් තම ජංගම දුරකථනය රුපියල් 60,000ක් පමණ වටිනා ස්මාට් වර්ගයේ දුරකථනයකි. යාෂීන්ට පහර දුන් සහ ඔහුගේ ජංගම දුරකථනය පැහැර ගත් අය අත්අඩංගුවට ගැනීමට කින්නියා පොලිසිය අසමත් වුවද, කින්නියා රෝහලට, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට සහ පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.එස්. තව්ෆික්ගේ නිවසට පහර දුන් අය කෙටි කාලයක් තුළ අත්අඩංගුවට ගැනීමට කින්නියා පොලිසිය සමත් වී තිබේ.

මාධ්‍යවේදීන්ට තම වෘත්තිය ශාරීරික සහ මානසික ඒකාග්‍රතාවයකින් යුක්තව නිදහස්ව කරගෙන යෑමේ වාතාවරණයක් පැවතීම ජනමාධ්‍ය නිදහස පිළිබඳ මූලික කොන්දේසියකි. එබඳු තත්ත්වයක් තුළ මාධ්‍යවේදීන්ට එරෙහිව මෙම පහරදීම සිදු වන්නේ, දෙනෝ දහසක් ගැවසෙන නගරයක් මධ්‍යයෙහිදී ජනතාව අතරින්ම වීම විශේෂත්වයකි. මෙම පහරදීම සිදු වන අවස්ථාවේ, නිල ඇදුමෙන් සැරසුණු පොලිස් නිලධාරීන් මෙන්ම සිවිල් ඇදුමෙන් සැරසුණු බුද්ධි අංශ නිලධාරීන් රැසක්ද එහි රැඳී සිටි ඇති නමුත්, ඔවුන් එම තත්ත්වය වැළැක්වීමට හෝ පාලනය කිරීමට කටයුතු නොකළ බව පහර කෑමට ලක් වූ අබ්දුල් සලාම් යාෂීන් කියා සිටී.

"ඇත්තටම ඒ වෙලාවේ සිවිල් ඇඳුමෙන් සැරසුණු පොලිස් බුද්ධි අංශයේ අය ගොඩක් ඒ අවට හිටියා. ඒ අය තමා රෝහලටයි මන්ත්‍රීතුමාගේ ගෙදරටයි පහර දීපු අයව හඳුනා ගත්තේ. ඒ පහරදීම් කරපු අයම තමා අපේ සිද්ධියටත් සම්බන්ධ. නමුත්, මාධ්‍යවේදීන්ට පහරදීපු අය හොයන්න පොලිසියේ උනන්දුවක් නොතිබුණු තරම්.."

## පැමිණිලි නොකළ සිදුවීම්

ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මාධ්‍යවේදී සංගමයේ හිටපු ලේකම්වරයෙකු වූ ඒ.එල්.එම්. රෆයිදීන් මහතා කියන්නේ, තමා ගමන් ගත් රථයට පහර දෙන දර්ශන පවා සමාජ මාධ්‍ය තුළ සංසරණය වී තිබියදී කින්නියා පොලිසියට සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට නොහැකි වීම බරපතළ ගැටලුවක් බවයි. කලහකාරීන් තමාට පහර දීමට පැමිණෙන දර්ශන පවා රෆයිදීන් විසින් සමාජ මාධ්‍යට පවා මුදා හැර තිබුණි. එහෙත්, රෆයිදීන් තමාට සිදු වූ හිරිහැර කිරීම සම්බන්දයෙන් පොලිසියට පැමිණිලි නොකිරීමද මෙහිදී කැපී පෙනේ. ඒ පහරදීමේ සිද්ධිය සිදු වන අවස්ථාවේ, ඔහු සමග සිටි මව්ලවිවරයාගේ බලවත් ඉල්ලීම හේතුවෙනි.

"මම මේ සිද්ධිය වාර්තා කිරීමට ගියේ, මගේ හිතවතෙකුගේ මෝටර් රථයෙන්. එයා වාහනේ ඩ්‍රයිව් කරද්දී, මම ෆෝන් එකෙන් විඩියෝ කරා. ඒක දැකපු පිරිසක් අපේ කාර් එක නවත්තලා මගේ බෙල්ලෙන් අල්ලලා තද කරලා ෆෝන් එක උදුර ගත්තා. හැබැයි, මම එයාලට මගේ මාධ්‍ය හැඳුනුම්පත පෙන්නලා මම මාධ්‍යවේදියෙක් කියලා කිව්වහම ෆෝන් එක ආපසු දුන්නා. ඔය වෙලාවේ තව පිරිසක් අපේ වාහනේටත් පහර දුන්නා. හැබැයි, ඒ වෙලාවෙම පොලිසිය එතනට ආව නිසා ඒ පිරිස අපිව දාලා ගියා."

රංගයිදීන් කියන අන්දමට වාහනයේ හිමිකරු වූ මව්ලව්, එම ගැටලුව වැඩිදුරටත් සමාජයට නිරාවරණය කිරීමට තිබූ අකමැත්ත හේතුවෙන් පොලිසියට පැමිණිලි කිරීම අතපසු කර ඇති බව පෙනේ. එහෙත්, රංගයිදීන්ට පහර දීමට පැමිණෙන හා පහර දීමේ මුල් අවස්ථාව ඔහු විසින්ම සමාජ මාධ්‍ය ජාලාවලට නිකුත් කර තිබුණු අතර, පොලිසියට අවශ්‍යතාවයක් තිබුණේ නම්, එම දර්ශන උපයෝගි කර ගනිමින් සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට හැකියාව තිබූ බව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මාධ්‍යවේදීන්ගේ සංගමයේ ලේකම් ඒ.එම්. සාලි ගේ අදහසයි.

මෙම සිද්ධියේදී පහර කෑමට ලක් වූ හයාතු මොහොමදු හලාල්දීන් කින්නියා ප්‍රදේශයේම ප්‍රකට මාධ්‍යවේදියෙකි. හලාල්දීන්ද තමාට සිදු වූ පහරදීම් සම්බන්දයෙන් පොලිසියට පැමිණිලි නොකිරීමට වග බලා ගෙන ඇති අතර, මාධ්‍යවේදීන්ගේම එම හැසිරීම සමස්ත මාධ්‍ය සමාජයම හෑල්ලුවට ලක් කරවන බව මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ "රට වටා ජනමාධ්‍යවේදියෝ" සංවිධානයේ ජාතික සංවිධායක ජුඩ් සමන්තගේ අදහසයි. ජුඩ් සමන්ත කියන්නේ මාධ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් කිසිදු දැනුමක් හෝ සුදුසුකමක් නොමැති අය මාධ්‍යවේදීන් වූ පසු මෙවැනි නිවට නියාලු තත්ත්වයන් ඇති වීම පුදුමයක් නොවන බවයි. වෘත්තිය මාධ්‍යවේදියෙකුට මෙවනි අවස්ථාවකදී කටයුතු කරන ආකාරය සම්බන්ධයෙන් දැනුමක් සහ අවබෝධයක් ඇතත්, නුපුහුණු මාධ්‍යවේදියෙකු එවැනි තත්ත්වයකට මුහුණ දීමේ දී මෙවැනි අවසනාවන්ත තත්ත්වයන් නොවැළැක්විය හැකි බව ජුඩ් සමන්ත අවධාරණය කරයි. එසේම මාධ්‍යවේදියෙකු මෙවැනි අවස්ථාවකදී තම ජනවර්ගය හෝ දේශපාලන රුචිකත්වය මුල් කර ගනිමින් ඊට එරෙහිව කටයුතු කිරීමට මැළිකමක් දක්වන්නේ, මාධ්‍ය ක්ෂේත්‍රයේ ගෞරවණීයත්වය සම්බන්ධයෙන් පවතින අල්ප දැනුම හේතු කොට ගෙන බව හෙතෙම කියා සිටී.

## මාධ්‍යවේදීන්ගේ වගකීම

රජයේ ප්‍රවෘත්ති දෙපාර්මේන්තුවේ හිටපු ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී ආචාර්ය රංග කලංසූරියද මේ සම්බන්ධයෙන් දක්වන්නේ ඊට සමාන අදහසකි. ඔහු පෙන්වා දෙන්නේ, මෙවැනි ආපදා හා කලහකාරී අවස්ථාවකදී මාධ්‍යවේදියකු තම වාර්තාකරණය සම්බන්ධයෙන් මීට වඩා සැලකිලිමත් විය යුතු බවයි. විවිධ තත්ත්වයන් යටතේ වාර්තාකරණය සම්බන්ධයෙන් මාධ්‍යවේදීන් පුහුණුවක් ලැබිය යුතු අතර එසේ නොවන මාධ්‍යවේදීන් අවදානමකට මුහුණ දෙන අවස්ථා වැඩි බවයි.

ආචාර්ය රංග කලංසූරිය පෙන්වා දෙන්නේ, මෙය ජනතාවගේ තොරතුරු දැන ගැනීමේ අයිතියට එල්ල කළ ප්‍රහාරයක් වන නමුදු, පුහුණු සහ අත්දැකීම් සහිත මාධ්‍යවේදියකු මෙවැනි තත්වයන් කළමනාකරණය කර ගැනීමට සමත් වන බවයි. කිසිදු ප්‍රවෘත්තියක් තම ජීවිතය තරම් නොවටිනා බව හැම විටම සිහියේ තබා ගෙන තැනට සුදුසු නුවණින් කටයුතු කිරීම වෘත්තිය මාධ්‍යවේදියෙකුගේ මූලික ලක්ෂණය බව හෙතෙම අවධාරණය කර සිටී.

පාලම් පාරුව පෙරළී යෑමෙන් පසු කින්නියා ප්‍රදේශයේ ඇති වූ සිදුවීම් හුදෙකලා හෝ අහඹු සිදුවීම් නොවන බව පැහැදිලිය. මන්ද මෙම හදිසි ඒකරාශී වීමට කින්නියා ප්‍රදේශයේ බහුතරයකගේ සහාය ලැබී නොතිබුණි. ජනතාවගේ තොරතුරු දැන ගැනීමට තිබෙන අයිතියට බාධා කිරීම මෙන්ම එය වාර්තා කළ මාධ්‍යවේදීන්ට හිරිහැර කිරීම සම්බන්දයෙන් තමා බෙහෙවින් කනගාටුවට සහ ලැජ්ජාවට පත් වන බව කින්නියා සූරා සභාවේ සහකාර ලේකම් එම්.එස්.එම්. නියාස් පැවසුවේය. කින්නියාවේදී මාධ්‍යවේදීන්ට පහර දුන් පිරිස පිටුපස ක්‍රියාත්මක වූ බලවේගය කවුරුන්ද යන්න වහා හෙළි කර ගත යුතු බව හෙතෙම කියා සිටී.

## ජාත්‍යන්තරව පිළිගත් අයිතියක්

1948 වසරේ දෙසැම්බර් මස 10 වන දින සම්මත කළ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 19 වන වගන්තියෙන්ද භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස පිළිබඳ පුළුල් අර්ථකථනයක් සපයා දී ඇති බවත්, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ද එම අයිතීන් මෙන්ම ජනතාවගේ තොරුතුරු දැන ගැනීමේ අයිතියද තහවුරු කර ඇති පසුබිමක මෙම සිද්ධියට පාත්‍ර වූ ජනමාධ්‍යවේදීන්ට සාධාරණය ඉෂ්ඨ නොවීම නැවත නැවතත් විමසා බැලිය යුතු බවත් නියාස්ගේ අදහසයි. ඔහු සූරා සභාවේ නියෝජිතයෙකු වන අතර වෘත්තියෙන් ත්‍රිකුණාමලය මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ටාර්වරයෙකු ලෙසද කටයුතු කරන්නෙකි.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් විශ්ව ප්‍රකාශනයේ 1.1.1. 19 වන වගන්තියට අනුව "තම නිදහස් මත දැරීමට හා ප්‍රකාශ කිරීමට සෑම පුද්ගලයෙකුටම අයිතියක් ඇත. අනුන්ගේ බාධා කිරීම්වලින් තොරව තම මතය දැරීමේ, දේශ සීමා නොසලකා කවර මාධ්‍යකින් හෝ තොරතුරු සෙවීමේ, ලබා ගැනීමේ හා බෙදා හැරීමේ නිදහස මෙම වගන්තිය මගින් තහවුරු කර ඇති බව නියාස් පෙන්වා දෙයි.

එක්සත් ජාතීන්ගේ මණ්ඩලය 1966 වසරේදී සම්මත කර ගන්නා ලද එක්සත් ජාතීන්ගේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට ශ්‍රී ලංකා රජය 1980 වසරේදී අත්සන් කොට එය බලාත්මක කිරීමේ වගකීම භාර ගෙන තිබේ. ඊට අමතරව 1997 වසරේදී මෙම සම්මුතියේ වෛකල්පිත කෙටුම්පත 10 අත්සන් තබා එය පිළිගැනීමට තීරණය කර ඇති අතර, ඒ මගින් "සෑම අයෙකුටම තමන් කැමති මතයක් දැරීමේ පූර්ණ අයිතියක් සහ තොරතුරු ලබා ගැනීම හෝ බෙදාහැරීම බාධාවකින් තොරව සිදු කිරීමට හිමිකමක් ඇත." යනුවෙන් ඉතාමත් පැහැදිලිව අර්ථකථනය කර තිබේ.

## නීතිය ක්‍රියාත්මක නොවීම

කින්නියා පාලම්පාරුව පෙරළී යෑමේ සිද්ධිය සහ අනතුරුව ඇති වූ සිදුවීම් වාර්තා කිරීමේ යෙදුණු මාධ්‍යවේදීන්ට හිරිහැර සිදුවීම ඉහත නියමයන් පැහැදිලිවම උල්ලංගනය කිරීමක් ලෙස දැක්විය හැකිය. එම තත්වයන් වැළැක්වීමට කටයුතු නොකිරීම මෙන්ම ඊට සම්බන්ධ අයට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද කිරීම හා එම තත්ත්වයන් නොසලකා හැරීම නීතිය ඉදිරියේ සියලු දෙනා සමානය යන නියමය උල්ලංගනය වීමක් බව කැලණිය විශ්වවිද්‍යාලයේ ජනමාධ්‍ය නීතිය පිළිබඳ බාහිර කථිකාචාර්ය නීතිඥ ජගත් ලියනආරච්චි පෙන්වා දෙයි. ජාතික මාධ්‍ය මධ්‍යස්ථානයේ හිටපු අධ්‍යක්ෂවරයෙකුද වන නීතිඥ ජගත් ලියනආරච්චි, කින්නියා සිද්ධියේදී හිරිහැරයට ලක් වූ මාධ්‍යවේදීන් වෙනුවෙන් මෙතෙක් නීතිය හරිහැටි ක්‍රියාත්මක නොවීම පිළිබඳ අදහස් දක්වමින් මෙසේද කියා සිටියේය.

"මාධ්‍යවේදීන්ට නිවැරැදි තොරතුරු ලබා ගැනීමට හැකියාව ලැබුණොත් පමණයි, ජනතාවට නිවැරැදි තොරතුරු දැන ගැනීමට අවස්ථාව හිමි වෙන්නේ. සාමාන්‍යයෙන් මේ වගේ බාධා කිරීම් සිදු වෙන්නේ, රාජ්‍ය හෝ දේශපාලන යාන්ත්‍රණයෙන්. නමුත් මේ කින්නියා ප්‍රශ්නය ගත්තොත්, ඒක සිද්ධවෙලා තියෙන්නේ, ජනතාව අතරින්මයි. ඒක හරිම කනගාටුදායක තත්වයක්. මේ මාධ්‍යවේදීන් හිරිහැරයට ලක් වෙන්නේ, ජනතාව වෙනුවෙන් ඔවුන්ගේ වගකීම ඉටු කරමින් සිටියදීයි. මේ සිද්ධියේදී මාධ්‍යවේදීන්ට තොරතුරු ලබා ගැනීමට බාධා කිරීම මෙන්ම ඒ තුළින් ජනතාවට තොරතුරු ලබා ගැනීමට තිබෙන අයිතිය උල්ලංගනයවීම යන කාරණා දෙකම මානව හිමිකම් උල්ලංගනය වීම් ලෙස අර්ථ ගැන්විය හැකි වෙනවා. එසේම මාධ්‍යවේදීන්ට පහර දුන් පිරිස් අත්අඩංගුවට නොගැනීම, නීතිය ඉදිරියේ මාධ්‍යවේදීන්ට සමාන රැකවරණය නොලැබී යෑමක් ලෙසයි මා දකින්නේ.."

ජනමාධ්‍යවේදියෙකුට සිය වෘත්තීය කටයුතු නිදහසේ සිදු කර ගෙන යෑමට සුදුසු වාතාවරණයක් රට තුළ නොමැතිකම සම්බන්ධයෙන්ද රජය වගකිව යුතු සේම, මාධ්‍යවේදීන් අරභයා කින්නියා පොලිසිය "වෙනස් කොට සැලකීම" විමසා බැලිය යුතු කාරණයක් බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ කැඳවුම්කරු මාධ්‍යවේදී ලසන්ත ද සිල්වාගේ අදහසයි.

"ජනමාධ්‍යවේදියා ජනතාවගේ තොරතුරු දැනගැනීමේ අයිතිය උදෙසා කටයුතු කිරීමේදී සිදු වන මෙවැනි හිරිහැර සඳහා පවතින තත්වයන් තුළ පවා නීතිය නිසි ආකාරයෙන් ක්‍රියාත්මක කළ හැකියි. නමුත්, මෙහිදී මාධ්‍යවේදීන්ට නීතිය වෙනස් කොට සැලකීම ඔවුන්ගේ මානව හිමිකම් උල්ලංඝනය වීමක් හැටියටයි අපි දකින්නේ. මාධ්‍යවේදීන්ට පහරදීම නොසලකා හරින්නට කින්නියා පොලිසියට සදාචාරාත්මක අයිතියක් නැහැ. මේක රාත්‍රී කාලයේ හොර රහසේ සිදු වූ පහරදීමක් නෙවෙයි. මහ දවල් විශාල පිරිසක් ඉදිරියේ ප්‍රසිද්ධියේ සිදු වූ මෙම පහරදීමට සම්බන්ධ සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට නොහැකි වුණා කියලා කියන්න කින්නියා පොලිසිය ලැජ්ජා විය යුතුයි.." ලසන්ත ද සිල්වා වැඩිදුරටත් අවධාරණය කර සිටී.

කින්නියාවේදී මාධ්‍යවේදීන් කිහිපදෙනෙකුට පහරදීමේ හා ඔවුන්ගේ ජංගම දුරකථන පැහැර ගැනීමේ සිද්ධිය හෙළාදකිමින් මාධ්‍ය නිවේදනයක් නිකුත් කළ නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කර සිටියේද, මේ සම්බන්ධයෙන් වහා සාධාරණ හා අපක්ෂපාති විමර්ශනයක් සිදු කර වගකිවයුත්තනන් නීතිය හමුවට පමුණුවන ලෙසත්, අගතියට ලක් වූ මාධ්‍යවේදීන් වෙනුවෙන් සාධාරණය ඉෂ්ඨ කරන ලෙසත්ය.

### මානව හිමිකම් කොමිසමේ දැනුම්දීම

නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විසින් නිකුත් කළ එම මාධ්‍ය නිවේදනය පදනම් කර ගනිමින්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමද 2021.11.26 වන දින කින්නියා පොලිසියට දැනුම් දී ඇත්තේ, 2021 නොවැම්බර් මස 23 දින කින්නියා ප්‍රදේශයේ පාලම්පාරුවක් පෙරළී යෑමෙන් සිදු වූ අනතුර වාර්තා කිරීමට ගිය මාධ්‍යවේදීන් තිදෙනාට පහරදීම හා මාධ්‍ය වාර්තාකරණයට බාධා කිරීම සම්බන්ධයෙන් ගෙන ඇති පියවර හා ඉදිරියේදී ගැනීමට නියමිත පියවර පිළිබඳව සවිස්තර වාර්තාවක් 2021.12.10 වන දිනට ප්‍රථම තම ආයතනයට ලබා දෙන ලෙසයි.

ජනමාධ්‍යවේදීන් සඳහා රජයේ ප්‍රවෘත්ති දෙපාර්මේන්තුව විසින් නිකුත් කරනු ලබන මාධ්‍ය හැඳුනුම්පතෙහි ‘මෙම හැඳුනුම්පත හිමි ජනමාධ්‍යවේදියාට සිය වෘත්තීය කටයුතු බාධාවකින් තොරව ඉටු කිරීමට සහයෝගය ලබා දෙන ලෙස’ සඳහන් කර ඇතත්, මෙතෙක් එම බාධා කිරීම් අරබයා රජය වැඩි සැලකිල්ලක් නොදැක්වීම කනගාටුවට කරුණක් බව මාධ්‍ය සේවක වෘත්තීය සංගමයේ ප්‍රධාන ලේකම් ධර්මසිරි ලංකාපේලි කියා සිටී. එවැනි සංස්කෘතියක් අප රටේ ක්‍රියාත්මක වන්නේ නම්, මෙවැනි අවසනාවන්ත තත්ත්වයන් ඇති නොවීමට ඉඩ තිබුණු බව හෙතෙම වැඩිදුරටත් පැවසුවේය.

“ජනමාධ්‍යවේදියා දරන මේ හැඳුනුම්පත, රජය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් ලෙස සලකන්න පුළුවන්. නමුත්, කිසිදු අවස්ථාවක මේ හැඳුනුම්පත සම්බන්ධයෙන් කිසිදු පාර්ශ්වයක් සැලකිල්ලක් දක්වන බවක් දකින්නට නැහැ. අපි රජයට, ජනමාධ්‍ය අමාත්‍යවරයාට බල කර කියා සිටින්නේ, වහා මෙම තත්ත්වය වෙනස් කිරීමට කටයුතු කරන ලෙසයි.”

### පොලිසියේ ප්‍රතිචාරය

කින්නියා පාලම්පාරුව පෙරළීමෙන් පසු ඇති වූ තත්වයන් ආවරණය කරමින් සිටියදී, ජනමාධ්‍යවේදීන් පහර කෑමට හා විවිධ හිරිහැරවලට ලක් වීම පිළිබඳ පැමිණිල්ල සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද යන්න අප කින්නියා පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක චමින්ද ප්‍රනාන්දුගෙන් විමසුවෙමු.

“අපි මේ සිද්ධිය සම්බන්ධයෙන් තවදුරටත් පුළුල්ව පරීක්ෂණ කටයුතු සිදු කරමින් සිටිනවා. අපි මේ කියන සිද්ධිය සම්බන්ධයෙන් විවිධ තොරතුරු ඔස්සේ, පුද්ගලයන් සිව් දෙනකුගෙන් ප්‍රශ්න කර සිටියත්, ඔවුන්ව අත්අඩංගුවට ගැනීමට පැහැදිලි සාක්ෂි නොමැතිකම හේතුවෙන් මුදා හැරීමට සිදු වුණා. පැහැරගත් බව කියන ජංගම දුරකථනය පිළිබඳව විදුලි සංදේශ නියාමන කොමිසමට දැනුම් දී ඒ සම්බන්ධයෙන් වාර්තාවක් ඉල්ලා තිබෙනවා. අපි මේ ගැන තව දුරටත් පරීක්ෂණ සිදුකරමින් සිටින බව කියන්න ඕනේ..”

යම් කිසි අපරාධයක් සිදු කර ඊට දඬුවම් නොලබා සිටීම හෙවත් ‘දණ්ඩ මුක්තිය’ තුළින් අපරාධකරු තව තවත් එවැනි ක්‍රියා සඳහා යොමු වීම සාමාන්‍ය තත්ත්වයකි. බොහෝ විට මෙවැනි පහරදීම් හා හිරිහැර පුද්ගල උවමනාව මත සිදු නොවන බව රහසක් නොවේ. වෙනත් බලවේගයන්හි අවශ්‍යතාව මත මෙම කටයුතු සඳහා බොහෝ විට යොමු වන්නේ, නිසි අධ්‍යාපනයක් නොලද හා අපරාධ රැසකට සම්බන්ධ පිරිස්ය. ඔවුන්ට දණ්ඩ මුක්තිය ලැබීම තව තවත් අපරාධ රැසකට මුල පිරීමක් බව ජනමාධ්‍යවේදීන්ගේ අදහසයි.

### දේශපාලන හස්තයක්?

කින්නියා පාලම්පාරු අනතුර හා ඉන් පසුව ඇති වූ තත්ත්වයන් වාර්තාකරමින් සිටි මාධ්‍යවේදීන්ට එල්ල වූ ප්‍රහාරය හුදෙකලා සිදුවීමක් නොවන බවත්, මේ පිටුපස යම්කිසි දේශපාලන අදිසි හස්තයක් ක්‍රියාත්මක වූයේද යන්න පිළිබඳව විමර්ශනයක් කළ යුතු බවත් ත්‍රිකුණාමලය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ඉම්රාන් මහරූෆ්ගේ අදහසයි.

“ජනමාධ්‍යවේදීන්ට ප්‍රහාර එල්ල කිරීම වගේම ඔවුන්ගේ කටයුතුවලට බාධා කිරීම කිසිසේත් අනුමත කරන්න බැහැ. ඒ වගේම මේ සිද්ධිය වූ දිනයේ රෝහලට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ප්‍රහාර එල්ල කරපු පිරිස්ම මාධ්‍යවේදීන්ට පහර දුන්නා කියලා කියන්න බැරි වුණත්, මේ දෙකම මෙහෙයවන්න ඇත්තේ එක් කණ්ඩායමක් කියලා තමා මම විශ්වාස කරන්නේ. ඒ නිසා පොලිසිය මේ අවස්ථාවේ කළ යුත්තේ, පහරදීපු අය හොයනවාට වඩා ඒක මෙහෙයවූයේ කව්ද කියලා විමර්ශනය කරන එක. එතකොට තවත් බොහෝ දේවල් දැන ගත හැකියි. කොහොම වුණත්, මාධ්‍යවේදීන්ට පහරදීපු අයට එරෙහිව වහාම නීතිය ක්‍රියාත්මක කළ යුතුයි.”

සමාජයේ සෙසු සාමාජිකයන් අතරින් ජනමාධ්‍යවේදීන් සුවිශේෂ වන්නේ, ඔවුන්ගේ වෘත්තිය මෙන්ම වෘත්තීය භාවිතය හේතුවෙනි. ජ්‍යෙෂ්ඨ මාධවේදිනියක හා මාධ්‍ය ක්‍රියාකාරිනියක වන සීතා රංජනී කියා සිටින්නේ, මේ සුවිශේෂී තත්ත්වය හමුවේ, මාධ්‍යවේදීන්ට අතිරේක වගකීමක් මෙන්ම වරප්‍රසාදද හිමි වන බවයි.

ජනතාවගේ තොරතුරු දැන ගැනීමේ අයිතිය සුරක්ෂිත කිරීම ජනමාධ්‍යවේදීන්ගේ මූලිකම කාර්යයක් ලෙස සැලකේ. සමාජයේ යහ පැවැත්ම, අභිවෘද්ධිය සහ ගුණාත්මක දියුණුව සහතික කිරීම අරමුණු කර ගනිමින් ගැතිකමින්, පක්ෂග්‍රාහීබවෙන් සහ බියෙන් තොරව සිය හෘද සාක්ෂියට එකඟව කටයුතු කිරීමේ වගකීම මාධ්‍යවේදීන්ට පැවරී ඇති බව පිළිගැනීමයි. එසේ කටයුතු කිරීමේ වටපිටාව සැකසීමේ වගකීම රජය සතු බව සීතා රංජනී පෙන්වා දෙයි. වර්තමානයේ ජනමාධ්‍යවේදීන් මුහුණ දී සිටින බරපතළම අභියෝගය මාධ්‍යයට එරෙහි අපරාධ සම්බන්ධයෙන් යුක්තිය ඉටු නොවීම බව සීතා රංජනී වැඩිදුරටත් අවධාරණය කර සිටී.

■ **මංගලනාත් ලියනආරච්චි**

# ලංකාවේ මාධ්‍ය නිදහස, සිදුවීම් සහ ප්‍රවණතා

## 2021 වසරේ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ මාසික නිරීක්ෂණ වාර්තා ඇසුරින්

ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහස සහ භාෂණයේත් ප්‍රකාශනයේත් නිදහස සම්බන්ධයෙන් පවතින පොදු චිත්‍රය අලංකාර එකක් නොවේ. වඩාත් හොඳින් පැහැදිලි කළහොත්, මෑතකාලීන ඉතිහාසය තුළ ලංකාවේ මාධ්‍ය නිදහස යහපත් මට්ටමක ඇතැයි ඒ පිළිබඳ තක්සේරුකරණයේ යෙදෙන කිසිදු ජාත්‍යන්තර ආයතනයක් සඳහන් කර නොමැත. දේශසීමා රහිත වාර්තාකරුවෝ හෙවත් (RSF) සංවිධානය, සිය මාධ්‍ය නිදහස් දර්ශකය තුළ මෑතකාලීන ඉතිහාසයේදී ශ්‍රී ලංකාව අදාළ කරගන්නා රටවල් 180 අතරින් 125න් ඉහළට කිසි විට ඔසවා තබා නොමැති අතර ෆ්‍රීඩම් හවුස් ආයතනය සැම විටම ශ්‍රී ලංකාව නම් කර ඇත්තේ නිදහස් නොවන කලාපයේ රටක් හැටියටය.

මෙම දර්ශක බටහිර දෘෂ්ටිකෝණයෙන් මාධ්‍ය නිදහස පිළිබඳ තක්සේරුකරණයේ යෙදෙන ඒවා ලෙස පවතින විවේචනයට අනුගත වෙමින් ලංකාවේ මාධ්‍ය නිදහස සහ ඒ හා බැඳුණු පදනම වන භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස පිළිබඳ තවත් ගැඹුරට ස්වාධීනව අධ්‍යයනය කළ විට ද පෙනී යන්නේ මෙම තක්සේරුකරණය අසාධාරණ නොවන බවයි. සීතා රංජනීගේ ලේඛනයක් උපුටා දක්වමින්, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විසින් මාධ්‍ය නිදහස 2020 වාර්තාවේ දක්වා ඇති පරිදි 1981 සිට 2009 දක්වා කාලය තුළ මාධ්‍යවේදීන්, මාධ්‍ය සේවකයන්, කලාකරුවන් සහ සංස්කෘතික ක්‍රියාධරයන් 116 දෙනකු ඝාතනයට ලක්ව ඇත. එහි තවදුරටත් සඳහන් වන්නේ, 2010 සිට 2014 දක්වා වන කාලයේදී අවම වශයෙන් මාධ්‍යවේදීන් සහ මාධ්‍ය සේවකයන් 40 දෙනෙකුවත් ඝාතනයට ලක්ව ඇති බවයි. එකී මාධ්‍ය නිදහස 2020 වාර්තාව මගින් සිදු කරන විශ්ලේෂණයේදී 2000 සිට 2019 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහසට එරෙහි සිදුවීම් කාණ්ඩ 13ක් යටතේ හඳුනාගෙන ඇත. ඒවා අතර ඝාතන සහ අතුරුදන් කිරීම්, පහරදීම් සහ පැහැරගෙන යෑම්, බාධා කිරීම් සහ තර්ජන, මාධ්‍ය ආයතනවලට ප්‍රහාර එල්ල කිරීම්, නීතිමය ගැටලු, වෙබ් අඩවි සහ සමාජ මාධ්‍ය ජාලා අවහිර කිරීම්, අන්තර්ජාලය වසා දැමීම, විධායක තීරණ, පොලිසියේ විෂමාචාර, දණ්ඩ මුක්තිය, මාධ්‍ය සේවක අයිතීන් උල්ලංඝනය වීම, වාරණය ආදිය වේ. මේ සියල්ල දෙස විමසිල්ලෙන් බලන විට ලංකාව මාධ්‍ය නිදහස සම්බන්ධයෙන් හිතකර රටක් නොවන බවට වන නිගමනය අසාධාරණ එකක් නොවන බව තවදුරටත් තහවුරු වේ.

කෙසේ වෙතත්, ලංකාවේ මාධ්‍ය නිදහසත් භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහසත් සම්බන්ධ චිත්‍රය පිළිබඳ තවදුරටත් අධ්‍යයනය කරන විට හඳුනාගත හැකි ප්‍රවණතාවක් වන්නේ ඊට අදාළ සිදුවීම්වල ස්වභාවයේ පවතින වෙනස්වීමය. උදාහරණයක් ලෙස දක්වතොත් 2014ට පෙර මාධ්‍ය නිදහස හා සම්බන්ධ සිදුවීම් අතර මාධ්‍යවේදීන් ඝාතනය කිරීම, පැහැරගෙන යෑම, තර්ජනය කිරීම, මාධ්‍ය ආයතනවලට පහරදීම සහ හානි කිරීම වැනි සිදුවීම් බහුලව වාර්තා විය. එහෙත්, 2015 වර්ෂයෙන් පසු එම ස්වභාවයේ යම් වෙනසක් සිදුව ඇති අතර විධායක තීරණ, නීතිමය තත්වයන් ආදිය හරහා සුමට, එහෙත් දැඩි අහිතකර බලපෑම් සහිත මාධ්‍ය නිදහස අහිමි කිරීමක් ලෙස සිදුවීම්හි ස්වභාවයේ විතැන් වීමක් නිරීක්ෂණය කළ හැකිය. මෙය යහපත් ප්‍රවණතාවක් ලෙස ඇතැමෙකුට නිරීක්ෂණය කළ හැකි වුවත් එහි ඇත්තේ හානියේ ස්වභාවය වෙනස්වීමක් මිස මාධ්‍ය නිදහසට ඇති තර්ජන අහෝසි වී යෑමක් නොවේ.

## 2021 වසරේ සිදුවීම්

මෙම පසුබිම මත පිහිටා ගෙවී ගිය 2021 වර්ෂයේ ලංකාවේ මාධ්‍ය නිදහසත්, භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහසත් සම්බන්ධයෙන් වන තත්ත්වය නිරීක්ෂණය කළ විට ද පෙනී යන්නේ යහපත් වර්ධනයක් නොව ආපසු ගමන් කිරීමකි. නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ, මාධ්‍ය නිදහස 2020 වාර්තාවට අනුව මාධ්‍ය නිදහසට අදාළ තර්ජනාත්මක සිදුවීම් 58ක් එම වසරේදී හඳුනාගෙන ඇති අතර 2021දී එම තත්වය තවත් වර්ධනය වී ඇත්තේ එවැනි සිදුවීම් 80ක් ඉක්මවා වාර්තා කරමිනි. 2021 වර්ෂයට අදාළව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සකස් කළ මාසික මාධ්‍ය නිරීක්ෂණ වාර්තා අනුව මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතභාවයට අදාළ සිදුවීම් 40ක්, නීතිමය තත්වයන් හා බැඳුණු සිදුවීම් 43ක් සහ ඊට අදාළ පෙර සිදුවීම්වල වර්ධනයන් 10ක්, මාධ්‍ය ස්වාධීනත්වයට අදාළ අවස්ථා 03ක්, ව්‍යුහාත්මක කරුණු 11ක්, වෘත්තීයවේදයට අදාළ අවස්ථා 02ක් සහ මාධ්‍ය නිදහසට අදාළ ප්‍රවණතා 01ක් ලෙස මාධ්‍ය නිදහසට අදාළ කරුණු, ප්‍රවණතා, සහ සිදුවීම් 109ක් නිරීක්ෂණය කර තිබේ. මෙම සිදුවීම් අතුරෙන් 80කට වැඩි සංඛ්‍යාවක් මාධ්‍ය නිදහසට අදාළ තර්ජනාත්මක හෝ ඊට අහිතකර බලපෑම් ඇති කරන තත්ත්වයන් ලෙස හඳුනාගත හැකිය.

මාධ්‍ය නිදහසට අහිතකර බලපෑම් මතු කරන 2021 සිදුවීම් අතර කැපී පෙනෙන්නේ නීතිය හරහා මාධ්‍ය නිදහසට බලපෑම් ඇති කිරීමට දරන ලද විවිධ උත්සාහයන්ය. ඒ අතර අවස්ථා ගණනාවකදීම පවතින නීති සංශෝධනය කිරීම හෝ නව නීති ගෙන ඒමට කටයුතු කිරීම හරහා මාධ්‍ය නිදහසට බාධා මතුවිය හැකි තත්ත්වයන් නිර්මාණය වීමට ගිය අන්දම නිරීක්ෂණය කළ හැකිය.

උදාහරණයක් ලෙස 2021 පෙබරවාරි මාසයේ දී 1973 අංක 05 දරන පුවත්පත් මණ්ඩල පනත විද්‍යුත්, නව සහ සමාජ මාධ්‍යවලටද අදාළ වන පරිදි සංශෝධනය කිරීමට අදාළ නිවේදනයක් ආණ්ඩුව විසින් ප්‍රසිද්ධ කර තිබිණ. මේ පිළිබඳ මාධ්‍ය සහ සිවිල් සමාජයේ බරපතළ විරෝධයක් මතු වූයේ මුද්‍රිත මාධ්‍යයට පමණක් අදාළ යල්පැන ගිය නීතියක් වන පුවත්පත් මණ්ඩල පනත, ප්‍රායෝගික නොවන ලෙස, විකාශන, නව සහ සමාජ මාධ්‍ය ක්ෂේත්‍රයට අදාළ කිරීමට යෑම සහ වගකීමකින් තොර නියාමනය හඳුන්වාදීමට යෑම හේතුවෙනි. එහි ප්‍රතිඵලයක් ලෙස අදාළ සංශෝධනය කිරීම යම් මන්දගාමී තත්වයකට පත් වූ බවක් නිරීක්ෂණය කළ හැකි විය.

තවත් අවස්ථාවක දී අසභ්‍ය ප්‍රකාශනවලට අදාළව නව නීති කෙටුම්පතක් ගැසට් කරන ලද අතර එහි ඇතුළත් කරුණු ද භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස මතත්, තවත් තාක්ෂණික කරුණු ගණනාවක් මතත් බරපතළ ලෙස විවේචනයට බඳුන් විය. එහි ප්‍රතිඵලයක් ලෙස අවසානයේ දී එය බලරහිත කිරීමට කටයුතු කරන ලදි.

## අත්අඩංගුවට ගැනීම හා රඳවා තබා ගැනීම

භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහසත්, මාධ්‍ය නිදහසත් භුක්ති විඳි ජනමාධ්‍යවේදීන් ඇතුළු විවිධ පුද්ගලයන් ඇතැම් නීති යොදාගෙන අත්අඩංගුවට ගැනීම මෙන්ම රඳවා තබා ගැනීමේ සිදුවීම් රැසක් ද 2021 වර්ෂය තුළ දී වාර්තා විය. විශේෂයෙන් මෙහිදී කැපී පෙනුණු තත්ත්වයක් වූයේ සමාජ හෝ නව මාධ්‍යය අවකාශයේ අදහස් පළ කළ පිරිස් ප්‍රධාන වශයෙන් මෙම තත්ත්වයේ ගොදුරු බවට පත් වීමයි.

වෙබ් ලේඛකයෙකු මෙන්ම ව්‍යාපාරිකයෙකු වූ ෆසාල් මොහොමඩ් නම් තරුණයෙකු ජනාධිපතිවරයාගේ ප්‍රකාශයක් විවේචනය කරන වීඩියෝවක් අන්තර්ජාලයට එක් කිරීම හේතුවෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සයිබර් අපරාධ අංශය විසින් ජනවාරි මාසයේ දී අත්අඩංගුවට ගෙන අධිකරණය හමුවට ඉදිරිපත් කරනු ලැබ අයිසීසීපීආර් පනත යටතේ රක්ෂිත බන්ධනාගාරගත කෙරිණ. මෙය සිදු වූයේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් බලාත්මක කිරීමට අදාළ අයිසීසීපීආර් පනත, එහි එන වෛරී ප්‍රකාශ වැළැක්වීමට අදාළ නෛතික තත්ත්වය යොදා ගනිමින් භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස සීමා කිරීමට යොදා ගන්නා බවට ජාතික මෙන්ම අන්තර්ජාතික වශයෙන් ද විරෝධයක් මතුව ඇති පසුබිමකය. ජාතීන් අතර නොසන්සුන්තාව ඇති කරන ප්‍රකාශ සිදු කිරීමේ චෝදනාව මත මෙකී අයිසීසීපීආර් පනත යටතේම අත්අඩංගුවට ගෙන මාස ගණනාවක් රඳවාගෙන සිටි දේශපාලඥයෙකු වන අසාද් සාලි දෙසැම්බර් මාසයේ දී මහාධිකරණය විසින් නිදොස් කොට නිදහස් කළ අතර එය මෙම පනත සහ නීතිය වැරදි ලෙස භාවිත කරන බවට ආණ්ඩුවට එරෙහිව නැගී ඇති චෝදනාව සනාථ කර දක්වන හොඳම උදාහරණයකි.

මඩකලපුවේ ප්‍රාදේශීය මාධ්‍යවේදියෙකු වන මුරුගාපිල්ලේ කෝකිලදාසන් එල්ටීටීඊ සංවිධානය ප්‍රවර්ධනය කරන ඡායරූපයක් සිය සමාජ මාධ්‍ය ගිණුම හරහා ඉදිරිපත් කරන ලද බව දක්වමින් අත්අඩංගුවට ගැනුණේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේයි. අවසානයේ ඔහු ඇප මත මුදා හැරුණේ, මාස 15කටත් වඩා වැඩි කාලයක් රක්ෂිත බන්ධනාගාර ගත කිරීමකින් අනතුරුවය. මේ වනතුරුත් ඔහුට එරෙහිව සාක්ෂි සහිතව පැහැදිලි චෝදනා ගොනු කිරීමක් සිදුව නොමැති අතර සමාජ මාධ්‍ය පෝස්ටුවක් හේතුවෙන් පුද්ගලයෙකුව මාස 15ක් රක්ෂිත බන්ධනාගාරගත කිරීමකට හැකි වන තරමට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යොදා ගැනීමත්, ඒ හරහා භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස සම්බන්ධයෙන් සමාජය මත ඇති කරන පූර්ව වාරණයත් බෙහෙවින් බරපතළ තත්වයක් බව පැහැදිලිය. දෙමළ භාෂා ගුරුවරයෙකු වන අහ්නාෆ් ජසීම් ඔහු ලියූ කවි පදනම් කරගෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගෙන කිසිදු චෝදනාවක් නොමැතිව මාස 18කට වැඩි කාලයක් ත්‍රස්ත විමර්ශන ඒකකයේ රඳවා තබා ගැනීමද මෙම පනත මෙන්ම නීතිය භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහසට එරෙහිව යොදාගැනීම පිළිබඳ සාක්ෂි සපයයි. මෙකී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා ගැනීමට ලක්වූයේ මාධ්‍යයට හෝ කලාවට සම්බන්ධ දෙමළ සහ මුස්ලිම් සුළුතර ජනවර්ගවලට අයත් අය පමණක් නොවේ. ඉන්දීය මහකොමසාරිස් කාර්යාලයට ප්‍රහාරයක් එල්ල විය හැකි බවට අනතුරු ඇඟවීමක් කළ ලංකා ඊ නිවුස් වෙබ් අඩවියේ මාධ්‍යවේදියෙකු වන කීර්ති රත්නායක ද අත්අඩංගුවට ගෙන රඳවා තබා ගැනුණේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේමය.

## ප්‍රශ්න කිරීම සඳහා කැඳවීම

මීට අමතරව තවත් මාධ්‍යවේදීන් සහ විවිධ මත දැක්වීම් සිදු කළ පුද්ගලයන් විශාල සංඛ්‍යාවක් විවිධ නීතිවල ප්‍රතිපාදන යොදා ගනිමින්, ප්‍රකාශ සටහන් කර ගැනීම සඳහා බව පවසමින් පොලිසිය වෙත කැඳවීම 2021 වසරේ දී කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් ඇති අන්දම නිරීක්ෂණ කළ හැකිය. මෙසේ කැඳවනු ලැබූ පිරිස අතර ලංකාදීප, දිවයින සහ ද අයිලන්ඩ් යන පුවත්පත්වල කතුවරුන්ද වූ අතර ඔවුන් එසේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හමුවට කැඳවනු ලැබ තිබුණේ සතොස ආයතනයේ සිදු වූ මහාපරිමාණ දූෂණ ගැන පළ කළ වාර්තාවක් පිළිබඳ ප්‍රකාශයක් ලබා ගන්නටය. ප්‍රධාන මාධ්‍ය හෝ සමාජ මාධ්‍ය හමුවේ සිදු කළ ප්‍රකාශ හෝ පළ කළ අදහස් මත පොලිසිය විසින් සිදු කළ තවත් මෙවැනි ක්‍රියාමාර්ග පිළිබඳ සිදුවීම් ගණනාවක් වාර්තා වූ අතර පාස්කු ප්‍රහාරය පිළිබඳ මාධ්‍යයට කළ ප්‍රකාශයක් සම්බන්ධයෙන් කතෝලික සභාවේ මාධ්‍ය ප්‍රකාශක සිරිල් ගාමිණී පියතුමා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ප්‍රශ්න කිරීම, සමාජ මාධ්‍යයේ තැබූ සටහනක් පිළිබඳ වෛද්‍ය නජිත් ඉන්දිකගෙන් ප්‍රකාශයක් ලබා ගැනීම, රූපවාහිනී වැඩසටහනකදී සිංහරාජයේ වන විනාශය සම්බන්ධයෙන් අදහස් පළ කළ භාග්‍යා අබේරත්න සිසුවියගේ නිවසට ගොස් ප්‍රකාශයක් ලබා ගැනීම, පුවත්පත් ලිපියක් සම්බන්ධයෙන් මාධ්‍යවේදී නන්දන වීරරත්නගෙන් ප්‍රකාශ ලබා ගැනීම ආදිය ඉන් කිහිපයකි. මෙවැනි සිදුවීම් ඔස්සේ අදාළ සිදුවීම හා බැදුණු භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහසට ඇති වූ බලපෑම පමණක් නොව මාධ්‍යකරණය සහ සමාජ මාධ්‍ය හෝ වෙනත් මාධ්‍යයක් ඔස්සේ සිදුකරන නිදහස් අදහස් දැක්වීම් මත සිදුවන පූර්ව වාරණ බලපෑම පිළිබඳවද අවධානය යොමු කළ යුතුමය. එමෙන්ම මෙවැනි ප්‍රවේශයන්, නීතිය යොදා ගනිමින් මාධ්‍යවේදීන් සහ අදහස් ඉදිරිපත් කරන්නන් එක්තරා ආකාරයකට පීඩාවට ලක් කිරීමක් ලෙස ද හඳුනාගැනීමේ වරදක් නොමැත.

## දණ්ඩමුක්තිය තහවුරු වීම

නීතිමය කරුණු පදනම් කරගත්, මාධ්‍ය නිදහසට අදාළ තවත් විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණක් වන්නේ දණ්ඩමුක්තියයි. ජනමාධ්‍යවේදීන්ට එරෙහි අපරාධ සම්බන්ධයෙන් පවතින දණ්ඩමුක්තිය ලංකාවේ ජනමාධ්‍ය නිදහසට අදාළ නොවිසඳුණු දීර්ඝකාලීන ගැටලුවක් වන අතර ගත වූ 2021 වසරේදී එය තවදුරටත් වර්ධනය වී ඇති ආකාරයක් නිරීක්ෂණය කළ හැකිවීම මාධ්‍ය නිදහස, නීතිය මෙන්ම ජනමාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතබව සම්බන්ධයෙන්ද බලවත් ගැටලුවකි. අගමැති මහින්ද රාජපක්ෂ විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් 2021 අප්‍රේල් 21 දින පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයට ඇතුළත් කරනු ලැබූ අතර එමගින් දේශපාලන පළිගැනීම් පිළිබඳ කොමිසමේ වාර්තාව ක්‍රියාත්මක කළ යුතු බවට යෝජනා කර ඇත. එම කොමිසමේ නිර්දේශ අතර රාජ්‍ය සහ හමුදා නිලධාරීන්ට එරෙහිව ඉදිරිපත් කර ඇති නඩු 70ක් පමණ ඉවත් කර ගැනීමට යෝජනා කර තිබේ. එම නඩු අතර මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා ලෙස කටයුතු කරන සමයේ සිදු වූ ලසන්ත වික්‍රමතුංග ඝාතනය, ප්‍රගීත් එක්නැලිගොඩ පැහැරගෙන ගොස් අතුරුදන් කිරීම, කීත්

නොයැර් පැහැරගෙන ගොස් පහරදීම මෙන්ම උපාලි තෙන්නකෝන්ට පහරදීම යන සිදුවීම්වලට අදාළව හමුදා නිලධාරීන් විත්තිකරුවන් ලෙස නම් කර පැවරූ නඩු ද වේ. මෙය දණ්ඩමුක්තිය පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් බරපතළ මෙන්ම කනගාටුදායක ප්‍රවේශයක් වන අතරම දේශීය වශයෙන් මෙන්ම අන්තර්ජාතිකවද අවධානයට සහ විවේචනයට ලක් වූ කරුණක් විය. එමෙන්ම ගත වූ වසරේදී ජනමාධ්‍යවේදීන්ට එරෙහි අපරාධ සඳහා දණ්ඩමුක්තිය ක්‍රියාත්මකවීමට අදාළ තවත් කනගාටුදායක සිදුවීමක් වූයේ 2000 වසරේදී සිදු වූ මාධ්‍යවේදී මයිල්වාගනම් නිමලරාජන් ඝාතනයේ විත්තිකරුවන් 06 දෙනා නීතිපති උපදෙස් මත නිදහස් කරමින් යාපනය මහේස්ත්‍රාත් අධිකරණයේ පැවති නඩු විභාගය අවසන් වීමයි.

## රාජ්‍ය සේවකයන්ගේ අදහස් මර්දනය

විවිධ නීති සහ රෙගුලාසි භාවිත කරමින් රාජ්‍ය සේවකයන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියට එල්ල වූ බලපෑම් සහ සීමා කිරීම්ද ක්ෂේත්‍රයේ 2021 වසරේ සිදු වූ කැපී පෙනෙන තත්ත්වයකි. සෞඛ්‍ය තත්ත්වය ගැන අදහස් පළ කළ ප්‍රදේශීය සෞඛ්‍ය බලධාරියෙකු වූ වෛද්‍ය චමල් සංජීවට එරෙහිව විනය පරීක්ෂණයක් පැවැත්වුණු අතර වන විනාශය ගැන සමාජ මාධ්‍ය සටහනක් තැබූ සහකාර ඉඩම් කොමසාරිස්වරයෙකු වන චමිල් ජයසිංහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අත්අඩංගුවට ගැනිණ.

මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණක් වන්නේ ඇතැම් අවස්ථාවලදී පොලිසිය නීති සහ රෙගුලාසි පිළිබඳ තමන්ට රිසි ලෙස විවිධාකාරයට අර්ථනිරූපණය කර ගනිමින් භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහසට බලපෑම් කිරීමට උත්සහ කිරීමයි. එක්තරා අවස්ථාවකදී පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා සඳහන් කර තිබුණේ ජනාධිපතිවරයාට අපහාස වන ප්‍රකාශ සිදු කිරීම හෝ හුවමාරු කිරීම නීතියෙන් තහනම් බවයි. කිසිදු සාධාරණ නෛතික පදනමක් නොමැති මෙම ප්‍රකාශය මාධ්‍ය සහ සිවිල් සමාජයේ දැඩි විවේචනයට ලක් වූ අතර ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම මෙම ප්‍රකාශය සම්බන්ධයෙන් පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයාගෙන් කරුණු විමසීමට කටයුතු කර තිබිණ.

## ශාරීරික හා මානසික හිංසන

ගත වූ වසරේදීද මාධ්‍යවේදීන් සහ අදහස් ප්‍රකාශනයේ නිරතවූවන්ගේ ආරක්ෂාවට සහ සුරක්ෂිතභාවයට තර්ජන එල්ල වූ අවස්ථා ගණනාවක් වාර්තා විය. ජනමාධ්‍යවේදීන් ඝාතනය කිරීම්, අතුරුදහන් කිරීම් ආදී බරපතළ ගණයේ සිදුවීම් වාර්තා නොවූවත් පහරදීම්, හිංසා කිරීම්, වාර්තාකරණයට බාධා කිරීම්, බලපෑම් කිරීම්, අනවශ්‍ය ලෙස ආවේක්ෂණයට ලක්කිරීම් ආදී සිදුවීම් රැසක්ම වාර්තා විය. ජනවාරි මාසයේ දී නිදහස් මාධ්‍යවේදියෙකු වන ලක්මාල් රණබාහුට කලවානේදී සිදු වූ පහරදීම, ජුනි මාසයේදී හිරු ප්‍රාදේශීය මාධ්‍යවේදියකු වූ ප්‍රසාද් මුතුකුඩආරච්චිට සිදු වූ පොලිස් පහරදීම, නොවැම්බර් මාසයේ මුලතිව් වෙල්ලමුල්ලිවයික්කාල්හිදී මාධ්‍යවේදී විශ්වලිංගම් විශ්වනාදන්ට හමුදා සාමාජිකයන් පිරිසක් විසින් පහරදීම, සැප්තැම්බර් මාසයේ දී මාධ්‍යවේදී ෂහීර් ඛාන්ට අක්කරපත්තුවේදී පොලිස් නිලධාරීන් පිරිසක් විසින් පහරදීම ඉන් කිහිපයකි.

ඇතැම් දෙමළ මාධ්‍යවේදීන් නිරතුරුව පොලිසිය වෙත කැඳවමින් ඔවුන් මානසික හිංසනයට ලක් කිරීමේ තත්ත්වයක් ද නිරීක්ෂණය කිරීමට හැකි වූ බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය 2021ට අදාළව සකස් කළ මාසික මාධ්‍ය නිරීක්ෂණ වාර්තා මගින් අනාවරණය කර ඇත. ඊට අනුව, මඩකලපුවේ මාධ්‍යවේදියෙකු වන පුන්‍යමූර්ති ශෂිකරන් සහ නිලන්තන් වෙත අවස්ථා කිහිපයක දී පොලිසිය වෙත කැඳවීම් ලැබී තිබූ අතර ඔවුන් ඇතැම් සිදුවීම් වාර්තාකරණයෙන් වළක්වාලීම එහි අරමුණු අතර වූ බව ද සඳහන් විය.

මෙම ප්‍රධාන සිදුවීම්වලට අමතරව මාධ්‍යයේ ස්වාධීනත්වයට බලපෑම් ඇති කරන, මාධ්‍යයේ ගුණාත්මක ව්‍යුහය අභියෝගයට ලක්කරන මෙන්ම වෘත්තීයභාවයට ගැටලු ඇති කරන සිදුවීම් සැලකිය යුතු සංඛ්‍යාවක් ද ගත වූ වසරේදී වාර්තා වී තිබේ. ඒ අතර රාවය පුවත්පතේ කර්තෘ විමලානත් වීරරත්නගේ සේවය අත්හිටුවීම, ලේකහවුස් මාධ්‍යවේදියෙකු වූ මංජුල සමරසේකරගේ සේවය අත්හිටුවීම ආදිය වේ.

සමස්තයක් ලෙස ගත් කළ 2021දී වැඩි වශයෙන්ම මාධ්‍ය නිදහසට සහ භාෂණයේ ප්‍රකාශනයේ නිදහසට බලපෑම් කර ඇත්තේ රාජ්‍යය විසින් විවිධ නෛතික ප්‍රවේශයන් භාවිතා කරමින් සිදු කළ මැදිහත්වීම් වීම් හරහා බව සඳහන් කළ හැකිය. එහිදී පවතින නීති සහ රෙගුලාසි නිසි ලෙස මෙන්ම අනිසි ලෙස ද යොදා ගනිමින් සිදු කළ මැදිහත්වීම් මෙන්ම

නීතිය සංශෝධනය කිරීම හරහා සිදු කිරීමට උත්සාහ කළ මැදිහත්වීම්ද නිරීක්ෂණය කළ හැකිය. එය, ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහසටත්, භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහසටත් ඇති බරපතළම අභියෝගය වන මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතභාවයට අදාළ ගැටලුවලින් සාපේක්ෂව විතැන් වෙමින් නෛතික තත්ත්වයන් පදනම් කරගත් එකක් බවට පත් වීමක් ලෙසද නිරීක්ෂණය කළ හැකිය.

## මාධ්‍ය හා සිවිල් සමාජයේ භූමිකාව

කෙසේ වෙතත්, මාධ්‍ය සහ සිවිල් සමාජය මෙන්ම විවිධ දේශපාලන නියෝජිතයන්ද මෙම තත්වයන් වළක්වා ගැනීම සහ පාලනය කර ගැනීම සඳහා ඊට එරෙහිව සැලකිය යුතු මැදිහත්වීම් සිදු කර ඇති බවද සඳහන් කළ යුතු වේ. ඇතැම් නීති සහ රෙගුලාසි මාධ්‍ය නිදහස සහ අදහස් ප්‍රකාශනය සීමා කිරීමට යොදා ගැනීම වළක්වා ගැනීමට මෙම මැදිහත්වීම් දායක වී ඇති බව අසභ්‍ය ප්‍රකාශන නීතිය අත්හිටුවීම, පුවත්පත් මණ්ඩල පනත කඩිනමින් සංශෝධනය වීම වැළකී යෑම වැනි තත්වයන් තුළින් පෙනේ.

එමෙන්ම ඇතැම් අවස්ථාවලදී අධිකරණය සහ නීතිය ක්‍රියාත්මක කරන ආයතන මෙම මර්දනකාරී ප්‍රවේශයන් වළක්වා ගැනීමට සාධනීය දායකත්වයන් දක්වා ඇති අන්දමද නිරීක්ෂණය කළ හැකිය. උදාහරණය ලෙස දක්වතොත්, වෘත්තීය සමිති නායකයෙකු වන ආනන්ද පාලිත මාධ්‍යයට කළ ප්‍රකාශයක් හේතුවෙන් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ අවස්ථාවේ දී කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය විසින් අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය ආරක්ෂා වන ලෙස තීන්දුවක් ලබාදෙන ලදි. තවත් අවස්ථාවක විරෝධතා තහනම් කිරීමට අදාළව නියෝගයක් නිකුත් කරන ලෙස කරන ලද ඉල්ලීමක් ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණය විසින් ප්‍රතික්ෂේප කෙරිණ. අගෝස්තු මාසයේ දී, ජනාධිපතිවරයා විසින් අන්තවාදී අදහස්වලින් පුද්ගලයන් මුදා ගැනීමට විධිවිධාන ඇතුළත් රෙගුලාසි මාලාවක් සහිත ගැසට් නිවේදනයක් නිකුත් කළ අතර එය ක්‍රියාත්මක වීම වළක්වාලමින් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අතුරු තහනම් නියෝගයක් නිකුත් කරන ලදි.

## 2022 පිළිබඳ නිරීක්ෂණ කිහිපයක්

කෙසේ වෙතත්, සමස්තයක් ලෙස ගත් කළ සඳහන් කළ හැක්කේ 2020 වසරට සාපේක්ෂව 2021 වසරේදී මාධ්‍ය නිදහසටත්, භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහසටත් අදාළ ගැටලු, අභියෝග සහ සිදුවීම්වල වර්ධනයක් සිදු වී ඇති බවයි. මෙම තත්ත්වය 2022 වසරේ ඇති විය හැකි තත්ත්වය පුරෝකතනයට යොදා ගැනීමට නොහැකි වුවත්, මාධ්‍ය නිදහස සම්බන්ධයෙන් 2022 වර්ෂයේ දැනටමත් වාර්තා වන සිදුවීම් ඔස්සේ පෙනී යන්නේ එළඹුණු වසරේ තත්ත්වයද එතරම් සුබදායී නොවන බවයි. මාධ්‍යවේදී චමුදිත සමරවික්‍රමගේ නිවසට එල්ල වූ ප්‍රහාරයට අදාළ සැකකරුවන් තවමත් අත්අඩංගුවට ගැනීමට නොහැකි වී ඇති අතර මෙම තත්වය සම්බන්ධයෙන් ජනමාධ්‍ය අමාත්‍යවරයා පවා සිය කනගාටුව පළ කර තිබිණ. කලාකරුවෙකු වන සුදන්ත තිලකසිරි යූටියුබ්හි ඔහු පවත්වාගෙන යන සාකච්ඡාමය වැඩසටහනක් පිළිබඳ කරුණු විමසීමටත්, සමාජ ක්‍රියාකාරිනියක වන ආශා දිල්රුක්ෂි පෙරේරා, ජනාධිපතිවරයාට එරෙහි වීඩියෝවක් ඇය විසින් සමාජ මාධ්‍ය ඔස්සේ බෙදාගැනීම පිළිබඳ ප්‍රශ්න කරන්නටත් 2020 ජනවාරියේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා තිබූ අතර එය භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස පාලනයට නෛතික ප්‍රවේශයන් යොදා ගැනීමේ තවත් දිගුවක් මේ වසරේ ද සිදු විය හැකි බවට පෙර නිමිත්තක් බඳුය. එමෙන්ම මාධ්‍යවේදී රාහුල් සමන්තට දුමින්ද සිල්වා වෙතින් බලපෑම් එල්ල වීම මාධ්‍යයේ මෙන්ම කර්තෘ මණ්ඩල ස්වාධීනත්වයටද පවතින බලපෑම් පිළිබඳ පිළිබිඹුවකි. මාධ්‍ය නිදහසට සහ භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහසට එරෙහි මෙම ප්‍රවණතා නිසි ලෙස හඳුනාගෙන කටයුතු කිරීම ඉදිරියේදී ඊට අදාළ තත්වයන් වළක්වා ගැනීමට වන හොඳම ප්‍රවේශය වනු ඇත.

■ **නීතිඥ විරංජන හේරත්**

# නීතිඥ අම්බිකා සත්කුනනාදන් එරෙහි ආණ්ඩුවේ ප්‍රතිචාරය හා අදහස් පළ කිරීමේ නිදහස

පුරවැසියන් සතු අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, ඒකරාශී වීමේ නිදහස, සැරිසැරීමේ නිදහස ඇතුළු මානව හිමිකම් ආරක්ෂා කිරීම ඉතා දුෂ්කර කාර්යයක් බවට පත්ව ඇත. මානව හිමිකම් ආරක්ෂකයින් ඇතුළු සමාජ ක්‍රියාකාරින්ගේ හඬ මර්දනය කිරීමට ක්‍රියා කරන ආණ්ඩුවේ උත්සාහයන් අඛණ්ඩව සිදු වෙමින් තිබේ. මෙයට තිත තැබිය යුතු අතර එවන් සිදුවීම්වලින් පීඩාවට ලක් කෙරෙන අයට යුක්තිය ඉටු කිරීම හා සහන ලබා දීම කළ යුතුය. මානව හිමිකම් උල්ලංඝනය කිරීම්වලට එරෙහිව එල්ල කෙරෙන පීඩන ජාත්‍යන්තර වශයෙන් සහ නීතිමය වශයෙන් විනිවිදභාවයකින් සිදු කළ යුතුය. එමෙන්ම මානව හිමිකම් සම්බන්ධයෙන් දැනුවත් කිරීම් ජනතාව අතර ප්‍රචලිත කළ යුතු අතර ඊට නිසි ආරක්ෂාවක් ලැබෙන බවද ජනතාවට පැහැදිලි කළ යුතු ය.

අදහස් පළ කිරීමේ නිදහස බරපතල ලෙස තර්ජනයට ලක් වූ ආසන්නතම උදාහරණයක් ලෙස ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසමේ හිටපු කොමසාරිස්වරියක, නීතිඥවරියක මෙන්ම මානව හිමිකම් ක්‍රියාකාරිනියකද වන අම්බිකා සත්කුනනාදන්ට එරෙහිව ශ්‍රී ලංකා ආණ්ඩුවේ ක්‍රියාකලාපය දැක්විය හැකි ය.

### තාවකාලික පනතක් ස්ථිර නීතියක් වීම

1979 තාවකාලික පනතක් ලෙස මාස 6කට යැයි කියමින් පනවන ලදුව රටේ ස්ථිර නීතියක් බවට පරිවර්තනය කරන ලද ත්‍රස්ත මර්දන පනත සංශෝධනය කිරීමට අදාළ ගැසට් පත්‍රය පළ කිරීම සහ එය බල රහිත බව යුරෝපා හවුලේ පාර්ලිමේන්තු උප කමිටුවට පසුගිය ජනවාරි 27 වැනි දින අදහස් දැක්වීමට එරෙහිව අම්බිකා සත්කුනනාදන්ට විරුද්ධ වාර්තාවක් පෙබරවාරි 04 වැනි දා විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ප්‍රසිද්ධ කෙරිණි. මෙම වාර්තාව මගින් නීතිඥවරියක වන ඇය වෙත බරපතළ ලෙස චෝදනා එල්ල කෙරිණි. මෙයින් ඇයගේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට බලපෑම් එල්ල කර තිබෙන අකර ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසද ප්‍රශ්නාර්ථයක් බවට පත් කර තිබේ.

මෙම කරුණ සම්බන්ධයෙන් අම්බිකා සත්කුනනාදන් මෙසේ සිය අදහස් ප්‍රකාශ කළාය.

එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු සමග සම්බන්ධ වී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිපත් කර ඇත්තෙමි. ඒ පිළිබඳව සෙනට් සභාවේ කතා කර ඇත්තෙමි. නමුත් ඒ කිසිම විටෙක කිසිම දෙයක් සිද්ධ නොවුණි. යුරෝපා හවුලේ පාර්ලිමේන්තු උප කමිටුවේ කතා කිරීමෙන් අනතුරුව රජය විසින් මට එරෙහිව වාර්තා පළ කොට තිබේ. ජී.එස්.පී ප්ලස් සහනය හේතුවෙන් මෙසේ පීඩන එල්ල කර ඇති බව විශ්වාස කරමි. මෙය අලුත් උපායමාර්ගයක් යැයි මම දකිමි. තනි පුද්ගලයෙකුට එරෙහිව වාර්තා පළ කිරීම හා පීඩන එල්ල කිරීම රජයක් විසින් සිදු

කරනු ලබන කටයුත්තක් නොවේ. එසේ තිබියදී ඔවුන් විසින් මෙසේ කර තිබේ. තර්ජනය කිරීම් හා සුපරීක්ෂණ මධ්‍යයේ සහ බලපෑම් මධ්‍යයේ උතුරු නැගෙනහිර ප්‍රදේශවල ජනතාව උද්ඝෝෂණ පවත්වති. මෙය රජය විසින් බලාපොරොත්තු නොවූ දෙයක්ද යන්න සිතන්නට තුඩු දෙන්නේ, මා උදාරණයට ගනිමින් අනෙක් අය ප්‍රසිද්ධියේ කතා නොකර සිටීමේ තත්ත්වයක් හා තමන්ටත් මෙසේ සිදු විය හැකිය යන ආකාරයේ බියක් නිර්මාණය කිරීම රජයේ අපේක්ෂාව යැයි පැහැදිලි වූ නිසාය"යි ඈ පවසන්නීය.

මෙහින් අදහස් වන්නේ, මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් රටේ දියත් කෙරෙමින් තිබෙන ක්‍රියාකාරකම් මැඩලීම සහ බලපෑම් එල්ල කිරීම යනු ජනතාව භීතියටත් අර්බුදයටත් පත් කිරීමක් බවයි.

## සිවිල් සංවිධාන හා පුරවැසියන්ගේ විරෝධය

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත පසුගිය 79 වසරේ සිට ක්‍රියාත්මක කරනු ලබන පනතකි. එහි සංශෝධන සිදු කළ යුත්තේ ජනතාවගේ අයිතීන් උල්ලංඝනය නොවන ආකාරයටයි. එකී පනත සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීම නිසා චෝදනා නගමින් ඇයට එරෙහිව වාර්තා පළ කිරීම අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස උල්ලංඝනය කිරීමේ ක්‍රියාවකි. තවද, අදහස් ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් එල්ල කරන බලපෑම පුද්ගලිකව සහ සමස්ත ජනතාවට තර්ජනය කිරීම හා සමානව සලකනු ලබයි.

මෙවන් තත්ත්වයක් තුළ යුරෝපා හවුලේ පාර්ලිමේන්තු උප කමිටු සැසිවාරයේදී ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්ත්වය සම්බන්ධයෙන් නීතිඥ අම්බිකා සත්කුනනාදන් විසින් ඉදිරිපත් කරන ලද අදහස් ප්‍රතික්ෂේප කරමින් විදේශ කටයුතු අමාත්‍යාංශය පළ කොට තිබෙන වාර්තාව සමාජ ක්‍රියාකාරීන් 161 දෙනෙක් සහ සංවිධාන 47ක් එක්ව පසුගිය පෙබරවාරි 06 වැනි දින හෙළා දකිමින් ප්‍රකාශයක් නිකුත් කර තිබේ.

යුරෝපා හවුලේ පාර්ලිමේන්තු උප කමිටුවේ සැසිවාරය පසුගිය ජනවාරි 27 වැනි දින සූම් ක්‍රමයට පවත්වන ලද අවස්ථාවේදී ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්ත්වය සම්බන්ධයෙන්ද සාකච්ඡා කරන ලදි. එම සැසියට සහභාගි වෙමින් වර්තමානයේදී රටේ පවතින මානව හිමිකම් තත්ත්වය පිළිබඳව පැහැදිලි කළ අම්බිකා සත්කුනනාදන් විසින් පෙන්වා දෙන ලද්දේ මෑත කාලයේ සිට මානව හිමිකම් තත්ත්වයන් අසතුටුදායක මට්ටමක තිබෙන බවයි. මෙලෙස බොහෝ සංවිධාන හා දේශපාලඥයන් ද සිය අප්‍රසාදය පළ කොට ඇති බව සඳහන් කළ යුතුයි.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස් කාර්යාලය විසින් දියත් කරනු ලැබ තිබෙන සාක්ෂි එක්රැස් කිරීමේ යාන්ත්‍රණය සඳහා යුරෝපා හවුලේ සාමාජික රටවල් මූල්‍යාධාර ඇතුළු සහයෝග ලබා දීමට ඉදිරිපත් විය යුතු බවත් අම්බිකා සත්කුනනාදන් විසින් අවධාරණය කරන ලදි. නමුත් ඇයගේ මෙම ප්‍රකාශය අභ්‍යන්තර යාන්ත්‍රණය හා අභ්‍යන්තර ව්‍යුහයන් ඔස්සේ සංහිඳියාව සහ වගවීම සහතික කිරීම සම්බන්ධයෙන් තමන් ගෙන තිබෙන ස්ථාවරය පිළිබඳව සැකය උපදවන ආකාරයේ ප්‍රකාශයක් බව විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිවේදනයෙහි සඳහන් වේ.

## සමාජය බියගැන්වීමේ වෑයමක්

එමෙන්ම නීති ක්ෂේත්‍රයේ ඉහළ ස්ථානයක සිටින කෙනෙකුට එරෙහිව සිදුකරනු ලබන මෙවන් ක්‍රියාකාරකම් හේතුවෙන් අනෙකුත් පුද්ගලයින්, සිවිල් ක්‍රියාකාරීන් හා මහජනතාව බිය ගන්වා මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳව සිදු කෙරෙන පීඩන අවම කරවයි. පොදු වේදිකාවේ සහ ජාත්‍යන්තර වශයෙන් මෙවන් තොරතුරු හෙළිදරව් කරනු ලබන විට පුද්ගලිකව මෙන්ම සංවිධානවල ක්‍රියාකාරීන්ට අපකීර්තියක් අත්කර දෙන අතරම ඔවුන්ගේ ගෞරවයට හානි වන අවස්ථා ද බහුලව පවතී.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අදටත් බොහෝ දෙනා අත්අඩංගුවට ගැනීමට සහ විමර්ශන නොකර රඳවා තබා ගැනීමට හේතු වී තිබේ. මෙය අහෝසි කළ යුතු යැයි බලපෑම් එල්ල වෙමින් තිබේ. එලෙස යුරෝපා හවුල විසින් ජී.එස්.පී ප්ලස් සහනය ලබා දීම පිළිබඳව ද බලපෑම් එල්ල වෙමින් තිබේ.

මානව හිමිකම් සම්බන්ධයෙන් කටයුතු කරමින් සිටින නීතිඥයන් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට බලපෑම් එල්ල කිරීමෙන් ඔවුන් විසින්ම එකී ක්‍රියාකාරීත්වයෙන් ඉවත් වීමේ තත්ත්වයක් නිර්මාණය කෙරේ. රටේ සමස්ත ජනතාව

නිහඬ කරවීමේ සලකුණු සටහන් වෙමින් පවතී. මෙය තුරන් කොට තැබිය යුතුයි. ජනතාව නිදහසේ සහ සාමකාමීව හා සැනසීමෙන් ජීවත් වීමේ මාර්ග ඇති කළ යුතුයි. ශ්‍රී ලංකාව මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් හඬ අවධි කරන අය මැඩපැවැත්වීම තුළින් රටේ ජනතාව තළා පෙළා පාලනය කිරීමට සිතන සහ ක්‍රියා කරන තත්ත්වයේ වෙනසක් සිදු කළ යුතුයි.

මේ කරුණ සම්බන්ධයෙන් විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන පුද්ගලයින් කිහිපදෙනෙකු විසින් මෙසේ අදහස් ප්‍රකාශ කරන ලදි.

**ඒ.කේ. ෆ්‍රැන්සිස්, විශ්‍රාමික ගුරු - වාකරේ**

"මානව හිමිකම් උල්ලංඝනයවීම්වලදී ඒ පිළිබඳව ඕනෑම කෙනෙකුට සිය මතය ප්‍රකාශ කළ හැකියි. අම්බිකා සත්කුනනාදන් මීට පෙර රජයට පක්ෂව සිටියත් දැන් ඇය විසින් වර්තමාන තත්ත්වය වටහා ගෙන තිබෙනවා. එමෙන්ම විග්නේශ්වරන් වැනි අය විනිසුරුවරයකු ලෙස සිටියත් දැන් ඔහු එකී තනතුරේ නැහැ. එම නිසා ඔවුන් එසේ පවසන එක වැරදි නැහැ. ඊට පදනමක් නැතැයි කිව නොහැකියි. පදනමක් නැත්නම් ඒ බව ඔප්පු කිරීම රජයේ වගකීමක්.

පරණ දේවල් අවුස්සන්නට එපා යැයි විදේශ ඇමති කියා තිබෙනවා. ඔහු එසේ පැවසීමෙන්ම ඔවුන් පිළිගන්නවා කුමක් හෝ සිදු වී ඇති බව. ඉතින් එයට විසදුමක් අවශ්‍ය නැද්ද? කුමක් හෝ දේකට විසඳුමක් ලැබෙන්නේ නම් කමක් නැහැ. ඊට සමාව දිය හැකියි. එනමුත් අමතක කරන්න බැහැ. එවිට මුළු ඉතිහාසයම මැකී යනවා. අත්අඩංගුවට පත් අය ඝාතනය කළේ තමන් යැයි පිළිගෙන විවෘතව සමාව අයැදින්නේ නම් ප්‍රශ්නය එතකින් නිමාවට පත් වේවි. පරණ දේවල් අවුස්සන්නට එපා යැයි කියන්නේ කුමක් නිසාද?

ලෝක මහා සංග්‍රමයේදී විදේශ රටවල යුද්ධ අපරාධවලට සම්බන්ධ අය අද වන විටත් සමාව අයැදිමින් සිටින නමුත් ශ්‍රී ලංකාවේ පමණක් එලෙස සමාව අයැදීමක් සිදුවන්නේ නැහැ. වැරදීමකින් තමන් විසින් ඔවුන් ඝාතනය කළා, වන්දි මුදලක් සහ මරණ සහතික ලබා දෙනවා, අප විසින් ඔබලාට දිය යුතු දේ ලබා දෙනවා යයි කීවොත් හරි.

කියනු ලබන සියලු දේ ලබා දෙන්නේ නැහැ. 83 ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් පත් කරන ලද කොමිෂන් වාර්තාවෙන් අනතුරුව කී දෙනෙකුට වන්දි ලබා දුන්නාද? ඉන් අනතුරුව කොමිෂන් සභා කීයක් පත් කළාද? අවසානයට අප්‍රේල් 21 වාර්තාවද කුණු කූඩයට දමලා. ඒ නිසා කවුරු කළත් වැරැද්ද වැරැද්දමයි. අම්බිකා කළ ප්‍රකාශය වැරදි නම් පරීක්ෂණ පවත්වන්න. සාධක තිබේ නම් එය ඔප්පු කරන්න. එසේ නොකර වැරදි යැයි පමණක් කීමෙන් එය පිළිගන්න බැහැ.

**කදිර් බාරතිදාසන්, මානව හිමිකම් ක්‍රියාකාරිනී**

"ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසමේ කොමසාරිස් ලෙස කටයුතු කළ අයෙකුට එරෙහිව විවේචන හා බලපෑම් එල්ල කරනු ලබමින් පවතින තත්ත්වය අනෙකුත් මානව හිමිකම් ක්‍රියාකාරීන් තුළත් මහත් කම්පනයක් ඇති කොට තිබෙනවා. සැබෑ ලෙසම ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් මෙවැනි ක්‍රියාවන්ට අවස්ථාව ලබා දී තිබෙනවා. ඇයගෙන් සැලසුම්සහගතව පළිගැනීමටත් ඇයගේ කීර්ති නාමයට කැළලක් ඇති කිරීමටත් මෙය මග පාදා තිබෙනවා.

කොමසාරිස්වරිය ලෙස කටයුතු කළ කාලසීමාව තුළ අවංකව සහ යුක්තිසහගතව මානව හිමිකම් පිළිබඳව ඇය කටයුතු කළ නමුත් ඒ සියලු කටයුතු හෑල්ලුවට ලක් කෙරෙන ආකාරයට සිදුකෙරෙමින් තිබෙන ක්‍රියාකාරකම් කනගාටුදයකයි. මෙහි තිබෙන තවත් කනගාටුදායක කරුණක් වන්නේ මහජනයා විසින් ඊට බරපතළ විරෝධයක් එල්ල කිරීමට ඉදිරිපත් නොවීමයි. එමෙන්ම රාජ්‍ය නොවන සංවිධාන මේ පිළිබදව වැඩි අවධානයක් යොමු කළ යුතුයි. අනෙකුත් සමාජ ක්‍රියාකාරීන් හා මානව හිමිකම් ක්‍රියාකාරීන්ට මෙය බරපතළ තර්ජනයක්. මොවුන් සියලු දෙනා තමන්ගේ අදහස් හා විරෝධය ප්‍රකාශ කිරීමට ඉදිරිපත් විය යුතුයි."

**කන්දයියා කුගනේශන් - ව්‍යාපාරික, කොළඹ**

"අම්බිකා සත්කුනනාදන්ගේ වාර්තාව ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ප්‍රතික්ෂේප කර තිබෙනවා. නමුත් ශ්‍රී ලංකාවේ 1979 සිට ඉතිහාසය පුරා ත්‍රස්ත මර්දන පනත ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාවෙන් ඔබ්බට ගිය පනතක් වශයෙන් සියලු ක්ෂේත්‍රවල භාවිත කෙරුණා. ආරක්ෂක, සිවිල් පරිපාලන ක්ෂේත්‍රය තුළ මානව හිමිකම් කඩවන ආකාරයට ශ්‍රී ලංකා රජය හා මහජාතිය විසින් තමන්ගේ ක්‍රියාකාරකම් දියත් කළා. ඇය විසින් එවැනි වාර්තාවක් ලබා දීම පිළිබදව

ශ්‍රී ලංකා රජයට අවශ්‍ය නම් හෙළා දැකීමටත් විවේචනය කිරීමටත් හැකියාවක් තිබෙන නමුත් එහි තිබෙන යථාර්ථය වන්නේ රජය වසර 40ක් තිස්සේ මානව හිමිකම් කඩ කරමින් සිටින බවයි. එය ත්‍රස්ත පනත හරහා ආරක්ෂක අංශ විසින් සිදු කරන කටයුතුවලට පමණක් සීමා වන්නේ නැහැ. එහි තවත් එක් පියවරක් ලෙස සංස්කෘතික ජන සංහාරය පෙන්වා දිය හැකියි. මීට පෙර ආයුධ පෙන්වා බිය වැද්දුවා, දැන් ඔවුන් අපගේ ප්‍රදේශවලට පැමිණ බුද්ධාගම ප්‍රචලිත කර එම ප්‍රදේශවල බුද්ධාගම සංකේතවත් කෙරෙන වස්තු තැන්පත් කර එය ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමය ලෙස ඉස්මතු කරනවා. දෙමළ ජනතාවගේ ඉඩම් සහ දෙමළ ජනතාවගේ ඓතිහාසික වැදගත්කමකින් යුත් ස්ථාන අත්පත් කර ගෙන දෙමළ ජනතාව ශ්‍රී ලංකාවට බාහිරින් පැමිණ පදිංචි වූ ඉතා සුළු ජන කොටසක් බවට පත් කිරීමට හා එලෙස හුවා දැක්වීමට උත්සාහ දරනවා. මෙය මානව හිමිකම් කඩ කිරීමක් නොවේද? මෙය ශ්‍රී ලංකාවේ ජීවත් වන ප්‍රජාතන්ත්‍රවාදීන් අනුමත කරනවාද? එලෙස බලද්දී අම්බිකා සත්කුනනාදන් එසේ පැවසීමේ කිසිම වරදක් නැහැ. සත්‍ය එයයි."

**ශිවයෝගනාදන් - සිවිල් සමාජ ක්‍රියාකාරික**

"හිටපු මානව හිමිකම් කොමසාරිස්වරියක ලෙසත් දක්ෂ සිවිල් සමාජ ක්‍රියාකාරිනියක ලෙසත් ඇයට තම අදහස ප්‍රකාශ කිරීමට අයිතියක් තිබෙනවා. නමුත් එම මූලික අයිතිය විදේශ කටයුතු අමාත්‍යාංශය උල්ලංඝනය කර තිබෙනවා. ඔවුන්ට අවශ්‍ය නම් ත්‍රස්ත මර්දන පනත යටතේ අත්අඩංගුවට ගැනීමේ හැකියාවක් පවතිනවා. ප්‍රජාතන්ත්‍රවාදී කෝණයෙන් බලද්දී, පාලනය හොබවන පක්ෂය හෝ විපක්ෂය හෝ විදේශ කටයුතු ඇමතිවරයා හෝ වෙනත් ඕනෑම කෙනෙක් රට වැරදි මාර්ගයක ගෙන යන්නේ නම් ඒ සම්බන්ධයෙන් තමන්ගේ මතය ප්‍රකාශ කිරීමේ නිදහස රට තුළ තිබිය යුතුයි. ඇය සත්‍ය හෙළි කර තිබෙනවා. එය ව්‍යාජ තොරතුරක් බව බාහිර ලෝකයට පෙන්වා දීමටයි රජය උත්සාහ කරන්නේ. බොහෝ ජාත්‍යන්තර සංවිධාන හා මානව හිමිකම් සංවිධාන සමග තිබෙන සබඳතා මෙන්ම ඇයට ඔවුන්ගේ සහාය ලැබීම හේතුවෙන් ඇයට තර්ජනවලින් බේරී සිටීමට හැකි වුණා. එලෙස බලද්දී මෙය විදේශ කටයුතු අමාත්‍යාංශයේ අනවශ්‍ය බලපෑමක්. විදේශ කටයුතු අමාත්‍යාංශය යනු ව්‍යවස්ථාව අනුව රටේ ස්වෛරීභාවයට යටත්ව ක්‍රියා කරන ව්‍යුහයක්. එය ප්‍රකාශ කළ යුත්තේ එකී ආයතනයේ මතයයි. කෙනෙකු විසින් පවසන ලද දේ වැරදි යැයි පැවසිය නොහැකි අතර එසේ කීමට කිසිම අමාත්‍යාංශයකට බලයක් නැහැ. මෙය වැරදි පූර්වාදර්ශයක්."

මෙවැනි අදහස් දැක්වීම හා තොරතුරු පදනම් කර ගනිමින් නීතිඥ අම්බිකාට එරෙහි වූ තාඩන පීඩන මානව හිමිකම් කඩ කිරීමක් ලෙස සැලකිය හැකි අතර අනාගතයේ දී මෙවන් පූර්වාදර්ශ නිර්මාණය නොවීමට සියලු දෙනා ක්‍රියා කළ යුතුය.

■ **ඉලට්චුමණන් දේවඅදිරන්**

# උමතු පුද්ගලයන් සම්බන්ධයෙන් රාජ්‍යයේ වගකීම ඉටු කිරීම

**පළමුවැනි කතාව**

කොටුව සිට පානදුර බලා ධාවනය වූ දුම්රිය බම්බලපිටියේ දී නවත්වා පිටත් වීමට සූදානම් වූ අවස්ථාවේ කිසියම් උමතු පුද්ගලයෙකු රේල්පාර දෙපැත්තට පනිමින් දුම්රියට ගල්වලින් පහර දෙන්නට වූයේය. එම පහරදීම්වලින් දුම්රියට අලාභ හානි සිදු වූ අතර දුම්රියේ ගමන්ගත් මගීන්ට ද හානි සිදු විය. අනතුරුව දුම්රියේ සිටි මගීන් ද දුම්රියෙන් බැස මේ උමතු පුද්ගලයාට පහරදෙන්නට වූහ. මේ සිදුවීම පිළිබඳ බම්බලපිටිය පොලිසියට ලැබුණු දුරකතන ඇමතුම් කිහිපයක් නිසා උපපොලිස් පරීක්ෂකවරයකු ඇතුළු පොලිස් නිලධාරීන් කිහිපදෙනෙක් ද එම ස්ථානයට ළඟා වූහ.

පොලිසියෙන් බේරීමට මුහුදු වෙරළ දෙසට පලා ගිය මේ උමතු පුද්ගලයාට උපපොලිස් පරීක්ෂකවරයා සහ තවත් පොලිස් නිලධාරියෙකු පොලු වලින් පහරදෙන්නට වූහ. පොලු පහර කෑ පුද්ගලයා මුහුදේදීම ඇස්පියා ගත්තේය.

රත්මලාන ඉන්ද්‍රජෝති මාවතේ පදිංචි බාලවර්ණන් සිවකුමාර් (29) ගේ ඉරණම විසඳී තිබුණේ මේ අයුරිනි. ඔහු ගල්කිස්ස ප්‍රදේශයේ ගරාජයක සේවය කළ සුළු සේවකයෙකි. උමතු පුද්ගලයෙකුට සමාජ රැකවරණය අහිමි වීම හෙවත් මුහුදේ ගිල්වා මරාදැමීමේ මේ ඛේදනීය සිදුවීම වූයේ 2009 වසරේ ඔක්තෝබර් 29 වැනි දිනය. එම වසරේ නොවැම්බර් මස 13 වන කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේදී මේ නඩුව විභාගයට ගත් අවස්ථාවේ දී එවකට පොලිස් මූලස්ථානයේ අපරාධ හා සංවිධානාත්මක අපරාධ පිළිබඳ නියෝජ්‍ය පොලිස්පති අනුර සේනානායක මහතා ප්‍රකාශ කර තිබුණේ "මියගිය අය සිහිමඳ පුද්ගලයෙකු බව දනිමින් සැකකාර පොලිස් නිලධාරීන් පොලුවලින් ඔහුට පහර දීම කිසිසේත් පොලිස් නිලධාරීන් ලෙස නොකළ යුත්තක් හා එය කිසිසේත්ම අනුමත කළ නොහැකි ක්‍රියාවක් බවයි. සැකකාර පොලිස් නිලධාරීන් පොල්ලකින් මරණකරුට පහරදීම හා පොලිස් නිලධාරියාගේ නොසැලකිල්ල නිසා මෙම මරණය සිදු වී ඇති බවද ඔහු අධිකරණයේ දී පිළිගත්තේය. සංස්කරණය නොකළ දර්ශන මගින් මේ සිදුවීම විකාශනය කළ රූපවාහිනී නාලිකා නිසා පොලිස් දෙපාර්තමේන්තුව ජාතික හා ජාත්‍යන්තර වශයෙන් අපකීර්තියට ලක් වූ බව පෙන්වා දෙමින් නියෝජ්‍ය පොලිස්පති අනුර සේනානායක මහතා "සංස්කරණය නොකළ දර්ශනවල ඇතුළත්වන අයුරින් එම සිද්ධිය නැවත විකාශනය කිරීමට" වාරණ නියෝගයක් නිකුත් කරන්නැයි ද කොටුව මහේස්ත්‍රාත් ගිහාන් පිලපිටිය මහතාගෙන් ඉල්ලා සිටියේ ය.

**දෙවැනි කතාව**

2020 සැප්තැම්බර් 16 වන දින වාර්තා වූ පුවත ඊට හාත්පසින්ම වෙනස්ය. වී දියඇල්ලකින් පහළට පැන සියදිවි හානි කරගැනීමට තැත් කළ මානසික රෝගයකින් පෙළෙන බව පවසන (23) හැවිරිදි තරුණයකු හැටන් පොලීසියේ අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් බේරාගැනීමයි. හැටන් රොතැස් වතුයායේ පදිංචිකරුවෙකු

වූ එම තරුණයා හැටන් අමොස්ලි වත්තේ දිය ඇල්ල ඉහළ රැඳී සිටියදී ආරක්ෂිතව පොලිස් භාරයට ගෙන තිබිණි. මව්පියන් සමග උරණ වී සිය දිවි හානිකරගන්නා බව පවසමින් ඔහු සැප්තැම්බර් (16) දින නිවසින් පැමිණි බව එම තරුණයාගේ මව පොලීසියට පවසා තිබිණි. පොලිස් භාරයට ගැනුණ තරුණයා හැටන් මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඔහු මානසික වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කිරීමටත් පසුව එම තරුණයා දෙමව්පියන් වෙත භාර දීමටත් කටයුතු කරන බව එවකට හැටන් මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක ජී.එස්. පලිහාන මහතා කියා සිටියේ ය.

මේ සිදුවීම් දෙකින්ම පෙනීයන්නේ මානසික රෝගී පුද්ගලයන්ට ජීවත්වීම සඳහා සමාජ රැකවරණය හිමි විය යුතු බවයි. ඒ වෙනුවෙන් වූ අණපනත්, ආයතන, රාජ්‍ය නිලධාරීන් හා වගකිවයුතු අංශ කොතෙකුත් තිබුණත් ඒ සියල්ලටම මගහැරී ගිය ජීවිත ඇතැම් විට මේ මොහොතේත් බස්නැවතුම්පොළේදී හෝ පදික වේදිකාවේදී මං මාවත්වලදී ඔබට මුණගැසෙනු ඇත.

## ගාල්ලෙන් වාර්තා වූ තෙවැනි කතාව

ගාල්ල නගරයේ සැරිසරන උමතු බවට පත් වූ පුද්ගලයන් දෙදෙනෙකු හේතුවෙන් නගරයට එන පුද්ගලයන්ට සහ නගරයේ ව්‍යාපාරිකයන්ට දැඩි කරදරකාරී තත්වයක් හටගෙන ඇතැයි මාධ්‍යවේදී සජීව විජේවීර සිය වෙබ් අඩවියේ ප්‍රවෘත්තියක් පළ කර තිබුණේ ඉකුත් ජනවාරි 31 වන දිනය. "ගාල්ලේ උමතු පුද්ගලයෙක් කතුන්ට නිරුවත පෙන්වා බැණවදියි. වගකිවයුතු පිරිස් නිහඬයි" යනුවෙන් එහි සිරස්තලය දැක්විණි. ගාල්ල නගරයේ ප්‍රධාන බස්නැවතුම්පොළ සහ ඒ අවට සැරිසරන මේ උමතු පුද්ගලයා කාන්තාවන් පසුපස එලවා යෑම, නිරුවක පෙන්වීම, පරුෂ වචනයෙන් බැණවැදීම, ව්‍යාපාරික ස්ථානවල අසූචි තැවරීම වැනි මහජන පීඩාකාරී කටයුතුවල නිරතවන බව එම වාර්තාවෙන් වැඩිදුරටත් කියැවිණි.

සජීව සිය ප්‍රවෘත්තිය සඳහා ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් අයි. හිමාලී රත්නවීර මහත්මියගෙන්ද ප්‍රකාශයක් ලබාගෙන තිබිණි. ඔහු එම ප්‍රකාශය ප්‍රවෘත්තියටද ඇතුළත් කර තිබුණි.

මේ සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග ගැන අප ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් හිමාලි රත්නවීරගෙන් විමසූ විට ඇය මෙසේ කීවාය. "මට ව්‍යාපාරිකයෙක් මේ ගැන කීවා. මම ඒ අයට පැහැදිලි කරලා දුන්නා ඔය කාරණය මට අදාළ නැති බව. මට කරන්න පුළුවන් දෙයක් නෙවෙයි" වගකීම හෝ ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්ට ඇති හැකියාව පෙන්වා දෙමින් සජීව විජේවීර සිය ප්‍රවෘත්තියට මෙම කොටසද ඇතුළත් කර තිබුණි.

"උමතු පුද්ගලයන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට හැකියාව ඇත්තේ 1873 මානසික සෞඛ්‍ය පනත යටතේය. ඒ සඳහා 1956 දී සංශෝධනයක් ඉදිරිපත් කර ඇති අතර 2007 දී නව පනතක් කෙටුම්පත් කර ඇතත් එය මෙතෙක් සම්මත කර නැත. මේ පනත අනුව යම් ප්‍රදේශයක උමතු පුද්ගලයෙකු සිටින්නේ නම් ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලයලත් නියෝජිතයා වන්නේ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීවරයාය. ප්‍රාදේශීය ලේකම්ට දැනුම් දී ග්‍රාම නිලධාරීවරයාට පොලීසියේ සහාය ඇතිව එවැනි පුද්ගලයෙකු අල්ලා ළඟම ඇති රෝහලක මනෝවෛද්‍ය ඒකකයට භාරදීමේ හැකියාව ඇති අතර එවිට අදාළ රෝහල විසින් එම රෝගියා අංගොඩ මානසික රෝහල වෙත යොමු කිරීම සිදු කරයි. නැතිනම් ග්‍රාම නිලධාරීවරයාට මේ බව පොලිසියට දැනුම් දී මානසික සෞඛ්‍ය පනත යටතේ ළඟම ඇති අධිකරණයට කරුණු වාර්තා කර උමතු පුද්ගලයා ප්‍රතිකාර සඳහා යොමු කිරීම, රැඳවුම් මධ්‍යස්ථානයකට යොමු කිරීම හෝ බන්ධනාගාර ගත කිරීම සිදු කළ හැකිය. ගාල්ලේ ව්‍යාපාරිකයන් පවසන්නේ මේ සම්බන්ධයෙන් කොතෙක් පැමිණිලි කළ ද නිලධාරීන් ඒ පිළිබඳ කිසිදු ක්‍රියාමාර්ගයක් නොගන්නා බවයි."

මෙවැනි අවස්ථා සම්බන්ධයෙන් රට තුළ කටයුතු සිදු වන ආකාරය තේරුම් ගැනීමට ඊළඟට සිදු වූ සිදුවීම් දමය පෙළගැස්වීම වැදගත් වේ.

## මූලාශ්‍රයට බලපෑම්

සජීව විජේවීරගේ ප්‍රවෘත්තියට මූලාශ්‍ර සපයා තිබුණේ ගාල්ල ප්‍රදේශයේ ව්‍යාපාරිකයෙකි. rata.lk හි සජීවගේ මේ ප්‍රවෘත්තිය පළ වීමෙන් පසු ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ "අංජන" නැමැති පුද්ගලයෙකු ප්‍රවෘත්ති

මූලාශ්‍රය වූ ව්‍යාපාරිකයාගෙන් ඉල්ලා ඇත්තේ ප්‍රාදේශීය ලේකම්ගේ කීර්ති නාමයට හරි නැති බැවින් සජීවගේ ප්‍රවෘත්තිය ඉවත් කර දෙන ලෙසයි.

භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහසට තර්ජන එල්ලවන්නේ බැණ වැදී තර්ජනය කිරීමෙන් පමණක් නොවේ. ඉතා සුමට ලෙස එන ළාමක ඉල්ලීම් ලෙසද තර්ජන පැමිණිය හැකිය. "මට ව්‍යාපාරිකයෙක් මේ ගැන කීවා. මම ඒ අයට පැහැදිලි කරලා දුන්නා ඔය කාරණය මට අදාළ නැති බව." කී ප්‍රාදේශීය ලේකම් තුමියගේ කාර්යාලයෙන්ම අදාළ ප්‍රවෘත්තිය ගලවා දමන්න යැයි ඉල්ලා සිටීම සාධාරණ විය හැකි ද? ප්‍රාදේශීය ලේකම්වරියගෙන් උමතු පුද්ගලයන් සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග විමසා සිටියදී ඊට සාධාරණ හා පිළිගත හැකි පැහැදිලි කිරීමක් නොකර වෙබ් අඩවියේ පළ වූ ප්‍රවෘත්තිය ඉවත් කර දෙන්නැයි ඉල්ලීම සම්බන්ධයෙන් "රට" වෙබ් අඩවියේ සංස්කාරක මාධ්‍යවේදී සජීව විජේවීර මහතාගෙන් ද විමසුවෙමු.

"ජනවාරි 31 වෙනිදා උදේ මට ගාල්ල නගරයේ ව්‍යාපාරික මහත්මයෙක් කතා කරලා කිව්වා, ගාල්ල නගරයේ අශෝභන හා අපචාරවත් ලෙස මහජන පීඩාකාරී ලෙස හැසිරෙන උමතු පුද්ගලයන් දෙදෙනෙකු ඉන්නවා කියා. ඔවුන් සම්බන්ධව ප්‍රාදේශීය ලේකම්වරියට දැනුම් දුන් බවත් කිව්වා. මේ උමතු පුද්ගලයන් සම්බන්ධයෙන් ක්‍රියා කරන්නේ කොහොමද කියලා මම ගාල්ල කරාපිටිය ශික්ෂණ රෝහලේ මනෝවෛද්‍ය ඒකකය භාර විශේෂඥ වෛද්‍ය රුමි රූබන්ට කතා කළා. එතුමා පැහැදිලි ව සඳහන් කළා මානසික රෝග පනත ගැන. ඒ අනුව මානසික රෝගියා අධිකරණයට ඉදිරිපත් නොකර කෙළින්ම මනෝවෛද්‍යවරයෙකු වෙත ඉදිරිපත් කිරීමේ හැකියාව තියෙන්නේ ප්‍රාදේශීය ලේකම්ට. පොලිසිය හෝ නගර සභාව උමතු පුද්ගලයා අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කරලා ඔහු රැඳවුම් නිවාසයකට යොමු කරලා, ප්‍රතිකාර ලබාදීම කාලයක් ගත වෙන ක්‍රියාවලියක්. නමුත් මානසික රෝග පනත අනුව ප්‍රාදේශීය ලේකම්ට බොහොම කඩිනමින් කටයුතු කරන්න පුළුවන්. නමුත් කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් මානසික රෝග පනත දැනගෙන හිටියේ නැහැ. මම පනත පැහැදිලි කළාම එයාට ඒක අහගෙන ඉන්න වෙලාවක් නැහැ කිව්වා. ඒ අනුව මනෝවෛද්‍ය රුමි රූබන් මහතාගේ උපදෙසත් මගේ අදහසත් වුණේ මානසික ව්‍යාධියෙන් පෙළෙන පුද්ගලයන් දීර්ඝ අධිකරණ ක්‍රියාවලියකට යොමු නොකර ඉතාමත් පහසුවෙන් ග්‍රාම නිලධාරීවරයාටත් ප්‍රාදේශීය ලේකම්වරයාටත් එම කටයුතු ඉතා කඩිනමින් කිරීමේ හැකියාව තිබෙන බව. කොහොම වුණත් ප්‍රාදේශීය ලේකම්වරියගේ ප්‍රකාශයත් ඇතුළත්ව මම මගේ වෙබ් අඩවියේ මේ පුවත පළ කළා. හවස මට දැනගන්න ලැබුණා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවකයකු මට තොරතුරු ලබාදීපු ව්‍යාපාරිකයාට කතා කරලා මේ ප්‍රවෘත්තිය ඉවත් කර දෙන ලෙස ඉල්ලුවා කියලා. ප්‍රාදේශීය ලේකම්ට හෝ වෙනත් කවර පුද්ගලයෙකුට වුණත් ප්‍රවෘත්ති මූලාශ්‍රවලට බලපෑම් කිරීමේ අයිතියක් නැහැග මේක වැරදි ක්‍රියාවක්."
**රැන්ඩන් චන්ද්‍රසෝම (ප්‍රවෘත්ති මූලාශ්‍ර සැපයූ ගාල්ල නගරයේ ව්‍යාපාරිකයා)**

"මේ පීඩාකාරී උන්මත්තකයන් ගැන මම ප්‍රාදේශීය ලේකම්තුමියට කිව්වා. එතුමිය කිව්වා මේක නගර සභාවට කියන්න කියලා. වැඩක් වුණේ නැහැ. බලධාරින්ගේ ඇස් අරවන්න ඕන නිසා මම සජීවට කතා කරලා මේක කිව්වා. ඊට පස්සේ තමයි ඔය ප්‍රවෘත්තිය දාලා තිබුණේ. හවස මට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් 'අංජන' කියන නිලධාරියෙක් කතාකරලා කිව්වා "අනේ මේ නිවුස් එක අපේ මැඩම්ට හරි නැහැ. පුළුවන්නම් සජීවට කියලා ඕක අයින් කරලා දෙන්න කියලා" තර්ජනය කිරීමක් කළේ නැහැ ප්‍රවෘත්තිය පළ වුණත් මේ උන්මත්තකයා ඉවත් කරන්න කව්රුවත් ම ආවේ නැහැ. අන්තිමට ගහලා මෙතනින් එලවලා දැම්මා. දැනුත් කොහේ හරි ඇති. බලධාරීන් මේවට පියවර ගන්නේ නැත්නම් අපි වෙන මොනවද කරන්නේ?"
**අයි. හිමාලි රත්නවීර (ප්‍රාදේශීය ලේකම් ගාල්ල කඩවත්සතර)**

ගාල්ල නගරයේ සැරිසරන උමතු පුද්ගලයන් සම්බන්ධයෙන් මාධ්‍යවේදී සජීව විජේවීර පළ කළ ප්‍රවෘත්තිය ඉවත් කරන්නැයි ඉල්ලන්න කියලා ඔබ කාටහරි කිව්වද?

"නැහැ"

ඔබට වගකීමක් නැද්ද මේ උමතු පුද්ගලයන් සම්බන්ධයෙන් ක්‍රියා කරන්න.

"මගේ විෂය පථයට ඇතුළත් නැහැ. නමුත් 31 වෙනිදා උදේ ව්‍යාපාරිකයෙක් මට කතාකරලා ඔය ගැන කිව්වා. ඊට පස්සේ 96 ඨ චීන කොරටුව භාර ග්‍රාම නිලධාරීවරයා කේ.ජී. දිලීප චාමින්ද මං එතනට යැව්වා. ඔහු ගිහින් මේ පුද්ගලයා

ගැන සොයාබලා දිග කලිසමක් අන්දවලා තුවාලයට අවශ්‍ය බෙහෙත් දාලා තිබුණා. රාජකාරීමය වගකීමක් නැතත් අවශ්‍ය කටයුතු ටික මම කළා. ඉදිරි කටයුතු කරන්න ඊළඟ දවසේ ඔහු සොයද්දී අපිට හොයාගන්න බැරි වුණා.

ඔබ ඔබට කතා කළ ව්‍යාපාරිකයාට මොනවද කිව්වේ.

"මම ඇහුවා ඔහුගෙන් ඇයි මට කතා කරලා සජීවට මේක කිව්වේ කියලා. නගර සභාවට පොලිසියට මේ උන්මත්තකයා ගැන කියන්න කියලත් කිව්වා.

ඔබේ ආයතනයේ "අංජන" කියලා සේවකයෙක් තමයි ප්‍රවෘත්තිය ගලවන්න කියලා ව්‍යාපාරිකයාට කියලා තියෙන්නේ. ඒ නමින් කාර්යාල කාර්ය සහායකයෙක් ඉන්නවාද?

"නැහැ" කාර්ය සහායකයින් නව දෙනෙක් ඉන්නවා. ඒ නවදෙනා අතර "අංජන" කියලා කෙනෙක් නැහැ.

නමුත් උමතු පුද්ගලයන් සම්බන්ධයෙන් ක්‍රියා කරන ප්‍රාදේශීය ලේකම්වරයෙකුට හැකියාව තියෙනවා නේද 'මානසික රෝග ආඥා පනත යටතේ?

මගේ රාජ්‍ය පරිපාලන සේවාව අවුරුදු 16ක් විතර වෙනවා. නමුත් ඔය කියන ආඥා පනත යටතේ ප්‍රාදේශීය ලේකම්ට පවරා ඇති බලතල හෝ වගකීමක් ගැන මම නම් දන්නේ නැහැ.

මහජන පීඩාකාරී ලෙස හැසිරෙන උන්මත්තක පුද්ගලයන් සම්බන්ධයෙන් පොලිසියට ක්‍රියා කළ හැකි ද? මේ සම්බන්ධයෙන් අපි පොලිස් මාධ්‍ය ප්‍රකාශක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නිහාල් තල්දූව මහතාගෙන් ද විමසීමක් කළෙමු.

"ඕනෑම ආකාරයක එවැනි පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමේ හැකියාව තියෙනවා. අපිට කාගෙන් හෝ පුරවැසියෙකුගෙන් එවැනි කරුණු වාර්තා කිරීමක් හෝ පැමිණිල්ලක් ලැබුණොත් අපි ඒ පුද්ගලයා අපේ භාරයට ගන්නවා. ඒ ගන්නේ අපරාධමය වරදකරුවෙක් අත්අඩංගුවට ගන්නා ආකාරයට නෙවෙයි. අපි ඒ පුද්ගලයාගේ ඥාතීන් සොයාගත යුතු නිසා ග්‍රාම නිලධාරීවරයාගේත් ප්‍රාදේශීය ලේකම්වරයාගේත් සහාය ලබාගන්නවා. ඔවුන් දැනුවත් කරනවා. අපේ භාරයට ගත් පුද්ගලයා හැකි ඉක්මනින් වෛද්‍යවරයෙකුට යොමු කරනවා. අවශ්‍ය වුණොත් අධිකරණයට කරුණු වාර්තා කරලා ඔහුව සුදුසු රැඳවුම් මධ්‍යස්ථානයකට යොමු කරලා ප්‍රතිකාර ලබාදීමට වගේම එම පුද්ගලයා ඥාතීන්ට භාර දීමට ක්‍රියා කරනවා.

"පාලනය කරගන්න අමාරු එවැනි පුද්ගලයන් සම්බන්ධයෙන් පවුලේ ඥාතීන්ගෙන් වුණත් පැමිණිලි ලැබෙනවා. ඒ කොහොම වුණත් එවැනි උන්මත්තක පුද්ගලයන් සම්බන්ධයෙන් පැමිණිලි ලැබුණොත් අපි ඔහු අත්අඩංගුවට ගන්නවා. සමාජයේ ආරක්ෂාව, සිවිල් පුරවැසියන්ගේ ආරක්ෂාව වෙනුවෙන්. මහජන සුබසිද්ධිය වෙනුවෙන්. හැබැයි එතනදී ක්‍රියාවලිය වෙනස්. අපරාධමය වරදක් කළ සැකකරුවෙක් අත්අඩංගුවට ගන්නා ක්‍රියාමාර්ගයට වඩා උන්මත්තක පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන රඳවා තබාගැනීම පවා කරන්නේ වෙනත් ආකාරයකට. ඒ සඳහා තමයි අපි ප්‍රාදේශීය ලේකම්ගෙත් ග්‍රාම නිලධාරීවරයාගෙත් සහයෝගය ලබාගන්නේ."

උන්මත්තක පුද්ගලයන්ගේ රැකවරණය හා ආරක්ෂාව වෙනුවෙන් කොපමණ ආයතන හා රාජ්‍ය නිලධාරීන් සිටියද ඔවුන්ගේ ආරක්ෂාව හා රැකවරණය වෙනුවෙන් කිසියම් සමාජයකට 'පොදු සමාජ වගකීමක් තිබේ.' බොහෝ දෙනෙකුට මග හැරෙන්නේ එයයි. එසේම එවැනි පුද්ගලයන් සහ සිදුවීම් සම්බන්ධයෙන් හෙළිදරව් කිරීමටත් ඊට අදාළ වගකිව යුත්තන්ට ඒ සම්බන්ධයෙන් පෙන්වා දීමටත් ජනමාධ්‍යකරුවාට වගකීමක් තිබේ. එහිදී වාර්තාකරුවාට හෝ මූලාශ්‍රයන්ට බලපෑම් කිරීම භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහසට බලපෑම් එල්ල කිරීමකි. තර්ජනයකි. මේ සම්බන්ධයෙන් වගකීමක් ඇති සියලු පාර්ශ්වයන් කටයුතු කළ යුත්තේ සිවිල් සමාජයේත් පුද්ගල ආරක්ෂාවේත් පදනම සහ අයිතීන් ආරක්ෂා වන අයුරිනි.

■ **දයා නෙත්තසිංහ**

# PTA සහ ICCPR හෙවත් අදහස් මර්දනයේ බර අවි

"දවස් 14ක් මගේ අත්වලට මාංචු දාලා, මාව පුටුවක තිව්වා. නිලධාරීන් හැමෝම මට කතා කළේ ත්‍රස්තවාදියෙකුට වගේ. ඒ දවස් 14ට පස්සේ මාව 11 දෙනෙකු එක්ක කාමරයකට දැම්මා. අපි හැමෝම පුටුවල ඉන්දලා, අත්වලට මාංචු දාලා හිටියේ. නිදාගත්තෙත් මාංචු පිටින්. කාටහරි ඕන වුණොත් මුත්‍රා කරන්න යන්න විදියක් තිබ්බේ නැහැ. කාමරේ හැමෝටම මුත්‍රා කරන්න ඕනෑ වුණොත් විතරයි හැමෝම එක්කගෙන යන්නේ. ඒ නිසාම ඒ කාලය ඇතුළත මම වැඩිය වතුර බිව්වේ නැහැ."

මේ මෑතකදී සමාජ කතාබහට ලක් වූ, මාස 18ක් චෝදනා ගොනු නොකර අත්අඩංගුවේ තබාගෙන සිට ඇප මත නිදහස් කරනු ලැබූ මුස්ලිම් ජාතික තරුණ කවියා වන අහ්නාෆ් ජසීම්, ඩේලි මිරර් පුවත්පතට තම අත්දැකීම විස්තර කරමින් කී කතාවකි. ඔහු සිදුවීම ගැන වැඩිදුරටත් මෙසේ කියා තිබුණි.

### කවිපොතක් ලිවීමේ 'අපරාධය'

"2020 මැයි 16 වෙනිදා නිලධාරීන් කිහිපදෙනෙක් මගේ නිවසට ඇවිත්, 'නවසරසම්' කියලා පොතක් ලිව්වේ ඔයා නේද ඇහුවා. මම 'ඔව්' කිව්වා. ඒ අවස්ථාවේදී ඒ නිලධාරීන් මගේ දුරකථනය සහ ලැප්ටොප් එක මගෙන් ඉල්ල ගත්තා. ඔවුන් මගෙන් 'නවරසම්' කවි පොතේ මගේ ගාව තියෙන පොත් ඉල්ලුවා. ඒ අය මගේ පොත් රාක්කේ තිබුණු පොත් 50ක් විතර ගත්තා. ඒ සියලුම පොත් සාහිත්‍යයට අදාළ පොත්, ඔවුන් 'මේ පොත් ත්‍රස්තවාදී අදහස් ඇති පොත්' බව කීවා. ඒ නිලධාරීන් මට කීවේ විමර්ශනයකට මාව අරගෙන යන්න සිදු වෙනවා. ඒ නිසා දවස් 3කට ඇඳුම් ලෑස්ති කර ගන්න කියලා.

"ඒ අය 'නවරසම්' පොත ගැන දිගින් දිගටම මගෙන් ප්‍රශ්න කළා. නිලධාරීන් මට කිව්වේ 'නවරසම්' පොතේ ජාතීන් අතර වෛරය ඇති වෙන දේවල් සහ ත්‍රස්තවාදය ව්‍යාප්ත වෙන විදියේ දේවල් ලියලා තියෙනවා කියලා. මම 'නවරසම්' පොතේ මම ලියපු කවි කියවමින් ඒ නිලධාරීන්ට සිංහලෙන් කවිවල තේරුම කියලා දෙන්න උත්සාහ කළා. ඒත් ඒ අය මම කියන කිසි දෙයක් ඇහුවේ නැහැ. කිසිම දවසක මම හීනෙන්වත් බලාපොරොත්තු වුණේ නැහැ මේ වගේ සිද්ධියක් මට වෙයි කියලා. මගේ පශ්චාත් උපාධිය සම්පූර්ණ කරලා, ගුරුවරයෙක් විදියට මගේ අනාගතයේ ඉදිරියට යන්න මට ලොකු වුවමනාවක් තිබුණා. විවාහ වෙන්න මගේ බලාපොරොත්තුවක් තිබුණා. මම ලියපු කිසිම කවියක ත්‍රස්තවාදය ප්‍රවර්ධනය වෙන කිසිම දෙයක් සඳහන් කරලා නැහැ.

"ඒත්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ මාව අත්අඩංගුවට අරගෙන කිසිම චෝදනාවක් ගොනු කරන්නේ නැතිව මාව මාස 18ක් රැඳවුම් භාරයේ තියාගෙන හිටියා. ඒ කාලය තුළ මම නොකරපු වැරැද්දක් භාර ගන්න කියලා මට බල කළා."

අහ්නාෆ් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මෙන්ම සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය පනත හෙවත් මෙතැන් සිට අයිසීසීපීආර් යන කෙටි නාමයෙන් හඳුන්වනු ලබන පනත යටතේ රඳවාගෙන සිටියේය.

## හිජාස් සහ ශක්තික

අහ්නාෆ් සමඟම කතාබහට ලක් වූ අනෙක් සිදුවීම මෑතකදී නිදහස ලැබූ තරුණ නීතිඥ හිජාස් හිස්බුල්ලාගේ අත්අඩංගුවට අත්දැකීමය. ඔහුව අත්අඩංගුවට ගෙන මාධ්‍යවලින් විශාල චෝදනා ගණනාවක් එල්ල කළේය. එහෙත් ඊට පසු මාධ්‍යවලින් ප්‍රසිද්ධ කරන ලද චෝදනා නොව වෙනත් චෝදනා ගොනු කරමින් ඔහුට නඩු පැවරීය. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ඔහු සිරගතව සිටියදී ඔහුගේ පුංචි දියණිය මෙලොව එළිය දුටුවාය. ඇයට මාස ගණනක් වනතුරු පියා සමඟ කාලය ගත කරන්නට අවස්ථාව අහිමි විය. හිජාස් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හෙවත් පීටීඒ යන කෙටි නාමයෙන් හඳුන්වනු ලබන පනත පාවිච්චි කරමින් අත්අඩංගුවට ගනු ලැබූ 'හෘදය සාක්ෂියේ සිරකරුවකු' ලෙස ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධාන මෙන්ම මෙරට සියලුම ප්‍රමුඛ පෙළේ මානව හිමිකම් ක්‍රියාකාරීන් විසින් පිළිගනු ලැබීය.

"අර්ධ" නම් කෙටිකතාවක් ලියා සිය ෆෙස්බුක් ගිණුමේ පළ කිර තිබීම හේතුවෙන් 2019 වසරේ අප්‍රේල් මස 01 වැනිදා ශක්තික සත්කුමාර අත්අඩංගුවට ගෙන තිබුණි. එම කෙටිකතාව මගින් බෞද්ධාගම හෑල්ලුවට ලක් කර ඇති බව සඳහන් කරමින් මාස 04කට අධික කාලයක්, දිගින් දිගටම ඇප ලබා නොදී ඔහු රිමාන්ඩ් භාරයේ තබන ලදි. ඔහු වෙනුවෙන් කුරුණෑගල මහාධිකරණයේ ගොනු කළ ඇප අයැදුමක් අනුව 2019 අගෝස්තු 05 වැනිදා ඇප ලැබුණි.

"ICCPR පනත එක්සත් ජාතීන් හඳුන්වලා දීලා තියෙන්නේ සුළුතර ජාතීන්ගේ අයිවාසිකම් ආරක්ෂා කරන්න. ප්‍රකාශනයේ භාෂණයේ නිදහස ආරක්ෂා කරන්න. නමුත් ලංකාවේ වෙන්නේ මේ පනත අවභාවිත කිරීමක්." යනුවෙන් අප කළ විමසීමකදී අදහස් දැක්වූ ලේඛක ශක්තික සත්කුමාර පැවසුවේ ය. ඔහු වැඩිදුරටත් සිහිපත් කළේ මීට කලින් ටෙනිසන් පෙරේරා, මංජුල වෙඩිවර්ධන ආදී ලේඛකයන්ගේ නිර්මාණ වාරණයන්ට ලක්ව තිබුණත් නිර්මාණකරුවකු අත්අඩංගුවට ගත් අවස්ථා නොතිබුණු බවය.

අප මෙහි උත්සාහ කරන්නේ පීටීඒ සහ අයිසීසීපීආර් යන පනත් දෙක පාවිච්චි කරමින් පුද්ගලයන් අත්අඩංගුවට ගෙන, ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් කඩ කරමින් රඳවා තබා ගැනීම ගැන කතා කරන්නටය. අප ඉහතින් සඳහන් කළේ මෑත කාලයේ ප්‍රකටම සිදුවීම් තුනකි. එහෙත් යටගිය ඉතිහාසයෙන් කතාවක් ගනිමු.

## රුකී ප්‍රනාන්දුගේ අත්දැකීම

ඒ 2014 මාර්තු 16 වැනිදාය. සිවිල් ක්‍රියාකාරික රුකී ප්‍රනාන්දු සහ ප්‍රවීන් ගනේෂන් පියතුමා කිලිනොච්චියේදී ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයෙන් අත්අඩංගුවට ගෙන, රඳවා තබාගෙන ප්‍රශ්න කිරීම්වලට ලක් කළේ එදාය. දින දෙකක් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ඔවුන් රැඳවුම් භාරයේ තබා ගනිද්දී දකුණේ මාධ්‍ය සංවිධාන මෙන්ම මානව හිමිකම් ක්‍රියාකාරීන් විශාල පිරිසක් කඩිමුඩියේ වැඩ කරමින් සිටියේ අත්අඩංගුවට පත් වූ ක්‍රියාකාරීන්ගේ අයිතිවාසිකම් රැකගැනීම වෙනුවෙනි.

එයින් පසු මේ දෙදෙනාගේ ජංගම දුරකථන සිම්පත්, අයිපෑඩ් ඇතුළු උපකරණ හා පාස්පෝට් අත්අඩංගුවට ගැනීම මෙන්ම ඇප ලබා නිදහස් වූ පසු තමන් අත්අඩංගුවට ගනු ලැබීමේ සිදුවීම ගැන මාධ්‍යවලට මතු නොව තමන්ගේ පවුලේ අය සමගවත් කතා කළ නොහැකි ලෙස මහේස්ත්‍රාත් නියෝගයකට පවා මුහුණ දීමට ඔවුන්ට සිදු විය. ඒ 'ත්‍රස්තවාදය' ගැන චෝදනා එල්ල කරමින් සාමකාමී ක්‍රියාකාරීන් දෙදෙනෙකුගේ ප්‍රකාශනයේ අයිතිය පවා සීමා කළ අවස්ථාවකි.

ඒ සිදුවීම වසර හයක් පැරණි එකකි. ඒ සිදුවීම සිහිපත් කළේ ඔය කියූ දිනට පෙරත්, ඉන් පසු අද දක්වාත් ලංකාවේ නීතිය අවභාවිත කරමින් මාධ්‍යවේදීන් හා ක්‍රියාකාරීන් අත්අඩංගුවට ගනු ලැබූ අවස්ථාවලදී ක්ෂණිකව ක්‍රියාකාරී වී එයට එරෙහිව හඬ නැගූ අය අතර රුකී ප්‍රනාන්දු ද සිටින නිසාය.

අනෙක් අතට ඔහු එක් කාරණයක් හොඳින් දනී. මාධ්‍ය ආවරණයක් ලැබෙන, සිවිල් සමාජයේ සම්බන්ධතා ඇති අයට මෙවැනි අත්අඩංගුවට ගැනීමකදී වැඩිපුර ආවරණයක් ලැබෙයි. එවැන්නෙකු අත්අඩංගුවට පත් වුණොත් ඔවුන්ට යම් ආරක්ෂක දැලක් ඇත.

“මම ඒ වෙලාවෙම මැසේජ් එකක් යැව්වා කිහිපදෙනෙකුටම. ඒ අය ඒ වෙලාවෙම ක්‍රියාත්මක වෙලා විවිධ මැදිහත් වීම් කළා. අපිව අත්අඩංගුවට අරගෙන දවස් කිහිපයකින් නිදහස් කළා. ඒකට හේතු වුණේ අපිට ලංකාවෙන් සහ වෙනත් රටවලින් ලැබුණු සහයෝගය. අපිව ඒ අවස්ථාවේදී බලන්න ආවා මානව හිමිකම් කොමිසමේ නිලධාරීන් 5ක් විතර. නීතිඥ කණ්ඩායම් 5ක් විතර අපිව හම්බවෙන්න ආවා. ඒත් ඒ අයට අපිව හම්බවෙන්න අවස්ථාවක් දුන්නේ නැහැ.” යනුවෙන් රුකී අප සමඟ තමන් ලැබූ අත්දැකීම විස්තර කළේය.

රුකීට මෙන් ආරක්ෂාවක්, දැනුමක් වාගේම පුද්ගල සම්බන්ධතාද නැති අය ඕනෑ තරම් උක්ත පනත් පාවිච්චි කරමින් අත්අඩංගුවට ගනු ලැබේ. මාධ්‍ය ආවරණය මෙන්ම ඇතැමුන්ගේ අවධානයත් නොලබන විශාල පිරිසක් මෑත ඉතිහාසය තුළ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මෙන්ම අයිසීසීපීආර් නිසා පීඩා විඳ ඇත. සමහර පුද්ගලයන් අත්අඩංගුවට අරගෙන මාස ගාණක් ගත වෙනකම් කිසිම මානව හිමිකම් නිලධාරියෙක් යන්නේ නැහැ.

“සමහර පුද්ගලයන්ව බලන්න අවුරුදු ගාණකින් නීතිඥයෙකුට අවසර දෙන්නේ නැහැ. මාව ඉක්මනින් නිදහස් කරන්න සහ අනෙක් අයව දීර්ඝ කාලයක් රඳවා ගෙන ඉන්න මේ කාරණා බලපාන්න ඇති කියලා මම හිතනවා.” වින්දිතයන් බොහෝ දෙනෙකු සමඟ කතාබහ කර ඇත්දැකීම් ඇති රුකී එසේ කීය.

## අදහස් මර්දනයට පනත් දෙකක්

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සහ අයිසීසීපීආර් යනු එකිනෙකට සම්පූර්ණයෙන් පටහැනි පනත් දෙකකි. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත 1979 දී සම්මත කර ඇත්තේම තාවකාලික පනතක් ලෙසය. එය අහෝසි කළ යුතු බවට මේ දක්වා දේශීයවත්, ජාත්‍යන්තරවත් ඉල්ලීම් පවතී.

එහෙත් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය පනත හෙවත් අයිසීසීපීආර් ඊට සම්පූර්ණයෙන් වෙනස්ය. එහි අරමුණ ජාත්‍යන්තරව පිළිගත් නවීන 'සිවිල් හා දේශපාලන' අයිතීන් තහවුරු කිරීමය. අප මේ පනත් දෙකේ පසුබිම ගැන මෙහි සඳහන් කරන්නේ නැත්තේ ඒ සංවාදය දීර්ඝ වශයෙන් සිදුවෙමින් පවතින නිසාය.

එකෙක් තාරාවෙකි, අනෙකා පාත්තයෙකි. එක වගේ අරමුණුවලට යොදා ගත්තාට දෙක එකිනෙකට වෙනස්ය. එක පනතක් ඉදිරියේදීත් පැවතිය යුතු අතර නිසි පරිදි ක්‍රියාවේ නැංවිය යුතුය. අනෙක සම්පූර්ණයෙන්ම පාහේ අහෝසි විය යුතුය.

මේ පනත් පාවිච්චි කරමින් අත්අඩංගුවට ගනු ලබන සමාජයේ ප්‍රකට පුද්ගලයන්ට අදාළව ගනු ලබන අනිවාර්ය පියවරක් වන්නේ අදාළ අයට එරෙහි දරුණු චෝදනා පුවත්පත් සහ රූපවාහිනීවලින් ප්‍රචාරය කිරීමය. අප මුලින් සඳහන් කළ හිජාස් හිස්බුල්ලාගේ සිදුවීමේදී මහජන සාමය පිළිබඳ අමාත්‍ය සරත් වීරසේකර පාර්ලිමේන්තුවේදී ඉතා දරුණු චෝදනා එල්ල කළේ හිජාස් 'භයානක ත්‍රස්තවාදියෙකු' බව කියමිනි. එතරම් භයානක නම් මාස ගණනකට පසු ඇප දෙන තැනට තල්ලු වුණේ කෙලෙසද? ඇමති වීරසේකර පාර්ලිමේන්තුවේදී කී භයානක චෝදනා බොහොමයක් සිදුවීම පිළිබඳ මහාධිකරණ නඩුවේ අධිචෝදනා අතරට එකතු නොවූයේ ඒ බොහෝ චෝදනා ගෙතූ ඒවා නිසාය.

## මාධ්‍ය 'අපරාධ සහකරුවන්' වීම

එහෙත් මේ චෝදනා පතුරුවන්නේ ඇමතිවරුන් හෝ අත්අඩංගුවට ගැනීම් සිදුකරන නිලධාරීන් විතරක් නොවේ. ඒ වෙනුවෙන්ම කැප වූ මාධ්‍යවේදීන්ද ලංකාවේ සිටී.

අප ඉහත සඳහන් කළ සිදුවීම්වලට අමතරව 2019-2022 කාලසීමාවේදී අසාද් සාලි, රිෂාද් බදියුදීන් යන දේශපාලනඥයන් උක්ත පනත් යටතේ අත්අඩංගුවේ තබාගෙන සිටියේ ප්‍රකට මාධ්‍ය වාර්තාවලින් චෝදනා ප්‍රචාරය කරනු ලැබූ පසුවය.

මානව හිමිකම් ක්‍රියාකාරිකයකු මෙන්ම ලේඛකයකුද වන නීතිඥ ප්‍රබෝධ රත්නායක සඟරාවක සංස්කාරකවරයකු ලෙස, තමන්ගේම ප්‍රකාශන නිදහස ගැන සැලකිලිමත් වන අයෙකි. මේ වන විට ඔහු අයිසීසීපීආර් පනත පාවිච්චි කරමින් අත්අඩංගුවට ගනු ලැබූ මුස්ලිම් ජාතිකයෙකු වෙනුවෙන් පෙනී සිටී. ඔහු තමන්ගේ සේවාදායකයා ගැන මෙසේ පැවසුවේය.

## ෆසාල් මොහොමඩ් නියාස්

"2021 ජනවාරි 13 වෙනිදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පිරිසක් ICCPR පනත යටතේ ෆසාල් මොහොමඩ් නියාස් නැමති අය අත්අඩංගුවට අරගෙන තිබුණා. ඒ ඔහු තමන්ගේ මුහුණු පොතේ පළ කරපු වීඩියෝවක් නිසා බෞද්ධ හිමිවරුන්ට අපහාස කළ බවක් කියමින්.

ඔහු කලම්බුට්රෙලිග්රාෆ් වෙබ් අඩවියට හා වෙනත් වෙබ් අඩවිවලට ලිපි ලියපු කෙනෙක්. තවම ඔහුගේ ලිපි අන්තර්ජාලයේ තියෙනවා. චෝදනාවට හේතු වූ වීඩියෝ එකත් එක්ක ඔහු තමන්ගේ මුහුණුපොතේ පළ කරලා තිබුණු සටහන් කිහිපයක් උපුටා දක්වලා තිබුණා. ඒ සටහන්වල වැඩි ප්‍රමාණයක් තිබුණේ කොවිඩ් වෛරසය හැදිලා මියයන මුස්ලිම් ජාතිකයන් ආදාහනය කිරීම සම්බන්ධයෙන් වූ විරෝධයයි. ඒ සටහන් සහ කමෙන්ට් පෙන්වමින් තමයි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ෆසාල් අත්අඩංගුවේ තියාගෙන ඉන්න හේතු දක්වන්නේ.

මේ වෙද්දි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වරින්වර අධිකරණයට ගෙනත් පෙන්නනවා, මේ පුද්ගලයා ජාතීන් අතර අසමගිය ඇති කරන්න ලිපි ලියපු කෙනෙක් බවට.

ඇත්තටම ඒ ලිපි විග්‍රහ කරලා බැලුවොත් ඒ ලිපිවල ජාතීන් අතර අසමගි ඇති කරන්න අදාළ කිසිම දෙයක් නැහැ කියලා තේරුම් ගන්න පුළුවන්. මේ විදියට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් නිතරම අධිකරණයට ඉදිරිපත් කරන ලිපි දෙකක් තියෙනවා.

එක ලිපියක හෙඩිම 'I Am A Sri Lankan Muslim Extremist' ඒ හෙඩිම සිංහලට පරිවර්තනය කළාම 'මම ශ්‍රී ලාංකික මුස්ලිම් අන්තවාදියෙක්.' ලිපියේ හෙඩිම ඒ විදියට දාලා ලිපිය ඇතුළේ ඔහු කියන්නේ 'මේ රටේ තියෙන ආගමික නිදහස වෙනුවෙන්, සියලු ආගම්වල අයිතිවාසිකම් වෙනුවෙන්, මනුෂ්‍යත්වය වෙනුවෙන් මම අන්තවාදියකු ලෙස පෙනී සිටිනවා' කියන කාරණයයි.

ඕනෑම ලේඛකයෙක් තමන්ගේ ලිපියට පාඨකයන් ආකර්ෂණය කරගන්න මේ විදියට සිරස්තල පාවිච්චි කරනවා. ලිපිය ඇතුළේ කතා කරන්නේ අපි කතා කරනවා වගේම මානව හිමිකම් සම්බන්ධ ප්‍රශ්න. ඒත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හැම විටම හෙඩිම පමණක් ඉස්මතු කර පෙන්වනවා. තව ලිපියක් තියෙනවා 'ISIS - Islamic State In Sri Lanka' කියලා. මේ ලිපිය ඔහු ලියලා තියෙන්නේ 2012 අවුරුද්දේ. ඒ ලිපියේදී ඔහු කියලා තියෙනවා ලංකාවේ මුස්ලිම් අන්තවාදයක් වර්ධනය වෙමින් තිබෙන බව. මේ අන්තවාදයට විරුද්ධව අපි මොනවාද කරන්න ඕනෑ කියලා ඒ ලිපියෙන් ෆසාල් කරුණු 10ක් පෙන්වමින් විසඳුම් යෝජනා කරලා තියෙනවා.

අත්අඩංගුවට ගත්තේ වීඩියෝ එක නිසා වුණාට ඒ චෝදනා විවිධ අවස්ථාවල වෙනස් වුණා. හිටපු ගමන් කියනවා ෆසාල්ගේ බැංකු ගිණුම්වල මුදල් තිබුණා, ඒ මුදල් හුවමාරු වෙලා තියෙනවා කියලා. පස්සේ ඒ චෝදනාව නැති වෙලා වෙනත් චෝදනාවක් ගෙනාවා, ෆසාල් රහස් දූරකථන ඇමතුම් හුවමාරු කිරීමේ මෘදුකාංගයක් යොදා ගෙන තියෙනවා කියලා. ඒ ගැන අපි ප්‍රශ්න කරද්දි තමයි දැනගත්තේ නොමිලේ බාගන්න පුළුවන් ඇප් එකක් ෆසාල් පාවිච්චි කරලා තියෙන්නේ කියලා. මේ වෙනකොට ඔහුට දාලා තියෙන චෝදනාව තමයි පාස්කු ප්‍රහාරයට සම්බන්ධ පුද්ගලයන් එක්ක මෙයා සම්බන්ධතා පැවැත්වුවා කියන එක. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට වුවමනා වෙලා තියෙන්නේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට ෆසාල්ව සම්බන්ධ කරන්න. ෆසාල්ගේ බිරිඳ මියගිහින්. ඔහුට අවුරුදු 10ක පුතෙක් ඉන්නවා. ඒ පුතා ඉන්නේ ෆසාල්ගේ අයියා ගාව. ඒ දරුවා ඉස්කෝලේ යන්නේ නැහැ දැන් අවුරුද්දක විතර ඉඳලා. ළමයාගේ ජීවිතේ මේ වෙද්දි ඛේදවාචකයක් වෙලා.

ෆසාල්ගේ සිදුවීමට මුලින් මාධ්‍ය ආවරණයක් ලැබුණු බව ඇත්තය. එහෙත් හිජාස් වාගේ කෙනෙකුට ලැබුණු ආවරණය ෆසාල්ට ලැබුණේ නැත. සිදුවීම ගැන පළ වූ පුවතක්, දෙකක් හැරුණාම සිදුවීම ගැන ආවරණය අඩුය. ඒ නිසා ඔහුත් අයත් වන්නේ රුකී මුලින් විස්තර කළ අප්‍රකට සිදුවීම් ගණයටය. රුකී ප්‍රනාන්දු මහතා වැඩිදුරටත් එවැනි සිදුවීම් ගැන මෙසේ කීය.

## යුක්තිය සමානව ඉටු නොවීම

"පුද්ගලයා ප්‍රසිද්ධ නැත්නම් ගොඩක් වෙලාවට ඒ කෙනා නිදහස් කර ගැනීමේ බර කරට ගන්න වෙන්නේ ඒ පුද්ගලයාගේ පවුලේ අයට. ඒ හැම පවුලකටම ඒ ශක්තිය සහ දැනුම නැහැ. මට ඒ වගේ පවුල් රැසක් හම්බවෙලා තියෙනවා. ඒ අය දන්නේ නැහැ මහේස්ත්‍රාත් අධිකරණය, මහාධිකරණය, ශ්‍රේෂ්ඨාධිකරණය කියන්නේ මොකක්ද කියලා. මූලික අයිතිවාසිකම් පෙත්සමක් සහ රිට් අඥාවක් සහ ඇප ඉල්ලීමක් කියන්නේ මොකක්ද කියන එක ගැන ඒ පවුල්වලට අවබෝධයක් නැහැ. යුක්තිය හැම පුද්ගලයාටම එක ආකාරයෙන් ලැබිය යුතුයි. අවාසනාවකට ලංකාවේ යුක්තිය හැමෝටම එක ආකාරයෙන් ඉෂ්ඨ වෙන්නේ නැහැ.

"නීතිඥ සහාය ලබා ගන්නවා කියන්නේ ඒ පවුල්වලට විශාල අභියෝගයක්. හුඟක් වෙලාවට නීතිඥයෝ මේ පුද්ගලයන් වෙනුවෙන් පෙනී ඉන්න ලක්ෂ ගණන් ගන්නවා. එක නීතිඥයෙක් මිලියන ගණනක් එක් පවුලකින් අරගෙන තිබුණා. හුඟක් පවුල්වලට මේ විදියට මුදල් ගෙවන්න බැහැ. ඒ අය තමන්ගේ දේපළ, ස්වර්ණාභරණ වගේ දේවල් විකුණලා තමයි මුදල් ගෙවන්නේ. ඒත් සමහර අවස්ථාවල නීතිඥයෝ සන්නිවේදනය කරන්නේත් නැහැ පවුල්වල අයට ඇත්තටම මොකක්ද සිද්ධ වෙන්නේ කියලා. සමහර නීතිඥයන් මුදලට නැතිව, අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින අවස්ථාත් තියෙනවා.

"මේ විදියට අත්අඩංගුවට අරගෙන රඳවාගෙන සිටි පුද්ගලයන් අවුරුදු ගණන් ගිහින් අධිකරණයෙන්ම තීරණය කරනවා මේ අය වැරැද්දක් කළේ නැති අය කියලා. මේ විදියට අවුරුදු ගණන් මිනිස්සුන්ට බන්ධනාගාර ගත වෙලා ඉන්න වෙන්නේ නීතියේ ඇති වරදක් නිසා. අත්අඩංගුවට ගන්න කෙනා *PTA* සහ *ICCPR* පනත් යටතේ අත්අඩංගුවට ගත්තා නම් ඒ පුද්ගලයාට ඇප ලබා ගැනීමට ඇති ඉඩ නැති වෙලා යනවා."

නීතිඥ සංජය විල්සන් ජයසේකර අහ්නාෆ් ජසීම් කවියා වෙනුවෙන් මුදල්මය ලාභ අපේක්ෂාවක් නැතිව පෙනී සිටියේය. අහ්නාෆ්ගේ සිදුවීම සමාජයේ ලොකු කතාබහකට ලක් වන්නට කලින්ම සංජය තමන්ගේ පෙනී සිටීම ඇරඹීය. මේ සටහනේ හමාර වාක්‍යය අයිති ඔහුටය. ඔහු මෙසේ කීය.

"ත්‍රස්තවාදය හෝ අන්තවාදය පැන නැගෙන්නේ මේ සමාජයේ තිබෙන අසාධාරණම්, අසමාන ලෙස සැලකීම් නිසා. මේ ක්‍රමය නිර්මාණය කරලා තියෙන්නෙත් මේ පාලකයන් විසින්මයි. ඒ පාලක පන්තියට විරුද්ධව ජනතාවට හඬ නගනකොට ඒ මිනිස්සු තළා පෙළා දමන්න අධිකරණය, පොලිසිය සහ බන්ධනාගාර පාවිච්චි කරනවා මහජනතාවට විරුද්ධව. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අයිතිවාසිකම් ගැන කුමක් සඳහන් වෙලා තිබුණත් මිනිස්සුන්ගේ මූලික අයිතිවාසිකම් පවා මර්දනය කරනවා, රාජ්‍ය ආරක්ෂාව මත පදනම් වෙලා. මේ නීති අකුළා දැමිය යුතුයි."

■ **රේඛා නිලුක්ෂි හේරත්**

# තර්ජනයෙන් යටපත් කළ පොලිස් හිංසනය

ඇය තවමත් නිවස ඉදිරිපිට දොර අසලට වී බලා සිටින්නීය.

තම දරුවාට වූ අසාධාරණය ගැන කියන්නට ඇති සෑම තැනකටම හැකි සියලු ආකාරවලින් කීව ද මිටි ගණන් ලියුම් ගොඩගැහුණ ද තම දරුවා වෙනුවෙන් සාධාරණය ඉටු නොවූ බව ඇය පවසයි. රටේ ජනතාව වෙනුවෙන් යැයි පවසන මාධ්‍ය පවා මේ අවස්ථාවේ දී තමාටවත් තම පුතුටවත් පිහිට නොවූ බව ඇය නගන චෝදනාවකි.

මේ ලේල්කඩ ගමගේ ප්‍රේමවතී නමැති 63 හැවිරිදි පස්දරු මවකි. ඇය පවසන්නේ තම බාලම පුතුට පොලිසිය අමානුෂික ලෙස පහර දී ඔහුට හරිහැටි වැඩක් පලක් කරගත නොහැකි තත්වයට පත් කර ඇති බවයි.

"පොලිසිය ඇවිත් පසුගිය 2021 අවුරුද්දේ දෙසැම්බර් 20 වැනි දා මහ රෑ පුතාව අරගෙන ගියා. අපි හැමෝම නිදාගෙන හිටියේ. නිල ඇඳුම් ඇඳගත්තු හතර දෙනෙක් ඇවිත් පුතාව නැගිට්ටවලා එයා පොරවගෙන හිටපු රෙද්දෙන්ම අත්දෙක ගැටගහලා පහර දිදී අරගෙන ගියා. මටත් කණුහරුප කියලා බැන්නා. පොලිස් නිලධාරීන් පස්දෙනෙක් ආවා. එයාලා බීමත්ව සිටි බව මට තහවුරු වුණා. අරගෙන යන අතරමග දී පුතාට පොලුවලින් පහර දීලා. මේ දරුවාට හොඳටම අමාරු වෙලා. පහුවදා පොලිස් ඇප දීලා දොස්තර කෙනෙක් ගාවට යවලා. එතැනින් කරාපිටිය ඉස්පිරිතාලෙට යන්න කියලා ඉස්පිරිතාලෙදි ඔපරේෂන් එකක් පවා කරලා. පොලිසියේ ලොකු මහත්තුරු මගේ පුතාව බයකරලා කියල තියෙනවා අපි ගහපු කතාවක් කියන්න එපා උඩකින් වැටිලා තුවාල වුණා කියලා කියන්න කියලා. නැත්නම් මරනවා කියලත් කියල තිබුණා. ඒ නිසා පුතා ඉස්පිරිතාලේ දොස්තරමහත්වරුන්ට කියලා තියෙන්නේ උඩකින් වැටුණා කියලා. නමුත් ඇත්ත කතාව පොලිසිය ගහලා තමයි පුතාට අමාරු වුණේ. දැන් අපි අසරණ වෙලා ඉන්නේ. කුලී වැඩ කරලා කීයක්හරි හොයාගත්ත පුතාට දැන් රස්සාවක් කරගන්න බෑ."

## නැති සිවිලිමකින් ඇදවැටීම

මේ මව සිදු වූ අසාධාරණය පිළිබඳ ගාල්ල දිසා භාර නියෝජ්‍ය පොලිස්පතිවරයාට, දකුණු පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාට සහ මානව හිමිකම් කොමිසමට පැමිණිලි කළා ය.

පහරදීමට ලක් වූ එච්.ජී. කසුන් හර්ෂාන් පවසන්නේ පැමිණිල්ලක් විභාග කිරීම සඳහා පොලිසියට පැමිණෙන ලෙස කරන ලද දැනුම්දීමකට අනුව තමන් පොලිසියට නොගිය බැවින් මෙලෙස අත්අඩංගුවට ගෙන පොලිසියට රැගෙන යන අතරතුර අමානුෂික ලෙස පහරදුන් බවයි.

එම අත්අඩංගුවට ගැනීම සිදු කර ඇත්තේ අක්මීමණ පොලිසියෙනි. පොලිසියේ ස්ථානාධිපතිවරයාගෙන් විමසූ විට ඔහු කියා සිටියේ කසුන් හර්ෂාන් අත්අඩංගුවට ගත් කතාව ඇත්තක් නමුත් ඔහුට කිසිම ආකාරයකින් පහර

නොදුන් බවයි. ඔහු අසල්වැසි නිවසක අයකු සමඟ ඇති වූ ආරවුලක් විභාග කිරීම සඳහා අවස්ථා දෙකක් පොලිසියට නොපැමිණීම හේතුවෙන් අත්අඩංගුවට ගැනීමට ගිය බවත්, පොලිසිය පැමිණි පසු නිවසේ සිවිලිමේ සැඟවී සිටි සැකකරු සිවිලිමෙන් බහින විට බිම ඇද වැටීමෙන් මෙවැනි තත්වයක් ඇති වූ බවත් පොලිසිය පවසයි.

නමුත් පොලිස් ස්ථානාධිපතිවරයා පවසන පරිදි එම නිවසේ සිවිලිමක් නැත. ඒ නිසා ඔහුට සිවිලිමක සැඟවීමට හැකියාවක් ද නැත.

පොලිස් ස්ථානාධිපතිවරයා පවසන පරිදි සැකකරු දෙවරක් පොලිසියි මඟහැර තිබේ. නමුත් නීතිය වන්නේ යම් සැකකරුවකු තුන්වතාවක් පොලිසියට නොපැමිණියහොත් ඒ සම්බන්ධයෙන් පොලිසිය විසින් අධිකරණයට කරුණු වාර්තාකර සැකකරුට සිතාසි යවා අධිකරණයට ගෙන්වා රජයේ නිලධාරියකුගේ උපදෙස් නොපිළිපැදීම සම්බන්ධයෙන් රුපියල් 50.00ට නොවැඩි දඩයක් නියම කර පොලිසිය හමුවේ පෙනී සිටින ලෙස අවවාද කිරීමයි. එම අවවාද ද නොතකා කටයුතු කළහොත් දැඩි පියවර ගැනීම අධිකරණය විසින් කළ යුතු කාර්යයකි.

නමුත් පොලිසිය කියන ආකාරයට ඔහු දෙවරක් පොලිසියට නොපැමිණීම හේතුවෙන් අත්අඩංගුවට ගෙන ඇත. වෙනත් පුද්ගලයකු පැමිණිල්ලක් කළ පමණින් සැකකරුවකු වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගැනීමට පොලිසියට කිසිදු අයිතියක් නැත.

## 'පොල්ලකින් පහර දුන්නා'

"පොලිසිය අපේ ගෙදරට මීටර 500ක් විතර ඈතින් බයිසිකල් නවත්තලා පයින් ඇවිත් තමයි දොරට ගහලා අපිව නැගිට්ටෙව්වේ. මම ඇහුවා මාව අත්අඩංගුවට ගන්නේ ඇයි කියලා. එතකොට කිව්වා පොලිසියට එන්න කියලා ආවේ නැති නිසා අල්ලන් යනවා, හෙට උදේට ඇප කාරයොන්ට එන්න කියන්න, ඇප දීලා එවන්නම් කියලා. අම්මත් මේ ගැන ප්‍රශ්න කළා. අම්මට කිව්වා පොලිසියට පසුවදා එන්න කියලා. මාව අරගෙන යන අතරතුර ගිලිසීලියා පොල්ලකින් මට ගැහුවා. ගහපු එක පාරක් මගේ වෘෂණකෝෂවලට වැදුණා. මම ඒ එක්කම සිහිය නැතිවෙලා වගේ බිම වැටුණා. ඇදලා නැගිට්ටවලා නැවත නැවතත් ගගහා තමයි අරගෙන ගියේ. පහළ කඩයක් ළඟ නැවතිලා එතැනට පොලිස් ජීප් එක ගෙන්නගෙන මට ගහලා ඒකට දැම්මා. පොලිසියට අරගෙන ගිහින් කූඩුවට දැම්මා." යනුවෙන් පහරකෑමට ලක් වූ බව කියන කසුන් හර්ෂාන් පවසයි.

කසුන් පවසන්නේ අක්මීමණ පොලිසියේ සැරයන්වරයකු වන ප්‍රියදර්ශන සහ චන්ද්‍රසෝම යන දෙදෙනා සහ තවත් පස් දෙනකු තමන් රැගෙන ගිය කණ්ඩායමේ සිටි බවයි. ප්‍රියදර්ශන ගැසූ පොලු පහරක් තම වම් වෘෂණකෝෂයට වැදුණු බවත් චන්ද්‍රසෝම තම හිසට පහරදුන් බවත් හෙතෙම වැඩිදුරටත් කියා සිටියේය. ජීප් රථයේ දී ද සැරයන් ප්‍රියදර්ශන තම බඩට පහරදුන් බව ඔහු පවසයි.

එදා ඔහු ජීප් රථයට නැංවූ ස්ථානය වෙළෙඳ සැළක් පිහිටි තැනකි. එතැන සීසීටීවී කැමරා සවි කර තිබේ. නමුත් මේ සිද්ධිය සම්බන්ධයෙන් ඇති හොඳම සාක්ෂිය වූ එම කැමරා දර්ශන ඒ කඩ හිමියන් විසින් ලබාදෙන්නේ නැත. ඒ ගැන විමසූ විට කියන්නේ "ඕවාට උසාවි ගානේ රස්තියාදු වෙන්න අපට බැහැ" යනුවෙනි. ඔවුන් පොලිසිය අමනාප කරගැනීමට ද කැමැත්තක් නැත.

## 'වැටුණා යැයි කිව්වේ තර්ජනය නිසා'

පසු දා උදෑසන කසුන්ගේ මවත්, ඥාතීන් කිහිප දෙනකුත් පොලිසියට ගියහ. ඒ ඔහුට ඇප ලබා දී රැගෙන ඒමේ අපේක්ෂාවෙනි.

නමුත් මව පවසන්නේ එලෙස පොලිසියට යනවිට තම පුතු ඉතාමත් අසාධ්‍ය තත්වයෙන් පසු වූ බවයි.

"ඒ වෙනකොට මගේ පුතා වමනය කරලා. නැගිටගන්න බැරි තරම් අමාරුවෙන් හිටියේ. පොලිසිය කිව්වා එයාට තියෙන පැමිණිල්ල සමථයකට පත් කරලා බේරලා දෙන්නම්, දැන් තලගහ මහින්ද දොස්තර මහත්තයා ගාවට ගිහින් බෙහෙත් ගන්න කියලා. පුතාට උදේ පොලිස් ඇප දුන්නා. ත්‍රී වීලර් එකකින් බෙහෙත් අරගන්න ගියාට පස්සේ පුතාව

පරීක්ෂා කරලා බලපු දොස්තර මහත්තයා කිව්වා තත්වය බරපතළයි ඒ නිස ා පුළුවන් ඉක්මනට කරාපිටිය රොහලට ගෙනියන්න කියලා. රෝහලට ගියාම වාට්ටු අංක 58ට පුතාව ඇතුළු කරලා. වෛද්‍යවරු ඇහුවාම පුතා කිව්වේ උඩකින් වැටුණා කියලා. අපි මේ ගැන ඒ වෙලාවේ මොනවත් දැනගෙන හිටියේ නැහැ. එදාම සවස පුතාට සැත්කමක් කළා. ඊට පස්සේ තමයි පුතා අපිට සිද්ධවෙච්ච දේ කිව්වේ."

පහරදීමට ලක් වූ කසුන් තමන්ට සිදු වූ දේ පවසන්නේ මේ ආකාරයෙනි.

"මට එදා රෑ පොලිසියේදී ගොඩක් අමාරු වුණා. පොලිසියෙන් ගහපු නිසා තමයි එහෙම වුණේ. වමනය ගියා. පස්සේ පොලිසියේ ස්ථානාධිපතිතුමා මට කාමරයට කතා කරලා කිව්වා පොලිසියෙන් ගහපු බව කාටවත් කියන්න එපා, උඩකින් වැටුණායයි කියන්න කියලා. පොලිසියෙන් ගහපු කතාව කිව්වොත් මාව මරනවා කියලා තර්ජනය කළා. උඩකින් වැටුණා කියලා කිව්වොත් මට විරුද්ධව තියෙන පැමිණිල්ල ඉවර කරලා දෙන්නම් කියලත් කිව්වා. මේ තර්ජනය නිසා මම ඉස්පිරිතාලෙට ගිහිල්ලත් කිව්වේ ඒ විදියට. දොස්තරවරු ඒක විශ්වාස කළාද කියලා මම දන්නේ නැහැ."

## ස්ථානාධිපතිගෙන් තර්ජන

21 වැනි දා සවස සැත්කමකට ලක් කළ කසුන් හමුවීමට පසුදින එනම් 22දා අක්මීමණ පොලිස් ස්ථානාධිපතිවරයාගේ මිතුරන් තිදෙනකු පැමිණ තිබේ. ඔවුන් සුනිල් ජයන්ත, අසිත සහ ගීතාංග ලෙස කසුන් විසින් හඳුනාගෙන තිබේ. ඔවුන් ස්ථානාධිපතිවරයා ඉගෙනුම ලැබූ විද්‍යාලයේ ඔහුගේම සමකාලීන මිතුරන් බවද කසුන් පවසයි.

"එයාලා ඇවිත් කිව්වා මේක ගොඩින් බේරගන්න කියලා. උඹ දන්නවානේ අපේ හැටි, ස්ථානාධිපතිතුමා කියන විදියට වැඩ කළොත් ගැටලුවක් වෙන්නේ නෑ. නැත්නම් අමාරුවෙයි කියමින් ඔවුන් මට තර්ජනය කළා. ඊට පස්සේ තමයි රෝහල් පොලිසියෙන් ආවේ." රෝහල් පොලිසිය නම ලියාගෙන නැවත හැරී ගොස් තිබේ නැවත පසුදා (23) උදෑසන 7.10ට පමණ රෝහල් පොලිසියේ නිලධාරියකු ප්‍රකාශයක් ලබාගැනීමට පැමිණි බවත් එම ප්‍රකාශය ලබාදෙන අවස්ථාවේදීද පොලිස් නිලධාරියාගේ ජංගම දුරකථනයට අක්මීමණ පොලිස් ස්ථානාධිපතිවරයා වරින් වර කතා කළ බවත් කසුන් පවසයි.

නමුත් ඒ වනවිට තම ජීවිතයට පවා බරපතළ අවදානමක් ඇති බව අවබෝධ කරගෙන සිටි කසුන් රෝහල් පොලිසියට සත්‍ය පවසා තිබේ. ස්ථානාධිපතිවරයාගේ තර්ජනය හේතුවෙන් වෛදයවරයාට පැවසුවේ උසකින් වැටුණු බව යැයිද නමුත් සිදු වූයේ පොලිසිය පහරදීම යැයිද ඔහු රෝහල් පොලිසියෙන් ප්‍රකාශයක් ලබාගත් නිලධාරියාට පවසා තිබේ. නමුත් ප්‍රකාශයක් ලබාගැනීමට නැවත පැමිණෙන බව පවසා රෝහල් පොලිසියේ නිලධාරියා එතැනින් ඉක්මනින් ඉවත්ව ගිය බවත් නැවත ආපසු නොපැමිණි බවත් ඔහු කියයි. එදින සවස 3.00ට පමණ රෝහලෙන් ඔහු නිවසට එවා තිබිණි. කසුන් පවසන්නේ පොලිසියේ බලපෑමක් හේතුවෙන් තමන්ව ඉකිමනින්ම නිවසට පිටත්කිරීමට රෝහල් බලධාරීන් කටයුතු කර ඇති බවකි.

තම පුතාට පොලිසිය විසින් කරන ලද අමානුෂික පහරදීම සම්බන්ධයෙන් ජේමවතී නම් මව මානව හිමිකම් කොමිසමට, දකුණු පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාට සහ ගාල්ල දිසාභාර නියෝජ්‍ය පොලිස්පතිවරයාට පැමිණිලි කළාය.

ඒ අනුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම විසින් ඇය වෙත 2022-01-24 දිනැතිව ලිපියක් යොමු කර ඇත. එහි දැක්වෙන්නේ මෙම පැමිණිල්ලේ ඉදිරි විමර්ශන කටයුතු සඳහා පැමිණිල්ලේ කරුණු සනාථ කිරීමට අදාළ සාක්ෂි දිවුරුම් ප්‍රකාශ මගින් 2022-02-03 වැනි දිනට ප්‍රථම මාතර කාර්යාලය වෙත යොමු කරන ලෙසයි.

ඔවුන් එයට අදාළ සියලු ලේඛන මේ වන විට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කර තිබේ.

මේ සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාවේ මාතර ප්‍රාදේශීය සම්බන්ධීකරණ කාර්යාලයෙන් විමසූ විට එහි සම්බන්ධීකරණ නිලධාරී ඩී.එම්.ආර්. දිසානායක කියා සිටියේ එම පැමිණිල්ල සම්බන්ධයෙන් HRC/MT/324/21/N අංක යටතේ විමර්ශනයක් ආරම්භ කර ඇති බවයි. තවමත් විමර්ශන සිදු කරන බවත් ඒ පිළිබඳ වැඩි විස්තර පැවසීමට නොහැකි බවත් හෙතෙම කියා සිටියේය.

මීට අමතරව එච්.ජී. කසුන් හර්ෂාන් විසින් ගාල්ල දිසාව භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා වෙත කරන ලද පැමිණිල්ල ගාල්ල පොලිස් අධිකාරී (1) වෙත යොමු කර ඒ සම්බන්ධයෙන් ඔහුගෙන් ප්‍රකාශයක්ද සටහන් කරගෙන තිබේ.

එම විමර්ශන කටයුතුවල තත්ත්වය දැනගැනීම සඳහා අප පොලිස් අධිකාරී කාර්යාලයෙන් කරුණු විමසූ විට පවසා සිටියේ පැමිණිල්ල සම්බන්ධයෙන් අදාළ පැමිණිලිකරුගේ ප්‍රකාශයක් සටහන් කර ගෙන අක්මීමණ පොලිසියෙන්ද ඒ පිළිබඳ වාර්තාවක් කැඳවා ඇති බවයි. එම කරුණු විමර්ශනය කිරීමෙන් අනතුරුව ඒවා දිසා භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා වෙත යොමු කරන බවද එම කාර්යාලයේ නිලධාරියෙක් කියා සිටියේය.

ජේමවතී මහත්මිය පවසන්නේ එදා දෙසැම්බර් 20 වැනි දා රාත්‍රී අත්අඩංගුවට ගත් තම පුතුට ඇප ලබා දෙද්දී පොලිසිය නැවත ජනවාරි 05 වැනි දින පැමිණෙන ලෙස පැවසූ බවයි. එලෙස ජනවාරි 05 පැමිණි විට පුතාට විරුද්ධව අසල්වැසියකු විසින් කර තිබූ පැමිණිල්ල ඉවත් කර දෙන බවත්, පොලිසිය පහර දුන් බව කිසිවෙකුට නොකියන ලෙසද පවසා තිබූ බවත් මව කියන්නීය. නමුත් කසුන් එදින පොලිසියට ගොස් නැත.

"එදා පොලිසියට ගියේ නෑ කියලා අපේ පුතාට තවත් නඩුවක් දාලා. දැන් 21 වැනි දා පුතාට ඇප අත්සන් කරපු දෙන්නටම මාර්තු 30 උසාවියට එන්න කියලා සිතාසි එවලා. මෙයාලා මගේ පුතාට තවත් නඩු පටලවනවා." ඒ මවගේ හඬයි.

කසුන් එල්ලකරන චෝදනා සම්බන්ධයෙන් අක්මීමණ පොලිස් ස්ථානාධිපති පොලිස් පරීක්ෂක මධුරංග අරුමප්පෙරුම පවසන්නේ මෙවැනි කතාවකි.

"පොලිසියෙන් එයාට ගැහුවේ නෑ. පැමිණිල්ලක් විභාග කරන්න දවස් දෙකක් එන්න කිව්වා. ආවේ නැති වුණාම පොලිසියෙන් ගියා අත්අඩංගුවට ගන්න. එතකොට මිනිහා සිවිලිමේ හැංගිලා. සිවිලිමෙන් බස්සනකොට තමයි ඔය වැටිලා තැලිලා තියෙන්නේ. රෝහලට ගෙනගියාමත් ඒ කතාව කියලා පස්සේ තමයි මේ පොලිසියෙන් ගැහුවා කියලා බොරු කියන්නේ. මිනිහාට කසිප්පු කේස් ගොඩක් තියෙනවා. දැන් පොලිස් ඇප දුන්නේ මාර්තු 05 වැනි දා අධිකරණයට එන්න කියලා. එදා අධිකරණයට ආවේ නෑ. දැන් අධිකරණයෙන් වරෙන්තු නිකුත් කරලා තියෙන්නේ. 30 වැනි දා නැවත නඩු දිනය. ඇපකරුවන්ටත් සිතාසි යැව්වා එදාට එන්න කියලා. දැන් මෙයා ප්‍රදේශයෙන් පලාගිහින් ඉන්නේ. මිනිහා හැංගිලා. පොලිසිය මඟ හරිමින් බොරු කිය කියා ඉන්නවා. මේ සම්බන්ධයෙන් එයා හැමතැනටම බොරු කියලා. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කාර්යාලයෙනුත් දැන් පැමිණිල්ලක් විභාග කරනවා. ඒ නිසා අපිට වැඩි දෙයක් කියන්න බැහැ."

පොලිසිය විසින් කරනු ලබන වධහිංසා පැමිණවීම් සම්බන්ධ මහජන පැමිණිලි විමර්ශනය කිරීමේ දී එය වදහිංසාවක් බව සනාථ වන්නේ නම් අපරාධ නීති විධිවිධාන පනත යටතේ ඉදිරි කටයුතු කිරීමේ වගකීම පොලිස්පතිවරයා සතු වේ.

කෙසේ වෙතත් මෙවැනි කාරණයක් සම්බන්ධයෙන් වධහිංසාවට ලක් වූ පුද්ගලයා විසින්ම පැමිණිලි කිරීම අවශ්‍ය නොවන බව ජාතික පොලිස් කොමිෂන් සභාව පවසයි. එහි මහජන පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා පිහිටුවා ඇති *CIU* නම් විශේෂ ඒකකය මෙවැනි සිදුවීම් සම්බන්ධයෙන් මාධ්‍ය වාර්තා, සමාජ මාධ්‍ය ප්‍රකාශ ආදී සියල්ල සැලකිල්ලට ගැනීම ද විශේෂත්වයකි.

ජාතික පොලිස් කොමිසම පවසන්නේ යම් පොලිස් නිලධාරියකු යම් පුද්ගලයකුට වධහිංසා පමුණුවා ඇත්නම් උසස්වීම් ලබා නොදීම ඇතුළු විනය ක්‍රියාමාර්ග ගන්නා බවයි.

මෙම තරුණයාට පොලිසිය වධහිංසා පමුණුවා ඇත්නම් ඒ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක විය යුතුය.

■ **සජීව විජේවීර**

# ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරන ලෙස අයිතිවාසිකම් ආරක්ෂකයෝ බල කරති

ත්‍රස්ත විරෝධී නීතිය ඉවත් කිරීම සඳහා මහජන පෙත්සමකට අත්සන් කිරීමට කොළඹ කොටුව දුම්රිය ස්ථානයෙන් පිටතදී තමන් සමඟ එක්වන ලෙස අයිතිවාසිකම් ආරක්ෂා කරන්නන් ගණනාවකට රුකී ප්‍රනාන්දු ආරාධනා කළේය.

ප්‍රකට මානව හිමිකම් ආරක්ෂකයෙකු සහ මාධ්‍යවේදියෙකු වන රුකී ප්‍රනාන්දු ආගමික නායකයෙකු සමඟ පෙත්සමට අත්සන් කිරීමට ගියේ 2014 වසරට පෙර සිට ම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) ඉවත් කිරීමට ඔහු සටන් කරමින් සිටි බැවිනි.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඉවත් කරන ලෙස රජයට බලපෑම් කිරීම සඳහා 2022 පෙබරවාරි 15 වන දින කාර්යබහුල කොළඹ නගරයේ දී රුකී සමඟ සිය ගණනක් ජනතාව පෙත්සමට අත්සන් කළහ. පොදු බස් රථවල ගමන් කරමින් සිටි කිහිප දෙනෙක් ද බැස විත් පෙත්සමට අත්සන් කළහ.

එයට හේතුව නම්, දිගුකාලීනව අත්තනෝමතික ලෙස රඳවා තබා ගැනීම සඳහාත්, වධහිංසා පැමිණවීම මගින් බොරු පාපොච්චාරණයන් ලබා ගැනීමටත්, සුළුතර ප්‍රජාවන් සහ විරුද්ධ දේශපාලන පක්ෂ සාමාජිකයින් ඉලක්ක කර ගැනීම සඳහාත්, වසර 40කට වැඩි කාලයක් තිස්සේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත භාවිත කර තිබීමයි.

## ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්

ප්‍රනාන්දු මහතා පෙත්සමට අත්සන් තැබුවා පමණක් නොව, එම කුරිරු නීතිය අවලංගු කරන ලෙසට පෙත්සම්කරුවන් විසි එක් දෙනෙකුගේ පෙත්සමක් ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ පෙබරවාරි 17 වැනි දින ගොනු කළේය.

අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සීමා කරමින්, ගමන් බිමන් සීමා කරමින්, ඔහු ද ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ද රඳවාගෙන සිටි අතර, නිදහස් කිරීමෙන් පසුව පවා ඔහුගේ නඩුව වසර පහකට ආසන්න කාලයක් ඇදී ගියේය. ඔහුගේ ඉලෙක්ට්‍රොනික උපකරණ තවමත් ආපසු ලබා දී නැත.

2014 වසරේ මානව හිමිකම් ආරක්ෂක බාලේන්ද්‍රන් ජයකුමාරි සහ ඇගේ 13 හැවිරිදි දියණිය අත්අඩංගුවට ගැනීමෙන් පසු ප්‍රනාන්දු සහ යාපනයේ පිහිටි සාමය හා සංහිඳියා මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ප්‍රවීන් ඕමි පියතුමා එම ප්‍රදේශය නිරීක්ෂණය කළහ. ඇය දින 362ක් රඳවාගනු ලැබුවාය.

ප්‍රනාන්දු අත්අඩංගුවට ගැනීමට ලබාදුන් හේතු අතර රජය අපහසුතාවයට පත්කිරීම සහ මුදල් ඉපයීම සඳහා විදේශ රටවලට තොරතුරු සැපයීමද විය.

තාවකාලික පියවරක් ලෙස 1979දී හඳුන්වා දෙන ලද ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මගින් නිශ්චිත නොවන නීති විරෝධී ක්‍රියාකාරකම් සඳහා වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගැනීමට සහ අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් තොරව මාස 18ක් දක්වා රඳවා තබා ගැනීමට ඉඩ ලබා දෙයි.

මෙම නීතිය යටතේ රඳවාගෙන සිටින අය අතර මානව හිමිකම් ආරක්ෂකයෝ, මාධ්‍යවේදීහු සහ විපක්ෂ දේශපාලනඥයෝ ද වෙති.

මානව හිමිකම් කොමිෂන් සභාවට අනුව, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ 2021දී අත්අඩංගුවට ගැනීම් 109ක් සිදු වී ඇත. 2022 ජනවාරි වන විට පුද්ගලයින් 392 ක් රක්ෂිත බන්ධනාගාර ගත කර තිබිණි.

## මතුපිට වෙනස්කම් ප්‍රමාණවත් නැත

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මගින් දශක හතරකට අධික කාලයක් ශ්‍රී ලාංකිකයන් බොහෝ දෙනෙකු භීතියට පත් කර ඇති බවත්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරනවා වෙනුවට මතුපිටින් වෙනස්කම් සහිතව එය සංශෝධනය කිරීමට රජය උත්සාහ කරන බවත්, පෙත්සම්කරුවන් විසිඑක් දෙනාගෙන් එක් අයෙකු වන ප්‍රනාන්දු පැවසීය.

“වධහිංසාවට තුඩු දෙන බලහත්කාර පාපොච්චාරණයන්, විධායකයේ අභිමතය සහ කැමැත්ත පරිදි අධිකරණ අධීක්ෂණයකින් තොරව දිගු කාලයක් රඳවා තබා ගැනීම සහ ඇප ලබා දීම සඳහා අධිකරණ බලතල දැඩි ලෙස සීමා කිරීම වැනි බරපතළ ගැටලු රාශියකට මෙම යෝජිත වෙනස්කම් මගින් විසඳුම් නොලැබෙයි.” ප්‍රනාන්දු කියයි.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා තබා ගනු ලැබූ බොහෝ දෙනෙකු වසර 9-15ක් දක්වා තබා ගැනීමෙන් පසු නිදහස් කර ඇත්තේ ඇතැමුන්ට එරෙහිව විධිමත් චෝදනා ගොනු කිරීමකින් ද තොරව බවත්, ඔහු ප්‍රකාශ කළේය.

“සංශෝධන මගින් ශ්‍රී ලාංකිකයන්ගේ අයිතිවාසිකම්, අභිමානය සහ යහපැවැත්ම සහතික කරන බවක් නොපෙනෙන නමුත් ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය බරපතළ ලෙස උල්ලංඝනය කෙරෙන මෙම කුරිරු නීතිය නිසා , දැනටමත් අර්බුදයට ලක්ව ඇති ආර්ථිකයට විශාල පහරක් එල්ල කරමින් ජී එස් පී ප්ලස් වෙළෙඳ සහන අහෝසි වීමට හේතු විය හැකි නිසා, මෙය, යුරෝපා සංගමය, එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ජාත්‍යන්තර ප්‍රජාව රවටා සනසාලීමේ උත්සාහයකි.” යැයි ප්‍රනාන්දු පැවසීය.

ජීඑස්පී ප්ලස් යෝජනා ක්‍රමය මගින් අපනයනකරුවන් සඳහා යුරෝපා සංගම් වෙළඳපොළට වඩා හොඳ ප්‍රවේශයක් ලබා දෙයි. යුරෝපා සංගමය චීනයට පසුව ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම වෙළඳ හවුල්කරු වෙයි.

## මාධ්‍යවේදීන් බියගැන්වීමේ මෙවලමක්

ප්‍රනාන්දු මෙන්ම, පෙබරවාරි 04 වැනි දින නොපැවති විරෝධතා පා ගමනක් තහනම් කරමින් ලබාගත් අධිකරණ නියෝගයකින් දෙමළ මාධ්‍යවේදී පුන්නියමූර්ති සසිකරන් ද හිරිහැරයට පත් වී ය.

“ජාතික නිදහස් දිනයේ රාජ්‍ය විරෝධී පාගමනක් සංවිධානය කරන බවට පොලිසිය උසාවි නියෝගයක් ගෙන තිබුණා. එදින රාත්‍රිය වනතුරු නිවසින් පිටව යාමට මට අවස්ථාවක් නොලැබුණු අතර එය මාධ්‍යවේදීන් බිය ගැන්වීමේ උපක්‍රමයක්” යැයි මඩකලපුව දිස්ත්‍රික් දෙමළ මාධ්‍යවේදීන්ගේ සංගමයේ සාමාජික සසිකරන් ප්‍රකාශ කළේය.

“පොලිසිය ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අනිසි ලෙස භාවිතා කර මාව හය වතාවකට වඩා ප්‍රශ්න කිරීම සඳහා පොලිස් ස්ථානයට ගෙන ගියා” මාර්තු 10 වන දින සසිකරන් පැවසීය.

සිවිල් යුද්ධයට අදාළ සමරු ඡායාරූප සමාජ මාධ්‍යවල පළ කිරීමෙන් පසු දෙමළ මාධ්‍යවේදියෙකු වන මුරුගුපිල්ලේ කොකුලතාසන් දින 427ක් අත්අඩංගුවේ පසු වූ බව ද සසිකරන් ප්‍රකාශ කළේය.

”ඕනෑම වෙලාවක අත්අඩංගුවට ගන්න බලය තිබෙන බව පෙන්වා මාධ්‍යය බය කරන්න ඔවුන් හදනවා. ආරක්ෂක නිලධාරීන්ට ඕන මාධ්‍යවල හඬ යටපත් කරන්නයි, ඒ සඳහා මාධ්‍යවේදීන් මර්දනය කරන්න, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යොදාගෙන තිබෙනවා,” සසිකරන් පැවසීය.

කෝකුලතාසන් 2020 නොවැම්බර් 28 වැනි දින මඩකලපුවේදී අත්අඩංගුවට ගෙන ඇත.

කීර්ති රත්නායක නම් තවත් මාධ්‍යවේදියෙකු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ 2021 අගෝස්තු 14 වන දින අත්අඩංගුවට ගෙන තිබේ.

ප්‍රකට මුස්ලිම් නීතීඥයෙකු වන හිජාස් හිස්බුල්ලා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ 2020 වසරේ අත්අඩංගුවට ගනු ලැබීය. පාස්කු ඉරිදා මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරකයකුට සහය දුන් බවට ඔහුට මුලින් චෝදනා එල්ල කළ නමුත් පසුව පොලිසිය එම චෝදනා ඉවත දමා වාර්ගික සහජීවනයට එරෙහි වීමේ චෝදනා යටතේ නව නඩු ගොනු කිරීමකට කටයුතු කළේය.

## චෝදනා නැතිව වසර 12ක්

සිවිල් යුද්ධයේ අවසන් කාලයේ එල්.ටී.ටී.ඊ සංවිධානයට මුදල් එකතු කිරීමේ චෝදනාව මත යාපනයේ කරවෙට්ටි ප්‍රදේශයේ පදිංචිකරුවෙකු 2010 වසරේ කොළඹදී අත්අඩංගුවට ගනු ලැබීය. ඔහුට එරෙහි චෝදනා ඔප්පු කිරීමට අපොහොසත් වීම නිසා වසර 12කට පසුව ඔහු නිදහස් කරනු ලැබීය. ඔහු නිදහස් කිරීමට අධිකරණය නියෝග කළේ පෙබරවාරි 15 වැනිදාය.

2004 වසරේ සිට ශ්‍රී ලංකාවේ මාධ්‍ය සේවකයින් කිහිප දෙනෙකු ඝාතනය කර ඇත. තවත් බොහෝ දෙනෙකුට පහරදීම්, පැහැරගැනීම්, තර්ජනය කිරීම් හෝ රටින් පිටවීමට බල කරනු ලැබ ඇත.

නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමේ, රැස්වීමේ සහ සංවිධානයවීමේ අවකාශය ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මගින් සීමා කරනු ලබයි.. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්, ලිංගික හිංසනය සහ වධහිංසා පැමිණවීම් සඳහා බලපත්‍රයක් ලෙස මෙම නීතිය ක්‍රියාත්මක වී තිබේ.

මාධ්‍යවේදී ජයප්‍රකාශ් තිස්සනායගම්ට, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ, 2009 වසරේ දී වසර විස්සක බරපතළ සිරදඬුවමක් නියම විය. ඔහුගේ ලිපි මගින් වාර්ගික වෛරය සහ ත්‍රස්තවාදය ප්‍රවර්ධනය කළ බව ඔහු අත්අඩංගුවට ගැනීමට හේතු ලෙස දැක්වීය.

පසුගිය දශකය තුළ මාධ්‍යවේදීන්ට සහ මාධ්‍ය ආයතනවලට පහරදීමේ සිද්ධීන් 138ක් වාර්තා වී ඇති අතර, මාධ්‍යවේදීන් සුරැකීමේ ජාත්‍යන්තර කමිටුවට අනුව 2005 වසරේ සිට ශ්‍රී ලංකාව තුළ මාධ්‍යවේදීන් සහ මාධ්‍ය සේවකයින් 16 දෙනෙකු ඝාතනය කර ඇත. මෙම සියලු නඩු නොවිසඳී පවතී. අපරාධකරුවන් කිසිවකු තවමත් අත්අඩංගුවට ගෙන නොමැති බවට ශ්‍රී ලංකාවේ මාධ්‍යවේදීහු හඬ නගති.

ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය අතරතුර සහ ඉන් පසු කාලයේ දී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වූ බොහෝ රැඳවියන් දෙමළ ජාතිකයින් වූ අතර 2019 පාස්කු ප්‍රහාරයේ සිට බොහෝ රැඳවියන් මුස්ලිම්වරුන් වූයේ මෙම නීතිය සුළු ජාතීන්ට අසමාන ලෙස බලපා ඇති නීතියක් බව පෙන්නුම් කරමිනි.

රටේ පාලකයන් තම බලය රැකගැනීම සඳහා වරින් වර විවිධ ජන කොටස් සම්බන්ධයෙන් සමාජය තුළ භීතියක් ඇති කර ඇති බව මානව හිමිකම් පිළිබඳ නීතිඥ එර්මිසා ටයිගල් (ඊරපසී ඔසටැක) පැවසුවාය.

"මෙම නීතියෙන් සිදුවන හානිය මම දිගටම දකිමි. මෙම නීතිය සමාජයේ සුළු ජාතීන් බියට පත් කරයි. එය අත්අඩංගුවට ගත් පුද්ගලයින්ට පමණක් නොව මුළු සමාජයටම බිය පතුරුවයි" ටයිගල් ප්‍රකාශ කළාය.

## ජනාධිපතිවරයාගේ මාර්ගෝපදේශ

විමර්ශනවල වගකීමෙන් මිදීමේ කෙටි මගක් ලෙස පොලිසිය ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත භාවිත නොකළ යුතු බවටත්, ත්‍රස්තවාදයට පැහැදිලි සම්බන්ධතා තිබේ නම් පමණක් එය භාවිත කළ යුතු බවටත්, ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා මාර්ගෝපදේශයක් නිකුත් කළේය.

නීති පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට ගරු කරමින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වෙනස් කරන බවට පසුගිය ආණ්ඩු කිහිපයක් පොරොන්දු වූ නමුත් ඔවුන් බලයට පත්වීමෙන් පසු නීතිය වෙනස් කළේ නැත.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වූ බොහෝ රැඳවියන් වසර 15ක් දක්වා වූ කාල සීමාවන් රඳවා තබා ගැනීමෙන් පසු නිවැරැදිකරුවන් ලෙස නිදහස් කර ඇති අතර ඔවුන්ගෙන් ඇතැමුන්ට එරෙහිව විධිමත් චෝදනා ගොනු කිරීමක් හෝ කර නොතිබිණි.

## 'වහාම සමාලෝචනයක් අවශ්‍යයි'

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශේෂඥයින් ඉල්ලා ඇත්තේ, ජාත්‍යන්තර මානව හිමිකම් නීතියට අනුකූල වීම සඳහා වහාම සමාලෝචනයක් සහ නීති සංශෝධනයක් සිදු කරන ලෙසයි.

පොලිසියට ලබාදී ඇති පාපොච්චාරණය සාක්ෂියක් ලෙස වලංගු වීම මෙම සංශෝධන පනත් කෙටුම්පත මගින් වෙනස් නොවේ. සැකකරුවෙකු ප්‍රශ්න කිරීම සඳහා ඕනෑම ස්ථානයක රඳවා තබා ගැනීමට මෙම පනත් කෙටුම්පත මඟින් පහසුකම් සලසා ඇති අතර එය දිගින් දිගටම වධහිංසා පැමිණවීමේ අවදානම සහ බලහත්කාරයෙන් අතුරුදන් කිරීමේ අවදානම වැඩි කරයි.

හියුමන් රයිට්ස් වොච් ප්‍රකාශ කළේ යුරෝපා වෙළඳපොළට තීරුබදු රහිත ප්‍රවේශය ලබා දීම සඳහා ශ්‍රී ලංකාව සිය මානව හිමිකම් බැඳීම් ඉටු කළ යුතු බවට යුරෝපා සංගමය බල කළ යුතු බවයි.

ශ්‍රී ලංකාව තුළ අයිතීන් පිරිහීම පිළිබඳව මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් මිචෙල් බැචලේ නැවත නැවතත් අනතුරු අඟවා තිබේ.

ප්‍රනාන්දු ඇතුළු සියලුම මානව හිමිකම් ආරක්ෂකයින් පවසා ඇත්තේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම මිස එය සංශෝධනය කිරීමෙන් පලක් නොමැති බවයි.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වූ ඇතැම් දෙමළ රැඳවියන් නිවැරැදිකරුවන් ලෙස අධිකරණයෙන් නිදහස් කිරීමට වසර හතක්, දහතුනක්, පහළොවක් ගත වූ අවස්ථා ඇති බවත්, ඔවුන්ට සහ ඔවුන්ගේ පවුල්වල ජීවිතවලට වූ විනාශය පිළිබඳව පිළිගැනීමක් හෝ වන්දි ගෙවීමක් හෝ සිදු නො වූ බවත් රුකී ප්‍රනාන්දු කියයි.

"ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරනවා වෙනුවට, වධහිංසා පැමිණවීමට තුඩු දෙන බලහත්කාර පාපොච්චාරණයන්, අධිකරණ අධීක්ෂණයකින් තොරව ආණ්ඩුවේ විධායක හස්තයේ අභිමතය සහ සිතැඟි අනුව දීර්ඝ කාලයක් රඳවා තබා ගැනීම සහ ඇප ලබා දීමේ අධිකරණ බලය බරපතළ ලෙස සීමා කිරීම වැනි බරපතළ ගැටලුවලට අර්ථවත් ලෙස විසඳුම් ලබා නොදෙන මතුපිට වෙනස්කම් සමඟ එය සංශෝධනය කිරීමට රජය උත්සාහ කරයි."ප්‍රනාන්දු ප්‍රකාශ කරයි.

"අයිතිවාසිකම් ආරක්ෂා කරන්නන්ට සහ මාධ්‍යවේදීන්ට ඔවුන්ගේ නිදහස් අදහස් ප්‍රකාශනයට සහ සංවිධානය වීමට ඇති ඉඩකඩ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මගින් අඩු කරනු ලබයි" ප්‍රනාන්දු පැවසීය.

■ **ක්වින්ටස් කොළඹගේ**

# ෂෙහාන් මාලක අත්අඩංගුවට ගැනීම හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියට වැට බැඳීම

පෙබරවාරි 4 වැනිදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තමන් අත්අඩංගුවට ගනු ලැබීම සම්බන්ධයෙන් 2022 මාර්තු 15 වැනිදා සමාජ ක්‍රියාකාරික ශෙහාන් මාලක ගමගේ මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් කළේය.

පාස්කු ඉරුදින ප්‍රහාරයේ වින්දිතයින් වෙනුවෙන් යුක්තිය ඉටු කරන ලෙසත් ප්‍රහාරයට වගකිවයුත්තන් නීතිය හමුවට පමුණුවන ලෙසත් සමාජ මාධ්‍ය හරහා සේම සම්ප්‍රදායික මාධ්‍ය හරහාත් ආණ්ඩුවට බලපෑම් කිරීමට ශෙහාන් මාලක පසුගිය කාලය පුරා කටයුතු කර තිබිණි.

පානදුර වලාන ප්‍රදේශයේ දී සිය පෙම්වතිය හා ඇගේ පියා සමග මහ මග ගමන් කරමින් සිටියදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේනතුවේ නිලධාරීන් පිරිසක් ඔහු අත්අඩංගුවට ගෙන තිබිණි. ඒ 2022 පෙබරවාරි 14 වැනිදාය. සිවිල් ඇඳුමින් සැරසුරණු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඔහු අත්අඩංගුවට ගැනීම සඳහා පැමිණ තිබුණේ සුදු පැහැති වෑන් රථයකිනි. ඒ අවස්ථාවේ සිය ජංගම දුරකථනයෙන් 'ෆේස්බුක් ලයිව්' සක්‍රිය කළ ශෙහාන්, රහස් පොලිසියේ යැයි පවසන සිවිල් ඇඳුමින් සුදු වෑන් රියකින් පැමිණි පිරිසක් තමන් පැහැරගෙන යන බව ප්‍රකාශ කළේය. මේ හේතුවෙන් එම අත්අඩංගුවට ගැනීම පිළිබඳ දැඩි අවධානයක් ඇති විය.

මාධ්‍ය සාකච්ඡාවකදී අදහස් පළ කිරීමක් සම්බන්ධයෙන් දරුණු ගණයේ අපරාධකරුවෙකු අත්අඩංගුවට ගන්නා ආකාරයට තමා වැනි ක්‍රියාකාරිකයෙකු අත්අඩංගුවට ගන්නට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට තිබූ වුවමනාව ප්‍රශ්නකාරී එකක් බව ශෙහාන් මාලක පවසයි.

පෙබරවාරි 14 වැනිදා රාත්‍රියේ ශෙහාන් මාලක රඳවා තබාගත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පෙබරවාරි 15 වැනිදා කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළ අතර ඔහු ඇප මත නිදහස් කිරීමට මහේස්ත්‍රාත්වරයා නියෝග කළේය.

### ශෙහාන් පළමුවැනියා නොවේ

පාස්කු ප්‍රහාරයේ වින්දිතයින්ට යුක්තිය ඉටු කරන්නැයි ආණ්ඩුවට බල කළ අය අතරින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හමුවට කැඳවූ එකම පුද්ගලයා ශෙහාන් මාලක ගමගේ නොවන බවද මෙහිදී සිහිපත් කිරීම වැදගත්ය.

පාස්කු ප්‍රහාරය ගැන සිදු කළ ප්‍රකාශයක් සම්බන්ධයෙන් 2021 නොවැම්බර් 15 වැනිදා ආචාර්ය සිරිල් ගාමිණි පියතුමා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හමුවට කැඳවා තිබුණේ ජාතික බුද්ධි සේවයේ අධ්‍යක්ෂ මේජර් ජනරාල් සුරේෂ් සලේ කළ පැමිණිල්ලකට අනුවය.

සිරිල් ගාමිණී පියතුමන්ගේ ප්‍රකාශයකට ෆේස්බුක් මගින් ප්‍රතිචාර දැක්වූ පන්නිපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවකු වන කුමාර ජෝසප් ද්වේශසහගත ප්‍රකාශයක් සිදු කළේ යැයි පවසමින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා තිබුණේය. 2022 පෙබරවාරි 5 වැනිදා පැය පහක් තිස්සේ ප්‍රශ්න කිරීමෙන් අනතුරුව ඔහු ද්වේශසහගත ප්‍රකාශයක් සිදු නොකළේ යැයි විමර්ශකයන් පිළිගත් බව ප්‍රශ්න කිරීමෙන් පසු පිටතට පැමිණි කුමාර ජෝසප් මාධ්‍යයට අදහස් දක්වමින් පවසා තිබිණි.

කොළඹ අගරදගුරු පදවියේ ජන සන්නිවේදන අධ්‍යක්ෂ ගරු ජූඩ් ක්‍රිසන්ත පියතුමන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා තිබුණේ 2022 පෙබරවාරි 17 වැනිදාය. පාස්කු ප්‍රහාර සිද්ධියට හිටපු ජනපති මෛත්‍රීපාල සිරිසේන ද වගකිවයුතු බවට සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග කළ ප්‍රකාශයක් සම්බන්ධව පරීක්ෂණයක් පවත්වන ලෙසට ගරු ජූඩ් ක්‍රිසන්ත පියතුමන් 2021 දෙසැම්බර් 10 වැනිදා අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුවට පැමිණිල්ලක් කර තිබූ අතර ඊට අදාළව ප්‍රකාශයක් ලබාදීම සඳහා පියතුමන් මෙසේ කැඳවා තිබිණි.

## පසුබිම් කතාව

2019 අප්‍රේල් 21 වන දා කොච්චිකඩේ ශාන්ත අන්තෝනි, කටුවාපිටිය ශාන්ත සෙබස්තියන්, මඩකලපුව සියොන් යන දේවස්ථානවලටත්, ෂැංග්‍රිල්ලා, කිංස්ග්බරි සහ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලවලටත් එල්ල කෙරුණු පාස්කු ඉරුදින ප්‍රහාරයෙන් කුඩා දරුවන්, කාන්තාවන් ඇතුළු පුද්ගලයින් 268 දෙනෙකු මියගිය අතර 500කට අධික පිරිසක් බරපතළ ලෙස තුවාල ලැබූහ. මේ වන විට එම ප්‍රහාරය සිදු වී වසර තුනකට ආසන්න කාලයක් ගත වී හමාරය. මැල්කම් කාදිනල් රංජිත් අගරදගුරුතුමා ඇතුළු කතෝලික ප්‍රජාවගේ අදහස වී තිබෙන්නේ තවමත් පාස්කු ඉරුදින ප්‍රහාරයේ වින්දිතයින්ට යුක්තිය ඉටු වී නොමැති බවය. බෝම්බ ප්‍රහාරයට සෘජුව සම්බන්ධ වූවන් හා ඔවුන්ට සහාය දැක්වූවන්, මහා මොළකරු හා එයට සහාය වූවන්, ප්‍රහාරය වළක්වාගත හැකිව තිබියදී තම වගකීම පැහැරහැරිය දේශපාලකයින්, රාජ්‍ය නිලධාරීන් හා බුද්ධි අංශ නිලධාරීන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක විය යුතු බව කාදිනල්වරයා ඇතුළු කතෝලක ප්‍රජාවේ දැඩි ස්ථාවරය වී තිබේ.

එසේම මේ ප්‍රහාරය පසුපස දේශපාලන කුමන්ත්‍රණයක් තිබුණේ නම් ඒ පිළිබඳ විමර්ශනයක් සිදු කර ඔවුන් කවුරුන්දැයි රටට හෙළි කරන ලෙස ඔවුන් නිරන්තරයෙන් රජයට බලපෑම් සිදු කරමින් සිටී.

ශෙහාන් මාලක ගමගේ එම අදහස සමාජය වෙත සන්නිවේදනය කිරීම සඳහා සක්‍රීයව ක්‍රියා කළ කතෝලික සමාජ ක්‍රියාකාරිකයෙකි.

## අත්අඩංගුවට ගැනීමේ ස්වභාවය

"පෙබරවාරි 14 වෙනිදා දවල් 2.30ට විතර දවල් මමත්, මගේ පෙම්වතියත්, ඇගේ පියාත් ගෙදර ඉඳලා මීටර් 200ක් විතර ඉස්සරහට ඇවිදගෙන ආවා. එතකොට අපි එමින් සිටිය පැත්තට ප්‍රතිවිරුද්ධ පැත්තේන් සුදු වෑන් රථයක් ආවා. වෑන් එක ඇතුළේ තැඹිළි පාට හා කොළ පාට ටී ෂර්ට් දාගත්ත කිහිප දෙනෙක් ඉන්නවා මම දැක්කා. වෑන් එක පහු කරලා මීටර් කිහිපයක් අපි ඉස්සරහට යනකොට රැවුල් වවා ගත්ත දෙන්නෙක් වෑන් එකෙන් බැහැලා මාලක මහත්තයා කියලා අපි ඉන්න පැත්තට ආවා. මම මගේ පෙම්වතියට එයාගේ ෆෝන් එකේ වීඩියෝ එක ඔන් කරන්න කියලා ඒ ආසන්නයේ පිට්ටනියේ වොලිබෝල් කෝඩ් එක පැත්තට දුවගෙන ගියා. මට ඕනෑ වුණේ මගේ ආරක්ෂාවට වොලිබෝල් සෙල්ලම් කරමින් සිටි පිරිසගේ අවධානය ගන්න. වොලි බෝල් කෝඩ් එකට ඇතුල් වෙන්න බැරි වෙන්න ලොක් කරලා තිබුණා. ඊට පස්සේ තුන් දෙනෙක් මාව පස්සෙන් පන්නගෙන ඇවිත් සී.අයි.ඩී. කියලා හැඳුනුම්පත් පෙන්නලා මාව අල්ලා ගත්තා.

"ඇයි මාව අත්අඩංගුවට ගන්නේ.. මොකක්ද මම කරපු වරද? කියලා මම ඇහුවා. 120 යටතේ අත්අඩංගුවට ගන්නේ කියලා ඒ අය කිව්වා."

තමන් අත්අඩංගුවට ගැනීමේ ක්‍රියාවලිය ශෙහාන් මාලක විස්තර කළේ එසේය. පසුව අනාවරණය වන කරුණු අනුව ඔහුව අත්අඩංගුවට ගෙන තිබුණේ පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් 2021 අගෝස්තු 21 මරදාන සමාජය හා සාමයික කේන්ද්‍රයේදී පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවක් සම්බන්ධයෙනි.

## පොලිස් මාධ්‍ය ප්‍රකාශකගේ ආකල්පය

2021 අගෝස්තු 17 වැනිදා සමාජ මාධ්‍ය ජාලාවල පළ කළ යම් කිසි ප්‍රකාශයක් සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විමර්ශනයක් සිදු කොට, උදෘත ගොනු කර, අපරාධ නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව නීතිපතිවරයා වෙත යොමු කළ බවත් ඒ අනුව 2022 ජනවාරි 24 වන දා නීතිපතිවරයා නිකුත් කළ ලිපියට අනුව ශෙහාන් මාලක යන අය දණ්ඩ නීති සංග්‍රහයේ 120 වගන්තිය යටතේ වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන ලෙසට නියෝග කළ බවත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, ජ්‍යෙෂ්ඨ පොලිස් මාධ්‍ය ප්‍රකාශක නීතිඥ අජිත් රෝහණ 2022 පෙබරවාරි 21 වෙනි දා දෙරණ රූපවාහිනී නාලිකාවේ 360 වැඩසටහනට එක් එක් වෙමින් පැවසීය.

එහිදී ජ්‍යෙෂ්ඨ පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා වැඩි දුරටත් ප්‍රකාශ කළේ, ශෙහාන් මාලක අත්අඩංගුවට ගැනීමට මාස 6කට ආසන්න කාලයක් ගත වුණේ ඔහු සිදු කළ ප්‍රකාශය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විමර්ශන සිදු කරමින් සිටි නිසා බවය.

සිවිල් ඇඳුමින් සැරසී නිල නොවන රථයකින් පැමිණ මහ මගදී පොලීසිය මගහරිමින් සිටින අපරාධකාරයෙකු අත්අඩංගුවට ගන්නා ආකාරයෙන් ශෙහාන් මාලක අත්අඩංගුවට ගැනීම ගැනීමෙහි වරදක් නැති බවත් එය පොලිසියේ අයිතියක් බවත් හැඟවීමට පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා එම වැඩසටහනේදී උත්සාහ කළේය.

නීතිපතිවරයා ලිපිය නිකුත් කළ ජනවාරි 24 දා සිට ශෙහාන් අත්අඩංගුවට ගත් පෙබරවාරි 14 දක්වා දින 21කට නැති නම් සුමාන 3කට ආසන්න කාලයක් ගත වී තිබුණද ශෙහාන්ට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හමුවේ පෙනී සිටින ලෙස විධිමත්ව සිතාසියක් මගින් හෝ පොලිස් පණිවිඩයක් මගින් හෝ දැනුම් දීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණේ නැත. එයින් අපට අනුමාන කළ හැක්කේ මෙය ශෙහාන් මාලක බියට හා ත්‍රාසයට පත් කර ඔහුගේ හඬ යටපත් කිරීමේ අරමුණින් සිදු කළ අත්අඩංගුවට ගැනීමක් බවය.

## අයිතිවාසිකම් කඩවීමක්

ශෙහාන් මාලක අත්අඩංගුවට ගැනීම ගැන ඔහු වෙනුවෙන් අධිකරණය හමුවේ පෙනී සිටි නීතීඥ අමිල එගොඩමහවත්ත මෙසේ පැවසුවේය.

"අත්අඩංගුවට ගත් ස්වභාවය අනුව ශෙහාන් මාලකගේ අයිතිවාසිකම් කඩවීමක් සිදු වෙලා තියෙනවා. ශෙහාන් මාලක කියන්නේ සිවිල් ක්‍රියාකාරිකයෙක්. මින් පෙර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණෙන්න කියලා දන්වලා තිබුණු අවස්ථාවේ නීතිඥවරු සමග ඉදිරිපත් වෙලා දින අටක් තිස්සේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හමුවේ තමන්ගේ සියලු විස්තර ලබා දුන් ඔහු ඉතාම නීතිගරුකව කටුයුතු කළ අයෙක්. කිසි දිනක පොලිසිය හෝ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේනතුව මග හැර ගිය පුද්ගලයෙක් නොවෙයි. එසේ සහයෝගය ලබා දුන් පුද්ගලයෙක් මේ වගේ අත්අඩංගුව ගැනීම කෙතරම් සාධාරණද, නීත්‍යානුකූලද කියන ප්‍රශ්නය මෙතැනදී අපට මතු වෙනවා. නීතියෙන් පලා යන අපරාධකාරයෙක් වගේ සිවිල් ක්‍රියාකාරිකයෙක් අත්අඩංගුවට ගැනීම කිසිසේත් සාධාරණ නෑ."

නීතිඥවරයා පවසන ආකාරයට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පැමිණි ආකාරයේ බරපතළ ප්‍රශ්නයක් තිබේ. එම අවස්ථාවේ අත්අඩංගුවට පත් වන පුද්ගලයා පැමිණි පිරිස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ බව හඳුනා නොගෙන ප්‍රතිරෝධයක් දැක්වීමට ගියේ නම් ඔහුගේ ජීවිතයට අනතුරක් සිදු වෙන්න ඉඩ කඩ තිබූ බව ඔහු පවසයි. එසේ වූයේ නම් එය තවත් අතුරුදන් වීමක්, කතෘ අඥාත ඝාතනයක් වීමට තිබූ ඉඩකඩ බොහෝය. දශක ගණනාවක් ගෙවී ගියද අදටත් ඝාතකයා කවුදැයි සොයාගැනීමට පොලිසිය හෝ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අසමත් වූ එවැනි මරණ බොහොමයක් පිළිබඳ අත්දැකීම් මෙරට පුරවැසියාට තවමත් මතකය.

"මින් පෙර ශෙහාන් මාලකට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හමුවේ පෙනී සිටින්න කියපු වෙලාවේ නීතිඥයෝ කිහිප දෙනෙක් ඔහු වෙනුවෙන් ඉදිරිපත් වෙලා පෙනී හිටලා තිබුණා. කතෝලික සභාවේ පියතුමන්ලා ඔහු වෙනුවෙන් ඉදිරිපත් වෙලා තිබුණා. ඒ නිසා ඔවුන් හරහා ශෙහාන් සම්බන්ධ කර ගන්න අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට

හොඳටම ඉඩකඩ තිබුණා.

"නීතිය ඉදිරියේදී සෑම පුරවැසියෙකුටම සමාන සැලකිල්ලක් ලැබෙනවා නම් ශෙහාන් මාලක ගමගේටත් ඒ සමාන අවස්ථාව ලැබෙන්න තිබුණා. ඔහුව මහමගදී ඉතාමත් ත්‍රාසජනක ලෙස තමයි අත්අඩංගුවට ගෙන තිබෙන්නේ. ඒ නිසා පැහැදිලිවම නීතියට ගරුකරන පුද්ගලයෙක් ලෙස ශෙහොන් මාලකට අසමානකොට සැලකීමක් සිදු වෙලා තියෙනවා. චෝදනාව පවා ඔහුට හරියට කියන්නේ ඔහුම නැවත නැවත අහනකොට. වාහනේටත් දාගත්තට පස්සේ." නීතිඥ අමිල එගොඩමහවත්ත වැඩිදුරටත් පැවසීය.

## අදහස් පළ කිරීමේ අයිතියට බලපෑමක්

ශෙහාන් මාලක ගමගේගේ ප්‍රකාශවලින් ගම්‍ය වන වරද පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට අපහැදිලිතාවක් ඇති වූ නිසා නීතිපති උපදෙස් පැතූ බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අධිකරණය හමුවේ සඳහන් කර තිබේ. ඒ බව නඩු වාර්තාවල සඳහන්ය.

මාධ්‍ය සාකච්ඡාවකදී විනාඩි 20ක කාලයක් ශෙහාන් මාලක විවිධ කරුණු කතා කර තිබිණි. අපරාධ නඩු විධාන සංග්‍රහයේ 120 වගන්තියට අනුව ඒ කතාවේ කුමන කොටස තුළ ඔහු රජයට විරුද්ධව ජනතා අප්‍රසාදය ඇති වන ආකාරයේ ප්‍රකාශ කළේ දැයි නිශ්චිතව ප්‍රකාශ කිරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අසමත් වී තිබේ.

"යම් පුද්ගලයෙක් යම් වරදක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගන්නවා නම් ඔහු කළ ප්‍රකාශයේ මොන මොන කොටසද කියලා නිශ්චිත වෙන්න ඕනෑ. ජාතික ආරක්ෂාවට තර්ජනයක් නොවේ නම්, ව්‍යාජ කරුණු ඉදිරිපත් නොකරන්නේ නම් වැනි යම් යම් සීමාවන්ට යටත්ව වුවත් අදහස් ප්‍රකාශ කිරීමට පුරවැසියෙකුට අයිතියක් තියෙනවා. 120 වගන්තිය යටතේ වරදක් කළා කියලා තීරණය කරලා මේ ආකාරයෙන් කටයුතු කිරීම ශෙහාන් මාලක ගමගේ කියන පුරවැසියාගේ අදහස් දැක්වීමට ඇති අයිතියට බලපෑම් කිරීමක්" යැයි නීතිඥ අමිල එගොඩමහවත්ත පවසයි.

ශෙහාන් මාලක අත්අඩංගුවට ගත්, 'රජයට විරුද්ධව ජනතා අප්‍රසාදය' ඇති වන ආකාරයේ ප්‍රකාශ කිරීම ගැන සඳහන් වන 120 වගන්තියේ පසුව ව්‍යතිරේඛයක් ලෙස පෙන්වා දී තිබෙන්නේ රජයක්, ආණ්ඩුවක්, පාලනයක්, නීතිමය කාරණා සම්බන්ධයෙන් වැරදි ලෙස කටයුතු කරනවා නම් පුරවැසියෙකු ඒවා පෙන්වා දීම මේ පනත යටතේ වරදක් නොවන බවයි. වෙනත් ආකාරයකින් කියනවා නම් රජයේ වැරදි පෙන්වාදීමට පුරවැසියෙකුට අයිතියක් තිබේ.

ආණ්ඩුව සිදු කරමින් සිටින්නේ, පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධයෙන් වින්දිතයින්ට යුක්තිය ඉටු කරනවා වෙනුවට ඒ සම්බන්ධයෙන් අදහස් පළ කරන ශෙහාන් මාලක වැනි ක්‍රියාකාරිකයින් විටින් විට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හමුවට කැඳවමින්ද, අත්අඩංගුවට ගනිමින්ද ඔවුන්ගේ හඬ යටපත් කිරීමට වක්‍රව කටයුතු කිරීමයි.

■ **ප්‍රියන්ජිත් ආලෝකබණ්ඩාර**

# ‘සිරකරුවන්ගේ පවුල්වල අයද මනුෂ්‍යයෝය’

## පොලිසිය එය නොදැනීම ඛේදයකි!

‘සිරකරුවෝද මනුෂ්‍යයෝය’ යන තේමා පාඨයත් සමඟ වැලිකඩ බන්ධනාගාරයේ තාප්පයක් පුරා විහිදුණු දැවැන්ත චිත්‍රයකි. මෙය නිර්මාණය කර ඇත්තේ බන්ධනාගාරගත වූ සිත්තරෙකු විසිනි. කිසියම් හෝ නීති විරෝධි ක්‍රියාවක් සම්බන්ධයෙන් අත්අඩංගුවට පත්ව බන්ධනාගාරගත වූවකුට මනුෂ්‍යත්වයෙන් සලකන ලෙස කරනු ලබන ආයාචනයක් මේ තුළ ගැබ්ව තිබේ. එසේ වුවත් බන්ධනාගාර තුළදී මෙන්ම ඉන් පිටතදීද මනුෂ්‍යත්වයට පවා නිගාදෙන අන්දමින් ඔවුන්ට සලකන ආකාරය පිළිබඳව අපි කොතෙකුත් අසා ඇත්තෙමු. සිරුකරුවන්ට කෙසේ වෙතත් අඩුතරමින් ඔවුන්ගේ පවුල්වල අයට හෝ මනුෂ්‍යත්වයෙන් සලකන සමාජයක් අප හමුවේ තිබේද? සිරකරුවෙකුගේ පවුල්වල උදවිය සමාජයේදී අත්විඳින නින්දා, අපහාස, ප්‍රචණ්ඩත්වය, වෙනස්කොට සැලකීම සම්බන්ධව සමාජයක් ලෙස අප කතා කරන්නේ අඩුවෙනි. හිත්පාරවන මෙම අත්දැකීම් කිසිවෙකු හෝ බෙදා නොගෙන ඔවුනොවුන්ගේ පවුලේ අය සමඟ එම දුක් වේදනා කඳුළුවලට හරවා දිය කර හැරීමේ දුෂ්කර වෑයමක නිරතව සිටින සිරකරු පවුල් සංඛ්‍යාව දස දහස් ගණනකි.

පවුලේ අදායම් උපදවන පුද්ගලයා යම් වරදක් හේතුවෙන් සිරගත වුවහොත් ඔහුගේ හෝ ඇයගේ පවුලේ උදවිය පත්වන අසීරුතාව අමුතුවෙන් කිවයුතු නැත. කුසගින්න නිවා ගැනීමේ සිට දරුවන්ගේ අධ්‍යාපනය දක්වා සියලු කාරණා සපුරා ගැනීම ඔවුන්ට ප්‍රශ්නයකි. සිරගත වූ පුද්ගලයාගේ නඩු කටයුතු වෙනුවෙන් පෙනී සිටින අතර පවුල ජීවත් කරවීමේ වගකීමද පැවරෙන්නේ මවට, පියාට හෝ දරුවෙකුටය. මොවුන් ඇත්තෙන්ම කරන්නේ ජීවන අරගලයකි. සැමියා සිරගත වූ විට බිරිඳ හා දරුවන් ජීවන අරගලය ජය ගැනීමට ගන්නා වෑයම කුණාටු සයුරක රුවලක් පැද යනවාටත් වඩා අසීරුය. මේ අභියෝග හමුවේ අසරණ නොවී ජීවිතයට මුහුණ දෙන සිරකරුවන්ගේ පවුල්වල උදවිය ඇගයීම පිණිස මහනුවර මානව හිමිකම් කාර්යාලය සිරකරුවන්ගේ පවුල්වල සාමාජිකයින් ඇගයීමේ උත්සවයක් සංවිධානය කරන්නට කටයුතු කළේ ජගත් මානව හිමිකම් දිනයට සමගාමීව පසුගිය දෙසැම්බර් මස 11 වැනිදාය. බන්ධනාගාරගතව සිටින රැඳවූවන්ගේ සුබසිද්ධිය සඳහා කැපවීමෙන් කටයුතු කළ සහ අරගල කළ පිරිස් ඇගයීම වෙනුවෙන් මානව හිමිකම් කාර්යාලය මෙකී සම්මාන පිදීමේ උත්සවය වාර්ෂිකව පවත්වන අතර මෙවර ඔවුන් එය සංවිධානය කර තිබුණේ අඛණ්ඩව නවවන වතාවටය.

### ඇගැයීම විස වුණේ කාටද?

පූජකවරු, පොලිස් හා බන්ධනාගාර නිලධාරීන්, නීතිඥයින්, මානව හිමිකම් ක්‍රියාකාරීන් ඇතුළු 38 දෙනෙකු මෙයට ප්‍රථම අදාළ උත්සවය යටතේ ඇගයීමට ලක් කර තිබේ. මහනුවර මානව හිමිකම් කාර්යාලය මගින් 2021 ජාත්‍යන්තර මානව හිමිකම් දිනය නිමිත්තෙන් මහනුවර කැන්ඩියන් අර්ට්ස් හෝටලයේදී මෙවර උත්සවය පවත්වන්නට සැලසුම් කර තිබුණේ, බන්ධනාගාරගත වූවන්ගේ පවුල්වල සාමාජිකයින්ට මානව ගරුත්වය සහ මානුෂීය තත්ත්වයන් යටතේ සිටීමට ඇති අයිතිය තහවුරු කරමු යන්න තේමා කර ගනිමිනි. මෙම උත්සවය අධිකරණය මගින් තහනම් නියෝගයක් ලබා

ගනිමින් නතර කිරීමට මහනුවර පොලීසිය පියවර ගෙන තිබුණේ එමගින් සාමය කඩවීමේ අවදානමක් තිබෙන බවට පොලිසිය විසින් කරන ලද කරුණු දැක්වීමකට අනුවය.

මේ සම්බන්ධව අදහස් දක්වන මහනුවර මානව හිමිකම් කාර්යාලයේ අධ්‍යක්ෂ නන්දන මනතුංග පියතුමා මෙසේ ප්‍රකාශ කරන්නේය.

"බන්ධනාගාරගත වූවන්ගේ පවුල්වල එකමුතුවක් ගොඩනගා යුක්තිය උදෙසා කටයුතු කිරීම සඳහා ඔවුන්ට සහාය දීම මහනුවර මානව හිමිකම් කාර්යාලය මගින් කරනවා. මොකද සිරගතවූවන් සිරිමැදිරි තුළ විඳින වේදනාවලට වඩා දේවල් ඔවුන්ගේ පවුල්වල උදවිය සමාජය වෙතින් ලබනවා. වෙනස්කොට සැලකීම නිසා ඔවුන් විශාල මානසික පීඩනයකට ලක් වෙනවා. අනිත් පැත්තෙන් පවුලේ ආදායම් උපයන තැනැත්තා සිරගත වුණොත් එම පවුලේ සෙසු සාමාජිකයින් දැඩි අසරණ තත්ත්වයකට පත් වෙනවා. මේ සියලු ගැටලු විඳදරා ගනිමින් මොවුන් ජීවිතයට මුහුණ දෙන්නේ එක්තරා විදිහක අභියෝගක් විදිහටයි. මේ අයව අගය කරමින් අපි අවුරුදු 09ක් පුරා මේ උත්සවය පවත්වනවා. මෙවර ඒකට පොලිසිය මගින් තහනම් නියෝගක් ගත්තා. කෙසේ වුවත් ගැටලුව තිබෙන්නේ මේ නියෝගය සම්බන්ධව අවසන් මොහොත වනතෙක් පොලිසිය අපිව දැනුවත් නොකිරීමයි. මේ ගැන දැන ගැනීමට මා කිහිප අවස්ථාවක් පොලිසියට ගියත් ඔවුන් නොයෙක් හේතු දක්වමින් සත්‍යය වසන් කළා. අධිකරණයට ගොස් කරුණු කීමට ඇති අවස්ථාව පොලිසිය හිතාමතා ප්‍රමාද කළා."

## මානව හිමිකම්වලට සරදම් කිරීම

ලෝකයේ සියලු ජනතාවට උපතින්ම මූලික අයිතිවාසිකම්වලට ඇති අයිතියත් සමානාත්මතාව තහවුරු කිරීමත් අරමුණු කර ගනිමින් දෙසැම්බර් මස 10 දා ජාත්‍යන්තර මානව හිමිකම් දිනය ලෙස ප්‍රකාශයට පත්කර තිබේ. මූලික අයිතිවාසිකම්වලට ඇති අයිතිය සහ සමානාත්මතාව සියලු ජනතාවට තහවුරු කිරීම මානව හිමිකම් දිනය ප්‍රකාශයට පත් කිරීමේ අරමුණය. මානව හිමිකම් ගැටලු පිළිබඳව දැනුවත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ මානව හිමිකම් තත්ත්වය වැඩිදියුණු කිරීම ජාත්‍යන්තර මානව හිමිකම් දිනය සැමරීම ඔස්සේ අපේක්ෂා කරයි. එක්සත් ජාතීන්ගේ සාමාජිකයෙකු ලෙස ශ්‍රී ලංකාව 1955 දී මානව හිමිකම් ප්‍රඥප්තිය පිළිගත්තේය. මානව හිමිකම් දිනයේදී, මානව හිමිකම් සංවිධානයක් වසර 9ක් තිස්සේ පවත්වාගෙන ආ සමරු වැඩසටහනක් උසාවි නියෝගයකින් අත්හිටුවීමට පොලිසිය කටයුතු කර ඇති ආකාරයම, ලංකාවේ වර්තමාන මානව හිමිකම් තත්ත්වය පිළිබඳ ප්‍රබල පණිවුඩයක් සේ සැලකිය හැකිය.

වර්ෂයකදී බන්ධනාගාර ගතවන සංඛ්‍යාව සැලකීමේදී අසරණ තත්ත්වයට පත්වන පවුල් ගණන පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට පුළුවන. ඇම්නෙස්ටි ජත්‍යන්තර සංවිධානයේ දකුණු ආසියාතික නියෝජ්‍ය පර්යේෂණ අධ්‍යක්ෂ, නීතිඥ දිනූෂිකා දිසානායක මහත්මිය ඒ සම්බන්ධයෙන් මෙසේ අදහස් පළ කළාය.

## 2020 දී සැකකරුවන් අනූදාහක්

"අධිකරණය ඉදිරියේ වැරදිකරුවන් බවට පත්ව 2020 වසරේදී පුද්ගලයින් 93 දෙනෙකුට මරණ දඬුවම නියමව තිබෙනවා. ඒ අතරින් දෙදෙනෙකු කාන්තාවන්. බන්ධනාගාර දෙපාර්තමේන්තු සංඛ්‍යා ලේඛනවලට අනුව 2020 වසරේදී පොලිසිය මගින් සැකපිට අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ 90,000ක පමණ පිරිසක් බන්ධනාගාරවලට ඇතුළත් කර තිබෙනවා. මොවුන් වැරදිකරුවන් නොවූ සිරකරුවන් ලෙස හැඳින්විය හැකියි. ශ්‍රී ලංකාවේ සංවෘත බන්ධනාගාර 04ක් රිමාන්ඩ් බන්ධනාගාර 18ක් වැඩ කඳවුරු 10ක් විවෘත සිර කඳවුරු 02ක් පුහුණු පාසල් 01ක් තරුණයින් සඳහා විශෝධන මධ්‍යස්ථාන 02ක් සහ ලොකප් 23ක් තිබෙනවා. දිවයින පුරා විවිධ බන්ධනාගාරවලට දඬුවම් ලැබූ සිරකරුවන් ඇතුළත් කර තිබෙන සංඛ්‍යාව 19,000ක්. 2020 දෙසැම්බර් 31 වන විට පිරිමි 604ක් සහ කාන්තාවන් 54ක් වසර දෙකකට වැඩි කාලයක් නඩු විභාගයක් බලාපොරොත්තුවෙන් බන්ධනාගාරවල සිටින බව හෙළි වී තිබෙනවා. පුද්ගලයින් 93කට එම වසරේදී මරණ දණ්ඩනය නියමව තිබෙන අතර ඉන් දෙදෙනෙකු කාන්තාවන්."

මානව හිමිකම් දිනය සැමරීම සඳහා වූ උත්සවයක් සංවිධානය කිරීම අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය මගින් තහවුරු කළ අදහස් ප්‍රකාශනයේ සහ රැස්වීමේ නිදහස ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීමකි.

සමාජීය වශයෙන් වැදගත් සහ යුක්තිසහගත උත්සවයකට එරෙහිව යම් පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් විසින් අනීතික ක්‍රම මගින් බාධා කිරීමට සැලසුම් කරන්නේ නම් එවැනි බාධා කිරීම් වළක්වා එසේ කරන්නන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීම පොලිසියේ වගකීමය. එසේම අදාළ උත්සවය බාධාවකින් තොරව පවත්වාගෙන යෑම සඳහා සුදුසු ආරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීමේ වගකීමෙන්ද පොලිසියට බැහැර විය නොහැක්කේය.

## තහනමේ පදනම කුමක්ද?

මහනුවර අතිරේක මහේස්ත්‍රාත්වරයා, මහනුවර පොලිසිය විසින් දෙසැම්බර් මස 09 වැනිදා කරන ලද ඉල්ලීමකට අනුකූලව ඉහත කී උත්සවය පැවැත්වීම තහනම් කරමින් නියෝගයක් ලබා දී තිබුණේ අපරාධ නඩුවිධාන සංග්‍රහයේ 106 (1) වගන්තිය යටතේය. එම වගන්තිය ප්‍රකාරව සෞඛ්‍යයට හෝ ආරක්ෂාවට සිදුවන අනතුරක් හෝ කැරැල්ලක් හෝ කලහයක් ඇතිවිය හැකි බවට හැඟී යන්නේ නම් එම ක්‍රියාව සිදු කිරීමෙන් වැළකී සිටින ලෙස නියෝගයක් ලබාදීමට මහේස්ත්‍රාත්වරයාට පුළුවන. මානව හිමිකම් දින සැමරුම් උත්සවයට තාවකාලික තහනමක් පනවමින් දෙසැම්බර් මස 09 වැනි අධිකරණය මගින් ලබාදී තිබුණු නියෝගයේ සඳහන්ව තිබුණේ එමගින් විවිධ ජනවාර්ගික ප්‍රජාවන් අතර අසමගිය ඇති වීමට ඉඩක් ඇති බවකි. එම නියෝගය සම්බන්ධයෙන් මහනුවර මානව හිමිකම් කාර්යාලය මගින් 10 වැනි දින අධිකරණයට කරුණු දැක්වීමක් කළද අදාළ නියෝගය බලරහිත කිරීමක් සිදු නොවීය.

මෙරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වැනි ව්‍යවස්ථාවට අනුව සෑම පුද්ගලයකුටම සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහසට හිමිකම් තිබේ. එහි 14 වන ව්‍යවස්ථාව අනුව භාෂණයේ, රැස්වීමේ, සමාගමයේ, රැකියාවේ නිදහස පිළිබඳ කරුණු දක්වා තිබේ. 14 (අ) අනුව භාෂණයට, ප්‍රකාශනයට, අදහස් පළ කිරීමට හා තොරතුරුවලට ප්‍රවේශ වීමටද හිමිකම් ඇත. 14 (ආ) මගින් සාමකාමීව රැස්වීමේ නිදහසට ඇති හිමිකම් දක්වා තිබේ.

ඉහත දක්වන ලද මූලික අයිතිවාසිකම් භුක්ති විඳීමේදී ඊට ඇති සීමාවන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15 වන ව්‍යවස්ථාව හරහා දක්වා ඇත. ඒ අනුව එම අයිතිවාසිකම් 'රාජ්‍ය ආරක්ෂාව තහවුරු කිරීම පිණිස නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම්වලට' යටත් වේ. ජාතීන් හා විවිධ ආගමිකයන් අතර සහයෝගීතාව වර්ධනය කිරීම, ජාතික ආර්ථිකය ආරක්ෂා කිරීම, මහජන සෞඛ්‍යය හා සදාචාරය, මහජනයා ආරක්ෂා කිරීම පිළිබඳව එහි දක්වා ඇත. පොලිසිය අදාළ තහනම් නියෝගය ලබාගෙන තිබෙන්නේ මේ යටතේය.

මානව හිමිකම් ක්‍රියාධරයෙකු වන නීතිඥ සුරේන්. ඩී පෙරේරා ඒ පිළිබඳව මෙසේ පැහැදිලි කළේය.

## 'පොලිසියේ සැලසුම්සහගත ක්‍රියාවක්'

"මේ උත්සවය පැවැත්වීමට නොදීමෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහවුරු කර තිබෙන මූලික අයිතිවාසිකම් කිහිපයක් කඩ වී තිබෙනවා. භාෂණය හා අදහස් ප්‍රකාශනය සඳහා ලබාදී තිබෙන අයිතිය ඉන් ප්‍රධානයි. රැකියාවේ නිදහසද උල්ලංඝනය වී තිබෙනවා. මේක සංවිධානය කළ කෙනාගේ වෘත්තියේ කොටසක් මේක. ඕනෑම කෙනෙකුට අගය කිරීමක් ලබන්න පුළුවන්. පොලිසිය හා උසාවිය මේකට පහසුකම් සලසන්න ඕන. කවුරුන් හෝ මේකට අකමැති වෙලා බාධා කරනවා කියලා දැන ගන්න ලැබුණොත් පොලිසිය කළ යුත්තේ ඒ අය නතර කිරීමයි. නීත්‍යානුකූල ක්‍රියාවට ඉඩ හැරලා නීත්‍යනුකූල නොවන පිරිස වැළැක්වීම තමයි කළ යුතු වන්නේ. මෙතනදී පොලිසිය නවතා තිබෙන්නේ නීත්‍යානුකූලව කටයුතු කළ පිරිසගේ ක්‍රියාවයි. අධිකරණය මගින් මේක නතර කරන්න කියලා කරන නියෝගය සම්බන්ධව පොලිසිය පියතුමාට දැනුම් දිය යුතුයි. විවිධ ආකාරයෙන් මගහැරීම් කරලා 10 වැනි දින උසාවියට ඇතුළු වන දොරටුව අභියසදී තමයි පොලිසිය මේ නියෝගය පියතුමා අතට දුන්නේ. ඒ තුළින් තොරතුරු දැන ගැනීමේ අයිතියත් උල්ලංඝනය වෙලා තිබෙනවා කියලා අපි කරුණු දැක්වූවා. අධිකරණය මගින් නියෝගය ලබාගත් පිරිස අධිකරණයට නොපැමිණීම නිසා මහේස්ත්‍රාත්තුමාට අපේ කරුණු දැක්වීම අනුව නියෝගය අවලංගු කරන්න බැහැ. මෙතනදී පොලිසිය සැලසුම්සහගතව මේ උත්සවය පැවැත්වීම නතර කරන්න කටයුතු කළා."

මානව හිමිකම් ක්‍රියාධරයෙකු වන රුකී ප්‍රනාන්දු, මෙයට ප්‍රථම මහනුවර මානව හිමිකම් කාර්යාලය මගින් පැවැත්වූ මෙවැනි උත්සවයකදී සම්මානයට පාත්‍ර වූවෙකි. ඔහු මෙම තහනම පිළිබඳව මෙසේ පැවසුවේය.

## නීත්‍යානුකූල කාර්යයට රැකවරණය දිය යුතුයි

"මේක මානව හිමිකම් දිනය වෙනුවෙන් සංවිධානය කරන ලද වැඩසටහනක්. එතකොට ජත්‍යන්තර මානව හිමිකම් දිනය සැමරීමට බාධාවක් සිදු කර තිබෙන බව පැහැදිලියි. පොලිසිය මේ වැඩසටහනේ වරදක් පිළිබඳ කතා කරලා තිබුණේ නැහැ. ඔවුන් කරන්න ඕන නිත්‍යානුකූල සාමාකාමී වැඩසටහනකට කවුරුන් හෝ පැමිණ බාධා කරනවා නම් ඒ අයට විරුද්ධව කටයුතු කිරීමයි. පොලිසිය කරන්න තිබුණේ කලබල කරයි කියලා එයාලා අනුමාන කරපු අයට විරුද්ධව වාරණ නියෝගයක් ගැනීමයි. එහෙම නැත්නම් එවැන්නක් සම්බන්ධයෙන් ඔවුන්ට ලැබුණු තොරතුරට අනුව නීත්‍යානුකූලව ක්‍රියාකරන්න තිබුණා. තේමාව වෙලා තිබුණේ සිරකරු අයිතිවාසිකම් හා ඔවුන්ගේ පවුල්වල අයව ඇගයීමයි. ඒ වගේ දේකට බාධා කිරීමත් බරපතළ කාරණයක්. 'සිරකරුවෝද මනුෂ්‍යයෝය' කියලා ලංකාවේ ප්‍රධාන බන්ධනාගාරයක ගහලා තිබුණට ඒක බොරුවක් කියලා ඔප්පු වුණු අවස්ථාවක් මේක. අනිත් පැත්තෙන් 'සිරකරුවන්ගේ පවුල්වල අයද මනුෂ්‍යයෝය' කියලා අපිට කියන්න වෙනවා. ඒ අය කිසිදු වරදක් කරලා නැහැ. කිසිදු වරදක් නොකර පීඩාවට පත්ව සිටින පිරිසක් ඇගයීමට ලක් කිරීමට යෑමේදී ඒකට බාධා සිදු කිරීම බරපතළ තත්ත්වයක් සහ ඛේදවාචකයක්."

මෙම සිදුවීමට අදාළව පළවූ ඇතැම් මාධ්‍ය වාර්තා අතිශයින්ම පක්ෂපාතී ඒවා විය. පිළිතුරු ලබාදීමට අනෙක් පාර්ශ්වයට ඇති අයිතියට පවා ඉඩ නොදෙමින් ඉදිරිපත් කර තිබූ එම වාර්තා මගින් ජාති හා ආගම්වාදී ගැටුම් නිර්මාණය විය හැකි තත්ත්වයක් දක්නට ලැබිණි. 'සිරකරුවෝද මනුෂ්‍යයෝ' යැයි අපි සලකන්නෙමු. සිරගත වූවන් සමාජයෙන් වෙන්ව ජීවත් වන බැවින් සමාජ ප්‍රතිචාර අතිවිඳීමේ අවස්ථාව ඔවුන්ට නොලැබෙන්නේය. ඒ සියල්ල අත්විඳින්නට සිදුවන්නේ ඔවුන්ගේ පවුල්වල උදවියටය. වෙනස්කොට සැලකීමේ පීඩාව නිරන්තරයෙන් අත්විඳින ඔවුන්ට භාෂණයේ හා ප්‍රකාශනයේ පමණක් නොව ඇගයුමක් ලැබීමේ අයිතියද අහුරාලන්නේ නම් එය සමාජ කතිකාවට ලක් විය යුතු කරුණකි.

■ **අසේල කුරුළුවංශ**

# සිරගත වූ පියා වෙනුවෙන් දඬුවම් විඳින දියණියක්

මහනුවර ශ්‍රී දළදා මාලිගාවට එල්.ටී.ටී.ඊ සංවිධානය මගින් බෝම්බ ප්‍රහාරයක් එල්ල කරනු ලැබ මේ වන විට වසර 24ක් ගතව තිබේ. බෝම්බ ඇටවූ ලොරියක් දළදා මැදුරේ ප්‍රධාන වාහල්කඩ අසලදී පුපුරුවා හරිනු ලැබුවේ හරියටම 1998 ජනවාරි මස 25 දිනය. මෙම පිපුරුමෙන් දළදා මැදුරට දැඩි අලාභහානි සිදු වූ අතර පුද්ගලයින් 16 දෙනෙකුට දිවි අහිමි විය.

එම ප්‍රහාරයෙන් පසු ඊට ආධාර අනුබල දුන් බවට සිව් දෙනෙකු සම්බන්ධයෙන් පොලිසිය කරුණු අනාවරණය කර ගත්තේය. ඒ අතරින් අත්අඩංගුවට ගැනීමට හැකි වූයේ තිදෙනෙකු පමණි. සිද්ධියේ මහ මොළකරු යැයි පැවසුණු පුද්ගලයා අත්අඩංගුවට ගැනීමට පොලිසිය අපොහොසත් වූ අතර නඩුව විභාග වූයේ ඔහු නොමැතිවය. මහනුවර මහාධිකරණයේදී දීර්ඝ කාලයක් පැවති නඩු විභාගය අවසානයේ එක් අයෙකු නිදොස් කොට නිදහස් කළ අතර අනෙක් තිදෙනාට මරණීය දණ්ඩනය සමඟ වසර 1850ක බරපතළ වැඩ සහිත සිර දඬුවමක් නියම විය. අත්අඩංගුවට ගැනීමට නොහැකි වූ පුද්ගලයාටද මෙකී දඬුවම් නියම වූයේ ඔහු අත්අඩංගුවට ගත් දවසක එකී දඬුවම ක්‍රියාත්මක වන බව දැනුම් දෙමිනි. සිරදඬුවම් විඳිමින් සිටියදී එක් අයෙකු හෘදයාබාධයකින් මරණයට පත් වූ අතර මේ වන විට එකී සිද්ධිය සම්බන්ධයෙන් දඬුවම් විඳිමින් සිටින්නේ එක් අයෙකු පමණි.

## අවුරුදු නවයේදී ඇරඹුණු දඬුවම

දළදා මාලිගාවට බෝම්බ ප්‍රහාරයක් එල්ල වී වසර 24කට පසු ඒ පිළිබඳ අද යළිත් කතා කරන්නට සිදුව තිබේ. ඒ එම ප්‍රහාරය නිසා දළදා මාලිගාවට වූ හානිය හෝ ඊට සම්බන්ධ පුද්ගලයෙකු පිළිබඳව නොව ප්‍රහාරය එල්ල වන අවස්ථාවේ නව හැවිරිදි වියේ පසු වූ දැරියකට අදද අත්විඳින්නට සිදුව තිබෙන අමිහිරි අත්දැකීම් සම්බන්ධයෙනි. ඇය නමින් රාමචන්ද්‍රන් මේකලාය. වෙනත් ආකාරයකට හඳුන්වා දෙන්නේ නම් ඇය ශ්‍රී දළදා මාලිගාවට බෝම්බ ප්‍රහාරයක් එල්ල කිරීමේ සිද්ධියට අදාළ නඩුවේදී මරණීය දණ්ඩනය නියමව දැනට ජීවතුන් අතර සිටින ක්‍රිෂ්ණසාමි රාමචන්ද්‍රන්ගේ දියණියයි. එල්.ටී.ටී.ඊ සංවිධානයේ සාමාජිකයින් ලෙස කටයුතු කළ කරුණා, පිල්ලෙයාන් වැන්නන් පාර්ලිමේන්තුව පවා නියෝජනය කරද්දී ඇයට අදත් සමාජයෙන් සැඟ වී ජීවත්වන්නට සිදුව තිබේ. ඒ පියා 'කොටියෙකු' යැයි හංවඩු ගසමින් සමාජයේ බොහෝ කණ්ඩායම් ඇයට වෙනස්කොට සැලකීම හේතුවෙනි. රාජ්‍ය නිලධාරීන් පවා එම ලැයිස්තුවේ ඉහළින් රැඳී සිටින්නේ 'වෙනස්කොට සැලකීමෙන් ආරක්ෂා වීම' මූලික අයිතිවාසිකමක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කොට තිබියදීය.

"දළදා මාලිගාවට බෝම්බ ගැහුවා කියලා තාත්තා අත්අඩංගුවට ගන්නකොට මට අවුරුදු නවයයි. නංගිට අවුරුදු 07යි. තාත්තා කුලී රථ රියදුරෙක්. එයාට එල්ල වෙලා තිබුණ චෝදනාව බෝම්බ ඇටවූ ලොරිය මහනුවර හින්දු සංස්කෘතික

ශාලාවට පදවාගෙන ඇවිත් ගාල් කළා කියන එකයි. එයා එදා උතුරට ගියේ කුලී ගමනක්. ලොරිය ආපහු මහනුවරට එන අතර චෙක් පොයින්ට් එකක තාත්තාගේ නම ලියවිලා තිබුණා කියලා තමයි එයාව අත්අඩංගුවට ගත්තේ. එයා හැම චෙක් පොයින්ට් එකටම එයාගේ රියදුරු බලපත්‍රය ලබාදී තිබුණා. තාත්තා රස්සාවෙන් උපයන මුදලින් තමයි අපි ජීවත් වුණේ. 1998 පෙබරවාරි මාසේ 03 වැනිදා තාත්තාව පොලිසියෙන් අත්අඩංගුවට ගත්තා. අම්මා 2006 සැප්තැම්බර් මාසේ 30 වැනිදා හදිසියේ මියගියා. එතකොට මට අවුරුදු 17යි. එදා ඉඳලා මමයි නංගියි තනි වුණා. අපිට අම්මත් නැහැ, තාත්තත් නැහැ. මාමා තමයි අපි ගැන හොයලා බැලුවේ. දළදා මාලිගාවට බෝම්බ ගැහුව කෙනාගේ දුව කිව්වම අපිට හැම තැනින්ම ප්‍රශ්න ආවා. පාසලේදී, පොලිසියේදී ග්‍රාම නිලධාරී කාර්යාලයේදී මේ සිදුවීම හැම වෙලාවකම ඉස්මතු කළා. වෙනස්කොට සැලකීම නිසා මොනතරම් පීඩනයක් ජීවිතයට එනවද කියන කාරණය ඇති තරම් අත්වින්දා. බෝම්බ සිද්ධිය අපි දන්නේ නැහැ. එතකොට මට අවුරුදු නවයයි. නංගිට හයයි. ඒත් සමහරු අදත් අපි දිහා බලන්නේ අපිත් දළදා මාලිගාවට බෝම්බ ගැහුවා වගෙයි. රැකියාවකට යන්න ගියත් මේක බලපානවා. නංගී 2017 දී අසනීප තත්ත්වයකින් මියගියා." මේකලා පවසන්නේ සුසුම් හෙළමිනි.

මව හා පියා නොමැතිව නැගණිය සමඟ අසීරුවෙන් ජීවිතයට මුහුණ දෙමින් සිටියදී ඇයද මෙලොව හැර යෑමෙන් තනි වූ මේකලා පියා වෙනුවෙන් යුක්තිය ඉටු කර ගැනීමටද එකල දැඩි වෙහෙසක් ගත්තාය.

## පළමු සහ එකම ඇගයුම

මහනුවර මානව හිමිකම් කාර්යාලය ඇය පසුපසින් සිට ඇගේ දිවියට ශක්තියක් එකතු කළේය. සමාජය විසින් පමණක් නොව ස්වභාවධර්මය විසින්ද සියලු දේ උදුරා ගනිද්දී දිරියෙන් ජීවිතයට මුහුණ දුන් ඇයට ඇගයුමක් කරන්නට මහනුවර මානව හිමිකම් කාර්යාලය සැලසුම් කළේ, ජගත් මානව හිමිකම් දිනයට සමගාමීව ඔවුන් වාර්ෂිකව පවත්වන උත්සවයකදීය. පවුලේ සාමාජිකයෙකු සිරගතව සිටියදී ඔහු හෝ ඇය වෙනුවෙන් යුක්තිය ඉටු කර ගැනීමට කටයුතු කරන අතරතුර ජීවන අරගලය ජය ගැනීමට කරනු ලබන කැපවීම අගය කරමින් මෙවර සිරගතවූවන්ගේ පවුල්වල සාමාජිකයින් 22 දෙනෙකු ඇගයීමට ලක් කිරීමට මානව හිමිකම් කාර්යාලය සැලසුම් කර තිබිණි. පොලිසිය විසින් අධිකරණයෙන් වාරණ නියෝගයක් ගෙන උත්සවය තහනම් කරන්නට කටයුතු කළේ මේ අතරින් මේකලා මූලික කරගෙනය. අධිකරණය මගින් ලබාදුන් වාරණ නියෝගය පදනම් කරගනිමින් පොලිසිය විසින් ලබාදුන් තොරතුරු ඔස්සේ දිනපතා ජනප්‍රිය පුවත්පතක මුල් පිටුවේ ප්‍රවෘත්තියක් පළ කළේ "දළදා මාලිගාවට බෝම්බ ගසා මරණ දඬුවම නියම වූ කොටියාගේ දුවට උපහාර දෙන්න හදලා, මහනුවර උළෙලක් උසාවි නියෝගයෙන් තහනම්" යන සිරස්තලය යටතේය. අදාළ ප්‍රවෘත්තිය සියලු නාලිකාවන්හි උදෑසන පත්තර විස්තරය ඔස්සේද ප්‍රචාරය වීම නිසා මේකලා පත්වූ අසීරුතාව කෙබඳුද යන්න අමුතුවෙන් කිව යුතු නොවන්නේය.

"තාත්තා සිරගත වෙලා දැන් අවුරුදු 24ක්. තාමත් මේ සිදුවීමෙන් අපට ගැළවීමක් නැහැ. මේ ප්‍රවෘත්තිය පළ වුණාට පස්සේ මට පාරේ බැහැලා යන්න බැරි තත්ත්වයක් ඇති වුණා. මම විවාහකයි, දරුවෙක් ඉන්නවා. මේ වෙන දේවල් දැක්කම මම දන්නවා මගේ දරුවටත් මේක බලපානවා කියලා. තාත්තා වරදක් කළේ නැහැ. මම ඒක දන්නවා. නමුත් නීතිය ඉදිරියේ එයා වැරදිකරු වෙලා ඉවරයි. ඒත් අපිට මේ විදිහට සලකන්න අපි කළ වරද මොකක්ද?" මේකලා අපෙන් විමසයි.

## වෛරී මාධ්‍යකරණයේ ප්‍රතිඵල

මහනුවර මානව හිකම්කම් කාර්යාලයේ සම්බන්ධීකාරිකා ලුසිල් අබේකෝන්, මේකලාගේ ගැටලු වෙනුවෙන් නිරන්තරව පෙනී සිටි අයෙකි. ඇය මේකලා මුහුණ පෑ තත්ත්වය පිළිබඳව මෙසේ පැවසුවාය.

"මේ සිදුවීම නිසා මේකලාට ගොඩක් දේවල් අහිමි වුණා. පුවත්පත් වාර්තාව පළ වුණාට පස්සේ පියාගේ මිතුරන් දුරකතනයෙන් කතා කරලා ඇයි ආයෙත් ප්‍රශ්නයක් කියලා අහලා තිබුණා. මේක තව පරම්පරා කීයකට යයිද කියලා එයා අහනවා. මේ ප්‍රශ්නය මගෙන්වත් ඉවර වෙන්න ඕන කියන තැනට තමයි මේකලා දැන් පත්වෙලා ඉන්නේ. මොකද එයා මුහුණ දීලා තියෙන දේවල් එක්ක මේ ප්‍රශ්නයෙන් එයාට මේ ආත්මයේදී ගැළවීමක් නොලැබෙන බව එයාට තේරිලා තියෙනවා. මහනුවර මානව හිමිකම් කාර්යාලට පැමිණි උඩ පේරාදෙණියේ කාන්තාවක් තමයි මේකලාව අපි ළඟට යොමු

කළේ. එයා කිව්වා ළමයි දෙන්නෙක් ඉන්නවා, එයලාගේ තාත්තාගේ නඩුවට පෙනී ඉන්න නීතිඥ මහත්වරුන්ටවත් ගෙවා ගන්න විදිහයක් නැතුව ඉන්නෙ කියලා. මව මියගොස් පියා සිරගත වුණාට පස්සේ මේ දරුවෝ දෙන්නගේ අධ්‍යාපනයත් කඩාකප්පල් වී තිබුණා.”

මහනුවර මානව හිමිකම් කාර්යාලයේ අධ්‍යක්ෂ නන්දන මනතුංග පියතුමා මේ පිළිබඳව මෙසේ අදහස් දැක්වීය.

“මේ දරුවා අම්මා මියගිය දවසේ පටන් තාත්තා නිදහස් කර ගැනීම සඳහා අපිත් එක්ක එකතු වෙලා ලොකු මහන්සියක් ගත්තා. මේකලා ඇත්තටම අභියෝග ඉදිරියේ නොසැලී ඒවාට මුහුණ දුන් දරුවෙක්. ඒ නිසයි අපි ඇයව ඇගයීමට ලක්කරන්න තීරණය කළේ. මෙතනදී ඇගයීමට ලක්කිරීමට නියමිතව තිබුණේ ඇය පමණක් නොවෙයි. සිරගතව සිටින අය වෙනුවෙන් යුක්තිය ඉටුකර ගැනීමට කටයුතු කරන අතර ජීවන අරගලයට දිරියෙන් මුහුණ දුන් 22 දෙනෙකු ඇගයීමට අපි සූදානමින් සිටියා. තාත්තා සිරදඬුවම් විඳීම නිසා ඇයට ඇගයුමක් ලබන්න බැරිද? මලල ක්‍රීඩා තරගයකට සහභාගි වී ඇය ජයග්‍රහණයක් ලබා ගත්තොත් ඒ ජයග්‍රහණය ඇයට ලබා දෙන්නේ නැද්ද? ඇයි අපි සමාජයක් ලෙස මේ දරුවාට වෙනස්කොට සලකන්නේ? තාත්තා වරදක් කළා නම් එහි දඬුවම් දරුවනුත් විඳින්න ඕනද? මේවා සුළුවෙන් තැකීමට පුළුවන් දේවල් නෙවෙයි.

## මානව හිමිකම් උල්ලංඝනය කිරීමක්

මානව හිමිකම් ක්‍රියාකාරී රුකී ප්‍රනාන්දු පැවසුවේ මෙයත් පිළිගත් මූලධර්මයක් උල්ලංඝනය වී ඇති බවයි.

මේක එක පැත්තකින් වෙනස්කොට සැලකීමක්. අනිත් පැත්තෙන් බොහොම අමානුෂික දෙයක්. යම් පුද්ගලයෙකු විසින් සිදුකරන්නට ඇති හෝ සිදු කළ බවට සැක කෙරෙන ඕනෑම අපරාධයක් වෙනුවෙන් ඔහුගේ හෝ ඇයගේ පවුලේ සාමාජිකයින් වගකිවයුතු හෝ දඬුවම් නොලැබිය යුතු බවට මූලධර්මයක් තිබෙනවා. මේකලා ජීවිතයේ අවස්ථා කිහිපයකදීම පියාට හිමි වූ දඬුවම පදනම් කර ගනිමින් සමාජය වෙතින් වෙනස් කොට සැලකීමේ අත්දැකීම දරුණු විදිහට අත්විඳ තිබෙනවා. අගය කිරීමක් ලැබීම සඳහා සුදුසු යැයි තෝරාගත් පුද්ගලයෙකුට එම අවස්ථාව අහිමි කරන්නේ ඔහුගේ හෝ ඇයගේ පවුලේ සාමාජිකයෙකු විසින් යම් අපරාධ කළ බැවින් හෝ එසේ කළ බවට චෝදනා නගා ඇති නිසා නම් මෙය එකී මූලධර්මය කඩ කරන අවස්ථාවක් බව පැහැදිලියි.

අධිනීතිඥ ලාල් විජේනායක මේ සම්බන්ධයෙන් මෙසේ පැවසුවේය. “මෙතන පැහැදිලි ලෙසම මානව හිමිකම් කඩවීමක් සිදුව තිබෙනවා. මේ තරුණියට වෙනස්කොට සලකා තිබෙන්නේ කිසිදු පදනමක් නොමැතිවයි. ඇයට සමාජයෙන් ඇගයුමක් ලබන්නට පියා කළ වරද නිසා නොහැකි වෙනවා නම් එතන ප්‍රශ්නයක් තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (2) අනුව කිසිම පුරවැසියකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂයකට හෝ භාජන නොවිය යුත්තේය කියලා දක්වා තිබෙනවා. මෙම සිදුවීමේදී පැහැදිලි ලෙස මේ තරුණියට වෙනස්කොට සැලකීම කියන කාරණය පැහැදිලිව දකින්න පුළුවන්....”

■ **අසේල කුරුළුවංශ**

# 799 දෙනෙකු මගහැර එක් අයකුට එරෙහිව ක්‍රියාත්මක වූ 'වනජීවී' නීතිය!

දසක ගණනාවක් තිස්සේ ජනාවාසයක් ලෙස රජය මගින් සංවර්ධනය කර ඇති ග්‍රාම නිලධාරී වසමක, බලපත්‍ර සහිත ඉඩමක පදිංචිව සිටි එක් හමුදා සෙබළෙකුගේ පවුලක්, පැරණි ගැසට් පත්‍රයක හිමිකමක් උපයෝගී කරගෙන මහමගට ඇද දැමීමට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව කටයුතු කර තිබෙනවා. අම්පාර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කරංගාව ග්‍රාම නිලධාරී වසමට අයත් මෙම ප්‍රදේශය ගල්ඔය සංවර්ධන සැලසුමට අනුව අම්පාර නාගරික බල ප්‍රදේශයට අයත් වන අතර, ඉහත පැරණි ගැසට් නිවේදනයේ බලපෑමෙන් එම ප්‍රදේශය නිදහස් කිරීමට කැබිනට් තීරණයක්ද ගෙන තිබියදී මෙසේ කටයුතු කිරීම මවිතයට කාරණයක්.

## ගැටලුවෙහි පසුබිම

ගල් ඔය ව්‍යාපාරය ආරම්භ කිරීමට ප්‍රථම අම්පාර යනු මඩකළපු දිස්ත්‍රික්කයට අයත්ව තිබූ ගම්මානයක්. සේනානායක සමුද්‍රය ඉදි කිරීමට සමාන්තරව ගල්ඔය සංවර්ධන සැලැස්ම 1950-1958 වකවානුව තුළ මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් සැලසුම්කර නිර්මාණය කරන අතර එම සැලසුමට ගම්, නගර, මාර්ග වාරිමාර්ග, කෙත්බිම්, රක්ෂිත හා ජලාශ වෙන් වෙන් වශයෙන් සිතියම්ගත කිරීමට කටයුතු කර තිබුණා. ඒ අනුව අම්පාර නාගරික බල ප්‍රදේශයට අයිති භූමිය ගල්ඔය සිතියම තුළ පැහැදිලිව දක්නට ලැබෙනවා.

ගල්ඔය ව්‍යාපාරය තම සංවර්ධන සැලැස්ම අනුව යමින් අම්පාර නගරය ආශ්‍රිතව ආයතන ස්ථාපිත කිරීම මෙන්ම ජනතාව පදිංචි කිරීමේ කටයුතු ද සිදු කළා. මෙම සැලසුම් ක්‍රියාත්මක කරමින් සිටින පසුබිමක ඒවා පිළිබඳ සැලකිල්ලක් නොදක්වා වනජීවී දෙපාර්තමේන්තුව 1954 වසරේදී ගල්ඔය ඊසානදිග අභයභූමිය ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන්නේ අම්පාර නගරය සඳහා ගල් ඔය සංවර්ධන සැලැස්මෙන් වෙන් කර තිබූ භූමියෙන් කොටසක් ද ඇතුළත් වන ආකාරයටයි. 1965 වසරේදී අම්පාර ඒ නමින් දිස්ත්‍රික්කයක් බවට පත් වෙනවා. ඉන් පසුව අම්පාර දිස්ත්‍රික්කය විකාශනය වන්නේ අම්පාර නගරය කේන්ද්‍ර කර ගනිමින්. 1992 වසරේදී පමණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස නිර්මාණය වන අතර අම්පාර දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දාසයකට බෙදී වෙන් වෙනවා. අම්පාර නාගරික බල ප්‍රදේශය අම්පාර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටා ඇති අතර ඊට ග්‍රාම නිලධාරී වසම් දහයක් හා කරංගාව ග්‍රාම නිලධාරී වසමේ කොටසක්ද අයිති වෙනවා.

## පැරණි ගැසට් නිවේදනයක්

ඉහත ගැටලුවට හේතු වී ඇත්තේ අම්පාර නාගරික බල ප්‍රදේශය තුළට ඇතුළත් සාමපුර ග්‍රාම නිලධාරී වසමේ කොටසක් හා කරංගාව ග්‍රාම නිලධාරී වසමේ කොටසක් 1954 පෙබරවාරි මස 12 වන දින ප්‍රකාශයට පත් කර ඇති

ගැසට් නිවේදනයකට අනුව ගල්ඔය ඊසානදිග අභයභූමියට අයත් වීමයි. මෙම භූමි ප්‍රමාණය අක්කර 1191ක් වන අතර එහි ජීවත්වන පවුල් සංඛ්‍යාව නමසිය හැත්තෑ එකක්.

මෙම පවුල් සංඛ්‍යාවෙන් වැඩිම පිරිසක් අයත් වන්නේ කරංගාව ග්‍රාම නිලධාරී වසමට වන අතර එහි ජීවත්වන පවුල් සංඛ්‍යාව 799ක්. ඒ අතරින් පවුල් 662කට ඉඩම්වල අයිතියට සම්බන්ධ දීමනා පත්‍ර හා අවසරපත් නිකුත් කර තිබෙනවා. පවුල් 137ක් සැලකෙන්නේ අනවසර පදිංචිකරුවන් ලෙසයි. මෙම වසමේ රාජ්‍ය ආයතන කිහිපයක් වන කරංගාව ජනරජ පාසල, මානසික පුනුරුත්ථාපන ඒකකය, විශේෂ කාර්ය බලකා කඳවුර මෙන්ම ශ්‍රී ලංකා මානව හිමිකම් කාර්යාලය පිහිටා තිබෙනවා. ඊට අමතරව ආගමික සිද්ධස්ථාන හා මහා පරිමාණ ව්‍යාපාර ආයතන කිහිපයක් ද පිහිටා තිබෙනවා. රජය විසින් මෙම ප්‍රදේශය සඳහා අවශ්‍ය මං මාවත්, විදුලිය, ජලය ඇතුළු සියලු යටිතල පහසුකම් සපයා තිබෙනවා. නමුත් නාගරික සංවර්ධන කටයුතු විධිමත්ව සිදු කිරීම සඳහා නාගරික සංවර්ධන සැලැස්මක් එළිදැක්වීමට කටයුතු කර තිබූ අතර එම කටයුත්ත කිරීමට බාධාවක්ව පැවතුණේ නාගරික බල ප්‍රදේශයට අයිති කොටස් අභයභූමියට අයිති වී තිබීම හේතුවෙන්.

## කැබිනට් තීරණය

ඊට විසඳුම් වශයෙන් නාගරික බල ප්‍රදේශයට අවශ්‍ය කොටස් හඳුනාගෙන සැලැසුමක් සකස් කර, එම සැලැසුමට අනුව ඉඩම් නිදහස් කර ගැනීම වෙනුවෙන් නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යවරයා විසින් 2009 අප්‍රෙල් මස 22 වන දින අමාත්‍ය මණ්ඩලයට සංදේශයක් ඉදිරිපත් කරන අතර එම සන්දේශයට සංශෝධන ද ඇතුළත් කර පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යවරයා 2009 මැයි මස අනුමැතිය ලබා දෙනවා. ඒ අනුව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව කළ යුතුව තිබුණේ ගල්ඔය ඊසානදිග අභයභූමියට අදාළ ගැසට් පත්‍රය සංශෝධනය කර නීතිගත කිරීමයි. එය මේ දක්වාම සිදු වී නැහැ.

එහෙත් කැබිනට් නිර්දේශයට අනුව යමින් අම්පාර නාගරික සංවර්ධන සැලැස්ම ප්‍රකාශයට පත් කරමින් 2010 මාර්තු මස 4 වන දින නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා අම්පාර නගර සභා බල ප්‍රදේශයද සමන්විත වන අම්පාර නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කරනවා.

එලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත් කළද සංවර්ධන කටයුතු සිදු කිරීමේදී ගැටලු ඇති වූ බැවින් එම ගැටලුවට යම්තාක් දුරට විසඳුමක් ලබා දීමේ අපේක්ෂාවෙන් ජනාධිපති ලේකම්වරයාගේ මැදිහත්වීමෙන් ගොවිජනසේවා සහ වනජීවී අමාත්‍යාංශයේ ලේකම්වරයාත් ඉඩම් කොමසාරිස් ජනරාල් වරයාත් අතර නාගරික සංවර්ධන බල ප්‍රදේශයට වෙන් කළ භූමියෙන් ඔබ්බට සංවර්ධන කටයුතු සිදු නොකිරීමට එකඟතාවක් ඇති කර ගැනුණා. ඉන් ජනතාවගේ ඉඩම් ගැටලු සඳහා සහනයක් අපේක්ෂා කරනු ලැබූ අතර එම එකඟතාව ජනාධිපති කාර්යාලය විසින් 2011 සැප්තැම්බර් 7 දිනැති ලිපියෙන් අදාළ රාජ්‍ය ආයතන වෙත දන්වා යවා තිබෙනවා.

## 'වනජීවී' ක්‍රියාමාර්ගය

මෙවැනි පසුබිමක් තුළ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව කැබිනට් නිර්දේශ මගින් ඉවත් කිරීමට යෝජිත අම්පාර නාගරික සංවර්ධන සැලැස්මට අයත් කරංගාව ග්‍රාම නිලධාරී වසමේ පුද්ගලයෙකු විසින් බලපත්‍ර මත භුක්ති විඳි ඉඩමක තාවකාලික නිවසක් ඉදිකරගෙන ජීවත් වූ හමුදා සෙබළෙකුගේ බිරිඳට එරෙහිව ඉඩමෙහි සන්තකය පවරන ලෙස ඉල්ලා අම්පාර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරනවා.

දිනූෂා අවන්ති නම් ඇය, තමන්ට විඳින්නට සිදු වූ අසාධාරණය ගැන මෙසේ පැවසුවා:

"මමත් මහත්තයත් දරුවාත් කරංගාව ප්‍රදේශයේ පිහිටි යුද හමුදා නිල නිවාස තුළ ජීවත් වුණා. 2007 වසරේදී එම නිවාසයෙන් ඉවත් වීමෙන් පසු යන්නට තැනක් තිබුණේ නෑ. යුධ හමුදා නිවාස අසල පදිංචි වීරසිංහ මහත්තයා එයාගෙ ඉඩමේ කොටසක තාවකාලික නිවසක් ඉදිකරගෙන පදිංචි වෙන්න අවස්ථාව ලබා දුන්නා. නමුත් වනජීවී දෙපාර්තමේන්තුව 2014 මැයි මාසේ මට විරුද්ධව ඉඩමේ සන්තකය ඉල්ලලා නඩු දැම්මා. 2014 ඔක්තෝබර් මාසයේදී එම නඩුවේ තීන්දුව

අනුව මාව ඉඩමෙන් නෙරපන්න නියෝග කළා. මම ඒ තීන්දුවට එරෙහිව අම්පාර පළාත්බද මහාධිකරණය ප්‍රතිශෝධන නඩුවක් පැවරුවා. ඒ නඩුව විභාග කරන්න පළාත්බද මහාධිකරණයට බලයක් නෑ කියලා 2016 මැයි මාසයේ තීන්දුවක් ලබා දුන්නා. මට ඉන් ඉදිරියට වෙනත් අධිකරණයකට යෑමට තරම් ආර්ථික ශක්තියක් තිබුණේ නෑ. ඒ නිසා 2016 ජූනි මාසයේ අපි මහ පාරට වැටුණා.

## සහනය හෙණයක් වීම

"ඊට පස්සේ අපට සිදු වෙච්ච අසාධාරණය පිළිබඳව විමලවීර දිසානායක මන්ත්‍රීතුමා දැනුවත් කළා. එතුමා අම්පාර දිස්ත්‍රික් සංවර්ධන සම්බන්ධීකරණ කමිටුවට මේ පිළිබඳව දැනුම් දුන්නා. ඒකෙන් අපිට සහනයක් දෙන්න පොරොන්දු වුණා. නමුත් ඒක කෙරුණෙ නැති නිසා මගේ මහත්තයා 2016 දෙසැම්බර් මස අම්පාර ඔරලෝසු කණුව ඉදිරිපිට විරෝධතාවක් දැක්වුවා. එදා හිටපු දිසාපතිතුමා මගේ මහත්තයව ගෙන්නගෙන, ප්‍රශ්නය විසඳන්න කටයුතු කර ඇති බවත් එබැවින් නිවසට ගොස් නිවස පදිංචිය සඳහා සකස් කර ගන්නා ලෙසත් ඔහුට දැනුම් දුන්නා. ඒ අනුව අපි නිවස සකස් කර ගනිමින් සිටින අතරතුර වනජීවී නිලධාරීන් අපිට විරුද්ධව අම්පාර පොලිසියට පැමිණිලි කර තිබුණා. ඒ අනුව පොලිසිය මට විරුද්ධව 2017 පෙබරවාරි මාසේ අධිකරණ නියෝග උල්ලංඝනය කළා කියලා අම්පාර අධිකරණයේ නඩු පවරලා තිබුණා. ඒ හේතුවෙන් මට දින හයක් සිරගත වෙන්න පවා සිදු වුණා. අදටත් ඒ නඩුව අධිකරණයේ විභාග වෙනවා. සිදු වූ අසාධාරණය සම්බන්ධයෙන් 2016 ජූලි මස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට පැමිණිලි කළත් සාධාරණයක් ඉටු වුණේ නෑ.

"මේ නිසා වනජීවියෙන් විතරක් නෙවෙයි මානව හිමිකම් කොමිසන් සභාවෙනුත් මට විශාල අසාධාරණයක් සිදුවෙලා තිබෙනවා. පවුල් 799 ජීවත්වන ගමක මා පමණක් නීති විරෝධී වන්නේ කොහොමද? නීතිය ක්‍රියාත්මක වන්නේ මා පමණක් විශේෂ කොට සලකා ද? මට සාධාරණයක් ඉටුවන්නේ කවදාද කියා මං බලා ඉන්නවා."

## මානව හිමිකම් කොයිබටද?

දිනූෂා අවන්ති සහ ඇගේ පවුලේ අය පදිංචිව සිටි ඉඩම, 1995 ජනවාරි මස එකොළොස් වන දින අම්පාර ප්‍රාදේශීය ලේකම් මගින් බලපත්‍ර අංක අම්/ව/බ 2861 යටතේ එස්.ඒ.ඩී. සුනන්දා නමින් නිකුත් කර ඇති අතර එම බලපත්‍රය අදටත් වලංගුයි. එවැනි තත්ත්වයක් තුළ මෙවැනි නඩුවක් පැවරීම ගැටලුසහගත තත්ත්වයක්. ඒ අනුව සෙසු බලපත්‍රලාභීන්ගේ හිමිකම්ද අභියෝගයට ලක් වෙනවා. මොවුන්ට සහනයක් ලබාදීම වෙනුවෙන් අම්පාර දිස්ත්‍රික් සංවර්ධන සම්බන්ධීකරණ කමිටුව 2016 සැප්තැම්බර්, ඔක්තෝබර් හා දෙසැම්බර් යන මාසවලදී මේ පිළිබඳ දීර්ඝ ලෙස සාකච්ඡා කර තීන්දුවක් ලබාගෙන තිබෙනවා. එම තීන්දුව අම්පාර දිස්ත්‍රික් ලේකම්වරයා විසින් 2017 ජනවාරි 16 දාතමින් ලිපියෙන් වනජීවී අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දන්වා යවා තිබෙනවා. එම තීන්දුව ප්‍රකාරව මෙකී පවුලට නැවත නිවසේ පදිංචියට යන ලෙස දැනුම් දී තිබූ පසුබිමක මේ ආකාරයට වනජීවී නිලධාරීන් අධිකරණ නියෝග උල්ලංඝනය කර ඇති බවට පවසා පොලිසියට පැමිණිලි කර අධිකරණයේ නඩු පැවරීමට කටයුතු කිරීම බලවත් ගැටලුවක් පමණක් නොව මානව හිමිකම් ද උල්ලංඝනය කිරීමක්. අසාධාරණයට ලක් වූ පුරවැසියකුට සාධාරණය ඉටු කිරීම සඳහා දිස්ත්‍රික් සංවර්ධන සම්බන්ධීකරණ කමිටුවේදී රාජ්‍ය නිලධාරීන් විසින් ඇති කරගත් සම්මුතියක් හිතුවක්කාර හා උද්දච්ච ලෙස නොතකා හැරීමට තවත් රාජ්‍ය ආයතනයක් කටයුතු කිරීම ඉතා අශෝභන තත්වයක් නොවේද?

පැරණි ගැසට්පත්‍රයක කුමක් සඳහන් වුවත්, කිසිසේත්ම වනාන්තර ප්‍රදේශයක් නොවන, දසක ගණනක් තිස්සේ රජය විසින් ජනාවාසයක් ලෙස සංවර්ධනය කර ඇති ග්‍රාම නිලධාරී කොට්ඨාසයක එක් පදිංචිකරුවකුට උන්හිටි තැන් නැති කිරීමට එම යල් පිනූ කඩදාසිය භාවිත කිරීම රාජ්‍ය සේවය අපකීර්තියට පත් කරන ක්‍රියාවක් නොවේද? මෙවැනි කරුණු සම්බන්ධයෙන් අධිකරණය මගින් යුක්තියක් ඉටු කර ගැනීමට නොහැකි වී ඇත්තේ කුමක් නිසාද? මානව හිමිකම් කොමිසම මේ කරුණ සම්බන්ධයෙන් තීන්දුවක් ලබා දීම දිගින් දිගටම පමා කරන්නේ ඇයි?

■ **අචල උපේන්ද්‍ර**

# සංස්කෘතික නිදහස හා අන්තවාදය අතර ගැටුම: නැගෙනහිර පාසලක අත්දැකීමක්

ෆාතිමා ෆක්මිතා රමීස් 31 හැවිරිදි ගුරුවරියකි. ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 (II) ශ්‍රේණිධාරී ගුරුවරියක වන ඇය දරුවන් සඳහා දෙවන බස සිංහල විෂය උගන්වයි. වසර 10ක සේවා කාලයක් පසු කරමින් යන ඇය මුතූර් මධ්‍ය මහා විදුහලට සිය පළමු පත්වීම ලබා පැමිණියාය. එම පාසලෙහි වසර 05ක් පුරා සේවය කර ඉන් සමුගෙන 2013 වසරේ ත්‍රිකුණාමලය ශ්‍රී ෂන්මුගා හින්දු බාලිකා විදුහලට ස්ථාන මාරු ලැබ පැමිණි ඈ සිය රාජකාරි භාර ගැනීමට සූදානම් වූ පළමු දිනයේ දී අබායා ඇඳුමකින් සැරසී පාසලට ගියාය. ඊට සිය විරෝධය පළ කළ පාසලේ විදුහල්පතිනිය ඇයට එම ඇඳුම පාසල තුළ යළි නො අඳින ලෙසට කියා තිබිණි. ඊට අවනත වූ ඇය අබායා ඇඳුම නොපැළඳ සිටියාය.

මේ වන විට පාසල තුළ සේවය කරමින් සිටි ඇගේ සහෝදර ගුරුවරියන් හත් දෙනෙකුට ද එම ඇඳුම තහනම්ව තිබිණි. පසුව කෙටි කලකින් පාසලට පැමිණි නව පත්වීම්ලාභී ගුරුවරියක අබායා ඇඳුමින් පැමිණියද ඇයට කිසිදු විරෝධයක් නොදැක්වීම නිසා, තම සංස්කෘතිය පිළිබිඹු වන අබායා ඇඳුම යළි හැඳ පැමිණෙන බව විදුහල්පතිනියට ද දන්වා තමන් හත් දෙනා ඊට පසු දින අබායා ඇඳුමින් පාසලට පැමිණි බව ෆාතිමා පවසන්නීය.

### සමාජ මාධ්‍ය ඔස්සේ තර්ජන

"අපි හිතුවේ නැහැ මේ තරම් ලොකු විරෝධයක් එයි කියලා. රෑ වෙනකොට ෆේස්බුක්වල අපිට එරෙහිව පෝස්ට් පළ වුණා. ඒවා ජාතිවාදී පෝස්ට්. ඊට පහුවෙනිදාම පාසල ඉදිරිපිට දෙමාපියන් හා දෙමාපියන් නොවන විවිධ සංවිධානයන්ට අයත් පිරිස් අපිට එරෙහිව උද්ඝෝෂණය කළා" යැයි 2018 වසරේ දී පළමු වරට අබායා ඇඳුම හැඳ පාසලට පැමිණීම නිසා තමන් හා සෙසු ගුරුවරියන් මුහුණ පෑ තත්වය ගැන ෆාතිමා පැවසුවාය.

ෆාතිමා ඇතුළු පිරිසට එල්ල වූ විරෝධය හමුවේ අධ්‍යාපන බලධාරීන් වහා පාසලට පැමිණ තත්වය පාලනය කරන්නට කටයුතු කළේ ෆාතිමා ඇතුළු ගුරුවරියන්ට අබායා ඇඳුම නොහැඳ සිටින ලෙස දන්වමිනි. එහිදී ෆාතිමාට යාබද පාසලක් වන සහිරා විදුහලට තාවකාලික අනුයුක්තයක් ලබා දීමට ද අධ්‍යාපන බලධාරීන් කටයුතු කළේ තත්වය පාලනය වනු ඇති බව සිතමිනි.

පළමු වර මාස තුනකට පමණක් ඇයට මෙම අනුයුක්තය ලබා දී තිබූ අතර එම කාලය තුළ සෙසු සහෝදර ගුරුවරියන් වෙත පාසල තුළින් සිදු වූ කොන් කිරීම් වැනි ක්‍රියා නිසා වෙනත් පාසල් කරා ස්ථාන මාරු ලැබ යන්නට වූ බව ඇය පවසනුයේ කනගාටුවෙනි. මාස තුනක තාවකාලික අනුයුක්තය වසරක් දක්වා කඩින් කඩ දිගු වෙමින් ගිය පසු ඇය 2018 මැයි 21 වන දා HRC/TCO/27/18 අංකය යටතේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් කළාය. ඒ තමන්ට සාධාරණය ඉටු කර දෙන ලෙස ඉල්ලමිනි. පැමිණිල්ල භාර ගත් මානව හිමිකම් කොමිෂන්

සභාව මේ පිළිබඳව විමර්ශනය කර ඇගේ අයිතිවාසිකම් කඩ වී ඇති බව පෙනී යන හෙයින් අබායා ඇඳුම හැඳ පාසලට පිවිසීමට ඇයට පවතින බාධා ඉවත් කරන ලෙසට අධ්‍යාපන අමාත්‍යාංශයට දන්වා පිටු 09ක වාර්තාවක් මගින් නිර්දේශ කර තිබිණි. එමෙන්ම ඇය විසින් සමාජ මාධ්‍ය හරහා ඇයට පීඩාවක් සිදු කළ බව පෙන්වා දීම නිසා ICCPR පනත යටතේ ද ඇයට හිංසනයක් සිදුව ඇති බව එකී වාර්තාවේ වැඩිදුරටත් සඳහන් කරන්නට කොමිසම කටයුතු කර තිබිණි.

## කොමිසම තීරණයට ප්‍රතිචාර

අනතුරුව ඇගේ තාවකාලික අනියුක්තය 2019 ජනවාරි මස 01 දායින් අවසන් වී යළිත් ෂන්මුගා විද්‍යාලයට ගිය පසුව ඇයට පංතියක් හෝ ඉගැන්වීම් කාලසටහනක් ලබා නොදීමට විදුහල්පතිනිය කටයුතු කළ බව ඇය පවසයි. එමෙන්ම සහෝදර ගුරුවරුන් ඇයව කොන් කිරීමත් කිසිවකු ඇය හා කුළුපග නොවීමත් නිසා මහත් පීඩාවට පත්ව සිටි බවත් එම කාලය තුළ තමන් කුච්චවේලි අල් නූරියා විදුහලට ස්ථාන මාරු කළ බව පවසා ලිපියක් එවීමට කලාප අධ්‍යාපන කාර්යාලය කටයුතු කළ බව ෆාතිමා පැවසුවාය. මේ පිළිබඳව ඇය යළිත් මානව හිමිකම් කොමිසමට දැනුම් දීමෙන් පසුව එම ස්ථාන මාරුව අවලංගු කිරීමට කලාප අධ්‍යාපන කාර්යාලය කටයුතු කර ඇත.

මේ තත්වය තුළ දිගින් දිගටම පාසල තුළින් හා අධ්‍යාපන බලධාරීන් ගෙන් එල්ල වන පීඩාව හමුවේ සිය අයිතිවාසිකම් වෙනුවෙන් CA/WRI/125/2021 අංක යටතේ අභියාචනාධිකරණයේ නඩුවක් ගොනු කිරීමට ඇය කටයුතු කළාය. එම නඩුවේදී අධ්‍යාපන අමාත්‍යාංශය එකගතාවකට පැමිණියේය. ඒ අබායා ඇඳුම හැඳ පාසල තුළ ඉගැන්වීම් කටයුතු කිරීමට ඉඩ සලසන බවට අධිකරණයේ දී එකගවීමෙනි.

එසේ එකඟ වූ අධ්‍යාපන අමාත්‍යාංශය ඇයගේ තාවකාලික අනුයුක්තය අවසන් හෙයින් ඇයට යළි ෂන්මුගා විදුහලේ සේවය සදහා යන ලෙසට දන්වා 2022 ජනවාරි 28 වනදා ලිපියක් එවා තිබිණි. ඒ අනුව ඇය පෙබරවාරි 02 වන දා අබායා ඇඳුමකින් සැරසී පාසලට ගියාය. එහිදී ෆාතිමාට එරෙහිව යළිත් වරක් විරෝධයක් පැමිණියේ පාසලට සෘජුවම සම්බන්ධ නොවූ පිරිස්, සිසුවියන් ගුරුවරුන් හා එක්වෙමිනි. මෙහිදී ෆාතිමාට චෝදනා එල්ල වූයේ ඇය විදුහල්පතිනිය තල්ලු කළ බවත් අබායා ඇඳුම හැඳ මුහුණ වසාගෙන පාසලට පැමිණ සිටින බවත් පවසමිනි.

## හිරිහැර ගැන පොලිස් පැමිණිලි

විශාල පිරිසක් පාසල තුළට පැමිණීමත් ඇයගේ ජංගම දුරකතනය උදුරා ගැනීමට තැත් කරමින් හිරිහැර කිරීමත් නිසා ඒ පිළිබඳව ඇය පොලිසියට දන්වා තිබිණි.

"මම 119 කෝල් කළා. ගොඩාක් අය ඔෆිස් එකට ආවා. ඒ අයගෙන් සමහරු දෙමාපියන් නෙවෙයි. ඔවුන් මගේ පෝන් එක උදුරාගන්න මා එක්ක පොර බැදුවා. නමුත් මාව ආරක්ෂා කරන්න විදුහල්පතිනිය කටයුතු කළේ නැහැ. මම ඇඳුම ඇන්දේ ගුරු ආචාරධර්ම පද්ධතියට අනුවයි. එහි 5.1 (ආ) හි තියෙනවා සංස්කෘතියට අනුකූලව පිරිසිදු ඇඳුමක් අඳින්න කියලා. ඒ වගේම අයුතු ලෙස කොන් කිරීම, බිය වැද්දවීම හමුවේ තම සහෝදර ගුරුවරුන් රකින්න කියලා ඒකේ තිබුණත් මට දෙමාපිය විරෝධය ආ වෙලාවේ මාව ආරක්ෂා කරන්න විදුහල්පතිනිය කටයුතු කළේ නෑ පිටින් ආව අය කළේ මගේ රාජකාරියට බාධා කිරීමයි. මම ආවේ මගේ රාජකාරි අරඹන්න වැඩ භාර ගන්න" යැයි ෆාතිමා පවසයි.

අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කර තිබූ 2012/37 දරන චක්‍රලේඛ ප්‍රකාරව සංස්කෘතියට ගැළපෙන අයුරින් ඇඳුමක් හැඳ පාසලට යා හැකිය. ඒ හැර ගුරුවරයාගේ ඇඳුම මේ යැයි කිසිවකු විසින් හෝ නිශ්චිත කර නැත. ෆාතිමා ඇගේ සංස්කෘතියට ගැලපෙන සේ ඇඳුමක් හැඳ ගොස් ඇත. සිසුවියන් 2357ක් ඉගෙනුම ලබන ෂන්මුගා හින්දු බාලිකාවේ මුස්ලිම් දරුවන් ද 122දෙනෙක් සිටිති. එහි විවිධ ආගම්වලට අයත් දරුවන් 226 දෙනෙකි. ෆාතිමටෙ දිගින් දිගටම සිදු කළ බව කියන කෙනෙහිලිකම් පිළිබඳව හා ඇතිව තිබූ තත්වය පිළිබඳව ෂන්මුගා විදුහලේ විදුහල්පතිනි ලිංගේෂ්වරන් රවිරාජන්ගෙන් කළ විමසුමක දී ඇය පිළිතුරු දීම ප්‍රතික්ෂේප කළාය.

"උසස් නිලධාරීන් කියලා තියෙන්නේ අපට මාධ්‍යට කිසිවක් දෙන්න එපා කියලා. ඒ නිසා මට මුකුත් කියන්න බෑ කොහොම වුණත් මේක හින්දු බාලිකා පාසලක්. ඒක තුළ හින්දු සංස්කෘතිය ආරක්ෂා වෙන්න ඕනෑ" යැයි ඇය පවසයි. ඈ එසේ කියා සිටියද මෙම සිදුවීමට පසුදා මාධ්‍ය හමුවක් පැවැත්වීමට ඇය කටයුතු කර තිබුණි.

## අධිකරණයේදී වූ එකඟතා කඩ කරයි

මෙම විරෝධය අතර විදුහල්පතිනිය ද තමන්ට ෆාතිමා විසින් පහර දුන් බව පවසා රෝහල් ගතව තිබේ. මේ නිසා ෆාතිමාට යළිත් සහිරා විදුහලට තාවකාලික අනුයුක්තයක් ලබා දීමට අධ්‍යාපන අමාත්‍යාංශයට සිදුව තිබේ. ඔවුන් අධිකරණයේ දී වූ එකඟතාවන් බිඳ දමා කටයුතු කර ඇත. මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශ පවා පිළිනොගෙන ඇති බව පෙනී යයි.

ඇතිව පවතින මේ තත්ත්වය පිළිබඳව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක ශ්‍රීධරන් ගෙන් කළ විමසුමක දී කියා සිටියේ තමන්ට මේ සම්බන්ධව කිසිවක් පැවැසීමට නොහැකි බවයි "අනික ඇය නඩුවක් දාලා තියෙනවා ඒ නිසා මට මුකුත් කියන්න බෑ" අධ්‍යක්ෂවරයා පවසයි.

මෙරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන පරිච්ඡේදයේ මෙරට සෑම පුරවැසියකුටම භුක්ති විඳිය හැකි මූලික අයිතිවාසිකම් පැහැදිලිව සඳහන් කර ඇත. ඒ අනුව එහි සඳහන් පරිදි "සෑම කෙනෙකුටම තමන් අභිමත ආගමක් ඇදහීමේ හෝ වැළඳගැනීමේ නිදහස ද ලබ්ධියක් හෝ විශ්වාසයක් දැරීමේ හෝ පිළිගැනීමේ නිදහස ද ඇතුළුව ආගමික නිදහසට හිමිකම් පවතී.

සෑම පුරවැසියකුටම තනිව හෝ අන් අය සමග ස්වකීය සංස්කෘතිය භුක්ති විඳීම හා වැඩිදියුණු කිරීමේ නිදහසට හිමිකම් ඇත්තේය. නමුත් ත්‍රිකුණාමලය ශ්‍රී ෂන්මුගා විදුහල තුළ සිය රාජකාරී ආරම්භ කිරීමට සූදානම් වූ ෆාතිමාට අබායා ඇඳුමින් පාසලට පැමිණීමට විරෝධය පා එම පාසලේ සිසුවියන් ගුරුවරුන් හා දෙමාපියන් එක්ව ඇයව හුදකලා කරමින් සිදු කර ඇති විරෝධය තුළ කාන්තාවක ලෙස ඇය බලවත් මානසික හා ශාරීරික පීඩනයට ලක්ව තිබේ. මේ පිළිබඳව ප්‍රදේශයේ මානව හිමිකම් ආරක්ෂා කිරීමේ සංවිධාන හෝ ක්‍රියාකාරීන් මුනිවත රැකි බවක් දක්නට ලැබේ. ආගම සංස්කෘතිය හෝ ජනවර්ගය මුල් කරගත් අවදානම් හා අභියෝගසහගත කාරණාවන්හි දී ඔවුන් බොහෝ විට නිහඬ පිළිවෙතක් අනුගමනය කරන්නේ මෙවන් තත්වයක් තුළ පවතින අවදානම, ආරක්ෂාව නොමැතිකම හා පවතින වටපිටාව හේතුවෙනි.

## මානව හිමිකම් සංවිධාන නිහඬයි

මේ පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් සංවිධානයේ ජාතික විධායක අධ්‍යක්ෂ ශිරෝමන් රංගන ගෙන් කළ විමසුමක දී ඔහු කියා සිටියේ තමන් මෙම සිදුවීම පිළිබඳ මුලදී කිසිවක් නොදැන සිටි බවයි. තමන්ට මෙම සිදුවීම පිළිබඳව පසුව දැන ගැනීමට ලැබුණු නමුත් ඒ වන විට එය විසඳී අවසන් හෙයින් මැදිහත් වීමක් නොකළ බවයි.

එසේ තිබිය දී අයුතු ජන රාශියක් හා රජයේ දේපළක් වන පාසලකට අයුතු ඇතුළුවීමක් පිරිසක් විසින් සිදු කර තිබේ. පොලිසිය එසේ ඇතුළු වූ පිරිස් කෙරෙහි දැක්වූ ප්‍රතිචාරය කෙතරම් යුක්තිසහගතද යන්න තවත් ගැටලුවකි. මේ වනවිට සිදුවීම සමථ මණ්ඩලයට යොමුව පවතින බව ෆාතිමා පවසයි. ඇයට හිරිහැර කිරීම ඇගේ රාජකාරියට බාධා කිරීම වැනි දෑ සිදුව තිබිය දී මෙන්ම සංස්කෘතිය මුල් කරගත් බැරෑරුම් සහගත මෙවන් කරුණක් මත හටගත් ගැටුමක් විසඳීමට සමථ මණ්ඩලයට යොමු කිරීම විහිළුසහගත ක්‍රියාවකි.

ඉස්ලාම් ආගමික බැතිමතුන් ඔවුන්ගේ ඇඳුම ඇඳීම සම්බන්ධව ශුද්ධවූ අල් කුරාණයෙහි අවුරත් ලෙස සඳහන් වෙයි. කාන්තාවන් සඳහා වන ඇඳුම පිළිබඳව සඳහන් වන්නේ මැණික් කටුවෙන් පහළ වළලුකරෙන් පහළ සහ දෙකණ වැසී ගිය පසුව මුහුණ පමණක් පෙනෙන සේ ඇඳුම් ඇඳීම කළ යුතු බවයි. ඒ අනුව ඉස්ලාම් භක්තිකයකු වන ෆාතිමා සිය ඇඳුම හැඳ පාසලට පැමිණ ඇත. ඇයට ඊට බාධා කිරීමෙන් සිය සංස්කෘතිය පවත්වාගෙන යෑම අහිමිව ඇති බව පෙනීයයි.

මේ පිළිබඳව ජම්යතුල් උලමා සභාවේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් ඉන්ෂාත් මවුලවිගෙන් කළ විමසුමක දී ඔහු කියා සිටියේ "ඉස්ලාම් ආගමට අනුව කාන්තාවකට මුහුණ වසා ඇඳුම් අඳින්න කියලා අනිවාර්යය කරලා නැහැ. කැමැති කාන්තාවකට මුහුණ වසා සිටිය හැකියි. කැමැති අයෙකුට මුහුණ පෙනෙන සේ හැඳිය හැකියි" යනුවෙනි.

කාන්තාවකගේ ඇඳුම පිළිබඳව නිශ්චිත අර්ථකතනයක් දීමට මවුලවිවරුන්ට ද නොහැකි බව දිස්ත්‍රික් අන්තර් ආගමික කමිටුවේ ලේකම් මොහොමඩ් රිස්මි අලියා පවසයි. "ඉස්ලාම් ආගමේ ද පාර්ශ්ව කිහිපයක් තියෙනවා, කාන්තාවගේ ඇඳුම පිළිබඳව ඒ ඒ අය තුළත් විවිධ අදහස් තියෙනවා" ඔහු වැඩිදුරටත් පවසයි.

ෆාතිමාට එරෙහිව ෂන්මුගා විද්‍යාලයෙන් එල්ල වූ විරෝධයට ප්‍රතිවිරෝධය පෑමට කින්නියා කල්මුණේ ප්‍රදේශවල පිරිස් කටයුතු කළෝය. කින්නියා විද්‍යාලපති සංගමය කින්නියා විරෝධය සංවිධාන කළ අතර එය කලාප අධ්‍යාපන කාර්යාලය ඉදිරිපිට පැවැත්වූයේ සියයකට අධික පිරිසක ගේ සහභාගීත්වයෙනි.

කෙසේ වෙතත් මෙම විරෝධතාව වාර්තා කළ වීරකේසරී පුවත්පතේ ප්‍රාදේශීය වාර්තාකරුවකු වූ අලියාර් මොහොමඩ් ෆීත්ට සමාජ මාධ්‍ය ජාලා හරහා මුස්ලිම් ප්‍රජාවගෙන්ම විරෝධයක් එල්ල වූ බව ඔහු පවසයි. "කිහිප දෙනෙකුම මට කැත විදිහට බැණලා පෝස්ට් දැම්මා දෙමළ අයට සහාය දෙනවා කියලා. මම කළේ එදා ඇතිව තිබුණු තත්ත්වය වාර්තා කිරීම පමණයි" ඔහු පවසයි.

ඇතැම් ප්‍රාදේශීය මාධ්‍යවේදීන් ඒකපාර්ශවීය, ආචාරධාර්මික නොවන වාර්තාකරණයක නියැලීම තවත් ගැටලු සහගත එකක් ව තිබුණි. සමාජ මාධ්‍ය හැසිරීමත් ප්‍රාදේශීය සංවිධාන විරෝධතාවල පිටුපස සිටීමත් ඊට සහාය දක්වන ඇතැම් වාර්තාකරුවන් නිසාත් සමාජයේ සෙසු පිරිස් මෙම තත්වය තුළ සාධාරණය හා යුක්තිය වෙනුවෙන් පෙනී සිටීමට මැළිකමක් දක්වන්නේය.

සෑම පුරවැසියකුටම තනිව හෝ අන් අය සමග ස්වකීය සංස්කෘතිය භුක්ති විඳීම හා වැඩිදියුණු කිරීමේ නිදහසට හිමිකම් ඇත්තේය. එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම හිමිව ඇති මූලික අයිතිවාසිකමකි. නමුත් එකී අයිතිවාසිකම භුක්ති විඳීමට ඉඩ සැලසීමට මෙන්ම මානව හිමිකම් රැක ගැනීමට මානව හිමිකම් සංවිධාන මීට වඩා අවදියෙන් සිටීම වැදගත්ය. මෙම සිදුවීම සම්බන්ධයෙන් ප්‍රදේශයේ මානව හිමිකම් සංවිධානවල ක්‍රියාකාරීත්වයද ප්‍රමාණවත් නොවන බව මෙහිදී නිරීක්ෂණය විය.

■ **ලක්මාල් කේ. බදුගේ**

# සාගරගම නිවාස ගුවන් හමුදාවෙන් කඩා දැමීම:

## ● පුරවැසි මාධ්‍යකරණය ඔස්සේ හෙළිදරව් කළ අපරාධයක්

“ගුවන් හමුදාව තුවක්කු අරන් ඇවිල්ලා, අපේ දරුවන්ගේ ගෙවල් කඩනවා. පොලිසිය බලන් ඉන්නවා. එහෙම කරන්න උසාවියෙන් නියෝගයක් තියනවා කියලයි කියන්නේ”

2021 ජූලි මස පස්වැනි දින පස්වරු 04.45ට පමණ දුරකථනයෙන් මා ඇමතූ සාගරගම ලසන්ත එසේ පැවසුවේ දැඩි ආවේගයකිනි.

කල්පිටිය සාගරගම ග්‍රාමය සහ ඒ අවට ගම්මානවල ජනතාවට විටින් විට මුහුණ දීමට සිදු වූ අසාධාරණයන් හා ගැටලු මා වාර්තා කරන්නේ වසර පහළොවක පමණ සිටය. මීට වසර දහයකට පමණ පෙර මේ ප්‍රදේශයේ කුඩා දරුවන් කිහිපදෙනෙකු බෝම්බයකට බිලිවීම ඉන් ප්‍රධාන සිදුවීමකි. ඉන් පසු ඔවුන්ගේ ඉඩම් අයිතිය, යටිතල පහසුකම්, ගංවතුරට නිවාස ජලයෙන් යටවීම වැනි දෑ මා වාර්තා කර ඇත. 2021 වසරේ මුල සිට ද අවස්ථා කීපයකදී මේ ජනතාව තම ඉඩම් ගැටලුව පිළිබඳව මා දැනුවත් කර තිබිණි.

ලසන්තගේ දුරකථන ඇමතුමෙන් පසු සාගරගමින් ඇමතුම් කීපයක් ලැබිණි. මේ සියල්ලෙන් කියවුණේ ඉක්මනින් සාගරගමට එන ලෙසයි. මා සිටි ස්ථානයේ සිට එහි යෑමට ආසන්න වශයෙන් පැය දෙකක කාලයක් ගත වෙයි. ඒ අනුව මට ලබා දීමට තිබූ උපදෙස වූයේ, අදාළ උසාවි නියෝගය ඉල්ලා සිටින ලෙසයි.

“අපි උසාවි නියෝගය පොලිසියෙන් ඉල්ලුවා, ගුවන් හමුදාවෙන් ඉල්ලුවා. නමුත් ඒ අය එහෙම එකක් පෙන්වන්නේ නැහැ. උසාවියෙන් පිස්කල් ආවද කියලා ඇහුවා, එහෙම කෙනෙකුත් නැහැ.” යි ඔවුහු පැවසූහ.

### ‘ඔය කරන්නේ බලහත්කාරකමක්’

“එහෙම නම් ඔය කරන්නේ බලහත්කාරකමක්, උසාවි නියෝගයක් තියනවා නම් පෙන්වන්න ඕනෑ නේ. එහෙනම් ඉතින් කරන්න තියෙන්නෙ එකම දෙයයි. ෆෝන් තියන අය හැමෝම ඔතන සිද්ධ වෙන දේ වීඩියෝ කරන්න.” යැයි පැවසූ මම කඩිනමින් අදාළ ස්ථානය වෙත යෑමට පිටත් වුණෙමි. ඒ අනුව සාගරගම ස්මාර්ට් දුරකථන හිමි ලොකු කුඩා සියලු දෙනා ගුවන් හමුදාවේ මේ ක්‍රියාව වීඩියෝගත කළහ. ‘සිදු නොවූවක්’ ලෙස මිලිටරි මාධ්‍ය ප්‍රකාශකවරුන්ගේ ගාම්භීර ප්‍රකාශවලින් වැළලී යන්නට ඉඩ තිබුණු සාපරාධී ක්‍රියාවක් පැහැදිලි සාක්ෂි සහිත සිදුවීමක් ලෙස සටහන් වූයේ එපරිද්දෙනි.

මේ සිදුවීමෙන් පැය කීපයක් ඇතුළත මා කල්පිටිය පොලිසියේ ස්ථානාධිපතිවරයාගෙන් අදාළ උසාවි නියෝගයේ ඇත්තේ කුමක්දැයි විමසා සිටියත් එය පෙන්වීම හෝ තොරතුරු ලබා දීම පොලිස් ස්ථානාධිපතිවරයා ප්‍රතික්ෂේප

කළේය. ඒ අවස්ථාවේම කල්පිටිය ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් දුරකතනයෙන් කළ විමසීමේදී ඔහු පැවසුවේ තමන් එවැනි අධිකරණ කටයුත්තක් පිළිබඳව දැනුවත් වී නොමැති අතර මෙය රජයට අයත් ඉඩමක් බවයි. ඉඩම රජය සතු නම්, එහි වගකීම ඇත්තේ ප්‍රාදේශීය ලේකම්වරයාටය. ඔහුත් නොදැන ඒ සම්බන්ධයෙන් සිදු වූ අධිකරණ කටයුත්ත කුමක්ද? ඉඩමේ අයිතිය කා සතු වුවත් එහි මිනිසුන් ජීවත්වන ගමක් තිබේ. එහි නම 'සාගරගම' යි. එය නීති විරෝධී නම්, ඒ ගැන නීතිමය පියවර ගත යුත්තේ ප්‍රාදේශීය ලේකම්වරයාය. ගුවන් හමුදාවට එහි නිවාස කඩා දැමීමට ඇති බලය හෝ උවමනාව කුමක්ද?

## සාගරගම පුරාණය

"කොහොමද අපි බලෙන් ආවා කියලා කියන්නේ? මම උපන්නේ මේ ගමේ. අපේ අම්මලා තාත්තලා දැන් අවුරුදු තිස් තුනක් මේකේ ජීවත් වෙනවා. මම ඉස්කෝලේ ගියෙත් මේ ගමේ ඉඳලා. අපිට මේ ගමේ ඡන්දේ තියනවා නම් අපි මේ ගමේ නෙමෙයි කියන්න කාටවත් පුළුවන්ද?"

ඒ කල්පිටිය සාගරගම ග්‍රාමයේ ජීවත්වන රසික මනෝජ්. ඔහුගේ නම උප්පැන්නයේ එලෙස සඳහන්ව තිබුණත් ගමේ කවුරුත් ඔහුට අමතන්නේ 'සාගර' යන නමිනි. ඒ ඔහු උපත ලැබූ දිනයේ මේ ග්‍රාමයේ ජීවත් වූ බෙනඩික් ජෝශප් විසින් කළ ප්‍රකාශයක් හේතුවෙනි. "උප්පැන්නේ මේ ළමයාගේ නම රසික වුණාට කමක් නැහැ. මම මේ ළමයට නම දානවා සාගර කියලා. ඒ වගේම අද ඉඳලා මේ ගමේ නමත් සාගර ගම" සාගරගේ කතාව අනුව ඔවුන් සාගරගමට පැමිණ ඇත්තේ 1988 වර්ෂයේදීය.

ඒ වන විට සාගරගම වනගත ප්‍රදේශයක් ලෙස තිබී ඇති අතර ඔවුනට ඒ දිනවල ජීවත්වීමට සිදුව ඇත්තේ වන සතුන් මැදය. ක්‍රමක්‍රමයෙන් ගොවිතැනට හා ධීවර රැකියාවට හුරු වූ සාගරලාගේ වැඩිහිටියන් මේ ප්‍රදේශය සශ්‍රීක ප්‍රදේශයක් කිරීමට සමත්ව ඇත. සාගරලාගේ වැඩිහිටියන්ට අනුව පවුල් හැත්තෑවක් පමණ මුල් කාලයේ පදිංචිව සිට ඇති අතර එක් පවුලක් අක්කර දෙකකට වැඩි භූමි ප්‍රමාණයක් හෙළි පෙහෙළි කරගෙන තිබේ. ඒ දිනවල මේ සඳහා කිසිවෙකුගේ විරෝධයක් නොතිබී ඇති අතර අවස්ථා කීපයකදී පැවති රජයන් හා රාජ්‍ය නිලධාරීන් සාගරගම ජනතාවගේ පදිංචිය අනුමත කර ඊට නිත්‍යානුකූලභාවයක්ද දී ඇත. ඊට කදිම නිදසුන වන්නේ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිනිය මේ ග්‍රාමයේ ජීවත්වන පවුල් කීපයක් සඳහා ඔප්පු ලබා දීමයි. ඊට අමතරව ඔවුන් පදිංචි ස්ථානවල ලියාපදිංචි ඡන්දදායකයන් වන අතර රජය විසින් ඔවුන්ට යටිතල පහසුකම් සලසා දී ඇත. අවස්ථා කීපයකදී මේ ගම්මානයේ මාර්ග රජය විසින් සංවර්ධනය කර ඇති අතර ගමට විදුලිබලයද ලබා දී ඇත.

## කණකොකා හැඬීම

සාගරගම ශ්‍රියානි සමරවීර පවසන පරිදි මේ ග්‍රාමයට කණකොකා හඬන්නේ 2005 වර්ෂයේදීය.

"1988 ඉඳලා අපි සතුටින් මේ ගමේ ජීවත් වුණා. අපිට කිසි ප්‍රශ්නයක් තිබුණේ නැහැ. යුද්ද කාලෙ 2005දී ගුවන් හමුදාව කන්දකුලියට අවා. කන්දකුලිය කියන්නේ අපේ ගමට යාබද ගම. ඔවුන් ඇවිල්ලා එහේ කඳවුරු බැඳ ගත්තා. ඒ දවස්වල යුද්දේ නිසා ඒ අයට පහසු වුණා ඕනෑම දෙයක් කරන්න. ඒ අය ඒ අයට ඕනෑ විදිහට හිතු මතේ වැඩ කළා. අපේ ඇතැම් පවුල් එලෙව්වා. මේ ඉඩම් ඒ අයට අයිතියි කිව්වා. ලිංගික හිංසන කළා. මේ නිසා අපේ සමහරු නිවාස අතහැරලා යන්න ගියා. නමුත් අපි ගියේ නැහැ. මේ සියලු හිරිහැර විඳ දරා ගෙන අපි හිටියා. මුලින්ම ඒ අය අල්ල ගත්තේ කවුරුත් පදිංචි වෙලා නැති ප්‍රදේශයක්. ඊට පස්සේ තමයි ක්‍රමක්‍රමයෙන් ඒ අය අපේ ඉඩම් අල්ලන්න ගත්තේ. කොටින්ම කිවොත් යුද්දේ ඉවර වුණාට පස්සේ. මුලින් ඔවුන් මේ ස්ථානයේ පදිංචි වුණේ උඩින් ඇවිල්ලා බෝම්බ දාන්න පුහුණු වෙන්න කියලයි. ඒ විදිහට මේ අය පුහුණු වීම කළා. යුද්දේ නිසා ඒ සියලු හිරිහැර විඳගෙන අපි හිටියා. ඒ අතරේ මේ කඳවුරේ නිලධාරීන් මේ අවුරුද්දේ ජුනි මාසයේ දවසක අපේ ඉඩම්වල පොල් හිටවලා තිබුණා. මේ නිසා සියලු දෙනා භීතියට පත් වුණා. ඒ සමග තමයි මුලින් පදිංචි වෙලා හිටපු උදවිය නැවත ඒ ස්ථානවලට ආවේ."

## ඡන්දය හා අයිතිය

යුද්ධය නිමාවත් සමග මේ ජනතාවගේ ප්‍රධාන බලාපොරොත්තුව වූයේ තමනට අහිමි වූ ඉඩම් නැවත ලබා ගැනීමයි. ඒ සඳහා ඔවුන් ගමේ ග්‍රාම නිලධාරියාගේ සිට ජනාධිපති ලේකම්වරයා දක්වා මෙන්ම ගමේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයාගේ

සිට රටේ ජනාධිපතිවරයා දක්වාම ලිඛිතව හා වාචිකව දැනුවත් කර ඇත. එහි ප්‍රතිපලයක් ලෙස චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනපතිනිය ඉඩම් ඔප්පු කීපයක් මේ ජනතාවට ලබා දී තිබේ. ඊට අමතරව ‘යහපාලන’ රජය සිය මැතිවරණ පොරොන්දුව මගින් කියා සිටියේ වසර දහයකට වැඩි කාලයක් රජයේ ඉඩමක පදිංචිව සිටින්නේ නම් ඔවුනට එහි අයිතිය ලැබෙන බවයි. මේ දෙකටම අමතරව මේ ග්‍රාමයේ ජීවත්වන හැම වැඩිහිටියෙකුටම ඡන්ද අයිතිය ලබා දී තිබේ.

“අපි ලොකු ලොකු දේවල් දන්නේ නැති වුණාට අපිට දැනෙන දේ තමයි ඡන්දේ තියනවා නම් ඒ බිමේ අයිතියත් තියනවා කියන එක. මම මේ ඉන්නේ අපේ අම්මා තාත්තා හිටපු තැන.” චාමර සඳරුවන් පැවසුවේය. චාමර පවසන ලෙස ඔවුන් අලුතෙන් නිවාස ඉදිකළේ ගුවන් හමුදාව ඔවුන් සතු බිමේ පොල් පැළ සිටුවීම හේතුවෙනි.

“ගුවන් හමුදාවට ඉඩම් ප්‍රමාණයක් තියනවා. අපි ඒක පිළිගන්නවා. නමුත් අපිටත් ඉඩම් තියනවා. අපේ ඉඩම් තමයි ගුවන් හමුදාව අල්ලගෙන තියෙන්නේ. ගුවන් හමුදාව කියනවා 1984 ගැසට් එකකින් මේ බිම ඒ අයට දීලා තියනවා කියලා. නමුත් ඔවුන්ම අවස්ථා කීපයකදී කියලා තියනවා, අපිට තාම මේක ලැබුණෙ නැහැ, අපිට මේක දෙන්න නියමිතයි, ඒ නිසයි අපි මේක ආරක්ෂා කරන්නේ කියලා. ගුවන් හමුදා කඳවුරේ ලොකු මහත්තයා එහෙම කියන එක මාධ්‍යවේදීන් වීඩියෝ කරලත් තියනවා.” චාමර පැවසුවේය.

## හිංසාකාරී ක්‍රියා

2005 වර්ෂයෙන් පසු සාගරගම ජනතාවට විඳින්න සිදු වූ හිංසන විවිධාකාරය. මේ වන විට ඔවුන් ඒවා ප්‍රසිද්ධියේ ප්‍රකාශ කර තිබේ. ඒ අතර ලිංගික හිංසනද තිබේ. “බිරිඳ ඉල්ලලා පුරුෂයාට ගැහුවා, නංගි ඉල්ලලා අයියට ගැහුවා. කුඩා දරුවනට ලිංගික හිංසන කළා. යුද්දේ නිසා මේ සියලු දේ යට ගියා.”

සාගරගම ග්‍රාමයේ ජීවත්වන වැඩිහිටියෙකු වන එච්.පී. සිරිසේන පැවසිය. “මේ හින්දා තමයි අපේ ගමේ ගොඩක් දෙනෙකුට මේ ගමෙන් යන්න වුණේ. අපි මෙහෙන් ගිහින් ජීවත් වුණේ අනුන්ගේ වතුවල. යුද්දේ ඉවර වුණාම වැඩියෙන්ම සතුටු වුණේ අපි. මොකද අපිට අපේ බිම ලැබෙන නිසා. නමුත් සිද්ධ වුණේ වෙන දෙයක්. යුද්දේ අවස්ථාවේ විවිධ තාඩන පීඩන මැද හිටපු අයටත් මේ බිම දාලා යන්න වෙන තත්වයක් උදා වෙලා තියෙන්නේ. රටේ නීතිය රකින්න බැඳිලා ඉන්න නිලධාරීන් හා ආයතන බොරු කරනවා. අපිට තියෙන්නේ එක විශ්වාසයක් විතරයි. ඒ අධිකරණය. නමුත් අධිකරණයටත් ගුවන් හමුදාව හා පොලිසිය බොරු වාර්තා දීලා.”

අධිකරණයට බොරු වාර්තා ලබා දී අධිකරණය නොමග යැවීමට කටයුතු කර ඇත්නම් ඉතා භයානක තත්ත්වයකි. ගුවන් හමුදාව මේ ඉඩම පිළිබඳව කල්පිටිය පොලිසියට බොරු පැමිණිල්ලක් කළේ නම් ඒ පිළිබඳව විමසිය යුතු පළමු පුද්ගලයා වන්නේ කල්පිටිය ප්‍රාදේශීය ලේකම්වරයායි. කල්පිටිය ප්‍රාදේශීය ලේකම්වරයාගේ වාර්තාවක් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් මේ ඉඩමේ අයිතිය ඇත්තේ කාටද යන්න නිශ්චය කර ගත හැකිව තිබිණි. එහෙත් කල්පිටිය පොලිසිය කළේ 2021.07.01 දින ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කන්දකුලිය අනු ඒකකයේ සැරයන් 013774 ගුණපාල නමැති සෙබළා ඉදිරිපත් කළ පැමිණිල්ලක් මත හා 628/ඒ මුසල්පිටිය ග්‍රාම නිලධාරිනී මොහොමඩ් රහීම් ෆාතිමා සබ්රිනාගේ ප්‍රකාශයක් මත මේ ප්‍රදේශයේ පදිංචි පුද්ගලයන් අටදෙනෙකු අත්අඩංගුවට ගැනීමයි. ගුවන් හමුදා භටයා පොලිසියට පැමිණිලි කර ඇත්තේ 1984.12.18 හා 2005.02.15 දිනවල නිකුත් වූ රජයේ අති විශේෂ ගැසට් පත්‍රවලට අනුව ගුවන් හමුදා කඳවුරකට හා වෙඩි පිටියකට පවරා ඇති මෙම ඉඩමට ගම්වාසීන් පැමිණ අනවසරයෙන් ඇතුළු වී පොල් අතුවලින් හා තහඩුවලින් තාවකාලික නිවාස 10ක් ඉදිකර ඇති බවයි. ග්‍රාම නිලධාරිනියගේ ප්‍රකාශයේ ඇත්තේ තම වසමට ගුවන් හමුදා කඳවුර පිහිටා තිබෙන ඉඩමද ඊට අමතරව ගුවන් හමුදා කඳවුර ඇතුළු එම ප්‍රදේශයේ රජයට අයත් ඉඩම් අක්කර 1492ක් අයත් බවත් එම රජයේ ඉඩමේ පිරිසක් පදිංචිව සිටින අතර ඊට අමතරව කිසිදු අවසරයක් නොමැතිව 2001.07.01 වැනි දින තවත් නිවාස 10ක් සදා ඇති බවයි.

## යුක්තිය උදෙසා අරගලය

සාගරගම සිංහල, මුස්ලිම්, දමිළ යන ජාතීන් හා කතෝලික, බෞද්ධ, මුස්ලිම්, හින්දු යන ආගම් අදහන ජනතාව ජීවත් වෙයි. බෞද්ධ ජනතාව සුළුතරයක් වුවත් මේ ගමේ ජනතාවට වැඩි වශයෙන් නායකත්වය ලැබෙන්නේ කන්දකුලිය

ශ්‍රී සමුද්‍රාසන්න විහාරස්ථානයෙනි. මේ විහාරස්ථානයේ අධිපති පූජ්‍ය බැදිවැව දියසේන හිමියන්ගෙන් මේ පිළිබඳව කළ විමසීමේදී උන්වහන්සේ මෙසේ පැවසූහ. "දැනට ජනතාව පදිංචි වෙලා ඉන්න ප්‍රදේශය කාටවත් අයිති එකක් නෙමෙයි. මේ ඉඩමට අයිතිකාරයෙක් නැහැ. ඒ කියන්නේ රජයට අයිතියි. රජය කියන්නේ ජනතාව. මේක ආයතන දෙකක් නෙමෙයි. ඒ කියන්නේ මේක අයිති මේකේ හිටපු ජනතාවට. ගුවන් හමුදාවට ගැසට් කළ ප්‍රදේශයක් තියනවා. ගුවන් හමුදාව කරන්න ඕනෑ ඒ බිම රැකගන්න එක. නැතුව ජනතාව පදිංචි වෙලා ඉන්න බිමේ පොල් හිටවන එක නෙමෙයි. ඒ වගේම රෑට රෑට ඇවිල්ලා ජනතාවගේ ගෙවල් ගින්දර තියන එක නෙමෙයි. අනික් ප්‍රධාන කාරණය දැන් යුද්දේ ඉවරයි. යුද්දේ කාලේ උතුරේ අල්ලගත්තු ඉඩම් පවා දැන් නිදහස් කරනවා. උතුරු නැගෙනහිර වෙඩි හඬ අලුත උපදින දරුවන්ට ඇහෙන්නේ නැහැ. නමුත් ගුවන් හමුදාව මේ ප්‍රදේශවලින් ජනතාව එලවන්න දැන් දැන් මහා පරිමාණ බෝම්බ දානවා. මම වගකීමෙන් කියන්නේ, මෙහෙ ජීවත්වන ඕනෑම කෙනෙක්ගෙන් අහන්න. මම කාරුණිකව ඉල්ලනවා පුත්තලමේ පක්ෂ විපක්ෂ දේශපාලකයන්ගෙන් මේ පිළිබඳව පාර්ලිමේන්තුවේ කතා කරන්න. පුත්තලමට කරලා තියන විනාශ ඇති."

සාගරගම ජීවත්වන ෆාතිමා නජීමා දරු තිදෙනෙකුගේ මවකි. ඇය සිටින නිවසට විදුලිය ද ලබා දී තිබේ. ඇය කියන්නේ මේ ඉඩම් ගුවන් හමුදාව සතු නම් ඔවුන් ඒවා රැක ගැනීම සඳහා වසර 36ක් කටයුතු නොකළේ මන්ද යන්නයි.

"ගුවන් හමුදාවට මේ ඉඩම් දුන්නේ 84 අවුරුද්දේ කියලා දැන් කියනවා. එහෙනම් ඇයි ඒ අය වැටක් වත් ගහගන්න කටයුතු නොකළේ? එදා යුද්දේ කාලේ මේ ප්‍රදේශවල ජනතාව ඉන්නවට ගුවන් හමුදාව කැමති වුණා. මේ ගමේ මිනිස්සුත් බෝම්බ මැද්දේ හිටියා. උතුරට වඩා බෝම්බ මේ ප්‍රදේශයට වැටුණා. ඒ වගේ අපහසුකම් මැද්දේ ජීවත්වුණු අපිව අසාධාරණ විදිහට පාරට ඇදලා දාන්න යන එක කොච්චර සාධාරණද කියන එක හිතලා බලන්න."

## නීත්‍යානුකූල නොවන ක්‍රියාවක්

කල්පිටිය පොලිසිය මේ සිදුවීමේදී කටයුතු කර ඇති ආකාරය පිළිබඳව ගැටලු පවතී. නීතිඥ නිහාල් සුමනධීර පවසන ආකාරයට අධිකරණය පොලිසියට කළ නියෝගයක් වෙනත් පාර්ශ්වයකට - විශේෂයෙන් රජයේ හමුදාවකට පැවරීම නීත්‍යානුකූල නොවන තත්ත්වයකි.

"මම කියන්නේ රජයේ හමුදාවකට ජනතාවගේ ගෙවල් කඩන්න නියෝගයක් ලබා දෙන්න කාටවත් බැහැ. සාමාන්‍යයෙන් අධිකරණය නියෝග කරන්නේ පිස්කල් හරහා මෙවැනි දෙයක් කරන්න. අවශ්‍ය නම් පොලිසිය ඒ සඳහා සහභාගී කරවා ගත හැකියි. මේ වගේ අවස්ථාවක ගුවන් හමුදාව වෙඩි තැබීමක් කළේ නම් එහි වගකීම ගන්නේ කවුද?

"පුත්තලම මහේස්ත්‍රාත් අධිකරණයෙන් නඩු අංක 17 428 /21 යටතේ කල්පිටිය පොලිසියට නියෝග කරන්නේ මේ නිවාස ඉවත් කරන ලෙසයි. එහෙත් පොලිසිය කළේ ගුවන් හමුදාවේ නිලධාරීන් ගෙනල්ලා මේ නිවාස කඩවන එක. ගුවන් හමුදා භටයන් මේ කටයුත්ත කරන්න ආවේ තුවක්කු රැගෙන, එලෙස මේ නිවාස කඩා බිඳ දැමීම නීතියට කෙතරම් අනුකූල වන්නේද යන්න පිළිබඳව දෙවරක් නොව කීප වරක් සිතා බැලිය යුතුව තිබෙනවා." නීතිඥ නිහාල් සුමනධීර වැඩිදුරටත් පැවසිය.

කල්පිටිය පොලිසියේ ස්ථානාධිපති එම්.අයි.බී.එස්. නිශාන්ත කුමාර පුත්තලම අධිකරණයට ඉදිරිපත් කළ තොරතුරු අනුව මනාව පැහැදිලි වන්නේ මේ සිදුවීමට අදාළ ඉඩම රජය සතු ඉඩමක් බවයි. එම ඉඩමේ ජනතාව ස්ථිරව පදිංචිව සිටින බවද එහි සඳහන් වේ. ඒ අනුව කල්පිටිය පොලිසිය මේ සම්බන්ධයෙන් කල්පිටිය ප්‍රාදේශීය ලේකම් වරයා දැනුවත් කළ යුතුව තිබිණි. එහෙත් එවැන්නක් සිදු නොවූ බවත් තමන් මේ නඩුවේ පාර්ශ්වකරුවකු කර නොමැති බවත් කල්පිටිය ප්‍රාදේශීය ලේකම් ප්‍රගීත් ධනන්සූරියගෙන් කළ විමසීමේදී පැවසීය. "මේ ඉඩමට හිමිකම් කියන්නා හොයා ගන්න බැහැ. නමුත් කාලයක ඉදලා මේ ස්ථානයේ පවුල් 32ක් පමණ ස්ථිරව පදිංචි වෙලා ඉන්නවා. අලුතෙනුත් යම් පිරිසක් මේ ස්ථානයේ පදිංචි වෙලා ඉන්නවා. ඒ පිරිස නීත්‍යානුකූලව ඉවත් කරන්න මම අධිකරණයේ නඩුවක් ගොනු කරන්න ඉන්නේ."

## අධිකරණය නොමග යැවීම

පාලවිය ගුවන් හමුදා කඳවුරේ ප්‍රධානියාට හා කල්පිටිය ප්‍රාදේශීය ලේකම් වරයාට අනුව මේ ඉඩම මේ දක්වා ගුවන් හමුදාවට භාර දී නොමැත. ඒ අනුව කන්දකුලිය ගුවන් හමුදා කඳවුරේ 013774 ගුණපාල ධර්ම කුමාර නමැති සැරයන්වරයා

පුත්තලම අධිකරණයට කියා ඇත්තේ බොරුවකි. ඔහු පොලිසියට ඉදිරිපත් කර ඇත්තේද ඔවුනට නීත්‍යානුකූලව රජයෙන් ලබා දී ඇති අක්කර 1009ක භූමියේ ගැසට් පත්‍රයයි. මේ නඩුවට අදාළ මුසල්පිටිය ග්‍රාම නිලධාරිනියගේ ප්‍රකාශය අනුවද කියවෙන්නේ මේ ප්‍රදේශයේ රජයට අයත් අක්කර 1492ක භූමියක් තිබෙන බවයි. එහි ගුවන් හමුදාව මෙන්ම ජනතාවද ස්ථිරව පදිංචිව සිටින බව ඇය පැහැදිලිව කියා තිබේ. ඒ අනුව පොලිසිය මූලික විමර්ශනයක් නිසි අයුරින් සිදු කර අධිකරණයට කරුණු වාර්තා කළාද යන්න ගැටලුවකි. මෙහිදී පොලිසිය අනිවාර්යයෙන් කල්පිටිය ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් ප්‍රකාශයක් ලබා ගත යුතුව තිබිණි. ජනතාව කියන්නේ 2021 ජූලි 05 වැනි දින උසාවියට පැමිණ කරුණු දක්වන ලෙස තමන්ට කල්පිටිය පොලිසියෙන් දැනුම් නොදුන් බවයි. එසේ වූයේ නම් තමන් අධිකරණයට තමන්ගේ අයිතිය පිළිබඳව කරුණු දක්වන බවයි. පසුගිය සතියේ කල්පිටිය ප්‍රාදේශීය ලේකම් ප්‍රගීත් ධනන්සූරිය ගෙන් දුරකතනයෙන් කළ විමසීමේදී කියා සිටියේ රජයට අයත් ඉඩමේ පදිංචිකරුවන්ගෙන් කොටසක් සම්බන්ධයෙන් නඩු පැවරීමට කටයුතු කරන බවයි. ඒ අනුව ඉතාම පැහැදලි කරුණ නම් අක්කර 48ක් වන, සාගරගම ග්‍රාමය පිහිටි මේ ඉඩම ගුවන් හමුදාවට මේ වසරේ එනම් 2021 ජූලි 06 වැනි දින දක්වා ගැසට් පත්‍රයකින් පවරා දී නොමැති බවයි.

## ගුවන් හමුදාවේ ප්‍රතිචාරය

මේ සිදුවීම පිළිබඳව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මාධ්‍ය ප්‍රකාශක ගෲප් කපිතාන් දුෂාන් විජේසිංහ ගෙන් කළ විමසීමේදී කියා සිටියේ මේ පිළිබඳව සොයා බලා ප්‍රකාශයක් කරන බවයි. “මේ පිළිබඳව අධිකරණයේ නඩුවක් තියනවා. සාමාන්‍යයෙන් අපිට ඉඩම් දෙන්නේ රජයෙන්. ඒ කියන්නේ කැබිනට් අනුමැතියකින්. සාමාන්‍යයෙන් අපි ඉඩමක් පවරා ගන්නවා නම් ඒ ප්‍රදේශයේ ජනතාව පදිංචි වෙලා ඉන්නවා නම් වන්දි ගෙවලා තමයි ගන්නේ. එක තීරණය කරන්නේ ප්‍රාදේශීය ලේකම්.” ගුවන් හමුදා මාධ්‍ය ප්‍රකාශකවරයා වැඩිදුරටත් පැවසීය.

රටේ නීතිය අනුව හමුදාවකට ආයුධ සන්නද්ධව ගොස් රටේ ජනතාවගේ නිවාස කඩා බිඳ දැමීමේ අයිතියක් නොමැත. අධිකරණය පොලිසියට කළ නියෝගය පොලිසිය ගුවන් හමුදාවට භාර දුන්නේ කාගේ නියෝගයකින්ද? එසේම ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පාලවිය ඒකකයට අනුයුක්තව තිබෙන කන්දකුලිය අනු ඒකකයේ ගුවන් භටයන්ට මේ නිවාස කඩා බිඳ දැමීම සඳහා නියෝග ලබා දුන්නේ කවුද? පොලිසිය හා ගුවන් හමුදාව මේ ජනතාවට උසාවි නියෝගය නොපෙන්වූයේ ඇයි? මේ ජනතාව ප්‍රකාශ කරන පරිදි මේ වන විට ගුවන් හමුදා නිලධාරීන්ගෙන් මේ ජනතාවට නැවත නොයෙකුත් තාඩන පීඩන එල්ල වෙමින් තිබේ. මේ තත්ත්වය එම ජනතාවගේ මූලික අයිතීන් උල්ලංඝනය කිරීමක් නොවේද? මේ පිළිබඳව විශේෂ විමර්ශනයක් කර වින්දිතයන්ට යුක්තිය ඉටු කිරීම බලධාරීන්ගේ වගකීමකි.

■ **ප්‍රසාද් පූර්ණමාල් ජයමාන්න**

# පොලිස් හිංසනයකට එරෙහිව මූලික අයිතිවාසිකම් පෙත්සමක්

මහනුවර ගුරුදෙණිය කැන්දවලමඩිත්තේ පදිංචි විතානාරච්චිලාගේ අනුරසිරි වෘත්තියෙන් රියදුරෙකු වන, දෙදරු පියෙකි. කිසිදු චෝදනාවකින් තොරව නීති විරෝධී ලෙස අත්අඩංගුවට ගැනීම හා පොලිස් නිලධාරීන් කිහිපදෙනෙකුගේ පහරකෑමට ලක් වීමෙන් සිය මානව හිමිකම් උල්ලංඝනය වීම පිළිබඳව ඔහු ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කර තිබේ. මෙම සිදුවීම, නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා සිටින නිලධාරීන්, ඒ සඳහා තමන්ට පැවරී ඇති බලය සිය පෞද්ගලික අභිමතාර්ථ සාධනය කර ගැනීම සඳහා යොදා ගැනීමේ සුලබ තත්ත්වය මැනවින් පැහැදිලි කරන උදාහරණයකි. එමෙන්ම එවැනි අවස්ථාවන්හිදී අසාධාරණයට ලක් වූවන්ට නීතියේ රැකවරණය ලැබිය හැකි බවද එමගින් අවධාරණය කරයි.

අනුරසිරි 2017 සැප්තැම්බර් මාසයේ සිට සේවය කළේ, උපපොලිස් පරීක්ෂක රණවීර නැමැති නිලධාරියාගේ පුද්ගලික ව්‍යාපාරයක ලොරි රථයේ රියදුරු ලෙසය. වසර දෙකකට ආසන්න කාලයක් සේවය කළ ලොරි රථයට ඔහු පණ මෙන් ආදරය කළේය. පුරුදු පරිදි ඔහු සේවය නිම වී ලොරි රථය ගෙනැවිත් නිවස අසල නතර කරන්නේය. ආරක්ෂිතව එය රැක බලා ගන්නා අනුරසිරි පසුදා යළි ලොරි රථයේ නැගී තම රාජකාරියට පිටත්ව යන්නේය.

### සිදුවීමේ පසුබිම

උප පොලිස් පරීක්ෂක හෙට්ටිආරච්චිගේ රණවීරට අයත් මෙම ලොරි රථය වැලි ප්‍රවාහනය කරමින් සිටියදී බලපත්‍රයක් නැතිව වැලි ප්‍රවාහනය කිරීමේ චෝදනාවට අත්අඩංගුවට පත්වූයේ, 2019 පෙබරවාරි මස 26 වැනිදාය. අනතුරුව මහියංගණය මහේස්ත්‍රාත් අධිකරණයේ 1992 අංක 33 දරන පතල් හා ඛනිජ පනත යටතේ ඊට නඩු පවරා තිබේ. එම නඩුවේදී ලොරියේ හිමිකරු වන උප පොලිස් පරීක්ෂකට චෝදනා එල්ල කර නැත. ඉන් පසු වලංගු බලපත්‍රයක් නැතිව වැලි සහිත ලොරිය පැදවීම ප්‍රතික්ෂේප කරමින් වලංගු බලපත්‍රයක් සහිත අවස්ථාවල පමණක් වැලි ප්‍රවාහනය කළ බවත්, වැලි ප්‍රවාහනය ප්‍රතික්ෂේප කිරීම නිසා ලොරි රථයේ හිමිකරු දැඩි කෝපයකින් පසු වූ බවත්, බලපත්‍ර නොමැතිව වැලි ප්‍රවාහනය ප්‍රතික්ෂේප කළ අවස්ථා කිහිපයකදී වෙනත් රියදුරකු ලවා එම පොලිස් නිලධාරියා වැලි ප්‍රවාහනය කරවාගත් බවත් අනුරසිරි කියන්නේය.

එවන් පසුබිමක් මත, අනුරසිරි රියදුරු ලෙස කටයුතු කරමින් සිටිනා අතරතුර පොලිස් නිලධාරියාගේ උපදෙස් පරිදි එම ලොරි රථය 2019 අප්‍රේල් පළමු වැනිදා අලුත්වැඩියාව සඳහා ගරාජයක් වෙත රැගෙන ගොස් ආපසු පැමිණ තිබේ. ඉන් පසුව සිදු වූ දේ පිළිබඳව අනුරසිරි මෙසේ පැවසුවේය.

"එදා සවස 5.45ට පමණ මම නිවසට පැමිණියා. මහනුවර-හාරගම ප්‍රධාන මාර්ගයේ මගේ නිවස ඉදිරිපිට අයිනට වන්නට ලොරිය නතර කර තිබුණා. රාත්‍රී ආහාර ගැනීමෙන් පසු, නිදාගැනීමට නිවස ඉදිරිපිට නතර කර තිබූ ලොරි රථයට පැමිණියා. එසේ පැමිණියේ ලොරියේ ආරක්ෂාවට එහි නිදාගන්නා ලෙස රණවීර මහත්තයා මට කියා තිබෙන නිසයි. රාත්‍රී 11.50ට පමණ හදිසියේම නින්දෙන් අවදි වී බලන විට පොලිස් නිලධාරීන් දෙදෙනකු ලොරි රථය දෙසට

එනවා දැක්කා. එලෙස පැමිණි එක් අයකු වන පොලිස් කොස්තාපල් ජයකොඩි ලොරියට ගොඩ වී හෙල්මට් එකකින් පහර දුන්නා. 'මට ගහනවා මාව බේරාගන්න' කියලා මම කෑගැහුවා." අනුරසිරි කියා සිටියේය.

"මේ විදිහට පහර දුන් අවස්ථාවේ බිරිඳත් ළමයින් දෙන්නත් බලාගෙන හිටියා. මගේ ඔළුවෙනුත් කකුල් දෙකෙනුත් අල්ලලා ජීප් එකට දාගත්තා. කිසිම හේතුවක් දැනුම් නොදී මට පහර දෙමින් තලාතුඔය පොලිසියට රැගෙන ගියා. පසුවදා 2019 අප්‍රේල් 02 වැනි දින උදේ තලාතුඔය පොලිස් ස්ථානාධිපතිවරයා ඇවිත් 'උඹව තමයි අල්ල ගන්න හිටියේ' කියලා මුහුණේ දකුණු පැත්තට පහර දුන්නා." අනුරසිරි තවදුරටත් කියා සිටියේය.

## මූලික අයිතිවාසිකම් පෙත්සමක්

ගුරුදෙනියේ පදිංචිකරුවකු වන පහරකෑ අනුරසිරි වෙනුවෙන් නීතිඥ සුරේන් ඩී. පෙරේරා මාර්ගයෙන් ඉදිරිපත් කර තිබූ මූලික අයිතිවාසිකම් පෙත්සම පසුගිය දා ප්‍රීති පත්මන් සූරසේන ප්‍රමුඛ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඬුල්ලක් හමුවේ කැඳවිණි.

එම අවස්ථාවේ අනුරසිරි වෙනුවෙන් පෙනී සිටි නීතිඥ සුරේන් ඩී. පෙරේරා ප්‍රකාශ කළේ මෙම පෙත්සම්කරු ලොරි රථයේ වැඩ කළ රියදුරු බවයි. වැලි ප්‍රවාහනය සම්බන්ධයෙන් පොලිසිය ඔහුට නඩු පවරා ඇති මුත්, ඊට නියෝග ලබා දුන් ලොරි රථයේ හිමිකරුට නඩු පවරා නැතැයි කී නීතිඥවරයා ලොරි රථයේ හිමිකාරිත්වය සඳහන් වන වාර්තාවක් ද අධිකරණයට ඉදිරිපත් කළේය. ඒ අනුව පොලිස් නිලධාරියා සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස අධිකරණය පොලිස්පතිවරයාට නියෝග කළේය.

තලාතුඔය පොලිසියේ කොස්තාපල් ජයකොඩි, ස්ථානාධිපති අනුර ක්‍රිෂාන්ත, රථවාහන ස්ථානාධිපති සමන් කුමාර, උප පොලිස් පරීක්ෂක හෙට්ටිආරච්චිගේ රණවීර, පොලිස්පති සී.ඩී. වික්‍රමරත්න සහ නීතිපතිවරයා මෙම පෙත්සමේ වගඋත්තරකරුවන් ලෙස නම් කරනු ලැබ සිටිති.

තලාතුඔය පොලිස් ස්ථානයට අනියුක්තව සේවය කළ උප පොලිස් පරීක්ෂක හෙට්ටිආරච්චිගේ රණවීරට අයත් ලොරි රථයක රියදුරු ලෙස 2019 අප්‍රේල් පළමු වැනිදා දක්වා සේවය කර ඇති අතර උප පොලිස් පරීක්ෂකගේ දැනුම්දීම මත එම ලොරි රථය වැලි ප්‍රවාහනය සඳහා යොදාගෙන තිබේ.

එලෙස රියදුරු ලෙස කටයුතු කරමින් සිටිනා අතරතුර පොලිස් නිලධාරියාගේ උපදෙස් පරිදි වැලි ප්‍රවාහනය කරමින් සිටියදී බලපත්‍රයක් නැතිව වැලි ප්‍රවාහනය කිරීමේ චෝදනාවට අත්අඩංගුවට පත් වී 2019 පෙබරවාරි මස 26 වැනිදා මහියංගණය මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ 1992 අංක 33 දරන පතල් හා ඛනිජ පනත යටතේ නඩු පවරා තිබේ. එම නඩුවේදී ලොරියේ හිමිකරුට චෝදනා එල්ල කර නැත. ඉන් පසු වලංගු බලපත්‍රයක් නැතිව වැලි සහිත ලොරිය පැදවීම ප්‍රතික්ෂේප කරමින් වලංගු බලපත්‍රයක් සහිත අවස්ථාවල පමණක් වැලි ප්‍රවාහනය කළ බවත්, වැලි ප්‍රවාහනය ප්‍රතික්ෂේප කිරීම නිසා ලොරි රථයේ හිමිකරු වන පොලිස් නිලධාරියා දැඩි කෝපයකින් පසු වූ බවත්, අවස්ථා කිහිපයකදීම බලපත්‍ර නොමැතිව වැලි ප්‍රවාහනය ප්‍රතික්ෂේප කළ අවස්ථාවන්හිදී වෙනත් රියදුරකු ලවා එම පොලිස් නිලධාරියා වැලි ප්‍රවාහනය කළ බවත් එම ඔහුගේ මූලික අයිතිවාසිකම් පෙත්සමේ සඳහන් කර තිබේ. පෙත්සම ජුනි මස පළමු වැනිදා යළි කැඳවීමට නියමිතය.

## අයිතිවාසිකම් කිහිපයක් කඩ වෙලා

අදාළ සිද්ධිය සම්බන්ධයෙන්, නීතිඥ සුරේන් ඩී. පෙරේරා මෙසේ පැවසුවේය. "මෙම පුද්ගලයා සම්බන්ධයෙන් මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කිරීමට මූලිකම හේතුව වුයේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12-1 සහ 13-1 වගන්ති අනුව, සාපරාදී බියවැද්දීමක් සහ වදහිංසනට ලක් කිරීමක් සිදු කොට තිබීමයි. එලෙසම නීත්‍යානුකූල නොවූ අත්අඩංගුවට ගැනීමක්ද සිදුකොට තිබෙනවා. ඔහුගේ රියදුරු බලපත්‍රය තාවකාලිකව අත්හිටුවීමෙන් ඔහුගේ ප්‍රධාන මුදල් ඉපැයීමේ මාර්ගය වන රියදුරු වෘත්තිය සඳහා ද බාධා එල්ල වෙනවා. මෙවැනි පසුබිමක් යටතේ, ඔහුගේ ජීවිතයට ඇති වන තර්ජනය මානව හිමිකම් උල්ලංඝනය කිරීමක්."

දෙදරු පියකු වන අනුරසිරි මෙවන් තර්ජනයකට ලක් වීම ඔස්සේ, සමාජයට ගෙනයන පණිවිඩය ප්‍රබලය. රටේ සාමය සහ ආරක්ෂාව උදෙසා කැප විය යුතු ආරක්ෂක නිලධාරීන් විසින් සාමාන්‍ය පුද්ගලයකු මෙලෙස පීඩාවට පත් කරනු ලැබීම ඔස්සේ සමස්ත ජනතාවගේ ආරක්ෂාව පිළිබඳව ගැටලුවක් මතු වන්නේය. එබැවින්ම මෙය සමාජයේ කතාබහට ලක් කිරීම ඔස්සේ යළි මෙවන් අවස්ථාවන් උදා නොවන පසුබිමක් ඇති කළ යුතුය.

■ **සමන්ති වීරසේකර**

# සීමා නිර්ණය නිසා පීඩාවට පත් බෝගස්වැව

ශ්‍රී ලංකාවේ සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් 2015 වසරේදී ගන්නා ලද තීරණ කීපයකට අනුව වවුනියාවේ සීමා මායිම් නව වෙනස්කමකට භාජනය කිරීමට පියවර ගැනීමත් සමගම සිදුව ඇත්තේ වවුනියාව බෝගස්වැව ජනපදයේ මිනිසුන්ගේ මූලික මිනිස් අයිතිවාසිකම් හා මානව හිමිකම් අමු අමුවේම උල්ලංඝනය වීමකි.

1948 වර්ෂයේ නිදහස ලැබෙන විට බෝගස්වැව ඇතුළු මේ අවට ගොවි ජනපදය වවුනියාව දිස්ත්‍රික්කයට අයත්ව තිබූ බව වවුනියාව දිසාපති කාර්යාලයේ ලේඛනවලින් තහවුරු වේ. එය මඳක් වෙනස් වන්නේ වවුනියාවෙන් කොටසක් කැඩී මුලතිව් වශයෙන් අලුත් දිස්ත්‍රික්කයක් මීට විසිපස් වසරකට පමණ ඉහතදී නිර්මාණය වූ අවස්ථාවේදීය. නමුත් 2017 වසරේදී සීමා නිර්ණය කොමිෂන් සභාවේ නිර්දේශ මත මහවැලි අධිකාරිය විසින් මේ බෝගස්වැව ජනපදයේ සීමාමායිම් අලුතින් සලකුණු කොට මායිම් ගල් යොදා වෙන් කරන තුරුම මේ ජනපදය අයත්ව ඇත්තේ වවුනියාව දිස්ත්‍රික්කයටය.

බෝගස්වැව ජනපදය සමන්විත වන්නේ ප්‍රධාන ගම්මාන හතකිනි. බෝගස්වැව එක හා දෙක, නන්දිමිත්‍රගම, නාමල්ගම, සැළලිහිණිගම වෙහෙරතැන්න පැරණි ගම්මානය යන ගම්මාන ඊට ඇතුළත් වෙයි. සීමා නිර්ණය කොමිෂන් සභාවේ නිර්දේශයන් මත බෝගස්වැව ජනපදයට අලුතින් එක් වූ සීමාවන් නිසා එම ගොවි ජනපදය කොටස් හතරකට වෙන් වී තිබේ. මේ වෙන් වීම නිසා එම ජනපදයේ කොටසක් අනුරාධපුර දිස්ත්‍රිකයටද, තවත් කොටසක් මුලතිව් දිස්ත්‍රික්කයටද අනෙක් කොටස වවුනියාව දිස්ත්‍රික්කයටද වශයෙන් කැබලිවලට වෙන්ව තිබේ.

**එකම පන්සල, දිස්ත්‍රික්ක දෙකක**

වවුනියාවේ සිට බෝගස්වැව ජනපදය දක්වා අප ගමන් කරන විට මේ මායිම් බෙදීම ආරම්භ වන්නේ නාමල්ගම ප්‍රදේශයෙනි. නාමල්ගම රජ මහා විහාරාධිපති මරදම්මඩුවේ ඥානජෝති හිමියන් පැවසුවේ උන්වහන්සේගේ විහාරස්ථානයේ කොටසක් අනුරාධපුර දිස්ත්‍රික්කයටද තවත් කොටසක් වවුනියාව දිස්ත්‍රික්කයටද අයත් වී ඇති බවයි.

''අපේ පන්සලේ බුදු මැදුර දහම් පාසල් අයිති වෙන්නේ වවුනියාවේ දෙමළ ප්‍රාදේශීය ලේකම් කොටසටයි. එතැනින් එහා පැත්ත අයිති වෙන්නේ වවුනියාව දකුණු සිංහල ප්‍රාදේශීය ලේකම් කොටසටයි. සංඝාවාසය අයිති වෙන්නේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයටයි. පන්සලේ වැඩක් කර ගන්න මේ තැන් තුනටම යන්න ඕනේ. ගමන් වියදම විතරක් රුපියල් නවසීයකට වැඩිය වියදම් වෙනවා. පන්සල මීට කලින් වවුනියාවට විතරක් අයිති වෙලා තියන කොට කිසිම අපහසුවක් නෑ මෝටර් සයිකලේ ගිහින් අවශ්‍ය රාජකාරිය කරගෙන එන්න පුළුවනි. නමුත් දැන් එහෙම බැහැ.

මගෙ දායකයෝ දුප්පත් ඔවුන්ගේ සමෘද්ධි මුදල රුපියල් 1000යි. ඒත් ඒක ගන්න කැබිතිගොල්ලෑවට සමහරු යනවා. තවත් සමහරු නෙඩුන්කේණියට යනවා ඒ ගමන්වලට රුපියල් 900ක් වියදම් වෙනවා. නෙඩුන්කේණියට යන්න

සිද්ධ වෙන අයට සේරම කෙරෙන්නේ දෙමළ භාෂාවෙන්. ඒත් මේ අයට දෙමළ බැහැ. එහෙ ඉන්න නිලධාරීන්ට සිංහල බැහැ.මිනිස්සු මේ ප්‍රශ්නත් එක්ක ගම්මානය දාලා වෙනින් පළාත්වලට ගියා. ඔවුන්ට නිදහසේ ජීවත් වෙන්නත් නැහැ. දන්න භාෂාවෙන් වැඩ කරන්නත් බැහැ. මේ සීමා නිර්ණය ප්‍රශ්නය නිසා බෝගස්වැව ජනපදයේ ජනතාවට භාෂා අයිතිය, ඔවුන්ගේ මව් භාෂාවෙන් කටයුතු කිරීමට ඇති අයිතිවාසිකම සම්පූර්ණයෙන්ම වගේ අහිමි වී ගොස් තිබෙනවා.

**අධ්‍යාපනයේ ගැටලු**

බෝගස්වැව විද්‍යාලය සිංහල මාධ්‍ය පාසලකි. එය අයත් වන්නේ වවුනියාව දකුණ අධ්‍යාපන කලාපයටය. නමුත් සීමා නිර්ණය නිසා පරිපාලනමය කලාපය හා අධ්‍යාපන කලාපය වී ඇත්තේ නෙඩුන්කේණි ප්‍රදේශයයි. ඒ ආශ්‍රයෙන් මතු වී ඇති ගැටලු පිළිබඳව විදුහල්පති ඩබ්ලිව්.බී.ආර්. ජයකොඩි මෙසේ පැවසුවේය.

"වවුනියාව දකුණු සිංහල කොටසේ පාසල්වලින් වැඩිම සිසුන් සංඛ්‍යාවක් සිටින්නේ බෝගස්වැව පාසලෙයි. නමුත් එය දැන් අයිති වෙන්නේ නෙඩුන්කේණියේ දෙමළ කොටසටයි. රජයේ පාසල් සඳහා මානව හා භෞතික සම්පත් ලබා දීමේදී සමානව යමක් අපට ලැබෙන්නේ නෑ. හේතුව නෙඩුන්කේණියේ ජන අනුපාතය අනුව සිංහල කොටසකට සිටින්නේ මේ ළමයි හා ඔවුන්ගේ දෙමව්පියන් පමණයි. නෙඩුන්කේණියේ දෙමළ සිසුන්ගේ සංයුතිය අනුව සලකලා බලන කොට අපේ ළමයින්ගේ ගණන ඉතා සුළු අගයක් වෙනවා. මේ නිසා අපට භෞතික සම්පත් ලැබෙන්නේ ඉතාම අඩුවෙන්. රජයේ ප්‍රතිපත්තියක් මත බඳවා ගන්නා විවිධ නිලධාරීන් පාසල්වලට අනුයුක්ත කරනවා. සංවර්ධන නිලධාරීන් පාසල්වල ඉගැන්වීමේ කටයුතු සඳහා අනුයුක්ත කිරීම මේකට හොඳම නිදසුනක්. ඒත් නෙඩුන්කේණි ප්‍රදේශයේ සිටින සියලුම සංවර්ධන නිලධාරීන් දෙමළ ජාතිකයින් පමණයි. ඔවුන්ට මේ සිංහල පාසල්වලට ඇවිත් කරන්න දෙයක් නෑ. උගන්වන්නත් බැහැ. මේ නිසා මේ පාසලට අත්‍යවශ්‍ය විෂයන්වලට ගුරුවරු කවදාවත් ලැබෙන්නේ නෑ.

ඒකට හේතුව තමයි අපේ වවුනියාව සිංහල අධ්‍යාපන අධ්‍යක්ෂවරයාත් නෙඩුන්කේණි අධ්‍යාපන අධ්‍යක්‍ෂවරයාත් කවදාවත් එකම රැස්වීමකදී හම්බ වෙන්නේ නෑ. අපි ප්‍රශ්න කියන්න ඕනේ වවුනියාවට, උත්තර ගන්න ඕනේ නෙඩුන්කේණියෙන්. මේ නිසා හැමදාම අපේ පාසලේ ප්‍රශ්නම විතරයි. සම අධ්‍යාපනයක් නෑ. සම පහසුකම් නෑ. සම්පත්වල සාධාරණ බෙදීමක් නෑ. ඇවිල්ලා ඉන්න ගුරුවරු එදා ඉඳලම මේ පාසලේ ඉන්නවා. ඔවුන් වෙනුවට වෙන ගුරුවරු ලැබෙන්නේ නැති නිසා මෙහෙ ඉන්න අයට ඔවුන්ගේ ගම්වලට යන්න අවස්ථාවක් නෑ. මේ නිසා මේකට කොටු වෙලා ඉන්න ගුරුවරුන්ගේත් මූලික මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය වෙලා. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයන් අනුව වසර පහක් සේවය කළ පිරිසට තමන්ට පහසු පළාත්වලට යෑමේ අවස්ථාව ඇතත් ඒ අනුව මේ අයට එහෙම ඉඩක් ලැබෙන්නේ නෑ. බලහත්කාරයෙන් මේ ගුරුවරු තබා ගෙන ඉන්නවා. වවුනියාවට එන ගුරුවරුන් මේ පාසලට දෙන්න බලයක් මේ නව සීමා නිර්ණය නිසා ඇති වූ පළාත් බෙදීම මත සිදුව තිබෙන නිසා හැමදාම මේ පාසලේ තත්ත්වය මේකම තමයි."

**මැතිවරණ සිතියම වෙනස් වීම**

බෝගස්වැව ජනපදය නිර්මාණය වී ඇත්තේ වවුනියාවේ පාරම්පරිකව ජීවත් වූ ජනතාව හා පිටස්තර පළාත්වලින් රැගෙන විත් පදිංචි කළ පිරිසකගේ සංකලනයකිනි. පිටස්තර පිරිස් පැමිණ ඇත්තේ ශ්‍රී ලංකාවේ දකුණු පළාතෙනි. යුද්ධය හමාර වීමෙන් පසුව හම්බන්තොට, ගාල්ල, මාතර, පොළොන්නරුව, වලපනේ ආදී ප්‍රදේශවලින් පවුල් 7,000ක් පමණ රැගෙන විත් පදිංචි කොට ඇත්තේ යම් දේශපාලන අරමුණක් ඉටු කර ගැනීම පිණිසය. ඒ මේ වැසියන්ගේ ඡන්ද බලයෙන් වන්නි දිස්ත්‍රික්කයෙන් එක් සිංහල පුද්ගලයෙකු පාර්ලිමේන්තුවට යැවීම පිණිසය. නමුත් සීමා නිර්ණයත් සමගම බෝගස්වැව ජනපදයේ මැතිවරණ සිතියමද වෙනස් වීම නිසා මෙහි ඡන්ද දායකයෝ වවුනියාව, මුලතිව් හා අනුරාධපුර යන මැතිවරණ කොට්ඨාසවලට බෙදී ගොස් සමස්තයක් වශයෙන් වන්නිය ලෙස ගත් විට ලැබෙන ඡන්දදායකයින්ගේ එකතුව වෙනස් වී තිබේ. එනම් එකම පොකුරක් වශයෙන් සැලකූ ඡන්ද දායකයන් මැතිවරණ කොට්ඨාස කීපයකට කැඩී යෑම නිසා සිංහල වැසියෙකු පාර්ලිමේන්තුවට යැවීම කළ නොහැකි දෙයක් බවට පත්ව තිබේ.

මේ තත්ත්වය නිසා සිදුව ඇත්තේ බෝගස්වැව ජනපදයේ ඡන්ද දායකයින්ට තමන් කිසිදා නොදන්නා පක්ෂයක අපේක්ෂකයෙකුට ඡන්දය ප්‍රකාශ කිරීමට සිදුව තිබීමයි. නෙඩුන්කේණි මුලතිව් වැනි ප්‍රදේශවලින් මැතිවරණවලට ඉදිරිපත් වන්නේ දෙමළ දේශපාලන පක්ෂවල දෙමළ අපේක්ෂකයෝය. මේ පිරිසට ඡන්දය ප්‍රකාශ කිරීමට බෝගස්වැව ජනපදයේ පිරිස සූදානම් නැත. මේ නිසා බොහෝ දෙනෙකුට අකැමැත්තෙන් වුවද තම ඡන්දය ප්‍රකාශ නොකොට සිටීමට සිදුව ඇත.

බෝගස්වැව ජනපදයේ ඡන්දදායකයින් කැඩී බෙදී වෙන් වීම නිසා ඔවුන්ට කැමති අපේක්ෂකයෙකුට ඡන්දය දීමට මහමැතිවරණයකදී අවස්ථාව මෙතෙක් උදා වී නොමැත. මේ නිසා එහි ජනතාව පළාත් පාලන මැතිවරණවලදී ප්‍රාදේශීය සභාවන් සඳහා ඔවුන් කැමති අපේක්ෂකයෙකු ඔවුන්ගේ දේශපාලන පක්ෂයට අනුව තෝරා ගැනීමට උත්සාහ කොට ඇති අතර එය සාර්ථක වූ අවස්ථා කීපයක්ද වෙයි. ඔවුන් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් බවට පත්ව ඇත්තේ කැබිතිගොල්ලෑව හා නෙඩුන්කේණි පළාත් සඳහාය. නමුත් මේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ පදිංචිය වවුනියාවේය. මේ නයින් බලන විට බෝගස්වැව ජනපදයේ ජනතාවට නිදහස් වූ ඡන්ද බල අයිතියක් නොමැත්තේය. ප්‍රජාතන්ත්‍රවාදීව ඔවුන්ගේ සිතුම් පැතුම් හා ආකල්පවලට ගැළපෙන දේශපාලනඥයෙකු තෝරා ගැනීමට මගක් නොමැත.

දිවයිනේ දකුණු පළාතේ තමන්ට හිමිව තිබූ ඡන්ද බල අයිතිය කටු ගා දමා එය වන්නියට මාරු කරගෙන ඔවුන් මෙහි පැමිණියේ අරමුණු කීපයක් උදෙසා වුවත් ඒ සියලුම අරමුණු සීමා නිර්ණයත් සමග ඇති වූ අලකලංචියකින් විනාශ වී ගොස් හමාරය. සිංහලයන් වශයෙන් ඉපිද, සිංහල පරිසරයක ජීවත් වී වන්නියේ සිංහල ජනතාව අතර පදිංචියට පැමිණි ඔවුන්ට මේ වන විට දෙමළ ප්‍රදේශයක දෙමළ සංස්කෘතියට හා දෙමළ භාෂාවට යටත්ව දෙමළ දේශපාලනඥයින්ගේ හා නිලධාරින්ගේ අණ පනත් සමග ජීවත් වීමට සිදුව තිබේ.

## 'ජන සංයුතිය වෙනස් කිරීමක්'

බෝගස්වැව ජනපදයේ සිටින සිංහල ජාතිකයින් සීමා නිර්ණය නිසා මෙලෙස පීඩාවකට පත්ව සිටියදී ඊට යාබද දිස්ත්‍රික්කය වන මුලතිව් දිස්ත්‍රික්කයේ වැසියන්ගෙන් හා දේශපාලනඥයින්ගෙන් කියවෙන්නේද ඊට හාත්පසින්ම ප්‍රති විරුද්ධ වූ මතයකි. මුලතිව් ප්‍රදේශයේ දේශපාලන අධිකාරියේ බලවතුන් බවට පත්ව සිටින්නේ දෙමළ ජාතික සන්ධානයයි. එහි ප්‍රාදේශීය නායකයා වශයෙන් කටයුතු කරන උතුරු පළාත් සභාවේ හිටපු මන්ත්‍රී ටී. රවිහරන් පෙන්වා දෙන්නේ බෝග ස්වැව ජනපදයේ සිංහල ජනතාව සීමා නිර්ණයත් සමගම දෙමළ පළාත්වල ඡන්ද දායකයින් හා සාමාජිකයින් වීම නිසා උතුරේ දෙමළ ජනතාවගේ සංයුතියේ විශාල වෙනස්කමක් සිදුව ඇති බවයි.

මේ තත්ත්වය දෙමළ දේශපාලන ව්‍යාපාරයට එල්ල වූ තර්ජනයක් බවද ඔහු කියා සිටියි. රජය විසින් සිංහල මිනිසුන්ගේත් දෙමළ මිනිසුන්ගේත් අයිතිවාසිකම් අමු අමුවේ උල්ලංඝනය කරමින් කටයුතු කිරීම නිසා මේ ජාතීන් දෙකටම හිමි විය යුතු අයිතිවාසිකම් ඉටු නොවන බවක් ඔහු සඳහන් කරයි.

2017 වසරේදී මේ සීමා නිර්ණය සලකුණු කිරීම ආරම්භ වීමත් සමගම බෝගස්වැව ජනපදයේ ඇති ස්වේච්ඡා සංවිධාන ගණනාවක් රජයට වහාම මේ පනත හකුලා ගන්නා ලෙස බල කරමින් උද්ඝෝෂණ මාලාවක් දියත් කොට තිබේ.

## 'මී වස්සකු තරම්' ලිපි ගොනුවක්

ඔවුන් විසින් ජනාධිපතිවරයා ඇතුළු වගකිවයුත්තන්ට ලියා ඇති ලිපිවලින් පිරී ඇති ලිපි ගොනුව 'කුඩා මී වස්සෙකු තරම්' වෙතැයි ඔවුහු පවසති. එතරම් විශාල වූ ලිපි සංඛ්‍යාවක්, එකින් එක වරින් වර වන්නියේ සිට කොළඹට යොමු කරන ලද නමුත් මේ දක්වා ඒ කිසිවකට ඇහුම්කන් දුන් අයෙකු දැක ගැනීමට නොහැකිය.

පාලන අධිකාරියේ පළාත් පාලන බලය විශාල වශයෙන් හිමිවන්නේ දිසාපතිවරයාටය. බෝගස්වැව වැසියන් වවුනියාව දිසාපතිවරයාටද ලිපි ගණනාවක්ම ඉදිරිපත් කොට තිබේ. දිසාපති පී.ඒ. සරත්චන්ද්‍ර මහතා සමග කළ සාකච්ඡාවේදී ඔහු අපට ප්‍රකාශ කළේ එම ඉල්ලීම් ඇතුළත් සියලුම ලිපි බලධාරීන්ගේ අවධානය පිණිස යොමු කොට ඇති බවයි.

"මේ ඇතිව තිබෙන තත්ත්වය තේරුම් ගත යුත්තේ සීමා නිර්ණය පිළිබඳ කොමිෂන් සභාවයි. මේ සීමා මායිම් යළි වෙනස් කළ යුතුද නැද්ද මුල් තත්ත්වයට පත් කළ යුතුද නැද්ද යන්න තීරණය කළ යුතු වන්නේ එම කොමිසමයි. බලය තිබෙන්නේ ඒ කොමිසමට නිසා ජනතාවගේ ඉල්ලීම් සියල්ලම අපි කොමිසම වෙත යොමු කොට තිබෙනවා."

■ **දිනසේන රතුගමගේ**

# අපේ මුදල් වියදම් කරන හැටි දොරවල් වහගෙන කතා කිරීම

"කඩොලාන පද්ධතියට හානි වන සේ දමා ඇති පස් ඉවත් කළොත් මම ඒ සැණෙන් නිර්දේශය ලබා දෙනවා... ගැටලුව තිබෙන්නේ වන අපරාධකරුවෙකුට මට අවසර ලබා දෙන්න බැහැ." 2021 මාර්තු 30 වැනි අඟහරුවාදා පැවති ගම්පහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී එසේ කීවේ ගම්පහ දිසා වන නිලධාරිනී දේවානි ජයතිලකය.

"මීඩියාලට වචන කියන්න එපා." යනුවෙන් මහජන නියෝජිතයෙකු කියන හඬ ඇසුණි.

මුලාසනාරූඪව සිටි නිමල් ලාංසා ප්‍රමුඛ දේශපාලනඥයන් සමඟ ගැටෙන්නට දේවානි ජයතිලක මහත්මියට එදින සිදු විය. සියල්ල මාධ්‍යවල පටිගත වූ අතර සිදුවීමේ වීඩියෝපට සමාජ මාධ්‍ය හරහා හුවමාරු විය. ඇගේ සහයෝගයට සමාජ මාධ්‍යවලින් විශාල පිරිසක් ඉදිරිපත් විය. ඇය එහිදී තර්ක කර තිබුණේ රජයේ එක් ව්‍යාපෘතියක් නිසා කඩොලාන පද්ධතියට හානි සිදු වන බවය.

'ඒ ව්‍යාපෘතිය වන අපරාධකරුවෙක්. ඒ නිසා මට අවසර දෙන්න බැහැ.' යනුවෙන් ඇය කියා තිබුණි. දේශපාලනඥයන් ජනප්‍රිය අරමුණු මත පදනම්ව සිදුකරන ඇතැම් 'සංවර්ධන ව්‍යාපෘති' යැයි කියන ඒවායින් සැබෑවට සිදු වන්නේ පරිසරය හෝ වෙනත් සම්පත් විනාශ වීම විය හැක. නැත්නම් ඇතැම් ව්‍යාපෘති ඇත්තටම පලක් නැති ඒවා විය හැක.

දේවානි ජයතිලකට සමාජ මාධ්‍යවලින් ලැබුණු සහයෝගය නිසාම වෙනත් නිලධාරීන්ට වුව මාධ්‍ය ඉදිරියේ නිදහසේ කතා කරන්නට පාර කැපෙන්නට ඉඩ තිබේ. දේශපාලනඥයන්ගේ කයිවාරු සහ එහෙයියන් බඳු නිලධාරීන් හිස පාත් කරගෙන කියන කතාවලට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් සීමා නොවිය හැක.

## එක රටක් - නීති ගොඩක්

දේවානි මහත්මියගේ හඬ නැගීමෙන් දින කිහිපයක් යද්දී දිවයින පුරා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් ආවරණය සඳහා මාධ්‍යවේදීන්ට ඉඩ නොලැබෙන බව වාර්තා පළ විය. එතැන් පිට 2022 දක්වාම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලට සහභාගී වී ඒවා වාර්තා කරන්නට තමන්ට ඉඩ ලබා නොදෙන බවට මාධ්‍යවේදීන්ගේ මැසිවිලි නැගීම් වාර්තා වූ අවස්ථා බොහෝය.

2022 මර්තු මාසයේදී අප කළ සොයා බැලීම්වලට අනුව ලංකාවේ ඇතැම් දිස්ත්‍රික්කවල සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තා කරන්නට මාධ්‍යවේදීන්ට ඉඩ ලැබී තිබේ. එහෙත් තවමත් ඇතැම් දිස්ත්‍රික්වල තිබෙන්නේ දොරටු වසා හොරෙන් කරන සම්බන්ධීකරණ රැස්වීමය. අපි දිස්ත්‍රික්ක කිහිපයක මාධ්‍යවේදීන්ට සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල නිලධාරීන්ට ඇමතුම් ලබා දී මේ ගැන සොයා බැලුවෙමු.

එලෙස කළ විමසීමකදී නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් ජී.කේ.ජී.ඒ.ආර්.පී.කේ. නන්දන මෙසේ පැවසීය. 'මාධ්‍යවේදීන්ට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලට ඇතුළුවෙන්න නොදීම නුවරඑළියේ ප්‍රශ්නයක් නෙවෙයි. ලංකාවේම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලට මාධ්‍යවේදීන්ට මුල ඉඳලාම එන්න දෙන්නේ නැහැ.

අපිට උපදෙස් ලැබිලා තියෙන්නේ සම්බන්ධීකරණ කමිටුව අවසන් කරලා, සම්බන්ධීකරණ කමිටු සභාපතිතුමා ඇතුළු කණ්ඩායම මාධ්‍යවේදීන් කැඳවලා, මාධ්‍ය සාකච්ඡාවක් පවත්වලා සම්බන්ධීකරණ කමිටුවේදී ගත්ත තීරණ ගැන සාරාංශයක් කියන්න කියලා. ඒක තමයි ක්‍රමය.

ඔහු එසේ කීවත්, මෑතක් වනතුරුම බොහෝ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවල දොරටු මාධ්‍යවලට විවර විය. දොරටු විවෘත කිරීම දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ වගකීමක්ද වී තිබුණි.

## චක්‍රලේඛයේ සඳහන් උපදෙස්

ස්වදේශ කටයුතු චක්‍රලේඛ 06/2017 යටතේ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය 2017 මැයි 22 වැනිදා එවකට එහි ලේකම් නීල් ද අල්විස් මහතාගේ අත්සනින් යුතු 'දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු පැවැත්වීම' යනුවෙන් නිකුත් කළ චක්‍රලේඛයේ 25 සහ 26 වගන්ති මෙසේය.

'ප්‍රාදේශීය හෝ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව රැස්වීම සඳහා එම කොට්ඨාසයේ/දිස්ත්‍රික්කයේ මාධ්‍යවේදීන්ට සහභාගී වීමට හැකිය. ඒ අයගේ නාමලේඛනය ප්‍රාදේශීය/දිස්ත්‍රික් ප්‍රවෘත්ති නිලධාරීන් දැනගත යුතුය. මාධ්‍යවේදීන්ට අවශ්‍ය කරන පහසුකම් සැපයීමේ වගකීම ප්‍රාදේශීය ලේකම්/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යයකි.'

'ඉඩකඩ ප්‍රමාණවත් නොවන්නේ නම් එකම මාධ්‍ය ආයතනයකින් කිහිපදෙනෙකු සහභාගීවීම සීමා කර ගත හැකිය. මාධ්‍යවේදීන්ට සභාවේ කරුණු වාර්තා කිරීමට හැකි වන අතර මාධ්‍යයට කරුණු ඉදිරිපත් කිරීම සඳහා රැස්වීම අවසානයේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සම සභාපති, මහජන නියෝජිතයන්ට වෙනම සාකච්ඡාවක් පැවැත්විය හැකිය.'

ඒ අනුව දොරටු වැසූ අමුතු සෙල්ලමක් පටන් ගත්තේ මෑතකදීය.

## මිලිටරි නිලධාරීන්ගේ ආකල්ප

මෙලෙස සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාකරණයට 2021 වර්ෂයේදී තහංචි වැටුණේ මේජර් ජෙනරාල් කමල් ගුණරත්නගේ අත්සනින් යුතුව නිකුත් කළ 2021/02 චක්‍රලේඛය අනුවය. එයින් මාධ්‍යවේදීන්ට දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීම්වලට සහභාගී වීම සඳහා ඇති අයිතිය සීමා කොට අදාළ රැස්වීම අවසන කමිටු ප්‍රධානීන්ගෙන් 'සංක්ෂිප්ත වාර්තාවක්' ලබාගැනීමේ සංස්කෘතියක් ඇති කරන්නට යෝජනා කර තිබීම නිසාය. මෙය මාධ්‍යවේදීන්ගේ පමණක් නොව දේශපාලනඥයින්ගේද විරෝධයට හේතු විය.

2021 මැයි 14 වැනිදා මාතලේ ප්‍රාදේශීය සභා රැස්වීමේදී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙන් තේරී පත් වූ මාතලේ ප්‍රාදේශීය සභාවේ සභාපති කපිල බණ්ඩාර හෙන්දෙණිය ප්‍රාදේශීය සභා රැස්වීමක මාධ්‍යවේදීන්ට උක්ත රැස්වීම් සඳහා සහභාගී වීම සීමා කරමින් පැනවූ චක්‍රලේඛය හෙළා දකින බව කියා තිබුණි.

එවකට ස්වදේශ කටයුතු විෂය තිබුණේ ශ්‍රී ලංකාවේ මිලිටරි ආයතන අයත් වූ ආරක්ෂක සහ ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේය. එම අමාත්‍යාංශයේ ලේකම්වරයා වුණේ මිලිටරි නිලධාරියෙකු වූ කමල් ගුණරත්නය. ඔහු සිවිල් අයිතිවාසිකම් පිළිබඳ තමන්ට උනන්දුවක් නැති බව ප්‍රකාශවලින්ම පෙන්වා ඇති කෙනෙකි. ඔහු තොරතුරු දැනගැනීමේ අයිතිය ආරක්ෂා කිරීම ගැන උනන්දු වනු ඇතැයි කිසිසේත් බලාපොරොත්තු තැබිය නොහැක.

ඇත්තෙන්ම ස්වදේශ කටයුතු වැනි සිවිල් විෂයයක් ආරක්ෂක අමාත්‍යාංශය යටතට පත් කිරීම පවා අශෝක පීරිස් වැනි හිටපු අමාත්‍යාංශ ලේකම්වරුන් වන පරිපාලන ප්‍රවීණයන්ගේ සිට නොයෙකුත් ප්‍රාමාණිකයන්ගේ විරෝධයට ලක් වූ සිදුවීමකි.

කෙසේ වෙතත් මෙම තහංචි වැටීම ගැන වැඩිදුර කතා කරන්නට කලින් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් ගැනත් යමක් කිව යුතුය.

## සම්බන්ධීකරණ කමිටුවල වගකීම

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල රැස්වීම්වලට ඒ ඒ ප්‍රදේශවල මහජන නියෝජිතයෝ සහ රාජ්‍ය නිලධාරීහු සහභාගී වෙති. මේවා සංවිධානය කරන්නේ දිසාපතිවරුන් හෙවත් දිස්ත්‍රික් ලේකම්වරුන් යටතේය. දිසාපති කාර්යාල යටතේය.

ශ්‍රී ලංකාවේ පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලනය ඉතා අවිධිමත් බව අමුතුවෙන් කිව යුතු නැත. පළාත් සභා ඇත්තේ වෙනම ආයතන විශේෂයක් ලෙසය. දිස්ත්‍රික් ලේකම් කාර්යාල සමඟ විධිමත්ව ඒවා බද්ධ වී නැත. පළාත් පාලන ආයතනවල සීමා සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සීමා හරිහැටි සමපාත නැත. නිවැරදි ක්‍රමවේදය අනුව නම් පාර්ලිමේන්තුවට තේරී පත් වන මන්ත්‍රීවරුන්ගේ මූලික වගකීම ජාතික ප්‍රතිපත්ති සම්පාදනය සහ නීති සැකසීමය. ඔවුන්ට පාර්ලිමේන්තුවේ කමිටුවල සහ අනෙකුත් තැන්වල කරන්නට ඕනෑ තරම් වැඩ තිබේ.

ප්‍රාදේශීය මට්ටමේ සංවර්ධන කටයුතු විධිමත්ව සිදු කිරීම වෙනුවෙන් පළාත් සභා සහ පළාත් පාලන ආයතන ඇත. ඊට අමතරව දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා කටයුතු සිදු කළ හැක.

එහෙත්, ඊට වෙනස්ව සම්බන්ධීකරණ කමිටු නමින් වෙනම රැස්වීම් වික්‍රමයක්ද මෙරට පාවිච්චි වේ. බොහෝ විට මේ කමිටුවල සභාපතිවරුන් ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පත් කරනු ලබයි. ඇතැම් ආණ්ඩු පාර්ලිමේන්තුවට තේරී පත් නොවූ නමුත් ඇතැම් ප්‍රකට දේශපාලනඥයන් මේ තනතුරුවලට පත් කර ඇත. ඒ අයට ඇමතිවරුන්ට සමාන හෝ ඊට ආසන්න මට්ටමේ වරප්‍රසාද ලබා දෙන්නටත් කටයුතු කර ඇත.

## පටු දේශපාලන අරමුණු

උදාහරණයක් ලෙස 2019 දෙසැම්බර් මාසයේදී දිස්ත්‍රික් සංවර්ධන කමිටු සභාපතිවරුන්ට ඒ වෙනුවෙන් වාහන සහ ඉන්ධන දීමනාව බැගින් ලබා දීමට වත්මන් ආණ්ඩුව තීන්දු කර තිබුණි. ඒ සඳහා කැබිනට් අනුමැතියත් ලැබී තිබුණි. කැබිනට් මණ්ඩලය සීමා කරද්දී ඒවා නොලැබුණු ඇතැම් දේශපාලන ප්‍රබලයන්ගේ හිත් සැනසුවේ මේවා ලබාදෙමින්ය.

කෙසේ වෙතත් මේ සම්බන්ධීකරණ කමිටු ආකෘතිය ඵලදායීද, නැතිද යන ප්‍රශ්නය පසෙක තබා අප මෙහි සාකච්ඡා කළ යුත්තේ කුමන හෝ අරමුණු මත පවත්වාගෙන යන මේ ආයතනවල සිදු වන්නේ මොනවාද කියා දැනගැනීමට මහජනයාට ඇති අයිතිවාසිකම රැකගැනීම ගැනය.

මන්ද යත් ප්‍රදේශයේ එක් එක් මාර්ගවල සංවර්ධන කටයුතු කළ යුතු ආකාරය, ඒවාට තියෙන බාධා, ව්‍යාපෘතිවල අසාර්ථකවීම් හා සාර්ථකවීම් ආදී නොයෙක් දේ මෙවැනි රැස්වීම්වලදී කතාබහට ලක් වෙයි. සියල්ල දැනගැනීම මහජනතාව සතු අයිතියකි. දොරටු වසා හංගන්නට රහස් එහි නැත. ආණ්ඩු පක්ෂය ක්‍රීඩාංගණවලට බස්වලින් ගෙන හා සෙනඟ පුරවා මහජන රැළි පවත්වන කාලෙක වසංගතයක් පිටින් දමා දොරටු වසන්නට අයිතියකුත් නැත.

අප මේ කතාකරන මොහොත වන විට සිදුව ඇත්තේ වසංගත සමයේ ඇති කළ චක්‍රලේඛ වෙනස් නොවීමත්, ජාතික මට්ටමෙන් නිසි උපදෙස් නොලැබීමත් මත විවිධ දිස්ත්‍රික්කවල විවිධාකාරයෙන් මෙම රැස්වීම් පැවැත්වීමය.

## දිස්ත්‍රික්ක කිහිපයක අත්දැකීම්

උදාහරණයක් ලෙස මහනුවර දිස්ත්‍රික් ලේකම් චන්දන තෙන්නකෝන් මේ පිළිබඳව අදහස් දක්වමින් මෙසේ පැවසීය. 'අපි මේ අවුරුද්දේ (2022) දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු දෙකක් තිබ්බා. එහෙම ප්‍රශ්නයක් වෙලා නම් නැහැ. මීඩියා සේරම අයට අපි කියනවා.'

මාතර දිස්ත්‍රික් ලේකම් වයි. වික්‍රමසිරි පැවසුවේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලට මාධ්‍යවේදීන්ට ඇතුළු වීමට නොදෙන බව තමන් දන්නේ නැති බවය. ඒ පිළිබඳව තමන් සොයා බලා ඊට අදාළ ක්‍රියාමාර්ග ගැනීමට තමන් කටයුතු කරන බවද ඔහු පැවසීය.

එහෙත් කුරුණෑගල තත්වය වෙනස්ය. කුරුණෑගල අතිරේක දිස්ත්‍රි ලේකම් (සංවර්ධන) ජී.ඒ. කිත්සිරි මහතා කීවේ මෙසේය. 'මාධ්‍යවේදීන්ට ඇතුළුවෙන්න දෙන්නේ නැහැ නෙවෙයි. දිසාපතිතුමා ඒ කාරණය ගැන මාධ්‍යවේදීන් දැනුවත් කරලා තියෙන්නේ. අවසන් වුණාට පස්සේ, ඒ කමිටු රැස්වීම්වලදී අපි ගත්ත තීරණ ගැන මාධ්‍යවේදීන් දැනුවත් කරනවා. මෙතෙක් ඒ ක්‍රියාපාටිපාටය ගැන මාධ්‍යවේදීන්ගෙන් කිසිම ගැටලුවක් අපිට ඉදිරිපත් වෙලා නැහැ.'

ඒ අනුව විවිධ ප්‍රදේශවල විවිධ පිළිවෙත් අනුගමනය කෙරෙන බව පැහැදිලිය. ජාතික මට්ටමෙන් නිසි උපදෙස් මාලාවක් නැත.

රට වටා ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ ලේකම් සුනිල් එස් පැල්ලන්දෙණිය අදහස් දක්වමින් මෙසේ පැවසීය. 'මුලින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලට මාධ්‍යවේදීන්ට සහභාගී වෙලා, අපේ රාජකාරිය කරගන්න අපිට ඒ කමිටුවෙන් ඉඩ ලබා දුන්නා.

ඒ කමිටු ඇතුළේ නිලධාරීන් සහ දේශපාලනඥයින් අතර සිදු වන ගැටුම් මාධ්‍යවලින් මිනිස්සු අතරට යන නිසා මේ වගේ තීරණයක් ගත්තා කියලා අපි හිතන්නේ. ඉන් පස්සේ ප්‍රාදේශීය මාධ්‍යවේදීන් ගිහින් දිස්ත්‍රික් ලේකම්වරයා සහ අනෙක් නිලධාරීන් හමුවෙලා ඒ අය එක්ක මේ ගැන සාකච්ඡා කළා. ඒත් ඒ අපේ ගැටලුවට විසඳුමක් විදියට කිව්වේ, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් මාධ්‍යවේදීන් නැතිව පවත්වලා, ඒ කමිටුවේදී ගන්න තීරණ ගැන කියන්න මාධ්‍ය සාකච්ඡාවක් තියන්නම් කියලා.

අපි ඒක ප්‍රතික්ෂේප කළා. අපිට ඕනෑ ඒ අය ගත්ත තීරණ ලියන්න නෙවෙයිනේ. මේ විදියට මාධ්‍යවලට ඇතුළු වෙන්න නොදී වාරණය කළාම, ඇත්ත ප්‍රශ්න යට ගිහින් බලධාරීන් ගත්ත තීරණ විතරක් එළියට එනවා. අපි ඉල්ලන්නේ මාධ්‍යවේදීන්ට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම්වලට ඇතුළුවන්න අවසර දීලා. ඒ තොරතුරු ජනතාව අතරට මාධ්‍ය හරහා ගෙනියන්න ඉඩ දෙන්න කියලා. අපි වාර්තා කරන ප්‍රවෘත්තිවල ගැටලුවක් තියෙනවා නම් ඒකට පියවර ගන්න ඕනෑ තරම් නීත්‍යානුකූල ක්‍රම තියෙනවානේ."

## 'දැඩි ලෙස විරුද්ධයි'

ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ සභාපති දුමින්ද සම්පත් මෙසේ පැවසීය.

"දිස්ත්‍රික් සංවර්ධන කමිටුවලට ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ට ඇතුළුවෙන්න නොදී, ඒ ආයතනවල මාධ්‍ය ඒකකවල වැඩ කරන නිලධාරී මට්ටමේ ප්‍රාදේශීය මාධ්‍යවේදීන් හරහා ඒ කමිටු රැස්වීම්වලට මාධ්‍ය ආවරණ ලබා ගන්නවා. ලංකාවේ හැම මාධ්‍ය ආයතනවලින්ම ඒ නිලධාරී මට්ටමේ ඉන්න ප්‍රාදේශීය මාධ්‍යවේදීන් අදාළ ප්‍රවෘත්ති යැවුවාම ඒවා ප්‍රසිද්ධ කරනවා. ආණ්ඩුවට ඕනෑ කරන ප්‍රවෘත්ති ටික විතරක් මේ අය ලවා ලියවගන්න පුළුවන්. මේ සිද්ධියේදී බලවත් විදියට අසාධාරණයට ලක්වෙන්නෙ වෘත්තිමය විදියට තමන්ගේ රැකියාව කරන මාධ්‍යවේදීන්.

"ආණ්ඩුවේ බලධාරීන් අසාර්ථක වෙන තැන් වහගන්න මේ විකල්පය තමයි ආණ්ඩුව තෝරාගෙන තියෙන්නේ. අපි මේ කාරණය ගැන දැඩිව විරුද්ධ වෙනවා. සම්බන්ධීකරණ කමිටුවලට මාධ්‍යවේදීන්ට ඇතුළු වෙන්න නොදී සිටීම බරපතළ කාරණයක්. හැබැයි ජනමාධ්‍ය ආයාතනවලට මේ සිද්ධි ගැන කිසිම තැකීමක් නැහැ. තමන්ගේ මාධ්‍ය ආයතනයේ රැකියාව කරන මාධ්‍යවේදීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරලා දෙන්න මාධ්‍ය ආයතන ප්‍රධානීන්ට උවමනාවක් නැහැ."

■ **රේඛා නිලුක්ෂි හේරත්**

# නල්ලූර් මුහුදු ආදිවාසීන්ගේ උරුමය උදුරාගැනීමේ අවනඩුව

"මේ වැව, මේ කුඹුරු යාය මුහුදු ආදිවාසීන්ගේ පාරම්පරික උරුමයන්. ඒත්, අද වෙනකොට අපේ අසරණකම, නුගත්කම ප්‍රයෝජනයට අරගෙන අපේ මේ උරුමයන් වෙනත් පිරිසක් අපෙන් උදුරගෙන. අපි රජයෙන් ඉල්ලන්නේ, අපේ පාරම්පරික උරුමය අපේ ජනතාවට ලබා දෙන්න කියලයි..."

උල්ලුකුලම් වැවේ බිදෙන රළ පෙළ දෙස බලාගෙන මූතූර් මුහුදු ආදිවාසි නායක නඩරාජා කනගරත්නම් එසේ කියා සිටියේ, වෑවිය නොහැකි මහා සුසුමක් වාතලයට මුදා හරිමිනි.

ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ මඩකලපුව වාකරේ සිට ත්‍රිකුණාමලයේ සාම්පූර් දක්වා වූ වෙරළබඩ තීරයේ ව්‍යාප්ත මුහුදු ආදිවාසීන් ශ්‍රී ලංකාවේ වෙනමම අනන්‍යතාවකින් හෙබි සුවිශේෂ ජන කොට්ඨාසයකි. වෙනත් ජන කොට්ඨාසයන්ගේ ආක්‍රමණයන් හේතුවෙන් ඔවුන්ගේ පාරම්පරික උරුමයන් සිය භූමියේදීම ඔවුන්ට අහිමි වී යෑම අභාග්‍යකි. ආන්තික ජන කොට්ඨාසයක් සේ සැලකෙන මුහුදු ආදිවාසීන් අරබයා වෙනස් කොට සැලකීම ඔවුන් තව තවත් ආන්තීකරණයට යොමු කිරීමක් වන අතරම, එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 වන පරිච්ඡේදයේ 12 (2) අනුව "කිසිම පුරවැසියෙකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතූන් මත වෙනස්කමකට හෝ විශේෂයකට හෝ භාජනය නොවිය යුත්තේය" යන්න අභියෝගයට ලක් කරන්නකි.

## ඉංග්‍රීසි පාලන සමයේ සාක්ෂි

මූතූර් මුහුදු ආදිවාසී ගම්මානයක් වූ නල්ලූර් ගම්මානයට අයත් කුඹුරු සහ වැවත්, ඔවුන්ගේ භද්‍රකාලි අම්මාන් කෝවිලත් අද වන විට නල්ලූර් ගම්මානයට යාබද තෝපූර් ගම්වැසියන් විසින් ආක්‍රමණය කර ඇති බව මූතූර් මුහුදු ආදිවාසී නායක නඩරාජා කනගරත්නම් අප සමග කියා සිටියේ, ආදිවාසීන්ට ඒ සඳහා තිබෙන අයිතිවාසිකම් කියා පෑ හැකි බ්‍රිතාන්‍ය හා ඩී.එස්. සේනානායක යුගය කරා දිවෙන ලිපි සහතික සහිත ලිපි ගොනුවක්ද අප ඉදිරියේ දිග හරිමිනි. මුහුදු ආදිවාසීන් වෙසෙන නල්ලූර් ගම්මානයට යාබදව පිහිටි තෝපූර් ගම්මානය මුළුමනින්ම මුස්ලිම් ජාතිකයන් වෙසෙන ප්‍රදේශයකි.

මූතූර් ආදිවාසී ගම්මානයන්හි ආරම්භය ඉංග්‍රීසි පාලන කාලය දක්වා දිව යන බවත්, ඉංග්‍රීසි පාලන සමයේ නැගෙනහිර වෙරළ තීරයේ වාකරේ සිට සාම්පූර් දක්වා මුහුදු තීරයේ පදිංචි කළ ආදිවාසී පවුල් කිහිපයකින් මෙම මුහුදු ආදිවාසීන්ගේ ව්කාශය සිදු වූ බවත් මූතූර් ආදිවාසී නායක කනගරත්නම්ගේ අදහසයි.

එහිදී මූතූර් ආදිවාසී ගම්මාන කිහිපයක් වන නල්ලූර්, පාඨාලිපුරම්, නීලන්කේනි, උප්පූරාල් වැනි ගම්මානයන්හි ආදිවාසීන්ගේ කෘෂිකාර්මික කටයුතු වෙනුවෙන් වෙන් කෙරුණු උල්ලුකුලම් වැව මේ වන විට තෝපූර් ජනයා විසින්

ඔවුන්ගේ පාලනය යටතට ගැනීම සහ ඊට අයත් කුඹුරු වැඩි ප්‍රමාණයක් බලහත්කාරී හා විවිධ කූඨ උපක්‍රම ඔස්සේ තෝප්පූර් ජනතාව විසින් අත්පත් කර ගැනීම හේතුවෙන් අභිමානවත් ලෙස කල් ගෙවූ තම ජනතාව මේ වන විට හිඟමනට වැටී ඇති බවට ආදිවාසීහු චෝදනා කරති.

## කොට්ඨාස බෙදීමේ අවුල

මුහුදු ආදිවාසී ගම්මානයක් වූ නල්ලූර් සහ බහුතරයක් මුස්ලිම් ජාතිකයන් වෙසෙන තෝප්පූර් මායිමේ පිහිටි උල්ලුකුලම් වැව නව කොට්ඨාස බෙදා වෙන් කිරීම යටතේ තෝප්පූර් ප්‍රදේශයට එකතු කිරීම තම ජනවර්ගය හෑල්ලු කිරීමේ අරමුණින් සැලසුම් කරන ලද්දක් බව 'කුහේනි පලංකුඩි මක්කලින් නලංකුඩි සංගම්' හි ලේකම් මෙන්ම සංතෝෂපුරම් ආදිවාසී නායක නාගරත්නම් වර්ධන් කියා සිටී. යුද ගැටුම් සමයේ හා ඊට පෙර උල්ලුකුලම් ප්‍රදේශය ආදිවාසී ගම්මානයක් වූ නල්ලූර් ග්‍රාම නිලධාරී වසමට අයත්ව පරිපාලන කටයුතු සිදු වුවද, තෝප්පූර් වැසියන් පරිපාලන සහ දේශපාලන උපක්‍රම භාවිත කරමින් නීති විරෝධීව ස්ථාපිත කරන ලද ගම්මානයක් ඉක්බාල් නගර් ග්‍රාම නිලධාරී වසමට 2010 වසරේ සිට අන්තර්ග්‍රහණය කර ඉතාමත් සූක්ෂම ලෙස මුහුදු ආදිවාසීන් යටතේ තිබූ උල්ලුකුලම් වැව ඔවුන්ගෙන් උදුරා ගත් බව මුහුදු ආදිවාසීන්ගේ අදහසයි.

"පසු ගිය පළාත් පාලන ඡන්දෙ වෙලාවේ ග්‍රාම නිලධාරී වසම් දෙකක් එකතු කරලා තමා කොට්ඨාසයක් හැදුවේ. ඒ අනුව නල්ලූර් හා ඉක්බාල් නගර් කියන ග්‍රාම සේවා වසම් දෙක එකතු කරලා තමා මේ කොට්ඨාසය හදලා තියෙන්නේ. එහෙම වුණහම ඉක්බාල් නගර් අය අපේ නූගත්කම දුප්පත්කම ප්‍රයෝජනයට අරගෙන අපේ තියෙන වරප්‍රසාද උදුර ගන්නවා. ඒ ගම්මානවල ජනගහනය වැඩියි. අනික වෙනස් ජනවර්ගයක්. අපේ එහෙම දවසින් දවස එයාලගේ වගේ ජනගහනය වැඩි වෙන්නේ නැහැ. අපේ සමහර අය ජීවත් වෙන්නේ හිඟා කාලා. මේක අපේ ජනවර්ගය හෑල්ලු කිරීමක්. අපේ අයිතිවාසිකම් උදුරා ගැනීමක්. අපේ පාරම්පරික කෝවිල් පවා මේ අය විනාශ කරලා දාලා අපේ අයිතිවාසිකම්වල සාක්ෂි නැති කරලා දාලා තියෙනවා. දැන් මේ වැවේ වතුර ටික විතරක් නෙවෙයි, කුඹුරු ටිකත් එයාලගේ. මේ ගැන අපිට කියන්න පුළුවන් හැමෝටම දැනුම් දුන්නත්, මේ වෙනකම් කිසිම ප්‍රතිඵලයක් ලැබිලා නැහැ.." ආදිවාසී නායක වර්ධන් වැඩි දුරටත් කියා සිටී.

## උරුමයෙන් පිටමං කළ යුද්ධය

යුද ගැටුම් සමයේ නල්ලූර් ඇතුළු ආදිවාසි ගම්මාන සියල්ලේම ජනයා කොටි සංවිධානයේ නියෝග මත මිනිස් පලිහක් ලෙස යොදා ගනිමින් මඩකලපුවට පලා ගොස් තිබේ. ඔවුන් නැවත ත්‍රිකුණාමලයට පැමිණ ඇත්තේ යුද්ධය නිමා වී වසර ගණනාවක් ගතවීමෙන් පසුවයි. එසේ පැමිණියද, ඔවුන්ට සිය මුල් ගම් බිම් වෙතට යෑමට අවසරයක් නොලැබුණි. නල්ලූර් ආදිවාසීන් මෙන්ම සම්පූර් වැසියන්ටද වසර ගණනාවක් යනතුරුම කල් ගෙවීමට සිදු වූයේ, මූතූර් කිළිවෙට්ටි ස්ථාපිත කර තිබූ අවතැන්වූවන්ගේ සුභසාධක මධ්‍යස්ථානයක් තුළය. කෙසේ වෙතත්, මේ යුද ගැටුම් සමයේදී ආදිවාසී ගම්මානවලට යාබදව පිහිටි තෝප්පූර් හි වැසියන් තෝප්පූර් ප්‍රදේශය අතහැර නොගොස් තිබුණි. ඔවුන් එම කාලයේදී මහ වනයට යට වී තිබූ ආදිවාසීන්ගේ කුඹුරු සහ හේන් බිම් යන්ත්‍ර සූත්‍ර යොදා ගනිමින් මහ පරිමාණයෙන් එළිපෙහෙළි කොට කන්න කිහිපයක් වගා කටයුතු කිරීමටද කටයුතු කර තිබුණි. මේ හේතුවෙන් නල්ලූර් මෙන්ම ඊට යාබද ආදිවාසී ගම්මාන රැසක ජනතාවට වේලක් හැර වේලක් හෝ බත සැපයූ කුඹුරු අහිමි වී තිබූ අතර එහි අවසන් ප්‍රතිඵලය ආදිවාසීන් හිඟමනට වැටීම බව නල්ලූර් ආදිවාසී කනපති කදිරගාමන් තම්බි කියා සිටී.

## උරුම පොළොවේ සිඟමනට වැටීම

"අපි අවුරුදු ගාණක් කඳවුරුවල ඉඳලා එනකොට තෝප්පූර් අය කැලේට ගිහින් තිබුණු අපේ කුඹුරු ඩෝසර් දාලා සුද්ද කරලා ඒවට හොර ඔප්පුත් හදා ගෙන තිබුණා. සමහර අයට කඩෙන් ණයට බඩු දීලා ඒකට හරියන්න හොරට ලියුම්වලට අත්සන් අරගෙන ඉඩම අයිති කරගෙන. අපි අසරණ නිසා මේවට එරෙහි වෙන්න හයියක් නැහැ. අපි ඒවා අහන්න ගියහම අපිව ගහලා එලවලා දානවා. දවසින් දවස මේ තත්ත්වය වැඩි වෙලා අපිට යන එන මං නැති වෙන තත්ත්වයට වැටිලා ඉන්නේ. දැන් අපේ අයට ජීවත්වෙන්න කුඹුරු නැති හින්දා ඒ ගම්වලම හිඟා කන්න යනවා.."

සංතෝෂපුරම් ආදිවාසී නායක නාගරත්නම් වර්ධන් කියන අන්දමට සංතෝෂපුරම්හි බහුතරයක් කාන්තාවන්ගේ රැකියාව සිඟමන් යැදීමයි. ඔවුන් මුතූර්, තෝපූර්, සේරුනුවර, කින්නියා වැනි ගම්මානයන්හි සතියේ බෙදා ගත් දිනයන්හි සිඟමනේ යෙදීම සුලබ දසුනකි. තම ජනයාට අයත් කුඹුරු තෝපූර් ජනයා කූඨ ලෙස අත් කර නොගත්තා නම්, ඔවුන් සිඟමන් යදින තත්ත්වයට ඇද නොවැටෙන බව මූතූර් මුහුදු ආදිවාසී නායකයා කියා සිටී.

ඔහු පෙන්වා දෙන අන්දමට ඔවුන් සතු ඇතැම් ඉඩම්වලට බලපත්‍ර නිකුත් කර ඇත්තේ, එංගලන්තයේ මහ රැජිනගේ ආණ්ඩුවෙනි. ඩී.එස්. සේනානායකගේ ගොවිජනපද ව්‍යාපාරය යටතේද මුහුදු ආදිවාසීන් සඳහා කුඹුරු ඉඩම් ලබා දී ඇති අතර,ඒ පිළිබඳ ලියකියවිලිද ඔවුන් සතුව ඇත.

## කූඨ උපක්‍රමවල නොදැනුවත් ගොදුරු

ඒ කෙසේ වෙතත්, තෝපූර් වැසියන් විවිධ උපක්‍රම ඔස්සේ මේ වන විට ව්‍යාජ ලියකියවිලි සකස් කොට තම ඉඩම් බලහත්කාරයෙන් භුක්ති විඳින බවත්, ඒ සඳහා රජයේ නිලධාරීන්ගේ මෙන්ම දේශපාලඥයන්ගේ සහායද ලැබී ඇති බවත් ඔහු අවධාරණය කරයි. බොහෝ විට මුහුදු ආදිවාසීන් තෝපූර් හා මූතූර් ප්‍රදේශයේ වෙළඳ සැල්වලින් ලබා ගන්නා ණය මී පැණි වාරයට හෝ හේන් ගොවිතැන අවසානයේ නැවත ගෙවන බවට පොරොන්දු කර ගන්නා ලියකියවිලි අතර, හිස් කොළයකටද අත්සන හෝ ඇඟිලි සලකුණ ලබා ගැනීම සාමාන්‍ය සිදුවීමකි. පසු කලෙක එම ලිපිය අදාළ ණය මුදලේ හිලව්වට ඉඩම පැවරූ බවට පරිවර්තනය කරන බවත්, ඊට රජයේ නිලධාරීන්ගේ සහාය හිමි වන බවත් ඔහු පැවසුවේය. සහල් මිටියට කුඹුරු පවරා ගත් අවස්ථාද දැකිය හැකි බව සංතෝෂපුරම් ආදිවාසී නායක වර්ධන් කියා සිටින්නේ, තම ජනතාව වැටී ඇති ඛේදජනක තත්වයේ දිග පළල මනාව විවර කරමිනි.

"අපේ ගොඩක් අය අකුරු දන්නේ නැහැ. ඒ වගේම දුප්පත්. ඉතින් කොළේකට අත්සන් කරලා හාල් මිටියක් දුන්නහම ඒක එයාලට නිධානයක් වගේ. හැබැයි, මේ අය නිලධාරීන්ට සල්ලි දීලා අර අත්සන් කරපු කොළේ පසු කාලෙක ඉඩම් පැවරුම් ලිපියක් කරනවා.."

ආදි වාසීන්ගේ ඉඩකඩම් අත්පත් කර ගැනීමෙන් නොනැවතුණු තෝපූර් ගම්වැසියන් මුහුදු ආදි වාසීන්ගේ සංස්කෘතික හා ආගමික උරුමයන් පවා ආක්‍රමණය කිරීමට හා විනාශ කිරීමට පෙළඹී සිටින බව මාර්කන්ඩු වේලායුදන් පවසයි. මුහුදු ආදිවාසීන්ගේ ගෞරවාදරයට ලක්වූ උල්ලුකුලම් වැව පාමුල පිහිටි භද්‍රකාලි අම්මාන් කෝවිල කිසියම් පිරිසක් විසින් විනාශ කර දමා ඇති අතර, ඒ ආසන්නයේ පිහිටි ආදිවාසීන්ට අයත් ළිඳ පවා විනාශ කර දැමීමට මෙම පිරිස් කටයුතු කර ඇත.

## ඉඩම් කොල්ලයට රාජ්‍ය නිලධාරීන්ගේත් සහාය

මුහුදු ආදිවාසීන් සතු බලපත්‍ර සහිත හා කාලාන්තරයක් පුරා ඔවුන් භුක්ති විඳින ඉඩම් සඳහා තෝපූර් ප්‍රදේශයේ ඇතැම් පුද්ගලයන් ව්‍යාජ ඔප්පු සකස් කිරීම කාලාන්තරයක් පුරා සිදු වනුයේ, රජයේ නිලධාරීන්ගේද සහායෙන් බව නල්ලූර් ආදිවාසීන් පෙන්වා දෙයි. තමන්ට ප්‍රයෝජනවත් බව හැඟෙන ආර්ථික වටිනාකමක් සහිත ඉඩම් ඔවුනට හිතෛෂී මිනින්දෝරුවකු යොදා ගනිමින් මැනීම් කොට, එම ඉඩම් සම්බන්ධයෙන් ව්‍යාජ ඉතිහාස කථාවක් ගෙතීම මූලික පියවරයි. ඉන් අනතුරුව මෙවැනි කටයුතුවලට ප්‍රකට නීතිඥවරු ලවා ව්‍යාජ ලියකියවිලි සකස් කර, මෙම කටයුතුවලට සම්බන්ධ ඔවුන්ගේම අය සාක්ෂියට යොදා ගනිමින් අත්සන් කර අදාළ රාජ්‍ය ආයතනයේ ඔවුන්ගේම නිලධාරියෙකුට භාරදීම සිදු කරයි. මේ කිසිවක් ඉඩමේ සැබෑ හිමිකරු නොදන්නා බැවින් මෙම ලියකියවිලි සම්බන්ධයෙන් විරෝධතාවක් පැන නොනගින අතර ඉහළ නිලධාරීන්ගේ අනුමැතිය පවා ඊට හිමි වීම සිදු වේ.

පසු කලෙක මෙම ඉඩම් සම්බන්ධයෙන් ගැටලු මතු වූ විට එම ප්‍රදේශයේ පදිංචි සියලු දෙනාම එක හඬින් මෙම ඉඩම් සිය මුතුන් මිත්තන්ට ඉංග්‍රීසි පාලන සමයේ ලබා දුන් ඉඩකඩම් බව පවසමින් ඉහළ නිලධාරීන් ඉදිරියේ ව්‍යාජ ඉතිහාස කථා දිගහරිමින් නිලධාරීන් නොමග යැවීම සිදු කරන අතර අවසානයේ නූගත් ආදිවාසී සැබෑ ඉඩම් හිමිකරු නිලධාරීන් ඉදිරියේ හෑල්ලුවට ලක් වීම සුලබ තත්ත්වයකි.

"අකුරුවත් දන්නැති වැද්දන්ට කොහෙන්ද ඔප්පු. මේවා අපේ සීයලාට සුද්දෝ දීපු ඉඩම් කියලා අපිව ලැජ්ජාවට පත් කරනවා." එසේ කියන්නේ, නල්ලූර් හි විජේකාන්ත් ය.

## තෝප්පූර් ආඛ්‍යානය

උල්ලුකුලම් ගොවි සංවිධානයේ සභාපති ඒ.එස්.එම්. ජමීන් කියන්නේ ඊට හාත්පසින්ම වෙනස් කතාවකි. ඔහු පවසන පරිදි උල්ලුකුලම් වැව යටතේ කුඹුරු අක්කර 550ක් අස්වද්දන අතර, ඒ සියල්ල තෝප්පූර් වැසියන්ගේ ඉඩම්ය. එහෙත්, පසුගිය යුද ගැටුම් සමයේ කොටි සංවිධානය මුස්ලිම් ජාතිකයන් එම ප්‍රදේශයෙන් පලවා හැරීමෙන් පසු නල්ලූර් ආදිවාසී ජනයා කොටි සංවිධානයේද සහායෙන් මෙම කුඹුරු අස්වද්දා තිබුණු බව ඔහු කියයි.

"අපිව උල්ලුකුලම්, නල්ලූර්, උප්පූරාල්, ලංකා පටුන කියන දිහාවලින් 1985 එලෙව්වට පස්සේ අපිට ආපහු එහාට යන්න ලැබුණේ, 2009 අවුරුද්දේ. එතකොට අවුරුදු 25කට ආසන්න කාලයක් මෙයාලා මේ කුඹුරු කරලා තියෙනවා. හැබැයි, ඒවා අපේ සීයලාගේ තාත්තලාගේ ඉඩම්. මේ ඔක්කොම කරන්නේ, ආදිවාසි දෙතුන් දෙනෙක් විතරයි. මේවා ඔක්කොම පට්ටපල් බොරු කියලා අපි දැනටමත් ඔප්පු කරලා ඉවරයි."

ජමීන් කියන අන්දමට යුධ ගැටුම් නිමා වීමෙන් පසු මෙම ඉඩම් තෝප්පූර් වැසියන්ට නැවත පදිංචි කිරීම් යටතේ ලබා දී ඇත්තේ, එවකට මුතූර් ප්‍රාදේශීය ලේකම් ලෙස කටයුතු කල සෙල්වනායගම් නැමැති අයෙකි. එවකට නොදැක්වූ අයිතිවාසිකම් හිටි හැටියේ දැක්වීම පිටුපස තරමක් උගත්, ආදිවාසී ගම්මානයට මෑතකදී පැමිණි අය කිහිප දෙනෙකු සිටින බවත්, ආදිවාසීන්ගේ බහුතරය අහිංසකයන් බවත් හෙතෙම කියා සිටී.

නල්ලූර් ආදිවාසීන් තෝප්පූර් වැසියන්ට එරෙහිව සිදු කරන චෝදනා සම්බන්දයෙන් අප තෝප්පූර් තාහිබ් නගර් ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම්, මුතූර් හදිසි මරණ පරීක්ෂක අහමදු ජලාල්දීන් මොහොමදු නූරුල්ලා ගෙන් කළ විමසීමේදී ඔහු කියා සිටියේ, නල්ලූර් ආදිවාසීන් කරන මෙම චෝදනාව පදනම් විරහිත බවයි. එසේම ඔවුන් දැනට පදිංචිව සිටින ඉඩම් පවා මුල් කාලයේ තෝප්පූර් වැසියන්ට අයත් තමන්ගේ පාරම්පරික ඉඩකඩම් බවයි.

'මේ ඉඩම් ආදිවාසීන්ගේ නෙවෙයි අපේ'

"ඒ කාලේ අපේ සීයලා ආච්චිලා පදිංචි වෙලා හිටියේ නල්ලූර්වල. අපිව 1985 දි කොටි ඒ ගම්වලින් එලවලා දැම්මට පස්සේ අපි තෝප්පූර් පදිංචියට ආවා. හැබැයි, යුද්දේ ඉවර වෙලා 2009 නැවත පදිංචි කිරීම් කරද්දී අපේ ඔප්පු බලපත්‍ර පරීක්ෂා කරපු එතකොට මුතූර් හිටපු ප්‍රාදේශීය ලේකම් සෙල්වනායගම් මහත්තයා අපේ ඉඩකඩම් නිදහස් කළා. ඒ විතරක් නෙවෙයි, අපිට පසුව දෙන පොරොන්දු මත අපේ ඉඩම් සුනාමි ගෙවල් හදන්න ආදිවාසීන්ට පර්චස් දහය ගානේ ලබා දුන්නා. එයාලා ඒ කාලේ හිටියේ, මුහුද අයිනේ ඉඩම්වල. දැන් බොරු කතා ගොතලා ජනාධිපතිතුමාට ලිපි යවලා අපිව අපහසුතාවයට පත් කරනවා. අපි රජයට බල කරලා කියන්නේ, මේ සම්බන්ධයෙන් සාධාරණ පරීක්ෂණයක් කරන්න කියලයි..."

තෝප්පූර් වැසියන්ගෙන් මෙන්ම රජයේ නිලධාරීන්ගෙන් තම ජනතාවට සිදු වන අකටයුතුකම් සම්බන්දයෙන් 'කුවේනි ආදිවාසි ජන සුබ සාධක සංගමය' විසින් නැගෙනහිර ආණ්ඩුකාරවරියට, ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම්වරයාට හා මූතූර් ප්‍රාදේශීය ලේකම්වරයාට ලිඛිතව පැමිණිලි කර ඇතත්, ඊට මෙතෙක් කිසිදු සාධනීය පියවරක් ගෙන නොමැති බව ඔවුහු කියා සිටිති.

## කොමිසමට මඟහැරුණු අවනඩුව

කෙසේ වෙතත්, අප රටේ ආදිතම ජන කොට්ඨාශයක් වූ මුහුදු ආදිවාසීන්ට සිදුව ඇති බව කියන මෙම අසාධාරණය සම්බන්ධයෙන් අදහස් දැක්වූ නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම් තුසිත පී. වනිගසිංහ කියා සිටියේ, මෙවැනි අසාධාරණයට ලක් වූ පිරිස් වෙනුවෙන් නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරිය විසින් සියලු පාර්ශවයන්ගේ නියෝජනයෙන් කොමිසමක්ද පත් කළ බවයි. කෙසේ නමුත්, මෙම ආදිවාසීන්ගේ ගැටලු ඊට යොමු නොවීම කනගාටුවට කාරණයක් බව ප්‍රධාන ලේකම්වරයා කියා සිටියේය.

"මේ කොමිසම අපි පත් කරලා ජංගම සේවයක් පවා ක්‍රියාත්මක කළා. නමුත්, ඔය කියන ගැටලුව මේකට යොමු වෙලා තිබුණේ නැහැ. ඇත්තටම මේක හරිම සංවේදි කාරණයක්. අපි මේ කොමිසමේ කාලය ඉකුත් වී තිබුණත්, වෙනත් ක්‍රමවේදයක් ඔස්සේ හෝ එයට විසඳුම් ලබාදීමට කටයුතු කරන්න සූදානම්."

## විශේෂ වැඩසහනක් ක්‍රියාත්මකයි

නල්ලූර් ආදිවාසීන් මේ වන විට මුහුණ දී තිබෙන මෙම ගැටලුව සම්බන්ධයෙන් අප ත්‍රිකුණාමලය අතිරේක දිසාපති අරුල් රාජ් ගෙන් කළ විමසීමේදී කියා සිටියේ, මේ වන විටත් මුහුදු ආදිවාසීන් ගැටලුව සම්බන්ධයෙන් සොයා බැලීමට විශේෂ වැඩ සටහනක් ක්‍රියාත්මක කර ඇති බවයි. අතිරේක දිසාපති (ඉඩම්) පී.ආර්.ජයරත්න ගේ මූලිකත්වයෙන් පත් කළ කමිටුවක් හරහා මෙම කටයුත්ත මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින බව වැඩි දුරටත් කියා සිටියේය.

ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියෙකුටම විශ්වීය වශයෙන් පිළිගත් මානව අයිතිවාසිකම් තිබෙන අතරම එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් මගින් තහවුරු කර ඇති තත්වයක මුහුදු ආදිවාසීන්ට වෙනස් කොට සැලකීම, ජීවත්වීමේ අයිතිය අහිමි කිරීම බරපතළ තත්වයක් බව නීතිඥ විරංජන හේරත් පෙන්වා දෙයි. ඔවුන්ගේ පරම්පරාවෙන් හිමි වූ උරුමයන් ආරක්ෂා කරදෙමින් ඔවුන්ද ශ්‍රී ලංකාවේ පුරවැසියන් සේ සලකා වෙනස් නොකොට සැලකීම සම්බන්ධයෙන් රජය වග විය යුතු බවද ඔහු වැඩි දුරටත් අවධාරණය කර සිටී.

අප රටේ සුවිශේෂී ජන කොට්ඨාසයක් සේ සැලකෙන මුහුදු ආදිවාසීන් වර්තමානයේ මුහුණ දී ඇති ඛේදනීය තත්වය සම්බන්ධයෙන් ගත හැකි පියවර කවරේදැයි ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ත්‍රිකුණාමලය ප්‍රාදේශීය සම්බන්ධීකරණ නිලධාරී ඒ.එල්. ඉෂදීන් ගෙන් කළ විමසීමකදී මෙසේ ප්‍රකාශ කළේය.

"මේ සම්බන්ධයෙන් පසුගිය සතියේ රාජ්‍ය නොවන සංවිධානයක් විසින් මා වෙත කරුණු ඉදිරිපත් කළා. අපි අනිවාර්යයෙන්ම මේ සම්බන්ධයෙන් කරුණු සොයා බැලීමට හා මුහුදු ආදිවාසීන් මුහුණ දී සිටින ගැටලුවලට විසඳුම් ලබාදීමට කටයුතු කරන බව කියන්න ඕනේ. මොකද ඔවුන් අප රටේ ඉතාමත් වැදගත් ජන කොට්ඨාසයක් බව අපි හැමෝම දන්නවා. යම් පිරිසක් ඔවුන්ට වෙනස් කොට සලකන්නේ නම්, ඔවුන්ගේ මිනිස් අයිතිවාසිකම් කඩ කරනවා නම්, ඔවුන් මේ සම්බන්ධයෙන් පැමිණිලි නොකළත්, ඊට මැදිහත්වීමට බැඳී සිටිනවා. අපි ලබන සතියේදී පමණ අනිවාර්යෙන්ම මේ සම්බන්දයෙන් විමර්ශනයක් ආරම්භ කරනවා."

■ **මංගලනාත් ලියනආරච්චි**

හම්බන්තොට අලි කළමනාකරණ රක්ෂිතයේ අනවසර ක්‍රියාකාරකම් වැළැක්වීම:

# අධිකරණයෙන් ඉටු කළ යුක්තියට අභියෝග කරන ඇමති බලය!

හම්බන්තොට, මොණරාගල පරිපාලන දිස්ත්‍රික්කවලට මායිම්ව පිහිටි හම්බන්තොට, සූරියවැව, ලුණුගම්වෙහෙර, තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අයත් හෙක්ටයාර් 23,746.55ක් හම්බන්තොට වන අලි කළමනාකරණ රක්ෂිතයට අයත් ය. 2021 අප්‍රේල් 09 දිනැති අංක 2222/62 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් මේ රක්ෂිතය ස්ථාපිත කෙරිණි. එය වන අලි ගැටලුවෙන් පීඩා විඳින ප්‍රදේශවාසී ජනතාවගේ වසර 10කට වැඩි දීර්ඝ අරගලයක ජයග්‍රාහී සන්ධිස්ථානයකි.

එහෙත් රක්ෂිතය තුළ පවත්වාගෙන යන නීතිවිරෝධී ව්‍යාපාර සහ අනවසර වගා ඉවත් කිරීමට මෙතෙක් කටයුතු කර නැත. හම්බන්තොට මහේස්ත්‍රාත් අධිකරණයෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට නියෝග කර ඇත්තේ එවැනි මහා පරිමාණ අනවසර වගාකරුවන් 19 දෙනෙකු වහාම ඉවත් කරන ලෙසයි. එම තීන්දුව ක්‍රියාත්මක කිරීමට මෙතෙක් මහවැලි අධිකාරිය සමත් වී නැත. ඒ පිළිබඳව විමසීමට අප එම අධිකාරියේ වලව කලාපය භාර නේවාසික කළමනාකාරවරයා ඇතුළු නිලධාරීන් සම්බන්ධ කර ගැනීමට උත්සාහ කළද, ඔවුන් කිසිවකු මේ පිළිබඳ අදහස් දැක්වීමට ඉදිරිපත් වූයේ නැත. අදාළ විෂය භාර රාජ්‍ය ඇමැති සිරිපාල ගම්ලත්ගෙන් අදාළ ගැටලුව පිළිබඳව විමසීමේදී ඔහු ප්‍රකාශ කළේ, නියෝගය ක්‍රියාත්මක කිරීමේ පමාවක් පවතින බව තමන්ද පිළිගන්නා බවයි. අනවසර වගාකරුවන් විෂය භාර ඇමතිවරයාගේ ඡන්දදායකයන් වීම, අධිකරණ නියෝගය ක්‍රියාත්මක කිරීම පමා වීමට හේතුව බවත්, හැම කෙනෙක්ම එය වටහාගත යුතු බවත් රාජ්‍ය ඇමතිවරයා ප්‍රකාශ කළේය.

**සාමූහික අරගලය**

තමන්ගේ වගා දිගින්-දිගටම විනාශ වීමත්, ජීවිත තර්ජන වැඩි වීමත් හේතුවෙන් ලිඛිතව කරන ලද සියලු ඉල්ලීම් නොසලකා හැරීම නිසා, 2021 ජනවාරි 18 දා සූරියවැව සහ ඒ අවට ගොවි සංවිධාන 84ක් ඒකාබද්ධව දැවැන්ත සත්‍යග්‍රහයක් ආරම්භ කරන ලදි. සූරියවැව, වල්සපුගල වැව්කණ්ඩිය මත දී මේ සත්‍යග්‍රහය ආරම්භ කරන ලද අතර, ඔවුන්ගේ එකම ඉල්ලීම වූයේ කඩිනමින් හම්බන්තොට අලි කළමනාකරණ රක්ෂිතය ගැසට් කිරීම ය. ආණ්ඩුවේ ප්‍රධානීන් දෙදෙනා වන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂගේත්, අගමැති මහින්ද රාජපක්ෂගේත්, මේ රක්ෂිතයට අයත් වැඩිම භූමි ප්‍රමාණයක අයිතිය ඇති මහවැලි අධිකාරිය අයත් කැබිනට් ඇමැති චමල් රාජපක්ෂගේත් උපන් බිමේ ආරම්භ කළ මේ දැවැන්ත සත්‍යග්‍රහය උද්ඝෝෂකයින්ට බරපතළ තර්ජනයක් බව පෙනෙන්නට තිබිණි.

මුලදී මීට අදාළ කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කෙරුණේ මාසයක් තුළ අදාළ ගැසට් නිවේදනය ඉදිරිපත් කිරීමේ පොරොන්දුව මතය. එහෙත් ඒ මොහොතේ සිටම මේ සිදුවෙමින් පවතින දේ පිළිබඳ වලව දකුණු ඉවුර ගොවි සංවිධානයේ සභාපති එච්. සරත් ඇතුළු පිරිස අවබෝධයෙන් සිටියහ.

"මුලින්ම චමල් ඇමැතිතුමා කිව්වෙ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරපු හින්දා කලබල වෙන්න එපා කියලා. අපිට එහෙම කිව්වට ඇමැතිතුමාගෙ ගෝලයො කැලෑ කපන එක නැවැත්තුවෙ නෑ. ගැසට් කරන එක ෂුවර් නම් තවදුරටත් සල්ලි, කාලය ඔක්කොම වියදම් කරගෙන මේ කැලෑ කපන්නෙ, වගා කරන්නෙ ඇයි කියලා අපි ඇහුවම, උත්තර නෑ. නීතිය ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් මේ අනවසරකරුවන්ට යම් වාචික පොරොන්දුවක් ලබා දී ඇති බව පැහැදිලියි."

දැන් ගැසට් නිවේදනය නිකුත් කර තිබේ. එහෙත් තවමත් යෝජිත වන අලි කළමනාකරණ රක්ෂිත භූමියෙන් විශාල කොටසක කෙසෙල්, අඹ වැනි වානිජ වගා පවත්වාගෙන යන අතර, ඒවා පවත්වාගෙන යනු ලබන්නේ ප්‍රදේශයේ ගොවීන් නොවේ. පිටස්තර ප්‍රදේශවලින් පැමිණි පිරිස් අක්කර 50, 100 සහ 150 වැනි කොටස්වල විදුලි වැටවල් යොදා මේ වගාවන් පවත්වාගෙන යන අතර, එම ප්‍රදේශයේ ගල් වළවල් 13ක් ද පවත්වාගෙන යනු ලබයි. මේ වනවිට මේ යෝජිත රක්ෂිත භූමියේ පමණක් ගල්වළවල් 36ක් සඳහා මහවැලි අධිකාරියෙන් අනුමැතිය ලබා දී ඇති බව වලව ඒකාබද්ධ ගොවි සංවිධානය ප්‍රකාශ කරයි.

## උපක්‍රම සහ ජයග්‍රහණ

වල්සපුගල වැව් කණ්ඩිය මතදී ගොවීන් ආරම්භ කළ සත්‍යග්‍රහය නතර කිරීමට මුලදී හිතවත්කම් භාවිත කෙරිණි. සූරියවැව ඒකාබද්ධ ගොවි සංවිධානයේ සභාපති මහින්ද සමරවික්‍රම ඒ පිළිබඳව මෙසේ පවසයි.

"මම අවුරුදු ගාණක් වැඩ කළේ චමල් රාජපක්ෂ ඇමැතිතුමාලා දිනවන්න තමයි. ඒ හිතවත්කම්වලින් මේක නවත්තන්න හැදුවා. මම කිව්වා, මේක මගෙ තනි වැඩක් නෙමෙයි, ගොවි සංවිධාන 84ක තීරණයක් කියලා. ඊට පස්සෙ තර්ජන ආවා. ගොවියො එකමුතුව හිටපු හින්දා ඒවටත් අපි සාර්ථකව මුහුණ දුන්නා."

විශාල පිරිසකගේ අවධානයට ලක් වන පරිදි කොළඹ - කතරගම ප්‍රධාන මාර්ගය ඉදිරිපිටට නොපැමිණ ඔවුන්ගේ සත්‍යග්‍රහ සහ මාරාන්තික උපවාසය පැවැත්වුණේ සූරියවැව ය. මේ වන විටත් වල්සපුගල මූලික කරගෙන සත්‍යග්‍රහය පැවැත්වෙයි. මේ ගැන විමසූ විට, මහින්ද සමරවික්‍රම මෙසේ පිළිතුරු දුන්නේය.

"ඒක අපි උපක්රමයක් විදිහට කරපු වැඩක්. ප්‍රධාන පාරට ආව නම් මීට වඩා මේ ගැන මිනිස්සු කතා කරයි. ඒත් අපිට ආරක්ෂාව ගැන ප්‍රශ්න මතුවෙන්න පුළුවන්. මේ අපේ ගම. මෙතැන්ට එන්නෙ කවුද, යන්නෙ කවුද ඔක්කොම ගැන අපි දන්නවා. ඒ හින්දම තමයි ගොවියො බයකරන්න මේගොල්ලොන්ට බැරි වුණේ."

මේ අතර ගොවීන්ගේ මාරාන්තික උපවාසය අතරතුර, සූරියවැවේදී දැවැන්ත උද්ඝෝෂණයක් පැවැත්වීමටද සැලසුම් කෙරිණි. උද්ඝෝෂණය පිළිබඳ වාර්තාවීමත් සමග සූරියවැව පොලිසිය මහජන පීඩාව හේතුව ලෙස දක්වමින් සූරියවැව මහේස්ත්‍රාත් අධිකරණයෙන් තහනම් නියෝගයක් ලබාගැනීමට කටයුතු කළේය.

"අපිට මේ ගැන ඉවක් තිබුණා. ගමේ අයත් ඔය හැමතැනම ඉන්නවනෙ. අපි සූරියවැවේ වැඩේ ගැන ප්රචාරය කරන ගමන්, අම්බලන්තොට වෙනත් තැනක වැඩේ කරන්න සැලසුම් කළේ ඒකයි."

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරු කර ඇති මූලික අයිතිවාසිකමක් වන භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස නීතිය ක්රියාත්මක කරන ආයතනය වන පොලිසිය යොදාගනිමින් උල්ලංඝනය කිරීමට දේශපාලනඥයන් දරන ලද උත්සාහය, ගොවීන් විසින් උපක්රමශීලීව එසේ පරාජයට පත්කරනු ලැබිණි.

## ව්‍යාජ ලිපි සහ නිවේදන!

එසේම තමන් සතු ජනමාධ්‍ය බලය සහ රජයේ නිලධාරීන්ට බලපෑම් කිරීමේ හැකියාව යොදාගනිමින් ගොවි සංවිධාන අතර පවතින සාමූහිකත්වය නැති කිරීමේ උත්සාහයක් ද ක්‍රියාත්මක විය. වරක් හම්බන්තොට දිස්ත්‍රික් ලේකම්වරයා විසින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (මෙහෙයුම්) එම්.එස්.එල්.ආර්.පී. මාරසිංහ විසින් එවන ලද ලිපියක් ගොවීන්ට ඉදිරිපත් කරන ලද අතර, එහි සඳහන් වූයේ අදාළ රක්ෂිත ගැසට් නිවේදනය නිකුත් කිරීම සඳහා කඩිනම් පියවර ගෙන ඇති බවයි. එහෙත් ඒ වන විට ඊට අදාළ කිසිදු පියවරක් ගෙන තිබුණේ නැත.

මේ ලිපිය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද්දක් බවත්, එමගින් අදාළ ගැසට් නිවේදනය නිකුත් කිරීමට අදාළ පොරොන්දුවක් ලබාදී ඇති බවත් මාධ්‍ය මගින් නිකුත් කරන කෙටි ප්‍රවෘත්ති (*News Alert SMS*) මගින් ප්‍රචාරය කෙරිණි. එහෙත් එය මුළුමනින්ම අසත්‍යයක් බව පසුව තහවුරු වූ අතර, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් චන්දන සූරියබණ්ඩාර විසින් ලියුම්කරුට ඒ බව තහවුරු කළේය.

"මට මේ විදිහට පොරොන්දු දීමේ හෝ ප්‍රතිපත්ති තීරණ සම්බන්ධයෙන් කතාකිරීමේ කිසිම බලයක් නෑ."

අධ්‍යක්ෂ ජනරාල්වරයා ඒ සම්බන්ධයෙන් අදහස් දක්වමින් එසේ පැවසීය. මේ ආකාරයට ජනතාව නොමග යැවීම පිළිබඳව විමසීමේදී එවකට වනජීවී විෂය අයත් කැබිනට් අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස කටයුතු කළ සෝමරත්න විදානපතිරණ පැවසුවේ එවැන්නක් පිළිබඳව තමන් නොදන්නා බවත්, එවැනි ලිපියක් පිළිබඳ ජනමාධ්‍ය මගින් ප්‍රචාරය කිරීම අනුමත කළ නොහැක්කක් බවත්ය.

## මානව හිමිකම් කොමිසමේ මැදිහත්වීම

දිගින් දිගටම මානව හිමිකම් උල්ලංඝනය කරමින් සූරියවැව ජනතාවට නීතිය ඉදිරියේ සමාන ලෙස සැලකුම් ලැබීමේ අයිතිය අහිමි කිරීමටත්, ඒ සඳහා රක්ෂිතය ගැසට් කිරීම ප්‍රමාද කිරීම මෙන්ම රක්ෂිතය තුළ අනවසර ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කිරීමටත් එරෙහිව ශ්‍රී ලංකා තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය විසින් මානව හිමිකම් කොමිසමට පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලදි. එම පැමිණිල්ලට අනුව කොමිෂන් සභාව මගින් රජයේ ආයතන අටකට නියෝග කරන ලද්දේ වහාම මීට අදාළ කරුණු දැක්වීම් කරන ලෙසයි. ඒ අනුව පසුගිය පෙබරවාරි මාසයේදී අදාළ ආයතන මගින් කරුණු දැක්වීම් කිහිපයක් ඉදිරිපත් කරන ලදි. එහිදී පැමිණිලි පාර්ශ්වය මගින් අවධාරණය කරන ලද්දේ කොමිසමේ නිලධාරීන්ට අදාළ භූමිය නිරීක්ෂණය කළ හැකි නම්, එය වඩාත් වැදගත් වන බවයි.

මෙම පැමිණිල්ල ඉදිරිපත් කිරීම මෙන්ම ඒ සම්බන්ධයෙන් කොමිසම ක්‍රියාත්මක වීම කරුණු කිහිපයක් අනුව වැදගත් සංධිස්ථානයකි. පැමිණිල්ල ඉදිරිපත් කරන්නේ අසාධාරණයට ලක් වූ ගොවි ජනතාව නොව, ශ්‍රී ලංකා තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමයයි. හුදු ගැටලු වාර්තාකරණයෙන් ඔබ්බට යමින් විසඳුම් ලබාගැනීම සඳහා මැදිහත් වීමේ හා ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ශක්තිමත් කිරීමේ මාධ්‍ය භූමිකාව එමගින් නියෝජනය වීම එක් කරුණකි. එමෙන්ම, යම් මානව හිමිකම් කඩ වීමක් සම්බන්ධයෙන් පැමිණිලි කිරීමේ හැකියාව වින්දිතයාට පමණක් නොව ඒ පිළිබඳව සංවේදී වන තුන්වන පාර්ශ්වයකටද ඇති බව එමගින් අවධාරණය කෙරේ. ජන සමූහකට බලපාන පොදු ගැටලුවක් සම්බන්ධයෙන් මානව හිමිකම් පිළිබඳ මානයෙන් බැලීමත්, ඒ සඳහා පවතින යාන්ත්‍රණයක් උරගා බැලීමත් මෙමගින් සිදුවන අතර, කොමිසම මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම සාධනීය ප්‍රතිඵලයකි.

සූරියවැව ජනතාවගේ නොබිඳිය හැකි සාමූහිකත්වය හේතුවෙන් මෙම අලි කළමනාකරණ රක්ෂිත ගැටලුව රට පුරා ජනතාවට දැනෙන ප්‍රශ්නයක් බවට පත්වී අවසන් ය. ඒ වෙනුවෙන් ජනමාධ්‍ය, සිවිල් සංවිධාන මෙන්ම නීතිඥයන්, මානව හිමිකම් ක්‍රියාකාරීන් මැදිහත් විය. ඔවුහු අවධානයෙන් සිටිති. මේ වන විට ගොවි සංවිධාන නියෝජිතයන්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් සහ ගුවන් හමුදාව එක්ව අලින් රක්ෂිතය තුළට කොටුකිරීමේ කටයුතු සිදුකෙරමින් තිබේ.

## ගැටලුව අවසන් නැත!

කෙසේ වෙතත් මෙසේ අලින් රක්ෂිතය තුළ කොටු කිරීමෙන් ප්‍රශ්නය විසඳෙන්නේ ද යන්න සම්බන්ධයෙන් අප කළ විමසීමකදී පරිසරවේදී, ආචාර්ය රවීන්ද්‍ර කාරියවසම් පැවසුවේ කිසිවක් නොමැතිව සිටි ජනතාවට, මෙය වැදගත් වුවද, මෙමගින් ගැටලුව විසඳීමක් සිදු නොවන බවයි. කොටු වන අලින්ට ආහාර හිඟ වීම, ඔවුන්ගේ සංචරණයට අනවසර වගා සහ ව්‍යාපෘති නිසා බාධා ඇති වීම වැනි හේතු නිසා නැවත වටයකින් අලින් ගම්වැදීම ආරම්භ වනු ඇති බවයි. එම නිසා දැනට විවිධ ව්‍යාපෘති මගින් අහුරා ඇති අලිමංකඩ අලින්ට විවෘත කිරීම, ආරම්භක පියවරක් ලෙස අනිවාර්යෙන් ම කළ යුතුව ඇතැයි ද ආචාර්යවරයා සඳහන් කළේ ය.

සියලු ආකාරයේ අත්තනෝමතික බලය යෙදවීම් පරාජයට පත්කරන්නට සාමූහිකත්වයට හැකි බව සූරියවැව ගොවීහු දිගින්-දිගටම ඔප්පු කළහ. තවදුරටත් ඔවුන් අතර බෙදීම් ඇති කිරීමේ දේශපාලනඥයන්ගේ උත්සාහය අත්හැර දමා නැත. අධිකරණ තීන්දු පවා ක්‍රියාත්මක නොකරමින් ඔවුහු සිය බලපරාක්‍රමය විහිදුවමින් සිටිති. එහෙත් ජයග්‍රහණය ඇත්තේ ගොවීන්ගේ පැත්තේ ය.

## නියෝගය එක් වරම ක්‍රියාත්මක කරන්න බැහැ

මහවැලි විෂය භාර රාජ්‍ය ඇමැති සිරිපාල ගම්ලත්

හම්බන්තොට වන අලි කළමනාකරණ රක්ෂිතය තුළ සිටින මහා පරිමාණ අනවසර වගාකරුවන් ඉවත් කරන ලෙස අධිකරණයෙන් මහවැලි අධිකාරියට ලබා දී ඇති නියෝගය ක්‍රියාත්මක නොකරන්නේ ඇයි?

ක්‍රියාත්මක නොකරනවා කියල කියන්න බැහැ. නියෝගය අනුව ක්‍රියාත්මක කිරීම සඳහා යම් කාලයක් ගැනීමට සිදු වෙනවා.

ඒ කියන්නෙ දේශපාලන බලපෑම් නිසා තීන්දුව ක්‍රියාත්මක කරන්න බෑ...?

යම් ප්‍රමාදයක් තියෙනවා.

ඒක අධිකරණයට කරන අපහාසයක් කියලත් කෙනෙකුට තර්ක කරන්න පුළුවන්...?

එහෙම දෙයක් නෑ. මෙතැන තියෙන්නෙ විශේෂ තත්ත්වයක් නෙ. මහවැලි විෂය භාර කැබිනට් ඇමැතිතුමාගෙ ප්‍රදේශය. එතුමාගෙ ඡන්දදායකයන් ඉන්නෙ. ඒක හින්දා මහවැලි අධිකාරියෙ නිලධාරීන්ට වුණත් එක පාර ගිහින් ගිනි තියලා, කඩලා-බිඳලා ඒ මිනිස්සුන්ව අයින් කරන්න බෑ.

ඒ කියන්නෙ නීතිය සමානව ක්‍රියාත්මක වීමේ ගැටලුවක් තියෙනවා. ඒක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනියි...?

ඇමැති - මෙතැන තියෙන්නෙ ප්‍රමාදයක්. ඒ ප්‍රමාදයට ඇත්ත හේතුව මම කිව්වෙ. ඒකෙන් කියවෙන්නෙ නෑ වැඩේ කෙරෙන්නෙ නෑ කියලා.

භාර කැබිනට් ඇමැති චමල් රාජපක්ෂ දිගින්-දිගටම දුරකතනයට ප්‍රතිචාර දක්වන්නෙ නෑ. එම නිසා මේ ප්‍රශ්නයට ඔබෙන් නිශ්චිත පිළිතුරක් අවශ්‍යයි...

ඇමැති ගම්ලත් - මට කියන්න තියෙන්නෙ ඔච්චරයි. මට තේරෙනවා මෙතැන ප්‍රශ්නයක් තියෙනවා කියලා. ඒත් අපිට ඒක එකපාර විසඳන්න බැරි ප්‍රශ්නෙත් හැමෝටම තේරෙන්න ඕනෙ.

■ **ශාලික විමලසේන**

# මන්නාරම දෙමළ ජනයාගේ භාෂා අයිතිය උල්ලංඝනය වීම

දිස්ත්‍රික්කයක තිබෙන පරිපාලන ව්‍යුහය කාර්යක්ෂමව ක්‍රියාත්මක විය යුතු අතර පරිපාලනමය වශයෙන් ජනතාව මුහුණ දෙන ගැටලුවලට පහසුවෙන් විසඳුම් ලබා ගත හැකි විය යුතුය යන්න අප සියලු දෙනාගේ අපේක්ෂාවයි.

ශ්‍රී ලංකාවේ පවතින භාෂා ප්‍රතිපත්තිය සහ භාෂා අයිතීන් ප්‍රකාරව ජනතාවට තමතමන්ගේ අවශ්‍යතා හා සේවාවන් තමතන්ගේ මව් භාෂාවෙන් ඉටු කර ගැනීමට සම්පූර්ණ අයිතියක් තිබේ. එහෙත් එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක වනවා දැයි සොයා බලද්දී එය එසේ සිදු නොවන බව පැහැදිලිව පෙනෙන්නට තිබෙන සත්‍යයකි.

මන්නාරම දිස්ත්‍රික්කයේ භාෂා අයිතිය ක්‍රියාත්මක වීම පිළිබඳව කළ සොයා බැලීමකදී එම දිස්ත්‍රික්කයේ පිහිටි බොහෝ රාජ්‍ය ආයතනවලදී මහජනතාවගේ භාෂා අයිතිය උල්ලංඝනය වීම සිදු වන බව හෙළි විය.

## ඉඩම් හා පුරාවිද්‍යාව

විශේෂයෙන් ඉඩම් සම්බන්ධ හා ඉඩම්වල හිමිකම් සම්බන්ධ බොහෝ ආයතනවල උසස් නිලධාරීන් සිංහල භාෂාවෙන් කටයුතු කරන අය වන අතර එලෙස ඔවුන්ගේ දෙමළ භාෂා හැකියාව ඉතා පහළ මට්ටමක පැවතීම හේතුවෙන් සේවාවන් ලබා ගැනීමට පැමිණෙන දෙමළ කතා කරන ජනතාවට දුෂ්කර තත්ත්වයකට මුහුණ පෑමට සිදු වේ.

සාමාන්‍ය මහජනතාව උසස් නිලධාරීන් වෙත තමන්ගේ නොවිසඳන ලද ගැටලු ඉදිරිපත් කිරීමට හෝ තමන්ගේ අවශ්‍යතා හා ඉල්ලීම් පිළිබඳව කතා කිරීමට නොහැකි තත්ත්වයක් සමහර වැදගත් දෙපාර්තමේන්තුවල පවතින බවට ජනතාව මැසිවිලි නගති.

විශේෂයෙන් මන්නාරම දිස්ත්‍රික්කයේ පිහිටි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, වන සම්පත් දෙපාර්තමේන්තුව, වන ජීවී දෙපාර්තමේන්තුව, ධීවර දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව වැනි ආයතනවල සැලකිය යුතු උසස් නිලධාරීන් සිංහල භාෂාව කතා කරන අය වන අතර ඇතැම් දෙපාර්තමේන්තුවල සේවකයින් ද සිංහල භාෂාව කතා කරන අය වෙති.

මෙවන් පසුබිමක් යටතේ, වන සම්පත් දෙපාර්තමේන්තුව විසින් හෝ වන ජීවී දෙපාර්තමේන්තුව විසින් ජනතාවගේ ඉඩම් අත්පත් කර ගන්නා අවස්ථාවලදී හෝ ඉඩම්වල මායිම් සලකුණු කරනු ලබන අවස්ථාවලදී, නිතර ගැටුම්කාරී තත්ත්වයන් උද්ගත වන අතර එය ගැටලු සම්බන්ධයෙන් උසස් නිලධාරීන් සමග තමන්ගේ මව් භාෂාවෙන් ජනතාවට සාකච්ඡා කිරීමට තිබෙන අවස්ථාව ඉතාමත්ම අවම වේ.

තවද, පුරාවිද්‍යා අංශ මගින් කැණීම් කටයුතු හෝ වෙනත් ගවේෂණ කටයුතු සිදු කරනු ලබන අවස්ථාවන්වල දී

ඒ පිළිබඳ වූ සත්‍ය තොරතුරු හෝ බිම්මට්ටමේ පවතින සැබෑ තත්ත්වයන් මාධ්‍යවේදීන්ට දැනගැනීම ඉතාමත්ම අසීරු කාර්යයක් බවට පත්ව ඇත. එමෙන්ම පුරාවිද්‍යා ක්ෂේත්‍රය යනු බහුතර ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක වන ක්ෂේත්‍රයක් බවට දෙමළ ජනතාව සිතන තරමට භාෂාමය දුරස්ථභාවයක් මන්නාරම දිස්ත්‍රික්කයේ දක්නට ඇත.

## පොලිසිය හා ධීවර ක්ෂේත්‍රය

එමෙන්ම මන්නාරම දිස්ත්‍රික්කයේ ජීවත්වන බහුතර ජනතාව ධීවර රැකියාව සිය ප්‍රධානතම ජීවනෝපාය කොට ගෙන සිටීම හේතුවෙන් ධීවර දෙපාර්තමේන්තුව මගින් ඉටු කළ යුතු සේවය නැතුවම බැරි එකක් ලෙස පවතින නමුත් මන්නාරම දිස්ත්‍රික්කයේ ධීවර දෙපාර්තමේන්තුවේ උසස් නිලධාරියා දෙමළ භාෂාව භාෂාව කතා නොකරන අයෙකු බැවින් ධීවර කර්මාන්තයට අදාළ ගැටලු පිළිබඳව මෙන්ම නාවික හමුදාවෙන් සිදු කෙරෙන අගතීන් සම්බන්ධයෙන් ධීවරයන්ට ඔහු සමඟ සෘජුව සාකච්ඡා කිරීමට නොහැකි වී තිබේ.

එමෙන්ම මහජනතාවට ඉතාමත්ම වැදගත් දෙපාර්තමෙන්තුවක් වන පොලිස් දෙපාර්තමේන්තුවට අදාළව මන්නාරම දිස්ත්‍රික්කය තුළ පිහිටි බොහෝ පොලිස් ස්ථානවල ස්ථාන භාර නිලධාරීන් ඇතුළු පොලිස් නිලධාරීන් බහුතරයක් සිංහල භාෂා කතා කරන අය වන අතර ප්‍රදේශයේ ජනතාව කතා කරන භාෂාව හැසිරවීමේ දක්ෂතාවක් ඔවුන්ගෙන් බහුතරයකට නොමැති වීම නිසා පොලිස් ස්ථානවලට පැමිණෙන ජනතාව විවිධ දුෂ්කරතාවලට මුහුණ දෙති. ඔවුන්ගේ පැමිණිලි හා ගැටලු නිසි අයුරින් ඉදිරිපත් කිරීමට නොහැකි තත්ත්වයක් පවතින අතර එසේ ඔවුන්ගේ පැමිණිලි හා ගැටලු ඉදිරිපත් කළත් ඇතැම් ලේඛන ඔවුන්ට ලබා දෙනු ලබන්නේ සිංහල භාෂාවෙනි. ඇතැම් අය සතුව සිංහල භාෂා දැනුම තිබුණත් බොහෝ දෙනෙක් පොලිස් ස්ථානයෙන් නික්ම යන්නේ ඔවුන්ගේ පැමිණිලි හා ගැටලු පිළිබඳව නිසි අවබෝධයකින් තොරවයි.

## පරිපාලන රැස්වීම් හා භාෂාව

මෙවන් වාතාවරණයක් මධ්‍යයේ දිස්ත්‍රික් මට්ටමින් සංවිධානය කරනු ලබන රැස්වීම් සහ දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම් මන්නාරම දිස්ත්‍රික්කය තුළ බොහෝ දුරට පවත්වනු ලබන්නේ දෙමළ භාෂාවෙනි. එලෙස දෙමළ භාෂාවෙන් එහි සාකච්ඡා කරනු ලබන කරුණු හෝ ගනු ලබන තීරණ ඔවුන් විසින් අවබෝධ කර ගන්නේ කෙසේද යන්න පිළිබඳව සහ ඊට ඔවුන් ප්‍රතිචාර දක්වන්නේ කෙසේද යන්න පිළිබඳව ඇත්තේ ප්‍රශ්නාර්ථයකි.

මෙවන් වාතාවරණයක් තුළ යුද්ධයෙන් පීඩාවට පත් වූ ජනතාව වැඩි වශයෙන් ජීවත්වන මන්නාරම දිස්ත්‍රික්කය ඇතුළු සියලු දිස්ත්‍රික්කවල භාෂාමය අයිතීන් හා භාෂා ප්‍රතිපත්තිය නිසි පරිදි පිළිපදිනු ලබන්නේ ද? ජනතා සේවය එකී ප්‍රදේශවල තමතමන්ගේ මව් භාෂාවෙන් ඉටුකරනු ලබන්නේද? යන්න පිළිබඳව අදාළ රජයේ බලධාරීන් සොයා බැලීම කාලෝචිත ක්‍රියාවකි.

බොහෝ පිරිසකගේ ඉල්ලීම වී ඇත්තේ යම් ඉහළ තනතුරකට පත්වීමක් සිදු කරනු ලබන විට ප්‍රදේශයේ බහුතරයක් දෙනා කතා කරන භාෂාවට ප්‍රමුඛතාව ලබා දීම පිළිබඳව සැලකිල්ලක් දැක්විය යුතු අතර එසේ නොවන අවස්ථාවක ද්වී භාෂා ප්‍රවීණතාවය පිළිබඳව සැලකිල්ලක් දැක්විය යුතු බවයි. එමෙන්ම රජයේ කාර්යාලවල විශේෂයෙන් සිංහල භාෂාව කතා කරන උසස් නිලධාරීන් සේවය කරන දෙපාර්තමේන්තු හා ආයතනවල අදාළ භාෂා පරිවර්තකයින් සේවයේ යොදවා සිටිනවා දැයි තහවුරු කර ගැනීමක් සිදු කළ යුතුය.

ශ්‍රී ලංකාවේ සියලුම පළාත්වල ජීවත්වන ජනතාවට තමන්ගේ අවශ්‍යතා තමන්ට වඩාත් පහසු භාෂාවෙන් නිසි පරිදි ඉටු කර ගැනීමේ අවස්ථාව උදාකර දීම තිරසාර නිදහස සඳහා වූ පළවැනි පියවර වනු ඇති.

■ **ජෝසප් නායා**

# රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේ අභියෝග

තොරතුරු දැනගැනීමේ අයිතිය ඕනෑම ශ්‍රී ලාංකික පුරවැසියෙකුට හිමිව ඇති වැදගත් අයිතිවාසිකමකි. ඒ අනුව රාජ්‍ය ආයතන හෙවත් පොදු අධිකාරීන් සතුව ඇති ඕනෑම තොරතුරක් ඉල්ලා සිටීමට පුරවැසියන්ට අයිතිය තිබේ. තොරතුරු එය මාධ්‍යවේදීන්ටද එය ඉතා ප්‍රයෝජනවත් අයිතියකි. රජයේ ආයතනයක් සතුව ඇති තොරතුරක් දැනග ැනීම සම්බන්ධයෙන් මීට වසර 05කට පෙර තිබුණේ ඉතාම දුෂ්කර තත්ත්වයකි. එම තත්ත්වය මාධ්‍යවේදියකු වශයෙන් මෙම ලියුම්කරු ද අත්විඳ ඇත.

"මාධ්‍යයට තොරතුරු දෙන්න තහනම් නේ."

"තොරතුරු දෙන්න එපා කියලා චක්‍රලේඛනයකින්ම අපට දැනුම් දීලා තියෙන්නේ සැකයක් තියෙනවනම් චක්‍රලේඛනය පෙන්වන්නම්."

"අපෙන් විස්තර අහගෙන අපේ රස්සාව නැති කරන්නද හදන්නේ?"

මෙවැනි පිළිතුරු ආරක්ෂක අංශ, විශේෂයෙන් පොලිසිය හා රාජ්‍ය ආයතනවලින් ඕනෑ තරම් අසා ඇත. මේ තත්ත්වය නිසා අත්‍යවශ්‍ය වූ තොරතුරු දැන ගැනීම සඳහා මාධ්‍යවේදීන් වූ අපට විවිධ උපක්‍රම භාවිත කරන්නට සිදු විය. ඇතැම් විටෙක මාධ්‍යවේදියාගේ පෞරුෂත්වයට හානි සිදු වන බව හැඟී යන අවස්ථාද විය.

නමුත් 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත ක්‍රියාත්මක වීමත් සමඟ මාධ්‍යවේදියාට කොන්ද කෙළින් තබාගෙන රජයේ නිලධාරීන්ගෙන් තොරතුරු ඉල්ලා සිටීමේ බලය සහ අවස්ථාව හිමි විය. මෙම පනත 2017 පෙබරවාරි 03 සිට ක්‍රියාත්මක වූ අතර මේ වන විට වසර 05ක කාලයක් ගත වී ඇත. මේ වසර 05ක කාලය තුළ පනත ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී සිදු වන අඩුපාඩු හා දුර්වලතාවලට පුරවැසියන්ට මෙන්ම මාධ්‍යවේදීන්ටද මුහුණ දීමට සිදුව තිබුණි. තොරතුරු ඉල්ලා සිටින භාෂා මාධ්‍යයෙන් ප්‍රතිචාර ලබාගැනීමට නොහැකි වීමේ ගැටලුව තොරතුරු අයිතිවාසිකම භාවිත කිරීමේදී පුරවැසියන්ටත්, ජනමාධ්‍යවේදීන්ටත් මුහුණ දීමට සිදුව ඇති ගැටලු අතර ප්‍රමුඛ වේ. මට මුහුණ දීමට සිදු වූ ආසන්නතම අත්දැකීමක් මෙසේය.

## වව්නියාවේ අත්දැකීම

වවුනියාව දිස්ත්‍රික්කයේ වවුනියාව දකුණ සිංහල හා වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය දෙකකි. වවුනියාව දකුණ සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පදිංචිකරුවන්ගෙන් බහුතරය සිංහල භාෂාවෙන් කටයුතු කරන අය වන අතර දෙමළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බහුතරය දෙමළ භාෂාවෙන් කටයුතු කරන පුරවැසියෝය.

මාගේ භාෂා මාධ්‍ය සිංහල වුවද මාගේ පදිංචිය වූයේ දෙමළ ප්‍රාදේශීය කොට්ඨාස බල ප්‍රදේශයයි. පසුගිය දිනක මට දැනගැනීමට අවශ්‍ය තොරතුරක් ලබා ගැනීම සඳහා සෘඔෂ 01 අයදුම්පත දෙමළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යොමු කළෙමි. දින කිහිපයකට පසු සෘඔෂ 2 පිළිතුරු පෝමය මා වෙත ලැබිණ. එය ලියා තිබුණේ දෙමළ භාෂාවෙනි. ලිපිය කියවාගැනීමට දෙමළ භාෂාව දන්නා අයෙකු සොයා යෑමට මට සිදු විය. නමුත් එයින් අනතුරුව මාසයකට වැඩි කාලයක් ගත වුවද මාගේ සෘඔෂ 01 ප්‍රශ්නාවලියට පිළිතුරු ලැබුණේ නැත. එබැවින් වවුනියාව දෙමළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ගොස් තොරතුරු නිලධාරියා හමු වී ඒ ගැන සොයා බැලුවෙමි.

"ඉල්ලුම් පත්‍රය සිංහලෙන් තිබුණු නිසා විස්තරය දැන ගන්න දිසාපති කාර්යාලයේ භාෂා පරිවර්තකට යොමු කරලා ඉල්ලීමේ විස්තරය දැන ගත්තේ. ඒ නිසයි ප්‍රමාද වුණේ." යැයි පැවසූ හෙතෙම මාගේ තොරතුරු ඉල්ලීමට පිළිතුරු ලබා දීමට කටයුතු කළේය. එම පිළිතුරු ලැබුණේද දෙමළ භාෂාවෙනි. එම ලිපියද පෙර ලිපිය පරිදිම දෙමළ දන්නා අයෙකුට පෙන්වා එහි සඳහන් විස්තර දැනගැනීමට මට සිදු විය. මාගේ ප්‍රශ්න සඳහා පිළිතුරු ලබා දිය නොහැකි බව එහි සඳහන්ව තිබිණ. අනතුරුව සිංහල භාෂාවෙන් අභියාචනයක් සකස් කළ මම එම අභියාචනය ප්‍රාදේශීය ලේකම් වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමු කළෙමි. දින කිහිපයකට පසුව අභියාචනයට පිළිතුරු ලැබුණ අතර එයද දෙමළ භාෂාවෙන්ම ලියා තිබිණ.

"මම ඉල්ලපු භාෂා මාධ්‍යය සිංහල. ඒත් පිළිතුරු සේරම ලැබුණේ දෙමළ භාෂාවෙන්. එහෙම වුණාම මට තේරුම් ගන්න බෑනේ. ඇයි සිංහල භාෂාවෙන් දෙන්න අපහසු?" යැයි වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය ලේකම් එන්. කමලදාසන් ගෙන් විමසා සිටියෙමි.

"ඇත්තටම මගේ මතකයේ හැටියට මගේ කාර්යාලයට සිංහල භාෂාවෙන් තොරතුරු ඉල්ලලා ආපු පළමුවෙනි සෘඔෂ ඒක ඔයාගේ. ඒත් මගේ කාර්යාලයේ සිංහල භාෂාවෙන් වැඩ කරන අය නැහැ. ඒ නිසා වෙන්න ඇති දෙමළ භාෂාවෙන් පිළිතුරු ලැබුණේ." ඔහු පැවැසීය.

## ප්‍රායෝගික දුෂ්කරතා

"එතකොට මේ ප්‍රශ්නයට විසඳුම් සොයන්න උත්සාහ කළේ නැත්ද? "

"ඇයි නැත්තේ. කිහිප අවස්ථාවකදීම භාෂා පරිවර්තකයෙක් වගේම සිංහල භාෂාවෙන් ටයිප් සෙට්න් කරන්න පුළුවන් අය දෙන්න කියලා ඉල්ලීම් කළා. ඒත් ලැබුණේ නැහැ. විසඳුමක් හැටියට විවිධ ආයතනවල පරිගණක පුහුණුලාභීන් ප්‍රායෝගික පුහුණුව සඳහා මගේ ආයතනයට ගන්න උත්සහ කළා. නමුත් එයාලා හැමදෙනාටම ඉංග්‍රීසි ටයිප් සෙට්න් තමයි දන්නේ. ප්‍රාදේශීය ලේකම්වරයා වැඩිදුරටත් පැවසීය.

වවුනියාව දිස්ත්‍රික් ලේකම් පී.ඒ. සරත්චන්ද්‍ර පවසන්නේ "ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට පමණක් නොව වවුනියාව පරිපාලන ආයතන කිහිපයකම සිංහල නිලධාරීන්ගේ හිඟයක් පවත්නා බවයි.

"ඊට පිළියමක් විදියට සංවර්ධන නිලධාරීන් ලෙස සිංහල මාධ්‍ය උපාධිධාරීන් පිරිසක් පසුගිය කාලයේ බඳවා ගත්තා. නමුත් ඔවුන්ගෙන් වැඩි පිරිසක් ප්‍රදේශයේ සිංහල මාධ්‍ය පාසැල්වල ගුරු හිඟය පියවීම සඳහා අනුයුක්ත කරන්න සිදු වුණා. නමුත් සිංහල මාධ්‍යයෙන් වැඩ කරන නිලධාරීන් නැහැ කියලා රජයේ නිලධාරීන්ට මහජනතාව පීඩාවට පත් කරන්න බැහැ. දැන් රජයේ පාර්ශ්වයෙන්ම සිංහල/දෙමළ ද්විභාෂා දැනුම අනිවාර්ය කරලා තියෙන්නේ. භාෂා දැනුම නැති අයට රජය විසින් නොමිලයේ භාෂා පාඨමාලා පවත්වනවා. කොහොම වුණත් වවුනියාවේ සිංහල මාධ්‍ය සේවකයින්ගේ අඩුව පුරවන්න රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය දැනුම්වත් කර තිබෙනවා. අලුත් පත්වීම් දීමේදී මේ ගැටලුව විසඳෙනු ඇතැයි විශ්වාසය තැබිය හැකියි."

## මාතලේ සහ නුවරඑළියේ අත්දැකීම්

කෙසේ නමුත් බහුතර දෙමළ භාෂා මාධ්‍ය භාවිත වන වවුනියාවේ පදිංචි කරුවෙකු වූ මා මුහුණ දුන් අත්දැකීමට සමාන අත්දැකීමකට සමාජ ක්‍රියාකාරකයෙකු එම්. ප්‍රදීපන්ද මුහුණ දී තිබුණි. ප්‍රදීපන්ගේ පදිංචිය මාතලේ ප්‍රදේශයයි. ඔහුට අවශ්‍ය වූ තොරතුරු කිහිපයක් දැන ගැනීම සඳහා මාතලේ නගර සභාවට හා පන්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත සෘඔෂ 01 අයදුම් පත්‍රයක් ඉදිරිපත් කර තිබූ අතර ඔහු අයදුම්පත ඉදිරිපත් කර තිබුණේ දෙමළ භාෂාවෙනි. නමුත්

ඔහුට පිළිතුරු ලැබී තිබුණේ සිංහල භාෂාවෙනි. තොරතුරු දැනගැනීමට අවශ්‍ය කාරණාවක් වූ බැවින් භාෂා ප්‍රශ්නය විසඳාගැනීමට වෙනත් විකල්පවලට යෑමට සිදු වූ බව හෙතෙම ලියුම්කරු සමඟ කීවේය. ප්‍රදීපන් පදිංචි මාතලේ දිස්ත්‍රික්කය තුළ දෙමළ භාෂාවෙන් කටයුතු කරන පිරිස ආසන්න වශයෙන් 66,031 ( ශ්‍රී ලංකා දෙමළ 24,320, ඉන්දියානු දෙමළ 23,493 හා මුස්ලිම් 38,462) කි. ප්‍රශ්නය ඇත්තේ ප්‍රදීපන් මෙන්ම 66,031ක් වූ සියලු දෙනාට තොරතුරක් දැන ගැනීම සඳහා රජයේ කාර්යාලයකට ගිය විට සිදුවන්නේ කුමක්ද යන්නයි. සමස්තයක් ලෙස ගත් විට ලංකාවේ පදිංචි පුරවැසියන්ගෙන් සැලකියයුතු පිරිසක් මෙම භාෂා ප්‍රශ්නයට මුහුණ දී සිටිති. මේ පිරිස අතරින් මේ තත්වයට මුහුණ දෙන වැඩි පිරිස දෙමළ භාෂාව සිය භාෂා මාධ්‍ය ලෙස තෝරා ගෙන ඇති පිරිස බව පෙනේ.

නුවරඑළිය දිස්ත්‍රික්කයද මීට හොඳ නිදර්ශනයකි. දිස්ත්‍රික්කයේ ජන සංඛ්‍යා ලේඛනය අනුව සිංහල භාෂාවෙන් කටයුතු කරන පිරිස 282,621 (40.2%) කි. දෙමළ භාෂාවෙන් කටයුතු කරන පිරිස 418,451 (59.5%) කි. එය ඉන්දියානු දෙමළ 355,830 (50.6%)ක්, ශ්‍රී ලංකා දෙමළ 46,066 (6.5%)ක් හා මුස්ලිම් 16,555 (2.4%)ක් වශයෙනි.

නමුත් නුවරඑළිය දිස්ත්‍රික්කයේ බොහෝ රජයේ කාර්යාල වෙතින් දෙමළ භාෂාවෙන් තොරතුරු ලබා දීමේදී ඉල්ලුම් කරන්නන් දුෂ්කරතාවයකට පත් වේ. මීට අමතරව සෙසු දිස්ත්‍රික්ක වන ගම්පහ දිස්ත්‍රික්කයේ දෙමළ භාෂාවෙන් කටයුතු කරන පිරිස 151,628කි. (ශ්‍රී ලංකා දෙමළ 65,302, ඉන්දීය දෙමළ 7,621, හා මුස්ලිම් 78,705) මීට අමතරව කුරුණෑගල, අනුරාධපුර, පොළොන්නරුව ආදී දිස්ත්‍රික්ක රැසක දෙමළ භාෂාවෙන් තොරතුරු ඉල්ලුම්කරන්නන් දුෂ්කරතාවයකට පත් වන බවට තොරතුරු වාර්තා වී තිබේ.

## උතුර-නැගෙනහිර සහ දකුණ

මෙහි බරපතළම තත්ත්වයක් දක්නට තිබෙන්නේ උතුරු නැගෙනහිර හා දකුණේ දිස්ත්‍රික් තුළය. සිංහල මාධ්‍ය භාවිතාව වැඩිම දිස්ත්‍රික්කය වන හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ දෙමළ භාෂා මාධ්‍ය පිරිස 7,939කි. එමෙන්ම ගාල්ල දිස්ත්‍රික්කය තුළ සිටින දෙමළ භාෂා මාධ්‍ය හසුරුවන පිරිස 55,042කි. එම දිස්ත්‍රික්ක දෙකෙහි රජයේ කාර්යාල තුළ දෙමළ භාෂාවට ඇත්තේ ඉතාමත් අවම පහසුකමකි. එමෙන්ම වවුනියාවට අමතරව මන්නාරම, කිළිනොච්චිය, මුලතිව්, යාපනය, මෙන්ම නැගෙනහිර මඩකලපුව යන දිස්ත්‍රික්ක තුළ විශාල ප්‍රමාණයෙන් නොවුවද සිංහල භාෂාවෙන් කටයුතු කරන පිරිස සුළු වශයෙන් හෝ සිටිති. නමුත් ඔවුනට සිංහල භාෂාවෙන් යම් තොරතුරු ඉල්ලීමක් ලබා ගැනීමට නොහැකි තරම්ය. අම්පාර හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල මේ තත්ත්වය දෙපාර්ශ්වයටම අඩු වැඩි වශයෙන් මුහුණ දීමට සිදු වේ. මේ සියල්ලටම අමතරව පොදුවේ රටේ විවිධ ප්‍රදේශයන්හි ජනතාව මෙම භාෂා දුෂ්කරතාවට මුහුණ දෙති.

## අයිතිය ගැන නොදැනීමේ ගැටලුව

නමුත් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(2) වගන්තිය අනුව ඕනෑම පුරවැසියෙකුට සිංහල හා දෙමළ භාෂාවෙන් සිය කටයුතු කර ගැනීමේ අයිතිය ඇත. එමෙන්ම සිංහල හා දෙමළ භාෂා දෙකට නිල වශයෙන් පිළිගත් රාජ්‍ය භාෂා වේ. නමුත් මෑත කාලයේ කරන ලද සමීක්ෂණයකින් හෙළි වී ඇත්තේ රටේ ජනගහනයෙන් 74%ක් මේ බව නොදන්නා බවයි. සත්‍ය වශයෙන් මෙය ඉතාමත් අවාසනාවන්ත තත්ත්වයකි. ඒ මක් නිසාද යත් රටේ ජනතාවගේ භාෂා අයිතිය සුරක්ෂිත කිරීම සඳහා රජය විසින් ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය නමින් වෙනම අමාත්‍යාංශයක් පිහිටුවා ඇමති වරයෙකුද පත් කර ඇති බැවිනි. එමෙන්ම එම අමාත්‍යංශය යටතේ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, රාජ්‍ය භාෂා කොමිෂම හා ජාතික භාෂා අධ්‍යාපනය හා පුහුණු ආයතනය නමින් ආයතන 03 ක් පිහිටුවා ඇත. නමුත් අමාත්‍යංශය පිහිටුවීමෙන් අපේක්ෂිත අරමුණු ඉටු වන්නේද යන ප්‍රශ්නාර්ථය ඉහත කරුණු කාරණා සැලකිල්ලට ගැනීමේදී අපට ඇති වේ.

මෙය තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකමට පමණක් සීමා වී ඇති ගැටලුවක් නොවේ. මෙය බහු ජාතික, බහු වාර්ගික සමාජයක රාජ්‍ය ආයතන පුරවැසියන්ට තේරුම් ගතහැකි භාෂාවකින් ගනුදෙනු කිරීම පිළිබඳ ප්‍රශ්නයකි. පුරවැසි යහපත වෙනුවෙන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ප්‍රවර්ධනය කිරීම කෙරෙහි රජයේ අවධානය මීට වඩා යොමු විය යුතුව ඇති බව මෙම නිදර්ශන අනුව පෙනේ.

■ **සනත් ප්‍රියන්ත**

ISBN : 978-624-5914-19-7